සැ. යු. - 2012.03.16 දින පළ වූ අංක 1,750 දරන ගැසට් පත්‍රයේ I–III සහ IV(අ) කොටස් පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,751 - 2012 මාර්තු මස 23 වැනි සිකුරාදා - 2012.03.23

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත )

| | පිටුව |
|---|---|
| තනතුරු-ඇබෑර්තු ... ... ... ... | 722 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... ... ... | 725 |
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | — |
| පළාත් පාලන සහා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... ... | — |
| අයවැය ලේඛන ... ... ... | — |
| දේපළ විකිණීම් ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... | 796 |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2012 මාර්තු මස 30 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2012 මාර්තු මස 16 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**ලක්ෂමන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2012 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

# තනතුරු ඇබෑර්තු

## ගලේවෙල ප්‍රාදේශීය සභාව

මධ්‍යම පළාත් සභා රාජ්‍ය සේවයේ ගලේවෙල ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩු වී ඇති III වැනි පන්තියේ පහත සඳහන් තනතුරු සඳහා බඳවා ගැනීම සඳහා ගලේවෙල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ස්ථිර පදිංචිකරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| 01. | *තනතුරු නාමය* | *තනතුරු සංඛ්‍යාව* | *අධ්‍යාපන සුදුසුකම්* |
|---|---|---|---|
| | මුරකරු | 01 | අ.පො.ස. (සා.පෙ.) විභාගයේ සිංහල හෝ දෙමළ භාෂාව සමඟ අවම වශයෙන් විෂයයන් 06ක් සමත්වීම |

02. *වැටුප් පරිමාණය* :- රු. 11,730-10x120-10 x 130-10 x 145-12 x 160-රු.17,600 ( 4 වැනි වැටුප් පියවරට එළඹීමට පෙර කාර්යක්ෂමතා කඩඉමකි) (රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 06/2006(iv) - පී. එල්. 1-2006ඒ).

03. පොදු සුදුසුකම් :-

1. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතු ය;
2. යහපත් චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍යයකින් යුක්ත විය යුතු ය;
3. තනතුරු සඳහා ඉල්ලුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ 45ට නොවැඩි විය යුතු ය. (දැනටමත් පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයට මෙම වයස් සීමාව අදාළ නොවේ);
4. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට පූර්වාසන්න වසර 03ක නොඅඩු කාලයක් ගලේවෙල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ස්ථිර පදිංචිකරුවෙකු විය යුතු ය. (ඡන්දහිමි නාමලේඛණය හෝ ප්‍රාදේශීය ලේකම් විසින් අත්සන් කළ සහතිකයකින් සනාථ විය යුතු ය.);
5. දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවෙකු වී දඬුවම් ලැබූවෙකු නොවිය යුතු ය;
6. දැනටමත් ගලේවෙල ප්‍රාදේශීය සභාවේ නියුතු අයදුම්කරුවන් කෙරෙහි විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ;
7. අයදුම්කරුවන්/අයදුම්කාරියන් පරම්පරාවෙන් හෝ ලියාපදිංචිවීමෙන් ශ්‍රී ලාංකිකයෙකු විය යුතු ය.

*04. බඳවා ගැනීමේ ක්‍රමය :—*

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකින් බඳවා ගැනීම සිදුකරනු ලැබේ.

05. *සේවයේ නියුක්ත කිරීමේ කොන්දේසි :—*

01. මෙම තනතුර ස්ථිර ය. විශ්‍රාම වැටුප් සහිත ය. නියමිත පරිදි වැන්දඹු අනත්දරු අරමුදලට දායක මුදල් ගෙවිය යුතු ය;
02. පත්වීම අවුරුදු 03ක පරිවාස කාලයකට යටත් වේ;
03. මෙම බඳවා ගැනීමේ කොන්දේසිවලට අමතරව ආයතන සංග්‍රහයේ කොන්දේසිවලට ද, මුදල් රෙගුලාසිවලට ද, මධ්‍යම පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කලින් කලට පනවනු ලබන වෙනත් කොන්දේසි හා රෙගුලාසිවලට ද , පළාත් පාලන ආයතනවලට අදාළ ආඥාපනත් වලට පනත්වල විධිවිධානවලට ද, ගලේවෙල ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද නියෝගවලට ද අනුකූලව කටයුතු කිරීමට එකඟ විය යුතු ය.

*ඉල්ලුම් කළ යුතු ආකාරය :-*

දැනටමත් රාජ්‍ය /පලාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා තම ඉල්ලුම්පත ආයතන ප්‍රධානියා මගින් එවිය යුතු අතර, නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

අයදුම්පත් කැඳවීමෙන් පසුව හෝ කැඳවන අතරතුරේ මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ සංශෝධනය කිරීමේ සම්පූර්ණ බලතල ගලේවෙල ප්‍රාදේශීය සභාවේ ලේකම් සතු ය.

මෙම නිවේදනය අවසානයේ සඳහන් ආදර්ශ ආකෘතිය ප්‍රකාරව අයදුම්පත්‍ර 2012 මාර්තු මස 30 වැනි දිනට හෝ ඊට පෙර ''ලේකම්, ප්‍රාදේශීය සභාව, ගලේවෙල'' යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් පමණක් එවිය යුතු ය. අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ ඉල්ලුම් කරන තනතුර සඳහන් කළ යුතු අතර අයදුම්පත්‍රය සමග පහත සඳහන් සහතිකවල අනු පිටපත් අමුණා එවිය යුතු ය.

*අයදුම්පත සමඟ එවිය යුතු සහතිකවල පිටපත් :-*

01. උප්පැන්න සහතිකය;
02. අධ්‍යාපන සහතිකය;
03. හැඳුනුම්පතේ පිටපතක්;

04. මෑතක දී ලබාගත් චරිත සහතික 02ක් (ඉන් එක් චරිත සහතිකයක් ග්‍රාම නිලධාරි සහතිකය විය යුතු ය.)
05. දැනට මෙම ආයතනයේ සේවයේ නියුක්ත වන්නේ නම් සේවා සහතික.

එච්. නිමල් ගුණවර්ධන,
ලේකම්,
ප්‍රාදේශීය සභාව,
ගලේවෙල.

2012 පෙබරවාරි මස 29 වැනි දින,
ගලේවෙල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

ආදර්ශ අයදුම්පත්‍රය

*මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ ගලේවෙල ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩු වී ඇති III වැනි පන්තියේ මුරකරු තනතුර සඳහා බඳවා ගැනීම*

01. (i) අයදුම්කරුගේ සම්පූර්ණ නම :——————.
(ii) මුලකුරු සමග නම :——————.
02. ස්ථිර ලිපිනය :——————.
03. ග්‍රාම නිලධාරි වසම හා අංකය :——————.
04. උපන් දිනය ඃ අවුරුද්ද:——————. මාසය:——————. දිනය:——————.
05. ඉල්ලුම්පත්‍ර භාරගන්නා අවසාන දිනට වයස ඃ අවුරුදු:——————. මාස:——————. දින:——————.
06. ස්ත්‍රී/පුරුෂ භාවය :——————.
07. ජාතික හැඳුනුම්පත් අංකය:——————.
08. ගලේවෙල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ස්ථිර පදිංචි කාලය වසර :——————.
09. ඔබ ශ්‍රී ලංකාවේ පුරවැසියකු වන්නේ උපතින් ද, ලියාපදිංචි වීමෙන් ද යන වග :——————.
10. අධ්‍යාපන සුදුසුකම්:——————.
11. වෙනත් සුදුසුකම්:——————.
12. වෘත්තීය සුදුසුකම්:——————.
13. සේවා පළපුරුද්ද:——————.
(i) දැනට සේවය කරන ආයතනය :——————.
(ii) දැනට දරන තනතුර :——————.
(iii) එම තනතුරට පත්වූ දිනය :——————.
(iv)මීට පෙර සේවය කරන ලද ස්ථානය හා දරන ලද තනතුර :——————.

මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීම හා විශ්වාසය පරිදි සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මෙම බඳවා ගැනීමේ කොන්දේසි අනුව මා විසින් සාවද්‍ය තොරතුරු ඉදිරිපත් කර ඇති බව බඳවා ගැනීමට පෙර හෝ පසුව අනාවරණය වවුහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහකරනු ලැබීමට යටත්වන බව මම දනිමි.

——————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :——————.

*දැනටමත් සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා ආයතන ප්‍රධානියාගේ සහතිකය ඃ*

මෙම ඉල්ලුම්කරුවන ..................................................................මයා./මිය./මෙනවිය දැනට මෙම දෙපාර්තමේන්තුවේ/ආයතනයේ ................................ වශයෙන් සේවය කරයි. ඔහු/ඇය විසින් ඉහතින් දක්වා ඇති තොරතුරු නිවැරදි බවත්, ඔහු/ඇය තෝරාගනු ලැබුවහොත් සේවයෙන් නිදහස් කළ හැකි/නොහැකි බවත් , ඔහු/ඇය කුමන ආකාරයේ හෝ විනයානුකූල දඬුවමකට භාජනය වී නොමැති බවත් මින් සහතික කරන අතර අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි/නොකරමි.

——————,
දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ හෝ
බලයලත් නිලධාරියාගේ අත්සන.

නම :——————.
පදවි නාමය :——————.
දෙපාර්තමේන්තුව/ආයතනය/නිලමුද්‍රාව තබන්න) :——————.
දිනය :——————.

03-792

## ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභාව

### බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පුරප්පාඩු පිරවීම

ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභාවේ දැනට පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරුවලට බඳවා ගැනීම සඳහා නියමිත සුදුසුකම් ඇති බස්නාහිර පළාත තුළ ස්ථිර පදිංචිකරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ :-

| *තනතුරු නාමය* | *තනතුරු සංඛ්‍යාව* | *වැටුප් පරිමාණය හා වැටුප් බේතය* | *අධ්‍යාපන සුදුසුකම්* | *වෙනත් සුදුසුකම්* |
|---|---|---|---|---|
| රියැදුරු II "ආ" | 01 | 06/2006(IV)PL-3 රු. 12,470-10x130-10x145 - 10x160-12 x 170 - රු.18,860 | අවම වශයෙන් 8 වැනි ශ්‍රේණිය 9 වැනි වසර සමත් වී තිබිය යුතු ය. | 1. තාර බර හොන්ඩර 24 ට අඩු ස්ටේෂන් වැගන් රථ පැදවීම පිළිබඳව හෝ ඊට වැඩි බර පන්තියක මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් විසින් නිකුත් කරන ලද සහතිකයක් ලබා තිබීම.<br>2. වාහන රියැදුරු වශයෙන් වසර 03ක පළපුරුද්දක් තිබිය යුතු ය. සහතික මගින් සනාථ කළ යුතු ය.) අවම උස අඩි 05ක් විය යුතු ය.<br>3. දිවා රාත්‍රී සේවයේ යොදන බැවින් ශාරීරික වශයෙන් සුදුසු විය යුතු අතර මනා ඇස් පෙනීමක් තිබිය යුතුයි.<br>4. මහා මාර්ග නීති සංග්‍රහය පිළිබඳ දැනුමක් තිබිය යුතු ය. |

*පොදු සුදුසුකම් :*

1. ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතු ය ;
2. යහපත් චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍යයකින් යුක්ත විය යුතු ය;
3. අයදුම්පත් කැඳවන දිනට පෙරාතුව බස්නාහිර පළාත තුළ අවම වශයෙන් වසර 03ක කාලයක් ස්ථිර පදිංචියක් තිබිය යුතු ය. (ශ්‍රී ජයවර්ධනපුර සභා බල ප්‍රදේශයේ පදිංචිකරුවන්ට වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.)

3. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :*

1. මෙම තනතුරු ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය.
2. වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතු ය.
3. බඳවා ගැනු ලබන තැනැත්තන් තුන් අවුරුදු පරිවාස කාලයකට යටත් වේ.

*4. සේවා කොන්දේසි :*

පත්වීම් ලබන්නන් ශ්‍රී ලංකා ආයතන සංග්‍රහයේ කොන්දේසිවලට ද, බස්නාහිර පළාත් සභාවේ මුදල් රෙගුලාසිවලට ද, බස්නාහිර පළාත් සභාවේ හෝ බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ හෝ ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභාව විසින් වරින් වර නිකුත් කරන රෙගුලාසි හා නියෝගවලටද අනුකූලව කටයුතු කිරීමට බැඳී සිටිය යුතු ය.

ඉහත සුදුසුකම් සපුරාලන අයදුම්කරුවන් විසින් සකස් කර එවනු ලබන අයදුම්පත් මේ සමග ඇති ආදර්ශ අයදුම්පත්‍රය අනුව 2012.03.20 වැනි දිනට හෝ ඊට පෙර ලැබෙන සේ "නාගරික කොමසාරිස්, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභාව, රාජගිරිය" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුයි. තව ද අයදුම්පත්‍රය බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ අයදුම්කරන තනතුර සඳහන් කළ යුතු ය. ප්‍රමාද වී එවනු ලබන අයදුම්පත් සහ අසම්පූර්ණ අයදුම්පත් සම්බන්ධව සලකා බලනු නොලැබේ.

ශාන්තා පී. ලියනගේ,
නාගරික කොමසාරිස්,*(වැ.බ.)*
ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභාව.

2012 මාර්තු මස 02 වැනි දින,
රාජගිරිය,
ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභාවේ දී ය.

*ආදර්ශ අයදුම්පත්‍රය*

*බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභාවේ ....................................... තනතුර සඳහා ආදර්ශ අයදුම්පත්‍රය*

1. (i) මුලකුරු සමග නම :——————————,
 (ii) මුලකුරුවලින් හැඳින්වෙන නම් :——————————,
2. ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :——————————,
3. ස්ථිර ලිපිනය :——————————.
4. ජාතික හැඳුනුම්පත් අංකය :——————————,
5. ස්ත්‍රී/පුරුෂ භාවය :——————————.
6. උපන් දිනය : අවුරුද්ද :——————————, මාසය :——————————, දිනය :——————————.
7. වයස අවුරුදු :——————————.
8. ශ්‍රී ලංකා පුරවැසියකු වන්නේ උපතින් ද? ලියාපදිංචිවීමෙන් ද? :——————————.
9. අධ්‍යාපන සුදුසුකම් :——————————,
10. රියැදුරු බලපත්‍රයේ වර්ගය සහ අංකය (රියැදුරු තනතුර සඳහා අදාලවේ.) :——————————,
11. අයදුම්කරුගේ උස :——————————.
12. වෘත්තීය සුදුසුකම් :——————————.
13. සේවා පළපුරුද්ද :——————————.
14. ඔබ කවරදාක හෝ උසාවියකින් වරදකරුවකු කරනු ලැබ තිබේ ද ?

ඉහත සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ පරිදි සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මෙම බඳවා ගැනීම පිළිබඳ කොන්දේසි අනුව මා විසින් සාවද්‍ය තොරතුරක් දන්වා ඇති බවට ඔප්පු වුවහොත් පත්කරනු ලැබීමට පෙර නුසුදුස්සෙකු වන බව සහ පත්වීම ලැබීමෙන් පසු සේවයෙන් පහකරනු ලැබීමට යටත් වන බව ද මම දනිමි.

——————————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :——————————.

03-893

# පළාත් පාලන නිවේදන

## කුරුවිට ප්‍රාදේශීය සභාව

කුරුවිට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටියා වූ පහත උපලේඛනයේ සඳහන් ප්‍රදේශ 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134(1) වගන්තිය යටතේ දියුණු ගම් ප්‍රදේශ වශයෙන් ප්‍රකාශයට පත් කිරීමට සබරගමුව පළාතේ පළාත් පාලන සහකාර කොමසාරිස් විසින් අනුමත කර ඇති බව මහජනතාවගේ දැන ගැනීම සඳහා මෙයින් දැනුම් දෙමි.

ප්‍රේමරත්න මල්කැකුළ,
සභාපති,
ප්‍රාදේශීය සභාව,
කුරුවිට.

උපලේඛනය

**කුරුවිට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ නව වරිපනම් සීමා**

1. කොළඹ-රත්නපුර පාරේ ඒදණ්ඩවල සිට ආර්. ටී. එස්. ෆැක්ට්‍රිය දක්වා පාරේ මධ්‍ය ලක්ෂ්‍යයේ සිට දකුණුපසට මීටර් 150 ක්.
2. කොළඹ-රත්නපුර පාරේ 82/2 පාලමේ සිට ඒදණ්ඩවල හන්දිය දක්වා පාරේ මධ්‍ය ලක්ෂ්‍යයේ සිට දෙපසට මීටර් 150 ක්.
3. කොළඹ-රත්නපුර පාරේ පැරඩයිස් ඉසුරු පෙදෙස අතුරු පාරේ ආරම්භයේ වැව දක්වා පාරේ, මධ්‍ය ලක්ෂ්‍යයේ සිට දෙපසට මීටර් 150 ක්.
4. කොළඹ-රත්නපුර පාරේ පැරඩයිස් සමන් පෙදෙස අතුරු මාර්ගයේ ආරම්භයේ සිට අවසානය දක්වා (වයි. විසුමපෙරුම මහතාගේ නිවස දක්වා) පාරේ මධ්‍ය ලක්ෂයේ සිට දෙපසට මීටර් 100 ක්.
5. කුරුවිට -ගුරුබැල්කඩ පාරේ ආරම්භයේ සිට එරත්න පාර හමුවන ස්ථානය දක්වා පාරේ මධ්‍ය ලක්ෂ්‍යයේ සිට දෙපසට මීටර් 100ක්.
6. රත්නපුර -කොළඹ පාරේ 82/2 පාලමේ සිට 86/5 පාලම දක්වා පාර මධ්‍ය ලක්‍ෂ්‍යයේ සිට දෙපසට මීටර් 150ක් (මෙම සීමාව තුළ තක්සේරු කළ වරිපනම් බදු අයකරන දේපළ ප්‍රමාණයක් ද ඇත),

7. රත්නපුර -කොළඹ පාරේ 86/5 පාලමේ සිට 86/2 බෝක්කුව දක්වා මාර්ගයේ මධ්‍ය ලක්ෂ්‍යයේ සිට මීටර් 150ක්.
8. රත්නපුර -කොළඹ පාරේ 86/2 බෝක්කුවේ සිට 86/1 බෝක්කුව දක්වා දෙපසට මීටර් 100ක්. (මෙම සීමාව තුල තක්සේරු කළ, වරිපනම් බදු අයකරන දේපළ ප්‍රමාණයක් ද ඇත)
9. රත්නපුර -කොළඹ පාරේ 86/1 බෝක්කුවේ සිට නාමල්දෙනිය ගොවිජන සේවා මධ්‍යස්ථානය දක්වා පාර මධ්‍ය ලක්‍ෂ්‍යයේ සිට දෙපසට මීටර් 150 ක්
10. කොළඹ -රත්නපුර පාරේ නාමල්දෙනිය ගොවිජන සේවා මධ්‍යස්ථානයේ සිට ඇහැලියගොඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ආරම්භය දක්වා පාර මධ්‍ය ලක්‍ෂ්‍යයේ සිට දෙපසට මීටර් 150 ක්.(මෙම සීමාව තුළ තක්සේරු කළ, වරිපනම් බදු අයකරන දේපළ ප්‍රමාණයක් ද ඇත)

03-890

---

**වඩමාරච්චි දකුණ/බටහිර ප්‍රාදේශීය සභාව - කරවෙඩ්ඩි**

1975 අංක 17 දරන පනතේ කමිටු අයිතිය ලබාදුන් පනත සහ 1987 අංක 38 දරන පනතේ සංශෝධනය

පහත උපලේඛනයේ සඳහන් කර ඇති පුද්ගලයන්ගේ ඉඩමේ ඔහුගේ නමට ඉදිරියෙන් දක්වා ඇති කමිටුව 2012 වර්ෂයේ පවත්වාගෙන යාමට ඉහත අයිතිය ලබාදෙන පනතේ 06 වැනි වගන්තියට අනුව මෙම ලිපියෙන් දැනුම් දෙමි.

මෙම අයිතිය ලබාදීමට යෝජනා කර ඇති කමිටුව පවත්වාගෙන යාමට තීරණය කර ඇති ඉඩම අසල පදිංචිකරුවන් කිසිවෙක් මේ සම්බන්ධව විරෝධය පළ කරයි නම් ගැසට් නිවේදනය පළ කර ඇති දින සිට සති හතරක් ඉක්ම යාමට පෙර ලිඛිත පිටපත් දෙකකින් මා වෙත එවිය යුතු බව දන්වමි.

තී. අන්නලිංගම්,
ලේකම්.
වඩමාරච්චි දකුණ/බටහිර ප්‍රාදේශීය සභාව

2012 පෙබරවාරි මස 28 වැනි දින,
වඩමාරච්චි දකුණ /බටහිර, ප්‍රාදේශීය සභාව,
කරවෙඩ්ඩි.

**උපලේඛනය**

| *අයදුම්කරුගේ නම හා ලිපිනය* | *කමිටුවේ සභාපති ද, ලේකම් ද, කළමනාකරු ද, යන වග* | *කමිටුවේ නම* | *කමිටුව පවත්වාගෙන යාමට සුදුසු යැයි යෝජනා කර ඇති ස්ථානය* |
|---|---|---|---|
| අය්යාතුරෙයි විග්නේෂ්වරන් අයිංකරාපදි තෙවරයාලි, නෙල්ලිඅඩි | කළමනාකරු | අයිංගරන් විනෝදාංශ සමාජය | ප්‍රධාන වීදිය, නෙල්ලිඅඩි, කරවෙඩ්ඩි |

03-802

---

**උඩුනුවර ප්‍රාදේශීය සභාව**

ගෝඝාතක ආඥාපනත (272 වැනි අධිකාරය)

මෙහි පහත උපලේඛනයෙහි සඳහන් අය විසින් ඒ අයගේ නම ඉදිරියෙන් සඳහන් ගෝඝාතකාගාරයේ මස් පිණිස සතුන් ඝාතනය කිරීමටත් නම ඉදිරියෙන් සඳහන් මස් වෙළඳ සලෙහි මස් වෙළඳාම් කිරීමටත් 2012 වර්ෂය සඳහා බලපත්‍රයක් ඉල්ලුම්කර තිබෙන බව ගෝඝාතක ආඥාපනතේ (272 වැනි අධිකාරය) 7 (2) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

02. මෙම බලපත්‍රය නිකුත් කිරීම සඳහා විරෝධතාවක් දැක්වීමට අදහස් කරන උඩුනුවර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පදිංචි ඕනෑම අයෙකුට ඔහුගේ/ඇයගේ විරෝධතාව සඳහා හේතුව දක්වමින් පිටපත් දෙකකින් යුතු ලියවිල්ලක් මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළවන දින සිට දින දාහතරක් (දින 14ක්) ඇතුළත මා වෙත එවන ලෙස මෙයින් ඉල්ලා සිටිනු ලැබේ.

ආර්. එම්. බන්දුල සෙනවිරත්න,
සභාපති,
උඩුනුවර ප්‍රාදේශීය සභාව,
ගෙළිඔය.

2012 ජනවාරි මස 20 වැනි දින,
ගෙළිඔය පිහිටි
උඩුනුවර ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

*උපලේඛනය*

| *අනු. අංකය* | *ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය* | *මස් වෙළෙඳ සල පිහිටි ස්ථානය* | *ගෝසාතකාගාරය පිහිටි ස්ථානය* |
|---|---|---|---|
| *එළු මස් වෙළඳාම :* | | | |
| 01. | මොහොමඩ් සුබයිර් මොහොමඩ් මුස්තාක් මහතා, අංක 426, නව ඇල්පිටිය, ගෙළිඔය. | අංක 49, කළුගමුව පාර, ගෙළිඔය | අංක 426, නව ඇල්පිටිය, ගෙළිඔය. |
| *ගවමස් වෙළඳාම :* | | | |
| 02. | මුහම්මදු ඉස්මයිල් මුහම්මදු නිෂාම් මහතා, 207/10, වටදෙනිය, වෙලම්බඩ. | අංක 141, වටදෙනිය වෙලම්බඩ | සියඹලාගහමුලවත්ත, වෙලම්බඩ. |
| 03. | සේගු මන්සූර් මොහොමඩ් අස්මි මහතා, අංක 49සී, දස්කර, මුරුතගහමුල. | අංක 330, හකුරංගේවත්ත, ලීමගහකොටුව | පල්ලියගාවහේන වත්ත, එගොඩකළුගමුව |
| 04. | මන්සූර් මොහොමඩ් රිස්මි මහතා, දස්කර, මුරුතගහමුල | 62 බී, දස්කර මුරුතගහමුල | පල්ලියගාවහේන වත්ත, එගොඩ කළුගමුව |
| 05. | මොහොමඩ් පාරුක් මොහොමඩ් සාදික් මහතා, අංක 528/2, නවඇල්පිටිය, ගෙළිඔය | පුවක්වැටියාවත්ත, කළුගමුව පාර, ගෙළිඔය | පල්ලියගාවහේනවත්ත, එගොඩ කළුගමුව |
| 06. | මුහම්මදු පජුර්දීන් මුහම්මදු සියාන් මහතා, අංක 07, දොඹගොල්ල, මුරුතගහමුල | අංක 383, හකුරංගේවත්ත, බූවැලිකඩ | සියඹලාගහමුලවත්ත, වෙලම්බඩ |
| 07. | මුයිනුදීන් මොහොමඩ් ඉක්බාල් මහතා, අංක 157, පැණිදෙනිය, පේරාදෙණිය | අංක 135, දවුලගල, හන්දෙස්ස | සියඹලාගහමුලවත්ත, වෙලම්බඩ |
| 08. | හේන්දෙනියේ සම්සුදීන් අබුබකර් මහතා, අංක 130/ඒ, කුරුකුත්තල, කඩුගන්නාව | අංක 130/ඒ, කුරුකුත්තල, කඩුගන්නාව | අංක 252/1 රූකවල්පල, වෙලම්බඩ |
| 09. | ආයිෂා උම්මා මොහොමඩ් හනීෆා මහත්මිය, අංක 115, නුවර පාර, වෙලම්බඩ | අංක 48, නුවර පාර, වෙලම්බඩ | සියඹලාගහමුලවත්ත, වෙලම්බඩ |
| 10. | මොහම්මදු සාලි නිර්ෂාඩ් මොහම්මදු මහතා, අංක 479/4, කළුගමුව, ගෙළිඔය | පුවක්වැටියාවත්ත, කළුගමුව පාර, ගෙළිඔය | පල්ලියගාවහේනවත්ත, එගොඩ කළුගමුව |
| 11. | මොහොමඩ් අනීස් සාජිත් අහමඩ් මහතා, අංක 29/6, රූකවල්පලපාර, වෙලම්බඩ | අංක 58බී, කුරදෙනිය පාර, වෙලම්බඩ | අංක 252/1, රූකවල්පල පාර, වෙලම්බඩ |
| 12. | මුහමඩ් සාලි මුහමඩ් සිද්ධික් මහතා, අංක 490/2ඩී, කළුගමුව, ගෙළිඔය | අංක 330, දෙල්ලංග පල්ලිය පාර, ගෙළිඔය | පල්ලියගාවහේනවත්ත, එගොඩ කළුගමුව |
| 13. | අන්වර්දීන් මොහොමඩ් හසන් මහතා, අංක 133ඩී, දුම්පල්ලංග, හන්දෙස්ස | අංක 211/2, නුවර පාර, දවුලගල, හන්දෙස්ස | අංක 252/1, රූකවල්පල, වෙලම්බඩ |

# අතුරු ව්‍යවස්ථා

## අතුරු ව්‍යවස්ථා

කොලොන්න ප්‍රාදේශීය සභාව

**1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනත**

1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ දෙවැනි වගන්තිය යටතේ පළාත් පාලන නිවාස හා ඉදිකිරීම් අමාත්‍යවරයා විසින් සම්පාදනය කරනු ලැබූ 1988.08.23 වැනි දින අංක 520/7 දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද්දා වූ ද, 1990 දෙසැම්බර් මස 27 වැනි දින අංක 642/10 දරන *ගැසට් පත්‍රයේ* (IV වන කොටස) පළ කළ සබරගමුව පළාත් සභාවේ යෝජනාවකින් පිළිගැනීමට අනුමත කළ නිවේදනය පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ ආදර්ශ අතුරු ව්‍යවස්ථා වල පළමු හා දෙවන කොටසේ අංක 01 සිට 42 දක්වා අතුරු ව්‍යවස්ථා පිළිබඳ සඳහන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* IV (ආ)) කොටසේ පළවූ දිනයේ සිට කොලොන්න ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ බල පැවැත්විය යුතු පොදු අතුරු ව්‍යවස්ථා වශයෙන් පිළිගැනීමටත් ක්‍රියාත්මක කිරීමටත් 2012 පෙබරවාරි මස 28 වැනි දින පැවැත්වූ මාසික මහසභාවේදී යෝජනා ස්ථිරත්වයෙන් සහා සම්මත කරන ලදී.

පී. එච්. ආර්. ඩී. දයා පතිරණ,<br>
සභාපති,<br>
ප්‍රාදේශීය සභාව,<br>
කොලොන්න.

2012 පෙබරවාරි මස 29 වැනි දින,<br>
කොලොන්න ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

*අතුරු ව්‍යවස්ථා*

*1 වැනි කොටස*

**සියළුම සම්මත අතුරු ව්‍යවස්ථා අර්ථ නිරූපණය කිරීමට අදාළ අතුරු ව්‍යවස්ථා**

මේ සම්මත අතුරු ව්‍යවස්ථා අර්ථ නිරූපණය කිරීමේදී ප්‍රාදේශීය සභාවක් විසින් යථා පරිදි පිළිගනු ලැබූ යම් සම්මත අතුරු ව්‍යවස්ථාවක යෙදෙන 'ප්‍රාදේශීය සභා' 'සභාපතිවරයා' 'ලේකම්වරයා' සහ 'ප්‍රාදේශීය සභා ප්‍රදේශය' යන යෙදුම්වලින් පිළිවෙලින් ඒ ප්‍රාදේශීය සභාව, ඒ ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා, ඒ ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා සහ ඒ ප්‍රාදේශීය සභාවේ ප්‍රාදේශීය සභා ප්‍රදේශය අදහස් වන්නේ ය.

II වැනි කොටස

***උකස් ලියාපදිංචි කිරීම***

01. ප්‍රාදේශීය සභා ප්‍රදේශය තුළ පිහිටි, කිසියම් නිශ්චල දේපළක සෑම උකස් ලාභියකු විසින් ම හෝ කිසියම් මියගිය උකස් ලාභියෙකුගේ කිසියම් උරුමක්කරුවකු නැතහොත් නීත්‍යානුකූල නියෝජිතයකු විසින් එවැනි යම් උකසක් ප්‍රාදේශීය සභා කාර්යාලයෙහි ලියාපදිංචි කිරීමට සැලැස්වීම නීත්‍යානුකූල වන්නේය.

02. ප්‍රාදේශීය සභා කාර්යාලයෙහි උකසක් ලියාපදිංචි කිරීමට අපේක්ෂා කරන සෑම තැනැත්තෙකු විසින්ම :

(අ) උකස් ලාභියාගේ හෝ උකස්ලාභියා මියගිය අයෙකු නම්, ඔහුගේ කිසියම් උරුමක්කරුවකුගේ නැතහොත් නීත්‍යානුකූල නියෝජිතයාගේ නම සහ ලිපිනය ;
(ආ) උකස්කරුගේ නම සහ ලිපිනය ; සහ
(ඇ) දේපළ පිළිබඳ විස්තරයක් හා දේපළ හඳුනා ගැනීම පිණිස අවශ්‍ය විය හැකි තොරතුරු, දැක්වෙන ප්‍රකාශයක් (මෙහි මින්මතු "සභාපතිවරයා" යනුවෙන් සඳහන් කරනු ලබන ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා වෙත ඉදිරිපත් කිරීම හෝ ඉදිරිපත් කිරීමට සැලැස්වීම හෝ කරනු ලැබිය යුතුය.

03. 2 වැනි අතුරු ව්‍යවස්ථාව යටතේ ප්‍රකාශයක් ලැබී, ප්‍රාදේශීය සභාව විසින් ඒ සඳහා නියම කරනු ලබන ලියාපදිංචි කිරීමේ ගාස්තුවක් ඉල්ලුම්කරු විසින් ගෙවනු ලැබූ විට, සභාපතිවරයා විසින් නම් සහ ලිපිනයන් ද අවශ්‍ය විස්තර ද ප්‍රාදේශීය සභා කාර්යාලයෙහි ඒ සඳහා තබා ඇති ලේඛනයක සටහන් කිරීමට සලස්වනු ලැබිය යුතුය.

04. මේ අතුරු ව්‍යවස්ථාවලට අනුකූලව, යම් උකසක් සහ නම සහ ලිපිනයන් ලියාපදිංචි කර ඇත්තේ යම් දේපළක් වෙනුවෙන් ද, ඒ දේපළ සම්බන්ධයෙන් ප්‍රාදේශීය සභාවට ලැබිය යුතු වරිපනම් බදු හෝ ගාස්තු කිසිවක් අය කිරීම, ක්‍රියාත්මක කිරීමෙහිලා යම් තහනමකට ගැනීමක දී එම දේපළ විකිණීම සඳහා දැන්වීම් පළ කිරීමට යටත් පිරිසෙයින් දින දහ හතරකට පෙර, තහනමට ගැනීම විකිණීම සඳහා නියම කරන ලද දිනය සහ තහනමට ගැනීම කරනු ලැබුවේ යම් මුදලක් අය කර ගැනීම සඳහාද? ඒ මුදල සඳහන් ලියවිල්ලකින් වූ දැන්වීමක් සභාපතිවරයා විසින් නම් සහ ලිපිනයන් ලියාපදිංචි කර ඇති තැනැත්තා වෙත හෝ තැනැත්තන් වෙත භාර දීම හෝ භාර දීමට සැලැස්වීම කරනු ලැබිය යුතුය.

05. විකිණීමට පෙර යම් අවස්ථාවක 4 වැනි අතුරු ව්‍යවස්ථාව යටතේ භාරදෙන ලද දැන්වීමෙහි සඳහන් මුදල ප්‍රාදේශීය සභාව වෙත ගෙවනු ලැබුවහොත්, එම දේපළ තහනමින් මුදා හරිනු ලැබේ.

06. මේ අතුරු ව්‍යවස්ථාවලින් කිසිවක් කඩ කරන යම් තැනැත්තෙක් වරදක් කරන අතර, නිසි අධිකරණයක් විසින් එසේ වරදකරු කරනු ලැබීමේ දී, ඔහු රුපියල් හත්සිය පනහකට වැඩි නොවන දඩයකට යටත් විය යුතුය.

*2. ප්‍රසිද්ධ පිට්ටනි පාවිච්චියට ගැනීම*

01. ප්‍රාදේශීය සභාවට අයත් වූ හෝ ප්‍රාදේශීය සභාව භාරයේ තිබෙන්නා වූ හෝ ප්‍රාදේශීය සභා ප්‍රදේශයක් තුළ පිහිටි, විවෘත භූමි භාග හෝ මහජනයාගේ විනෝදය සඳහා වූ ස්ථාන හෝ කිසිවක් (මෙහි මින්මතු "සභාපතිවරයා" යනුවෙන් සඳහන් කරනු ලබන) ප්‍රාදේශීය සභාවෙහි සභාපතිවරයාගේ ලියවිල්ලකින් වූ අවසරය නොමැතිව, සභාපතිවරයා විසින්, ප්‍රසිද්ධ දැන්වීමක් මගින් තහනම් කරනු ලැබූ යම් කාර්යයක් සඳහා පාවිච්චි කරනු නොලැබිය යුතුය.

02. (අ) එවැනි ස්ථානයක් ප්‍රයෝජනයට ගන්නා කිසිම තැනැත්තෙකු විසින් එහි බාධා ඇති කිරීම හෝ එය නීත්‍යානුකූලව ප්‍රයෝජනයට ගන්නා වෙනත් තැනැත්තන්ට අවහිර වන ආකාරයෙන් එහි හැසිරීම හෝ කරනු නොලැබිය යුතුය. එවැනි පිට්ටනි, ප්‍රාදේශීය සභාව විසින් නියම කරනු ලබන රීතිවලට අනුව, යහපත් හැසිරීමෙන් යුතුව පාවිච්චි කිරීමේ කොන්දේසිවලට යටත්ව, පෙරවරු 7 සිට පස්වරු 6 දක්වා කාලය තුළදී මහජනයාගේ ප්‍රයෝජනය සඳහා විවෘතව තබනු ලැබේ.

(ආ) වැවක්, පොකුණක් හෝ ජල මලක් තිබෙන යම් භූමි භාගයක් නැතහොත් ස්ථානයක් ප්‍රයෝජනයට ගන්නා කිසිම තැනැත්තකු එම වැවෙහි පොකුණෙහි හෝ ජල මලෙහි නෑම හෝ එහි ජලය අපවිත්‍ර වන ආකාරයකට වෙනත් යම් දෙයක් කිරීම හෝ නොකළ යුතුය.

(ඇ) එවැනි භූමි භාගයක් හෝ ස්ථානයක් ප්‍රයෝජනයට ගන්නා කිසිම තැනැත්තකු විසින් එහි කිසියම් කරදරයක් සිදු කිරීම හෝ එහි වැඩෙන පැළෑටි හෝ මල් සභාපතිවරයාගේ අවසරය නොමැතිව කඩා ගැනීම හෝ එහි වැඩෙන ගස්වලට සහ පඳුරුවලට කිසියම් හානියක් සිදු කිරීමට හෝ කරනු නොලැබිය යුතුය.

03. (අ) එවැනි භූමි භාගයක හෝ ස්ථානයක හෝ ප්‍රාදේශීය සභාව විසින් සපයන ලද ආසනයක් කිසිම තැනැත්තකු හිඳ ගැනීමේ කාර්යය නොවන කාර්යයක් සඳහා පාවිච්චි නොකළ යුතු අතර, කිසිම තැනැත්තකු එවැනි ආසන මත තම පා තැබීම හෝ එවැනි ආසනවලට හානි කිරීම හෝ ඒවා විනාශ කිරීම හෝ නොකළ යුතුය.

(ආ) කිසියම් ආසාදක නැතහොත් ස්පර්ශක රෝගයකින් පෙළෙන්නා වූ කිසිම තැනැත්තකු එවැනි යම් ආසනයක් පාවිච්චි නොකළ යුතුය.

04. කිසිම තැනැත්තකු විසින් යම් මුඩු බිමකින් හෝ පොදු ඉඩමකින් හෝ වැලි, පස්, ගල් හෝ වැඩෙන්නා වූ පැළෑටි හෝ ගස් කිසිවක් ඉවත් කරගෙන යාම හෝ එවැනි භූමියක මතු ස්වරූපය වෙනස් කිරීම හෝ විරූප කිරීම කරනු නොලැබිය යුතුය.

05. ඉහත සඳහන් අතුරු ව්‍යවස්ථාවලින් කිසිවක් කඩ කරන සෑම තැනැත්තකුම, වරදක් කරන අතර, අධිකරණය විසින් එසේ වරදක් කරනු ලැබීමේ දී රුපියල් හත්සිය පනහකට නොවැඩි දඩයකට ඔහු යටත් විය යුතුය.

*3. වාහන යනාදිය ධාවනය කරවීම*

ප්‍රාදේශීය සභා ප්‍රදේශය ඇතුළත වූ මාර්ගවල හෝ වීදිවල කිසියම් රිය මැදිරියක්, කරත්තයක්, ට්‍රයිෂෝවක්, අත් කරත්තයක්. විල්බැරෝවක්, බයිසිකලයක්, ට්‍රයිසිකලයක්, වෙලෝසිපිඩයක්, මෝටර් රථයක්, මෝටර් ලොරියක්, මෝටර් සයිකලයක් හෝ වෙනත් යම් වාහනයක් ධාවනය කරවන, ඇදගෙන යන, තල්ලුකරගෙන යන, පැදගෙන යන හෝ එවැනි වාහනයක් භාරව සිටින හෝ යම් අශ්වයකු නැතහොත්, වෙනත් යම් සතකු එළවාගෙන යන නැතහොත් එවැනි සතකු පිට නැගී යන හෝ සෑම තැනැත්තකුම වෙනත් වාහනයක් හෝ සතකු අභිබවා යන විටක හැර, මාර්ගයේ වම් පසින් හෝ පාරේ වමට ආසන්නයෙන් හෝ එසේ ගෙන යාම කළ යුතුය. එසේ අභිබවා යන විට, එම තැනැත්තා විසින් එකී වාහනයට හෝ සතාට දකුණු පසින් නැතහොත් ඉක්මවන පැත්තෙන් එය අභිබවා ගොස් පාරේ වමට හෝ වම්පස ආසනයට වහාම ආපසු පැමිණිය යුතුය.

02. ප්‍රාදේශීය සභා ප්‍රදේශය ඇතුලත යම් වීදියක හෝ මාර්ගයක කිසියම් කාල සීමාවක් සඳහා නතර කර තැබීම අවශ්‍ය වන ඉහත සඳහන් රීතියෙහි සඳහන් සෑම රිය මැදිරියක්, කරත්තයක්, ට්‍රයිෂෝවක් හෝ වෙනත් වාහනයක් සහ සෑම අශ්වයකුම හෝ වෙනත් සතකුම හැකිතාක් දුරට පාරේ අයිනටම ඇද හෝ නතර කර හෝ තිබිය යුතු අතර වාහනයක් සම්බන්ධයෙන් වූ විට, එහි යෂ්ටිය මාර්ගයට සමාන්තරව තිබිය යුතුය.එසේ වුවද රිය මැදිරි ට්‍රයිෂෝ හෝ වෙනත් වාහන නතර කර තැබීමේ ස්ථානයක් වශයෙන් ප්‍රාදේශීය සභාව විසින් නියම කරන ලද යම් ස්ථානයකට හෝ නැවතුම් පලකට මෙම රීතිය බල නොපැවැත්විය යුතුය.

03. දුනුවල ආධාරය නොමැති තදින් යුත් සෑම කරත්තයක් ම රියදුරු කරත්තය පැදවීමේ දී හැකිතාක් දුරට කරත්තය යන්නා වූ දිසාවේ මාර්ගයේ වම් පැත්තේ අයිනෙන් කරත්තය තබාගත යුතුය. පා ගමනේ වේගයට වැඩි වේගයකින් ඔහු තම ගවයා හෝ ගවයන් හෝ දක්කාගෙන යාම නොකළ යුතු අතර තමාගේ කරත්තය යන දිශාවටම යන්නා වූ කිසියම් සමාන කරත්තයක් නතර කර තිබේ නම් මිස එය අභිබවා යාම හෝ අභිබවා යාමට තැත් කිරීම ද නොකළ යුතුය. ඔහු තම කරත්තය මාර්ගයට සෘජුකෝණාශ්‍රව නතර නොකළ යුතුය.

04. සෑම මෝටර් බස් රථයකම, මෝටර් ලොරියකම හෝ මෝටර් රථයකම රියදුරු එය ධාවනය කිරීමේදී හැකිතාක් දුරට එම මෝටර් බස් රථය, මෝටර් ලොරිය හෝ මෝටර් රථය ගමන් ගන්නා වූ දිසාවේ මාර්ගයේ වම් පැත්තේ අයිනෙන් එම මෝටර් බසය, මෝටර් ලොරිය හෝ රථය තබාගත යුතුය. තමාගේ වාහනය යන දිසාවටම යන්නා වූ සමාන වාහනයක් නතර කර තිබේනම් හෝ එය පැයකට කිලෝමීටර් 10කට අඩු වේගයකින් ධාවනය වන්නේ නම් හෝ මිස, මෝටර් බසයක, මෝටර් ලොරියක හෝ මෝටර් රථයක කිසියම් රියදුරකු ඒ අනෙක් වාහනය අභිබවා යාම හෝ අභිබවා යාමට තැත් කිරීම හෝ නොකළ යුතුය.

05. කුලියට මගීන් ගෙන යාම සඳහා ධාවනය කරන මෝටර් බසයක රියදුරු මෝටර් බස් නතර කිරීමේ කාර්යය සඳහා ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා වෙන් කරනු ලැබ ඇති රැඳවුම් පොළක හෝ නැවතුම්පළක හැර, තම මෝටර් බසය නතර නොකළ යුතුය. එවැනි නැවතුම් පලක ඔහු තම මෝටර් බසය නතර කළහොත් එම නැවතුම්පළෙහි මගීන්ට ගොඩවීමට සහ බැස යාමට අවශ්‍ය වේලාවට වඩා දිගු වේලාවක් ඔහු එය නතර කර තබා නොගත යුතුය.

06. සෑම වාහනයකම රියදුරු පහත දැක්වෙන ක්‍රමවලට අනුකූලව වාහන ගමනාගමනය පාලනය කිරීම සඳහා යොදාගනු ලබන ඕනෑම ආලෝක සංඥාවකට අවනත විය යුතුය.

(1) මෙහි මින්මතු "නතර කිරීමේ රේඛාව" යනුවෙන් හඳුන්වනු ලබන සුදු රේඛාවක් මාර්ගයේ කිසියම් කොටසක් හරහා ඇඳ සෑම ආලෝක සංඥාවකටම අනුබද්ධව සපයා ඇත.

(2) සංඥාව මගින් පාලනය කිරීමට අදහස් කරන්නේ යම් දිසාවකට එන වාහන පේළියක් ද ඒ වාහන පේළියට මුහුණලා පහත දැක්වෙන ආලෝක හෝ සංඥා එකක් හෝ වැඩි ගණනක් සංඥා දීමේ කාර්යය සඳහා උපයෝගී කරගනු ලැබේ.

- (i) පහනේ කාචයෙහි ''නවතිනු'' යන වචනය සහිත රතු ආලෝකයක් ;
- (ii) කහ ආලෝකයක් ;
- (iii) පහනේ කාචයෙහි ''යනු '' යන වචනය සහිත කොළ පැහැති ආලෝකයක් ;
- (iv) ආලෝකමත් කළ කොළ පැහැති ඊතලයක් ;

(3) වර්ණ ආලෝක දැක්වෙන ඉහත සඳහන් පහන හෝ සංඥා සිරස් අතට තිබෙන අතර රතු ආලෝකය දැක්වෙන පහන ඉහළින්ම ද, කොළ පැහැති ආලෝක දැක්වෙන පහන පහතින්ම ද ඇත.

(4) වාහන ගමනා ගමනය පාලනය කිරීමේ කාර්යය සඳහා සංඥා ආලෝක දැක්වෙන අනුපිළිවෙල මෙසේය.

- (අ) රතු හෝ කොළ පැහැති ඊතලය සහ රතු පැහැය එක විට ;
- (ආ) කහ පැහැය සහ රතු පැහැය එක විට ;
- (ඇ) කොළ පැහැය ;
- (ඈ) කහ පැහැය

(5) ඉහත කී ආලෝක සංඥාවල වැදගත්කම පහත දැක්වෙන පරිදි වේ.-

(අ) රතු සංඥාවෙන් අදහස් වන්නේ, (ආ) ඡේදයෙහි විධිවිධාන සලසා ඇති පරිදි හැර කොළ පැහැති ආලෝකය දැක්වෙන තුරු නතර කිරීමේ රේඛාවෙන් ඔබ්බට කිසිදු වාහන ගමනා ගමනයක් සිදු නොවිය යුතු බවයි.

*4. වීදිවල දේශන පැවැත්වීම*

1. ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයාගෙන් ලබාගත් අවසර පත්‍රයක් ප්‍රකාර සහ ඒ අවසර පත්‍රයෙහි නිශ්චිත කාලවේලාවල් සහ සීමා කිරීම් ඇතුළත මිස, කිසිම තැනැත්තකු විසින් ප්‍රාදේශීය සභාවේ සීමා ඇතුළත යම් රැස්ව සිටින පිරිසකට හෝ සමූහයකට හෝ දේශන කිරීම හෝ කථා පැවැත්වීම හෝ යම් රැස්වීමක් හෝ කරනු නොලැබිය යුතුය.

2. මේ අතුරු ව්‍යවස්ථාව කඩ කරන යම් තැනැත්තෙක් වරදක් කරන අතර, යම්කිසි අධිකරණ බලය ඇති අධිකරණයකදී එසේ වරදකරු කරනු ලැබූවිට, රුපියල් හත්සිය පනහකට නොවැඩි දඩයකට ඔහු යටත් විය යුතුය.

*5. අවහිර කිරීම සහ අයුතු ඇදා ගැනීම*

1. ප්‍රාදේශීය සභා සීමා තුළ පිහිටි යම් ගොඩනැගිල්ලක්, වීදියක් හෝ යම් මුඩු ඉඩමක් හෝ වෙනත් භූමියක් හෝ ස්ථානයක් නැතහොත් යම් වීදි රේඛාවක් නිසි අවසරය නොලබා වෙනස් කර ඇති බව (මෙහි මින්මතු ''සභාපතිවරයා'' යනුවෙන් හඳුන්වනු ලබන) ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයාට පෙනී යන අවස්ථාවක එම ගොඩනැගිල්ල හෝ කොටු කිරීම ඉදි කර තිබෙන හෝ අවහිරය හෝ අයුතු ඇදා ගැනීම සිදු කර තිබෙන ඉඩමෙහි හෝ වීදි රේඛාවේ වෙනස් කිරීම සිදු කර ඇත්තේ යම් ඉඩමක් තුළින් හෝ මත්තෙහි ද ඒ ඉඩමෙහි හෝ ස්ථානයෙහි අයිතිකරු යයි කියා සිටින්නාට හෝ හිමිකම් පාන්නාට එම තැනැත්තාගේ හිමිකම් පෑමට පදනම් වන සෑම ඔප්පුවක්ම, ලේඛනයක්ම සහ සාධක පත්‍රයක්ම ද එම ස්ථානයේ යම් පිඹුරක් වේ නම්, ඒ පිඹුර ද ඉදිරිපත් කරන ලෙස, එම සභාපතිවරයා විසින් ලියවිල්ලක් මගින් ඉල්ලා සිටිනු ලැබීම නීත්‍යානුකූල වන්නේය. එම ඉඩමෙහි හෝ ස්ථානයෙහි පදිංචිකරු එහි අයිතිකරු නොවේ නම්, එහි අයිතිකරුගේ නම සහ වාසය කරන ස්ථානය පිළිබඳව සම්පූර්ණ තොරතුරු සපයන ලෙස සභාපතිවරයා විසින් ඉල්ලීමක් කර දින දහයක් ඇතුළත දී ඒ පිළිබඳ සම්පූර්ණ විස්තර සැපයීමට ඒ පදිංචිකරු බැඳී සිටින්නේය. එසේ අයිතිකරු යයි කියනු ලබන තැනැත්තා විසින්, එකී ඉඩම හෝ ස්ථානය සම්බන්ධයෙන් තම හිමිකම් පෑමට පදනම වන සෑම

ඔප්පුවක්ම, ලේඛනයක් ම සහ සාධක පත්‍රයක්ම, එකී ඉඩමේ හෝ ස්ථානයේ පිඹුරක් ඇත්නම් එයද, සමග ඉදිරිපත් කරන ලෙස, සභාපතිවරයා විසින් ඉල්ලා සිටිනු ලැබීමෙන් ඉක්බිති දින දහයක් ඇතුළත දී ඒවා තමන් සන්තකයෙහි තිබේ නම් ඉදිරිපත් කරනු ලැබිය යුතුය. එවැනි ඔප්පුවක්, ලේඛනයක්, සාධන පත්‍රයක් හෝ පිඹුරක් තම සන්තකයෙහි නොතිබේ නම්, ඒවා කවුරුන් සන්තකයෙහි තිබෙන්නේද යන්න ඉහත සඳහන් දින දහයේ කාල සීමාව ඇතුළත, සභාපතිවරයා වෙත ඔහු දන්වා සිටිය යුතුය. එවැනි යම් ඔප්පුවක් ලේඛනයක් සාධන පත්‍රයක් හෝ පිඹුරක් සන්තකව සිටින සෑම තැනැත්තකුම, ඒවා ඉදිරිපත් කරන ලෙසට සභාපතිවරයා විසින් ලියවිල්ලකින් ඉල්ලා සිටිනු ලැබීමෙන් පසු දින දහයක් ඇතුළත දී ඒවා ඉදිරිපත් කිරීමට බැඳී සිටින්නේ ය.

02. ඉහතින්ම වන වගන්තියෙහි සඳහන් ඔප්පු, ලේඛන, සාධන පත්‍ර සහ පිඹුරු ඒවා අදාළ වන ස්ථානයේ දී හෝ සභාපතිවරයා විසින් නියමකරනු ලබන වෙනත් ස්ථානයක දී හෝ ඉදිරිපත්කරනු ලැබිය යුතුය. ඒවා ඉදිරිපත් කරන ලෙස ඉල්ලා සිටීමට ඉහතින්ම වගන්තියෙන් දී ඇති බලයට, අවශ්‍ය වන පරිදි එම ඔප්පු, ලේඛන, සාධන පත්‍ර සහ පිඹුරු පරීක්ෂා කිරීමේ සහ ඒවායේ පිටපත් ගැනීමේ බලය ද ඇතුළත් වන ලෙස සැලකිය යුතුය. සභාපතිවරයා විසින් එම ඔප්පු, ලේඛන, සාධන පත්‍ර සහ පිඹුරු පරීක්ෂා කරනු ලැබීමට සහ ඒවායේ පිටපත් ගනු ලැබීමට අදාළ සෑම තැනැත්තකුම ඉඩ දිය යුතු අතර එම කාර්යය සඳහා පිටපත් ගැනීම පිණිස අවශ්‍ය වන කාලසීමාවකට , එම ඔප්පු, ලේඛන, සාධන පත්‍ර සහ පිඹුරු සභාපතිවරයා විසින් රඳවාගනු ලැබිය හැකිය.

03. යම් ගොඩනැගිල්ලක් හෝ කොටු කිරීමක් ඉදිකර ඇත්තේ හෝ අයුතු ඈඳාගැනීමක් හෝ 1 වැනි අතුරු ව්‍යවස්ථාවෙහි සඳහන් ආකාරයේ වීදි රේඛාවේ වෙනසක් හෝ සිදුකර ඇත්තේ හෝ යම් ඉඩමක්, ස්ථානයක් හෝ පරිශ්‍රයක් මතද ඒ ඉඩමට, ස්ථානයට සහ පරිශ්‍රයට සහ පරීක්ෂා කිරීම හෝ මැනීම අවශ්‍ය යයි සභාපතිවරයා සිතන වෙනත් යම් ඉඩමකට සහ පරිශ්‍රයකට, එහි පදිංචි කරු වෙත සාධාරණ දැනුම් දීමක් කිරීමෙන් පසුව සභාපතිවරයා හෝ ඔහු විසින් ලියවිල්ලකින් බලය පවරනු ලැබූ වෙනත් තැනැත්තකු ඇතුළු වීමද, එම ගොඩනැගිල්ල කොටු කිරීම, අවහිරය, නැතහොත් අයුතු ඈඳාගැනීම සභාව සතුව පවතින නැතහොත් සභාව භාරයේ තිබෙන යම් වීදියකින් හෝ ඉඩමකින් හෝ ස්ථානයකින් කළ අයුතු ඈඳා ගැනීමක් ද එසේ නැත්නම් වීදි රේඛාව ඇත්ත වශයෙන් ම වෙනස් කර තිබේද යන්න සභාපතිවරයාට නිශ්චය කරගත හැකි වීම සඳහා අවශ්‍ය පරීක්ෂක සහ මැනුම්, ඒ සියළු ඉඩම්, ස්ථාන හෝ පරිශ්‍ර සම්බන්ධයෙන් කිරීම ද නීත්‍යානුකූල වන්නේ ය.

04. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ වූ යම් නඩු කටයුත්තක දී සභාපතිවරයාගේ බලය පිට සාදන ලද කිසියම් පිඹුරක් හෝ මැනුමක් සාක්ෂියේ දී ඉදිරිපත් කරනු ලැබුවහොත්, එහි සඳහන් කරුණු සම්බන්ධයෙන් පටහැනි තත්ත්වයක් පිළිබඳව සතුටුදායක සාක්ෂි සාධනය කරනු ලැබුවහොත් මිස තීරණාත්මක සාක්ෂි විය යුතුය.

05. ඉහත කී ගොඩනැගිල්ල කොටු කිරීම හෝ අවහිරය, සභාව සතු වී පවතින නැතහොත් සභාව භාරයේ තිබෙන යම් වීදියකට අයත් ඈඳා ගැනීමක් ලෙස හෝ නිසි අවහිරය නොමැතිව වීදි රේඛාව වෙනස් කර ඇති බව හෝ එවැනි මැනීමකින් හෝ පරීක්ෂණයකින් පසුව සභාපතිවරයාට පෙනී ගියහොත් එම ගොඩනැගිල්ල හෝ කොටු කිරීම ඉදිකර ඇත්තා වූ හෝ අවහිරය හෝ අයුතු ඈඳා ගැනීම හෝ වෙනස් කිරීම සිදු කර ඇත්තා වූ හෝ ඉඩමෙහි හෝ පරිශ්‍රයෙහි අයිතිකරු නැතහොත් පදිංචිකරු යයි කියනු ලබන තැනැත්තා වෙත සභාපතිවරයා විසින් ලියවිල්ලකින් වූ දැන්වීමක් කරනු ලැබීමෙන් සභාපතිවරයාගේ බලය පිට එම පරිශ්‍රයෙහි හෝ ස්ථානයෙහි මැනීමක් කර ඇති බවත්, එම දැන්වීමෙහි සඳහන් ස්ථානයකදී අයිතිකරු නැතහොත් පදිංචිකරු යයි කියනු ලබන තැනැත්තාට, එය පරීක්ෂා කිරීම සඳහා විවෘතව ඇති බවත්, නැතහොත් සභාවේ නිලධාරියකු මගින් කිසියම් නියම කරගත් වේලාවකදී එම අයුතු ඈඳා ගැනීම හෝ වෙනස් කිරීම ඔහු වෙත පෙන්වා දීමට සැලැස්වීමට සභාපතිවරයා සූදානම් බවත් එම ඉඩමට හෝ පරිශ්‍රයට ඇති තම අයිතිය තහවුරු කිරීම සඳහා සහ එවැනි යම් ගොඩනැගිල්ලක් කොටු කිරීමක්, අවහිරයක් හෝ අයුතු ඈඳා ගැනීමක් ඉවත් කිරීම හෝ නීති විරෝධි ලෙස වෙනස් කර ඇති පූර්ව වීදි රේඛාව පුනස්ථාපනය කිරීම හෝ වැළැක්වීම සඳහා එම දැන්වීම භාර දී මාසයක් ඇතුලත එම තැනැත්තා විසින් හෝ ඔහු එය දරන්නේ හෝ එයට හිමිකම්පාන්නේ යම් තැනැත්තකු යටතේද, ඒ තැනැත්තා විසින් හෝ නීති කටයුතු කරනු ලැබුවහොත් මිස ඒවා ඉවත් කිරීමට හෝ එය ප්‍රතිස්ථාපනය කිරීමට හෝ එකී සභාපතිවරයා කටයුතු කරගෙන යන බවත්, දන්වා සිටිය යුතුය. නියම කරන ලද කාලය තුළ එසේ නීති කටයුතු කරනු නොලැබුවහොත් හා හිමිකම් ඔප්පු කරනු නොලැබුවහොත් හෝ නීති කටයුතු කරනු ලැබුව ද නිසි ලෙස මෙහෙයවනු නොලැබුවහොත් එම අයිතිකරු යැයි හෝ පදිංචිකරු යැයි කියනු ලබන තැනැත්තා වෙත සභාපතිවරයා විසින් ලියවිල්ලකින් වූ දැන්වීමක් කිරීමෙන් එම දැන්වීමෙහි සඳහන් කාලය තුළදී එම ගොඩනැගිල්ල, කොටු කිරීම අවහිරය හෝ අයුතු ඈඳා ගැනීම ඉවත් කරන ලෙස හෝ නීති විරෝධී ලෙස වෙනස් කර ඇති පූර්ව වීදි රේඛාව පූර්ණස්ථාපනය කරන ලෙස හෝ නියම කරනු ලැබිය හැකිය. සඳහන් කර ඇති කාලය ඇතුලත එම අයිතිකරු යැයි හෝ පදිංචිකරු යැයි හෝ කියනු ලබන තැනැත්තා විසින් එම නියමය අනුව කටයුතු කිරීම පැහැර හැරියහොත් ඔහු වරදක් කරන අතර, සභාපතිවරයා විසින් එම ගොඩනැගිල්ල කොටු කිරීම, අවහිරය නැතහොත් අයුතු ඈඳා ගැනීම ඉවත් කිරීමට සැලැස්විය යුතුය. නැතහොත් වෙනස් කරන ලද වීදි රේඛාව කලින් පැවති වීදි රේඛාව වන පරිදි පුනස්ථාපනය කළ යුතුය. තවද එවැනි වෙනස් කිරීමක් හෝ පුනස්ථාපනය කිරීමක් ක්‍රියාත්මක කිරීම සඳහා සභාපතිවරයා හෝ සභාපතිවරයා විසින් ලියවිල්ලකින් බලය පවරනු ලැබූ යම් නිලධාරියකු යම් නිවසකට ගොඩනැගිල්ලකට, ගෙවත්තකට, කොටු කිරීමකට හෝ වෙනත් පරිශ්‍රයකට ඇතුළු වීමද අවශ්‍ය තැනැත්තන් සහ උපකරණ සහ දේවල් සමග ඒවා තුළට ඇතුළු වීමට සැලැස්වීමද, නීත්‍යානුකූල වන්නේය. ඒ වෙනුවෙන් දරන ලද වියදම් එම ගොඩනැගිල්ල අවහිරය අයුතු ඈඳා ගැනීම හෝ වීදි රේඛාව වෙනස් කිරීම ඉදි කරන ලද්දේ නැතහොත් සිදු කරන ලද්දේ යම් ඉඩමක හෝ පරිශ්‍රයක ද එම ඉඩමෙහි හෝ පරිශ්‍රයෙහි අයිතිකරු ලෙසට හිමිකම් පාන්නා විසින් ගෙවනු ලැබිය යුතු අතර ඒවා මේ පනත යටතේ ප්‍රාදේශීය සභාව විසින් අය කරනු ලැබිය හැකි ලෙස නියමිත වියදම් ලෙස නිශ්චය කොට තීරණය කර අයකර ගනු ලැබිය යුතුය.

06. මේ අතුරු ව්‍යවස්ථාවලින් කිසිවක් කඩ කිරීම සම්බන්ධයෙන් රුපියල් හත්සිය පනහකට වැඩි නොවන දඩයක් පැනවීමෙන් දඬුවම් කරනු ලැබිය යුතු අතර කඩ කිරීම දිගටම කරගෙන යන විටක. අධිකරණයක් විසින් වරදකරු කරනු ලැබීමෙන් පසුව හෝ කඩ කිරීම පිළිබඳව අවධානය යොමු කරවමින් සභාපතිවරයා විසින් හෝ ප්‍රාදේශීය සභාව විසින් බලය පවරන ලද යම් නිලධාරියකු විසින් හෝ ලියවිල්ලකින් වූ දැන්වීමක් භාරදෙනු ලැබීමෙන් පසුව කඩ කිරීම දිගටම කරගෙන යන සෑම දිනයක් සඳහාම රුපියල් දෙසිය පනහක් නොඉක්මවන අතිරේක දඩයකින් ද දඬුවම් ලැබිය යුතුය.

***06. වාහන නතර කර තැබීම***

01. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස මේ අතුරු ව්‍යවස්ථාවල ;

"රියදුරු" යන්නෙන් එකලා පෙඩල් සයිකලයක් හෝ ට්‍රයිසිකලයක් සම්බන්ධයෙන් වන විට, එය පදවන්නා ද, අත් කරත්තයක් හෝ තල්ලු කරන කරත්තයක් සම්බන්ධයෙන් වන විට, එම කරත්තය ඇදගෙන යන හෝ තල්ලු කරගෙන යන හෝ තැනැත්තා ද, ට්‍රයිෂෝවක් සම්බන්ධයෙන් වන විට එය පදවාගෙන යන තැනැත්තා ද අදහස් වේ.

"නතර කර තැබීම"යන්නෙන්, වාහනය අචල තත්ත්වයකට ගෙන ඒම හෝ පුද්ගලයන් සහ බඩු වහාම නංවා ගැනීමේ හෝ බිමට බැස්සවීමේ කාර්යය නොවන වෙනත් කාර්යයක් සඳහා නතර කර තැබීමට සැලැස්වීම හෝ අදහස් වේ.

"වාහනය"යන්නෙන්, යන්ත්‍රානුසාරයෙන් හෝ වෙනත් ආකාරයකින් හෝ පදවනු ලබන්නා වූ ද, ගොඩබිමෙහි ප්‍රවාහන මාධ්‍යයක් ලෙස උපයෝගි කරගනු ලබන්නා වූ නැතහොත් උපයෝගි කර ගැනීමට හැකි වු ද, යම් කෘත්‍රිම උපක්‍රමයක් අදහස් වන නමුත්, 1951 අංක 14 දරන මෝටර් රථ ප්‍රවාහන පනතේ අර්ථ නිරූපනය කර ඇති පරිදි වූ මෝටර් රථයක් මීට ඇතුළත් නොවේ.

02. වාහන නතර කර තැබීම හෝ නතර කිරීම් තහනම් කරන, සීමා කරන නැතහොත් පාලනය කරන, එසේ නැතහොත් නාගරික ප්‍රදේශය ඇතුළත යම් වීදියක හෝ වීදියක කොටසක වාහන සඳහා වෙන්කර ඇති යම් වාහන නතර කිරීමේ ස්ථානයක් සඳහන් කරන දැන්වීමක් ප්‍රකටව පෙනී යන ආකාරයක හෝ ඒ වීදියේ සිට නැතහොත් වීදියේ කොටසෙහි සිට පෙනී යන ආකාරයකට හෝ (මෙහි මින් මතු "සභාපතිවරයා" යනුවෙන් සඳහන් කරනු ලබන) ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා විසින් හෝ සභාපතිවරයාගේ අණ පරිදි හෝ ප්‍රදර්ශනය කරනු ලැබිය හැකිය.

03. 2 වැනි අතුරු ව්‍යවස්ථාව යටතේ ප්‍රදර්ශනය කර ඇති දැන්වීමක් මගින්, යම් වීදියක හෝ වීදියක කොටසක වාහන නතර කිරීම හෝ නතර කර තැබීම හෝ තහනම් කරනු ලබන ඇති අවස්ථාවක -

(අ) යම් නිලධාරියකු විසින් හෝ බලධාරියකු විසින්, ඒ වීදියෙහි හෝ එහි කොටසක ඉදිකරන ලද යම් වාහන ගමනාගමන සංඥාවකට හෝ දැන්වීමකට අවනත වීමේ; හෝ

(ආ) එම වීදියෙහි හෝ එහි කොටසෙහි ඒ අවස්ථාවේ පවතින යම් වාහන ගමනාගමන ක්‍රමයට නිසි පිළිවෙල අනුගමනය කිරීමේ; හෝ

(ඇ) එම වාහනයකට බඩු පැටවීමේ හෝ එම වාහනයෙන් බඩු බෑමේ කාර්යය සඳහා අවශ්‍ය කාල සීමාව සඳහා හැර, වාහනය ඒ වීදියෙහි හෝ වීදියේ කොටසෙහි හෝ නවතා තැබීමට සැලැස්වීම වාහනයේ රියදුරු විසින් කරනු නොලැබිය යුතුය.

04. යම් වීදියක හෝ වීදියක කොටසක වාහන නතර කිරීම හෝ නතර කර තැබීම 2 වැනි අතුරු ව්‍යවස්ථාව යටතේ ප්‍රදර්ශනය කරන ලද යම් දැන්වීමක් මගින් තහනම් කර සීමා කර හෝ නොමැති අවස්ථාවක ඒ වීදියෙහි හෝ වීදියේ කොටසෙහි වාහන ගමනා ගමනය පාලනය කිරීමේ කාර්යය සඳහා පොලිස් නිලධාරියෙකු විසින් වාචික විධාන හෝ සංඥා දෙනු ලැබිය හැකිය. පොලිස් නිලධාරියා විසින් සඳහන් කරන ලද ආකාරයට හෝ සඳහන් කරන ලද කාලසීමාව සඳහා හෝ හැර අන් ආකාරයකට ඒ වීදියෙහි හෝ එහි කොටසෙහි වාහනය රඳවා තබා ගැනීමට සැලැස්වීම, වාහනයක රියදුරු විසින් කරනු නොලැබිය යුතුය.

05. මේ අතුරු ව්‍යවස්ථාවලින් කිසිවක් කඩ කරන යම් තැනැත්තෙක් වරදක් කරන අතර එසේ වරදකරු කරනු ලැබීමේදී රුපියල් පනහකට නොවැඩි දඩයකට, ඔහු යටත් විය යුතුය.

*7. වැඩ කටයුතු කරගෙන යාම*

01. (මෙහි මින් මතු ''සභාපතිවරයා'' යනුවෙන් හඳුන්වනු ලබන) ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා විසින්, ලියවිල්ලකින් බලය පවරනු ලැබූ යම් තැනැත්තකු නැතහොත් තැනැත්තන් විසින් සියලු සාධාරණ වේලාවල දී සියලුම අවශ්‍ය සහ නිසි සේවකයන්, කම්කරුවන්, වැඩකරුවන්, රිය මැදිරි, සතුන් සහ වෙනත් දේ සමඟ ප්‍රාදේශීය සභා ප්‍රදේශයේ සීමා ඇතුලත පවත්නා වූ හෝ ඇති කිරීමට අදහස් කරන්නා වූ හෝ වීදියක යාබද හෝ ආසන්න ඉඩමකට ඇතුළුවීමද එවැනි යම් වීදියක් අනුරේඛණය කිරීමේ, මැනීමේ, සෑදීමේ, කිරීමේ, විවෘත කිරීමේ, වෙනස් කිරීමේ, හැරවීමේ අළුත්වැඩියා කිරීමේ, එළි කිරීමේ, වැඩි දියුණු කිරීමේ හෝ වැට ගැසීමේ කාර්ය සඳහා හෝ ඒ මත ඇති යම් පාලමක්, වැටක්, කාණුවක්, වේල්ලක්, අගලක්, නලයක්, කේබලයක් හෝ වෙනත් උපකරණයක් ගොඩනැගීම, තැනීම, අළුත්වැඩියා කිරීම, එළි කිරීම, සෑදීම හෝ වැඩි දියුණු කිරීම සඳහා හෝ 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ විධිවිධාන යටතේ යම් ක්‍රියාවක්, කාරණයක් හෝ දෙයක් ඉටු කිරීම සඳහා හෝ අවශ්‍ය සියලු ක්‍රියා කරුණු සහ දේවල් එක්ව කිරීම සහ ඉටු කිරීමද නීත්‍යානුකුල වන්නේය.

02. තව ද ඉහත කී පරිදි බලය පවරන ලද තැනැත්තා හෝ තැනැත්තන් විසින් තමා විසින් හෝ තමා යටතේ සේවයේ නියුක්ත කර ගන්නා සේවකයන් වැඩ කරුවන් සහ කම්කරුවන් ද සමග සියලු සාධාරණ වේලාවලදී සියලුම අවශ්‍ය සහ නිසි රිය මැදිරි, සතුන් සහ වෙනත් දේ සමග පවත්නා වූ හෝ ඇති කිරීමට අදහස් කර ඇත්තා වූ වීදියක්, අනුරේඛණය කිරීමේ, මැනීම්, සෑදීමේ, කිරීමේ, විවෘත කිරීමේ, හැරවීමේ අළුත්වැඩියා කිරීමේ, එළි කිරීමේ, වැඩි දියුණු කිරීමේ හෝ වැට ගැසීමේ හෝ අනුරේඛණය කිරීමට, මැනීමට, සෑදීමට, කිරීමට, විවෘත කිරීමට, වෙනස් කිරීමට හැරවීමට, අළුත්වැඩියා කිරීමට, එළිකිරීමට, වැඩිදියුණු කිරීමට, හෝ වැට ගැසීමට වෙනත් ආකාරයකින් සහායවීමේ කාර්යය සඳහා හෝ ඒ මත ඇති යම් පාලමක්, වැවක්, කාණුවක්, වේල්ලක්, අගලක්, නලයක්, කේබලයක් හෝ වෙනත් උපකරණයක් ගොඩනැගීම, කැණීම, අළුත්වැඩියා කිරීම, එළි කිරීම, සෑදීම හෝ වැඩිදියුණු කිරීම සඳහා හෝ එවැනි යම් මහා මාර්ගයක හෝ ඒ අසල යම් නල හෝ කම්බි මාර්ගවල නැතහොත් ගොඩනැගිලිවල අවශ්‍ය කිනම් හෝ අළුත්වැඩියා කිරීම සඳහා හෝ එවැනි වීදියකට සම්බන්ධ යම් වැඩකට සේවයේ නියුක්ත කරගෙන ඇති ප්‍රාදේශීය සභාවේ යම් නිලධාරියකුගේ හෝ ඔහුගේ සේවයෙහි යොදාගනු ලැබ ඇති යම් වැඩකරුවන්ගේ රිය මැදිරිවල තැනැත්තන්ගේ හෝ දේපළ ප්‍රායෝජනය සඳහා එවැනි යම් වීදියකට යාබද හෝ ආසන්න යම් ඉඩමක සහ ඉඩමකින් ජලය, දැව අතු රිකිලි, ගල්, බොරළු, මැටි හෝ වෙනත් යම් ද්‍රව්‍ය සෙවීම, හෑරීම, කැපීම, ගැනීම සහ ඉවතට ගෙන යාමද ඒවා වෙනත් යම් තැනැත්තකුගේ භූමිය ඔස්සේ අයකු ඇතුළුවන්නකු ලෙස සළකනු නොලැබ ඉවතට ගෙන යාමද නීත්‍යානුකුල වන්නේය. එසේ වුව ද ප්‍රමාණවත් ද්‍රව්‍ය අසල මුඩු ඉඩම්වලින් හෝ පොදු හෝ අත්හැර දමන ලද ඉඩම්වලින් හෝ පහසුවෙන් ලබා ගත හැකි නම් ඉහත සඳහන් බලයලත් තැනැත්තා හෝ තැනැත්තන් විසින් එම ද්‍රව්‍ය, එම පහසුවෙන් ලබාගත හැකි තැනින් ලබාගත යුතු අතර, එසේ ලබා ගත නොහැකි නම් මිස යම් අංගනයකින් නිවසකට යන මාවතකින් හෝ තණ පිටියකින් හෝ කොටු කරන ලද ගෙවත්තකින්, වැවිල්ලකින්, කුඹුරකින් හෝ වනපෙතකින් එහි අයිතිකරුගේ අවසරය නොමැතිව එම ද්‍රව්‍ය සඳහා හෑරීම හෝ කැපීම හෝ එම ද්‍රව්‍ය ඉන් ඉවතට ගෙන යාම් කරනු

නොලැබිය යුතු ය. තව ද එසේ ගන්නා ලද සියලු ද්‍රව්‍ය සඳහා ද ඒවා ලබා ගැනීමෙන් සහ ගෙන යාමෙන් සිදුවූ අලාභ සඳහා ද ඒවායේ අයිතිකරුට සාධාරණ වන්දි ගෙවනු ලැබිය යුතු ය. තව ද එම ද්‍රව්‍ය ලබා ගන්නේ යම් ආකාරයකින් හෝ යළකින් ද එය යම් තැනැත්තෙකුට හෝ සතෙකුට අනතුරුදායක නොවන පරිදි එම තැනැත්තා හෝ තැනැත්තන් විසින් ඒවා කොටු කිරීම හෝ ආරක්ෂා වැටකින් වෙන් කිරීම හෝ කරනු ලැබිය යුතු ය.

03. පවත්නා හෝ ඇති කිරීමට අදහස් කරන හෝ වීදියක්, අනුරේඛණය කිරීමේ දී, මැනීමේ දී, සෑදීමේ දී, කිරීමේ දී, විවෘත කිරීමේ දී, වෙනස් කිරීමේ දී, හැරවීමේදී, අළුත්වැඩියා කිරීමේ දී හෝ ඒ මත වූ යම් පාලමක්. වැටක්, කාණුවක්, වේල්ලක්, අගලක්, නලයක්, කේබලයක් හෝ කිසියම් ආකාරයකින් ඊට සම්බන්ධ වූ වෙනත් උපකරණයක් ගොඩනැගීමේ දී, කැනීමේ දී, අළුත්වැඩියා කිරීමේ දී ඉහත සඳහන් පරිදි බලය පවරනු ලැබූ තැනැත්තකු හෝ තැනැත්තන් විසින් එවැනි යම් වැඩ කරන ස්ථානයකින් ඉවත් කිරීමට අවශ්‍ය පස්, කසළ හෝ ද්‍රව්‍ය ඊට යාබද හෝ ආසන්න යම් ඉඩමකට විසි කිරීම නීත්‍යානුකූල වන්නේ ය. එසේ වුව ද එම පස් කසල සහ ද්‍රව්‍ය සාධාරණ කාලයක් ඇතුළත ඉවත් කල යුතු ය.

04. පවත්නා හෝ ඇති කිරීමට අදහස් කරන යම් වීදියක කිසියම් වැඩක් කරගෙන යාමේ දී ඊට කිසියම් ආකාරයකින් සම්බන්ධ කාර්යයක දී ඉහත සඳහන් පරිදි බලය පවරනු ලැබූ තැනැත්තකු හෝ තැනැත්තන් විසින්, ඊට යාබද හෝ ආසන්න භූමි තුලින් පාරක් තනනු ලැබීම නිත්‍යානුකූල වන්නේ ය. එසේ වුව ද එවැනි පාරක්, යම් ගොඩනැගිලක් පිහිටි තිබෙන කිසියම් භූමියක් මතින් හෝ කොටු කරන ලද ගෙවත්තක් හෝ අංගනයක් මතින් සාදනු නොලැබිය යුතු ය.

05. ඉහත සඳහන් පරිදි බලය පවරන ලද තැනැත්තා හෝ තැනැත්තන් විසින් ප්‍රාදේශීය සභා ප්‍රදේශයේ යම් වීදියක වැඩෙන හෝ වීදියක ඉහළින් තිබෙන සියලු ගස්, පඳුරු, හෝ ලඳු කලෑ සහ ගස්වල සියලු කොළ හෝ අතු මුල් කපා ඉවත්කර, ඊට යාබද හෝ ආසන්න යම් භූමියක තැබීම හෝ යම් අවහිරයක් ඇති කිරීම සහ එම කාර්යය සඳහා එම ගස් පඳුරු, ලඳු කැලෑ කොළඅතු හෝ මුල් කැපීමට, පෑගීමට හෝ ඉවත් කරගෙන යාමට අවශ්‍ය තැනැත්තන් සතුන් සහ උපකරණ සමග යම් ඉඩමකට හෝ පරිශ්‍රයකට ඇතුලු වීම ද නීත්‍යානුකූල වන්නේ ය.

06.ඉහත සඳහන් පරිදි බලය පවරනු ලැබූ යම් තැනැත්තකුට හෝ තැනැත්තන්ට එසේ කිරීම අවශ්‍ය යයි පෙනී යන කවර අවස්ථාවක දී වුවද යම් වීදියක, පැත්තක්, වැටවල් , බඩවැටි, අගල්, කානු හෝ වේලි ඔහු හෝ ඔවුන් විසින් ඉදි කරනු ලැබීම හෝ සාදනු ලැබීම නීත්‍යානුකූල වන අතර එවැනි වැටවලට බඩවැටිවල, අගල්වලට කාණුවලට හෝ වේලිවලට යාබද ඉඩම්වල අයිතිකරුවන් හෝ පදිංචිකරුවන් හෝ විසින්, ඒවා හොඳින් අලුත්වැඩියා කළ තත්ත්වයෙන් මනාව තබාගත යුතු යැයි මෙයින් නියම කරනු ලැබේ.

07. යම් වීදියකට හෝ පාරකට හෝ ඇලකට හෝ ඇති කිරීමට අදහස් කරන වීදියකට හෝ පාරකට හෝ ඇලකට යාබද හෝ ආසන්නයේ පවතින යම් ඉඩම් හා භූමි තුලින්, යම් වීදියක් හෝ පාරක් හෝ ඇලක් ආරක්ෂා කිරීම, සංරක්ෂණය කිරීම, වැඩිදියුණු කිරීම, අළුත්වැඩියා කිරීම හෝ ඉදිකිරීම සඳහා අවශ්‍ය යයි සභාපතිවරයා ලියවිල්ලකින් බලය පවරන ලද තැනැත්තා හෝ තැනැත්තන් අදහස් කරන සියලු අගල්, පීලි සහ කාණු හෝ ජල මාර්ග ඒ තැනැත්තා හෝ තැනැත්තන් විසින් සෑදීම, සෝදා හැරීම, පිරිසිදු කිරීම සහ විවෘතව තැබීම ද බැහැර මාර්ග බිංගෙවල් පලක හෝ පාලම් සෑදීම සහ සවි කිරීම ද නීත්‍යානුකූල වන්නේ ය.

08. ඉහත සඳහන් පරිදි බලය පවරනු ලැබූ තැනැත්තකු හෝ තැනැත්තන් විසින් යම් ගල් හෝ බොරළු ගොඩක් හෝ කොටසක් හෝ දැවයක් හෝ වෙනත් යම් ද්‍රව්‍යයක් හෝ කිනම් හෝ දෙයක් යම් වීදියක් හෝ පාරක් මත තැබීම ද අළුත්වැඩියාවල් කිරීම පහසු කිරීම සඳහා හෝ අළුත්වැඩියා කළ වීදියට හෝ මාර්ගයට හානි සිදු වීම වැළැක්වීම සඳහා හෝ අවශ්‍ය පරිදි එම වීදිය හෝ පාර අළුත්වැඩියා කරනු ලබන කාල සීමාව තුළදී ද අළුත්වැඩියා කිරීම ආරම්භ කිරීමට පෙරාතුව යම් කාලයක් තුළ ද අළුත්වැඩියා කිරීම් සම්පූර්ණ කිරීමෙන් පසුව ද, ඒවා එහි තිබෙන්නට ඉඩ හැරීම ද, නීත්‍යානුකූල වන්නේ ය. එසේ වුව ද මාර්ගය ඔස්සේ යන තැනැත්තන්ට අනතුරු හෝ තුවාල සිදුවීම වැළැක්වීම පිණිස, ඔහු හෝ ඔවුන් විසින් නිසි සහ සාධාරණ ආරක්ෂක පියවරවල් ගනු ලැබිය යුතු ය.

09. මහජනයාට ආරක්ෂාව සැලසීමේ කාර්යය සඳහා හෝ වීදිවල අළුත්වැඩියා කිරීම් කරගෙන යන අතරතුර දී නැතහොත් සභාපතිවරයා විසින් ඒවායේ වැඩ කටයුතු කරවාගෙන යන අතරතුරදී කරත්තවල, ගවයන්ගේ රිය මැදිරිවල සහ අශ්වයන්ගේ හෝ වෙනත් සතුන්ගේ ගමනා ගමනය වැළැක්වීම පිණිස හෝ වීදියක් හරහා හෝ යම් වීදියක පිහිටුවා ඇති වැටක්, බාධක කඩුල්ලක්, දම්වැලක් හෝ කුළුණක් ගලවා දැමීම වෙනස් කිරීම හෝ ඉවත් කිරීම හෝ සවිකර ඇති යම් ආලෝකයක් හෝ ආලෝක නිවා දැමීම හෝ ඉවත් කිරීම කිසිම තැනැත්තෙකු විසින් කරනු නොලැබිය යුතු ය.

10. සභාපතිවරයා විසින් බලය පවරන ලද තැනැත්තෙකුට හෝ තැනැත්තන්ට මේ අතුරු ව්‍යවස්ථා මගින් හිමිකර දී ඇති බලතල හෝ අධිකාරී කිසිවක් ක්‍රියාවේ යෙදවීමේ හේතුවෙන් කිසියම් අලාභයක් හෝ හානියක් දරන්නට සිදුවන සෑම තැනැත්තෙකුටම ඒ සඳහා වන්දි ලැබීමේ හිමිකම ඇත. එසේ වුවද අලාභ හානි සඳහා හිමිකම් කියා සිටින්නේ, කරන ලදැයි කියන යම් ක්‍රියාවක් කරුණක් හෝ දෙයක් සම්බන්ධයෙන් ද එම ක්‍රියාව කරුණ හෝ දෙය සිදුව මාස තුනක් ඉකුත් වීමට පෙර යම් අවස්ථාවකදී තම හිමකම් පැමෙහි ස්වභාවය සම්පූර්ණ ලෙස දක්වමින්, සභාපතිවරයා විසින් ඉල්ලා සිටිනු ලැබිය හැකි විස්තරද සපයමින් ඒ සඳහා වූ ඉල්ලීම සභාපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතු ය. ඉහත කී කාලසීමාව ඇතුළත එම ඉල්ලුම් පත්‍රය ඉදිරිපත් නොකරන ලද නම් කරන ලදැයි කිය හානිය සඳහා වූ වන්දි හිමිකම් පෑමට ඉඩදෙනු නොලබන අතර, එය අයකර ගැනීමෙන් පසු වළක්වනු ලැබේ. වන්දි ප්‍රමාණය සම්බන්ධයෙන් එකඟත්වයකට එළඹීමට නොහැකි නම් එය බේරුම් කිරීමක් මගින් තීරණය කරගනු ලැබිය යුතු අතර, එක් බේරුම්කරුවකු සභාපතිවරයා විසින් ද අනෙක් බේරුම්කරු වන්දි සඳහා හිමිකම් පාන තැනැත්තා විසින්ද නම් කරනු ලැබිය යුතුය. වන්දි ප්‍රමාණය සම්බන්ධයෙන් විභාගය පවත්වාගෙන යාමට පෙර බේරුම්කරුවන් අතර කිසියම් මත භේදයක් තීරණය කිරීම සඳහා තීරකයකු ලියවිල්ලක් මගින් පත් කර ගත යුතු ය. තව ද යොමු කර ඇති කාරණය අනුව, බේරුම්කරුවන් හෝ තීරකගේ ප්‍රදානය අවසානාත්මක හා තීරණාත්මක විය යුතු ය.

*8. ගොඩනැගිලි සහ කාණු ඉදි කිරීම*

01. (අ) යම් කාණුවක් සාදනු ලැබ හෝ කණිනු ලැබ හෝ ඇත්තේ යම් වීදියක් අයිනෙන් ද, එම වීදියට යාබද යම් නිවසක,ඉඩමක හෝ පරිශ්‍රයක අයිතිකරු හෝ පදිංචිකරු විසින් (මෙහි මින්මතු "සභාපතිවරයා" යනුවෙන් සඳහන් කරනු ලබන) ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයාගේ අවසරය ඇතිව සහ නියම කිරීම අවශ්‍ය යැයි සභාපතිවරයා සලකන කොන්දේසිවලට යටත්ව, සහ ඔහු විසින් විධාන කරන ආකාරයට මිස එවැනි යම් කාණුවක් මත යම් පාලමක්, වේදිකාවක්, ගොඩනැගිල්ලක් හෝ කිනම් ආකාරයක වුව ද ඉදිකිරීමක් ඉදිකිරීම හෝ තැබීම කරනු නොලැබිය යුතු ය.

(ආ) එම අයිතිකරු හෝ පදිංචිකරු විසින් එම පාලම, වේදිකාව, ගොඩනැගිල්ල හෝ කිනම් ආකාරයක වුවද ඉදිකිරීම සභාපතිවරයා සෑහීමකට පත්වන පරිදි යහපත් තත්ත්වයකින් නඩත්තු කරනු ලැබිය යුතු ය.

(ඇ) කිසියම් පාර්ශවයකට එසේ පිහිටා ඇති යම් නිවාසයකට ඉඩමකට, හෝ ස්ථානයකට ඒ පාලම, වේදිකාව, ගොඩනැගිල්ල හෝ ඉහත කී පරිදි වූ ඉදි කිරීම නොමැතිව ප්‍රවේශයක් පවතින බව හෝ ඉහත කී පරිදි ඉදි කරන ලද්දක් හෝ තබන ලද්දක් නොවන වෙනත් පාලමක්, වේදිකාවක්, ගොඩනැගිල්ලක් හෝ ඉදි කිරීමක් මගින් ප්‍රවේශයක් පවතින බව සභාපතිවරයාට දැනගන්නට ලැබුණ හොත් එහි අයිතිකරුට හෝ පදිංචිකරුට එය ඉදි කරන ලෙස තබන ලෙස හෝ වෙනස් කරන ලෙස හෝ ඒ පාලම, වේදිකාව, ගොඩනැගිල්ල හෝ ඉදිකිරීම නැතහොත් එයට යටින් ඇති කාණුව යහපත් තත්වයෙන් නඩත්තු කිරීම ඔහු විසින් පැහැර හරිනු ලැබ හොත් එය යහපත් තත්ත්වයට පත් කරන ලෙස එහි අයිතිකරුට හෝ පදිංචිකරුට සභාපතිවරයා විසින් දැන්වීමකින් දැනුම් දීම නීත්‍යානුකූල වන්නේ ය.

(ඈ) ඒ දැන්වීම භාරදෙනු ලැබී දවස් තිහක් ඇතුළත හෝ එම කාර්යය හදිසි එකක් බව ඒ දැන්වීමේ සභාපතිවරයා විසින් සඳහන් කරනු ලබන ඇත්නම් එසේ දැන්වීම භාරදීමෙන් දවස් දහහතරක් ඇතුළත හෝ එසේ දෙන ලද දැනුම් දීමක නියමයන් සපුරාලීම ඔහු පැහැර හැරිය හොත් අවස්ථාවෝචිත පරිදි ඒ අයිතිකරු හෝ පදිංචිකරු වරදක් කරන්නේ ය. තව ද සභාපතිවරයා විසින් ඒ වැඩ කිරීමට සැලැස්විය හැකි අතර එහි පිරිවැය සහ වියදම් එහි අයිතිකරු හෝ පදිංචිකරු ගෙවිය යුතු ය.

02. අවශ්‍ය යැයි සභාපතිවරයා සලකන්නේ නම් ගොඩනැගිල්ලකට යාව ඇති අංගනයක හෝ භූමියක නැතහොත් ගොඩනැගිලි අතර හෝ ගොඩනැගිලි පේළියක් අතර හෝ ඇති යම් පටු පාරක, පාරක හෝ අඩි පාරක අයිතිකරුට හෝ අයිතිකරුවන්ට සභාපතිවරයා විසින් නියම කරනු ලැබිය හැකි යම් යුක්ති සහගත කාලයක් ඇතුළත ඒ අංගනය, භූමිය, පටුපාර, පාර හෝ අඩි පාර අවස්ථාවෝචිත පරිදි එවැනි යම් ගොඩනැගිල්ලක හෝ ගොඩනැගිලිවල හෝ ගොඩනැගිලි පේළියක සිට මීටර් 4.5 ක් නොඉක්මවන දුරකට ගල් අතුරා සභාපතිවරයා විධාන කරන යම් ආකාරයකට සකස් කරන ලෙසද ඒ අංගනයේ භූමියේ, පටු පාරේ, පාරේ හෝ අඩි පාරේ ජලය බැස යාමේ කාර්යය සඳහා ලඟම ඇති ප්‍රාදේශීය සභා පල්දෝරුව හෝ කාණුව දක්වා ප්‍රමාණවත් කාණු හෝ නල සපයන ලෙස ද සභාපතිවරයා විසින් ලියවිල්ලක් මගින් නියම කිරීම නීත්‍යානුකූල වන්නේ ය. ඒ කාණු හෝ නල සභාපතිවරයා නියම කරන ද්‍රව්‍යවලින් ද විශාලත්වයෙන් හෝ මට්ටමකින් ද බෑස්නාවකින් ද විය යුතු අතර එකී ප්‍රාදේශීය සභා පල්දෝරුව හෝ කාණුව සමග එසේ නියම කරන තැනක දී සන්ධි වන පරිදි ද විය යුතු ය. එසේ වුව ද ඒ අයිතිකරු විසින් සැපයිය යුතු කාණු හෝ නල සඳහා අවශ්‍ය ද්‍රව්‍ය ඔහු ඉල්ලුම් කළ විට සභාපතිවරයා විසින් ගැනුම් මිලට සැපයිය යුතු ය. ඒ අයිතිකරු හෝ අයිතිකරුවන් එවැනි දැන්වීමක නියම කර ඇති කාලය ඇතුළත එහි නියමයන් අනුව ක්‍රියා කිරීම පැහැර හැරිය හොත් ඔහු විසින් හෝ ඔවුන් විසින් වරදක් කරනු ලැබේ. තව ද සභාපතිවරයා හෝ ඔහු විසින් බලය දෙන ලද යම් නිලධරයන් විසින් කම්කරුවන් සමග එම ස්ථානයට ඇතුළු වී ඒ අවශ්‍ය වැඩ කිරීමට සැලැස්විය යුතු අතර එහි පිරිවැය සහ වියදම අයිතිකරු විසින් ගෙවිය යුතු ය.

එසේ වුව ද ලඟම ඇති ප්‍රාදේශීය සභා පල්දෝරුව හෝ කාණුව ඒ අංගනයේ භූමියේ පටු පාරේ, පාරේ හෝ අඩි පාරේ සිට මීටර් 30.5කට වැඩි වේ නම් ප්‍රාදේශීය සභාවේ කැමැත්ත කලින් ලබා නොගෙන එවැනි දැන්වීමක් නිකුත් නොකළ යුතු ය.

03. යම් පෞද්ගලික පල්දෝරුවක් හෝ කාණුවක් එය අයිතිකරුගේ ගොඩනැගිල්ලට යටින් තිබුණ ද පිටතින් තිබුණ ද ඒ පල්දෝරුවට හෝ කාණුවට නිසි වාතාශ්‍රයක් ලැබීම පිණිස සභාපතිවරයා නියම කරන යුක්ති සහගත කාලයක් ඇතුළත, අවශ්‍ය යැයි සභාපතිවරයා සලකන යම් නල සවිකරන ලෙස ඒ පල්දෝරුව හෝ කාණුව අයිතිකරුට සභාපතිවරයා විසින් ලිඛිත දැන්වීමක් මගින් නියම කිරීම නීත්‍යානුකූල වන්නේ ය. ඒ වාතාශ්‍ර නල, සභාපතිවරයා විධාන කරන විශාලත්වයකින් හා ද්‍රව්‍යයකින් විය යුතු අතර එසේ විධාන කරන උසක් දක්වා ගෙන යා යුතු ය. නියමිත කාලය ඇතුළත ඒ දැන්වීමෙහි නියමයන් අනුව ක්‍රියාකිරීම් ඒ අයිතිකරු පැහැරහැරියහොත් ඔහු වරදක් කරන්නේ ය. තව ද සභාපතිවරයා හෝ යම් නිලධරයන් සහ සභාපතිවරයා විසින් බලය දෙන ලද කම්කරුවන් ඒ ස්ථානයට ඇතුළු වී නියමිත වැඩය කිරීමට සැලැස්විය හැකි අතර, එහි පිරිවැය සහ වියදම ඒ අයිතිකරු විසින් ගෙවිය යුතු ය.

04. යම් පල්දෝරුවක් හෝ කාණුවක් හා සම්බන්ධවන ආවරණය කළ කාණුවක් හෝ නලයක් තැනීම හෝ එළීම අවශ්‍ය බව පෙනී ගිය විටක ඒ කාණුව තැනීම හෝ පයිප්පය එළීම සඳහා එය ජලය බැස්සවීම අවශ්‍ය ගොඩනැගිල්ලක හෝ ස්ථානයක සහ පොදු කාණුව හෝ පල්දෝරුව අතර මැද ඇති ඉඩමක් හෝ ඉඩම් හරහා ගෙන යාම අවශ්‍ය වන විට සභාපතිවරයා හෝ තත්කාර්ය සඳහා ඔහුගේ ලිඛිත අධිකාරයක් යටතේ ක්‍රියා කරන යම් නිලධරයකු හෝ විසින් එම කාණුව තැනීම හෝ නල එළීම කරගෙන ගොස් සම්පූර්ණ කිරීමට සභාපතිවරයා අදහස් කරන බවට ඒ අතර මැද ඇති ඉඩමෙහි හෝ ඉඩම්වල අයිතිකරුට හෝ පදිංචිකරුට දින දෙකක් කල් දීමකින් පසු එම ඉඩමට හෝ ඉඩම්වලට ඇතුළු වී ඒ කාණුව තැනීම හෝ නල එළීම කරගෙන ගොස් සම්පූර්ණ කිරීම නීත්‍යානුකූල වන්නේ ය. ඒ ඉඩමේ අයිතිකරු බදුකරු හෝ පදිංචිකරු සභාපතිවරයාගේ ලිඛිත කැමැත්ත ලබා නොගෙන ඒ කාණුවත් හෝ නලයක් වෙනස් කිරීම හෝ ඉවත් කිරීම හෝ ප්‍රතිසංස්කරණය හෝ නොකළ යුතු ය.

05. (i) යම් පල්දෝරුවක් හෝ කාණුවක් හා සම්බන්ධවන ආවරණය කළ කාණුවක් හෝ නලයක් තනන ලෙස හෝ එලන ලෙස දැන්වීමක් භාර කරනු ලැබ ඇති කවර හෝ තැනැත්තකු විසින්, ඒ කාණුව තැනීම හෝ නලය එළීම පිණිස එය ජලය බැස්සවීම අවශ්‍ය ගොඩනැගිල්ල හෝ ස්ථානය සහ පොදු පල්දෝරුවක් හෝ කාණුවක් අතර මැද ඇති ඉඩමක් හෝ ඉඩම් හරහා ගෙන යාම අවශ්‍ය බවට, සහතිකයක් නිකුත් කරන ලෙස සභාපතිවරයා වෙත ඉල්ලුම් කළ හැකි අතර එසේ සහතිකයක් නිකුත් කිරීම සුදුසු යැයි සභාපතිවරයා සලකන්නේ නම් ඒ බවට ලිඛිත සහතිකයක් ඒ තැනැත්තාට නිකුත් කළ හැකිය.

(ii) එම සහතිකය නිකුත් කරනු ලැබීමෙන් පසුව සහ අතර මැද ඉඩමෙහි හෝ ඉඩම්වල අයිතිකරුට හෝ අයිතිකරුවන්ට යුක්ති සහගත වන්දියක් ගෙවීමෙන් පසුව කවර වේලාවක වුව ද ඒ අතර මැද ඉඩමේ හෝ ඉඩම්වල අයිතිකරුට හෝ පදිංචිකරුට තමා ඒ කාණුව තැනීම හෝ නල එළීම සම්පූර්ණ කිරීමට අදහස් කරන බවට දෙදිනක කල් දීමකින් පසුව ඒ තැනැත්තා විසින් අවශ්‍ය හා නිසි සේවකයන් කම්කරුවන්, වාහන හා සතුන් සහ වෙනත් උපයෝගී ද්‍රව්‍ය ද රැගෙන ඒ අතර මැද ඉඩමට හෝ ඉඩම්වලට ඇතුළු වී ඒ කාණුව තැනීම හෝ නලය එළීම කරගෙන ගොස් සම්පූර්ණ කිරීම නීත්‍යානුකූල වන්නේ ය.

(iii) එකී වන්දි මුදල් ප්‍රමාණය හා අවශ්‍ය වුවහොත් එය කොටස් කර දීම ඒ පිළිබඳව මත භේදයක් ඇති වූ අවස්ථාවක බේරුම්කරුවන් දෙදෙනෙකු විසින් තීරණය කිරීම සඳහා යොමු කළ යුතු ය. ඒ බේරුම්කරුවන් ගෙන් එක් කෙනෙකු ඉහත කී තැනැත්තා විසින් ද අනෙක් බේරුම්කරු අදාළ ඉඩමෙහි හෝ ඉඩම්වල අයිතිකරු හෝ අයිතිකරුවන් විසින් ද නම් කළ යුතු ය.

(iv) වන්දි මුදල් ප්‍රමාණය ගැන විභාග කිරීමෙහි යෙදීමට ප්‍රථම, බේරුම්කරුවන් විසින් ලියවිල්ලක් මගින් තීරකයකු පත් කර ගත යුතු ය. යුක්ති සහගත වන්දි මුදල් ප්‍රමාණය හෝ එය කොටස් කළ යුතු ආකාරය හෝ පිළිබඳව එකඟත්වයකට පැමිණීමට බේරුම්කරුවන් අපොහොසත් වුවහොත් තමන් එකඟ නොවන කරුණ හෝ කරුණු ඔවුන් විසින් එකී තීරකට යොමු කළ යුතු ය. ඔහුගේ තීරණය අවසානාත්මක වන්නේ ය.

(v) බේරුම්කරුවකු නම් කරන ලෙස දැනුම්දීමක් ලැබී දවස් දහයක් ඇතුළත එසේ බේරුම්කරුවකු පත් කිරීම එකී අයිතිකරු හෝ අයිතිකරුවන් විසින් පැහැර හරිනු ලැබුවහොත් ඉහත කී තැනැත්තා විසින් පත් කරන ලද බේරුම්කරු එම වන්දි මුදල් ප්‍රමාණය සහ එය කොටස් කළ යුතු ආකාරය තීරණය කළ යුතු ය.

06. යම් ගොඩනැගිල්ලක් ඉදි කරන හෝ විශාල කරන හෝ වැඩි දියුණු කරන නැතහොත් ගොඩනැගිල්ලක ඉදිරිපස අලුත් කරන අලුත්වැඩියා කරන හෝ වෙනස් කරන සෑම තැනැත්තෙක්ම හෝ යම් කාණුවක් තනන නැතහොත් කාණුවක උඩින් පාලමක්, වේදිකාවක් හෝ නිර්මිතයක් තනන හෝ යම් වැසිකිළියක් හෝ කුණුදිය වලක් තනන සෑම තැනැත්තෙක්ම හෝ තමා වෙත නීතියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර සහ සභාපතිවරයා විසින් යම් ගොඩනැගිල්ලක් කාණුවක් වැසිකිළියක් හෝ කුණු දිය වලක් ඉදිකරන ලෙස වෙනස් කරන ලෙස හෝ අලුත්වැඩියා කරන ලෙස නියම කරනු ලැබිය හැකි යම් තැනැත්තෙක් හෝ තැතැත්තන්ම ඒ කටයුතු සම්පූර්ණ කිරීමෙන් පසුව දවස් දහහතරක් ඇතුළත ඒ පිළිබඳව සභාපතිවරයා වෙත ලියවිල්ලකින් දැනුම් දිය යුතු ය.

07. (1) යම් තැනැත්තකු විසින් මෙහි පහත දැක්වෙන කොන්දේසිවලට යටත්ව මිස ව්‍යවස්ථාවක් වශයෙන් ගෙයක් හෝ පැල්පතක් ඉදි කිරීම හෝ වාසස්ථානයක් වශයෙන් එවැන්නක පදිංචි වීමට ඉඩදීම නොකළ යුතු ය.

*(අ)* කිසිම අවස්ථාවක බිත්ති පොල් අතුවලින් සාදා නොතිබිය යුතු අතර, නිසි පරිදි කපරාරු කර හුණු ගෑමට හැකිවන පරිදි වරිච්චි, ගඩොල්, කබොක් හෝ වෙනත් යෝග්‍ය ද්‍රව්‍යයකින් තිබිය යුතු ය.

*(ආ)* මනුෂ්‍ය වාසය සඳහා ප්‍රයෝජනයට ගන්නා සෑම කාමරයක් සඳහාම යටත් පිරිසෙයින් මීටර් 1.8ක් උස සහ මීටර් 0.9 ක් පළල දොරක් සහ උසින් මීටර් 0.9 ට සහ පළලින් මීටර් 0.6ට නොඅඩු ප්‍රමාණයකට එක් ජනේලයක් තිබිය යුතුය.

*(ඇ)* සෑම විටම මීටර් 0.3කට නොඅඩු ප්‍රමාණයක් පොළොව මට්ටමට උසින් තිබිය යුතු ය. එසේ වුව ද පිහිටීම අනුව ඊට වඩා වැඩි උසක් නියම කිරීමට ප්‍රාදේශීය සභාවට නිදහස ඇත්තේ ය. පැල්පත් පේළි හෝ කට්ටි දෙකක් අතර අඩුම වශයෙන් මීටර් 4.5ක විවෘත ඉඩක් තිබිය යුතු ය.

(i) මේ අතුරු ව්‍යවස්ථාවේ විධිවිධානවලට පටහැනිව ඉදිකරන ලද යම් ගෙයක් හෝ පැල්පතක් වෙනස් කරන ලෙස හෝ කඩා දමන ලෙස එහි අයිතිකරුට ලියවිල්ලකින් දැනුම් දීමක් කර එක් මාසයක් ඇතුළත එසේ කිරීම පැහැර හැරියහොත් හෝ නොසලකා හැරියහොත් ප්‍රාදේශීය සභාව විසින් එය එහි අයිතිකරුගේ වියදමින් කඩා දැමීමට සැලැස්වීම නීත්‍යානුකූල වන්නේ ය.

(ii) සභාපතිවරයාගේ අනුමැතිය නොමැතිව යම් ගොඩනැගිල්ලක් හෝ ගොඩනැගිල්ලක කොටසක් පොල් අතු කොළ, පිදුරු තණකොල හෝ ලී පතුරු හෝ වෙනත් කවර වූ හෝ ස්වභාවයක දහ ද්‍රව්‍යයකින් ඉදිකරන අලුත් කරන හෝ ඉදි කිරීමට නැතහොත් අලුත් කිරීමට සලස්වන යම් තැනැත්තෙක් වරදක් කරන්නේ ය.

08. (i) වාසස්ථානයක් ලෙස ප්‍රයෝජනයට ගැනීමට අදහස් කර ඇති හෝ ප්‍රයෝජනයට ගන්නා යම් ගොඩනැගිල්ලක් කවර හෝ හේතුවක් නිසා මනුෂ්‍ය වාසය සඳහා යෝග්‍ය නොවන බව සභාපතිවරයාට පෙනී ගියහොත් ඒ ගොඩනැගිල්ල ඒ කාර්යය සඳහා තවදුරටත් ප්‍රයෝජනයට ගැනීම තහනම් කරන මෙන් මහෙස්ත්‍රාත් අධිකරණය වෙත සභාවේ නිලධරයකු ලවා ඉල්ලීමක් කරවීමට සභාපතිවරයා විසින් සැලැස්විය යුතු ය. සුදුසු යැයි ඒ මහෙස්ත්‍රාත්වරයා සලකන පරීක්ෂණයකින් පසුව, ඔහු විසින් ඉහත කී පරිදි තහනම් කිරීමේ ලිඛිත ආඥාවක් නැතහොත් සාධාරණ යැයි සහ යෝග්‍ය යැයි ඔහු සලකන වෙනත් යම් ආඥාවක් කරනු ලැබිය හැකි ය.

(ii) එවැනි යම් තහනම් කිරීමේ ආඥාවක් කරනු ලැබ ඇති විට එය මනුෂ්‍ය වාසය සඳහා අයෝග්‍ය බවට පත් කළ හේතු තමා සෑහීමට පත් වන පරිදි කර ඇති බවට සභාපතිවරයා සහතික කරන තෙක් හෝ ඉහත කී පරිදි වූ තහනම මහෙස්ත්‍රාත්වරයා විසින් ලිඛිත ආඥාවක් මගින් ඉවත් කර ගන්නා තෙක් හෝ ගොඩනැගිල්ලක අයිතිකරු හෝ පදිංචිකරු එය මනුෂ්‍යවාසය සඳහා පාවිච්චි කිරීම හෝ පාවිච්චි කිරීමට ඉඩදීම නොකළ යුතු ය.

09. වාසස්ථානයක් හෝ ස්ථානයක් ලෙස හෝ වෙනත් යම් කාර්යයක් සඳහා හෝ ප්‍රයෝජනයට ගන්නා යම් ගොඩනැගිල්ලක් හෝ ගොඩනැගිලි පේළියක් ප්‍රමාණවත් උසකින් තොරව හෝ නිසි ජලාපවහනයකින් තොරව තනා තිබීමේ හේතුවෙන් හෝ කසල ශෝධනය ප්‍රායෝගිකව කළ නොහැකි වීමේ හේතුව නිසා හෝ ඒ ගොඩනැගිල්ල හෝ ගොඩනැගිලි පේළිය සහ වෙනත් පැල්පත් හෝ මඩු එකට ආසන්නව ඇති ආකාරය

නිසා හෝ ඒවායේ පදිංචිකරුවන්ට නැතහොත් ඒ අවට පදිංචිකරුවන්ට රෝග වැළඳීමේ අන්තරාවක් ඇති කිරීමට ඉඩ ඇති බව නැතහොත් කවර හෝ හේතුවක් නිසා මහජන සෞඛ්‍ය හෝ ආරක්ෂාව අන්තරාවට පාත්‍රවීමට ඉඩ ඇති බව සභාපතිවරයාගේ මතය වේ නම් ඔහු විසින් ඒ පැල්පතේ හෝ මඩුවේ හෝ ප්‍රකටව පෙනෙන තැනක සවි කිරීමට සලස්වන ලිඛිත දැන්වීමක් මගින් එහි අයිතිකරුට හෝ පදිංචිකරුට නැතහොත් ඒ පැල්පත හෝ මඩුව පිහිටා ඇති ඉඩමේ අයිතිකරුට ඒ පැල්පත හෝ මඩුව ඉවත් කරන ලෙස හෝ වෙනස් කරන ලෙස නැතහොත් අවශ්‍ය යැයි සභාපතිවරයා සලකන පරිදි එය වැඩි දියුණු කිරීමට ක්‍රියා කරන ලෙස හෝ නියම කළ හැකිය. මේ කවර හෝ අතුරු ව්‍යවස්ථාවක් සම්බන්ධයෙන් වන සෑම උල්ලංඝනයක්ම රුපියල් හත්සිය පනහක් නොඉක්මවන දඩයකින් ද, අධිකරණයක් විසින් වරදකරු කරනු ලැබීමෙන් පසුව එම උල්ලංඝනය කෙරෙහි අවධානය යොමු කරමින් ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා විසින් නැතහොත් ප්‍රාදේශීය සභාව විසින් බලය දෙන ලද නිලධාරියකු විසින් ලිඛිත දැන්වීමක් භාර දීමට සැලැස්වීමෙන් පසුව ඒ උල්ලංඝනය කරගෙන යන සෑම දවසක් සඳහාම රුපියල් දෙසිය පනහක් නොඉක්මවන අතිරේක දඩයකින් ද දඬුවම් කරනු ලැබීමට යටත් වන්නේ ය.

**09. කසළ ශෝධනය**

01. මුළු ප්‍රාදේශීය සභා ප්‍රදේශයම සඳහා හෝ එහි යම් නිශ්චිත කොටසක් සඳහා හෝ කසළ ශෝධන සේවාවක් ආරම්භ කරනු ලැබූ විට, එම සේවාව පිහිටුවන ලැබ ඇති ප්‍රදේශය ඇතුළත පිහිටි යම් ස්ථානයක පදිංචිකරු විසින් තම ස්ථානයේ සියලු අළු, කුණු, රොඩු සහ වෙනත් කසළ ආවරණය කරන ලද උසින් සෙන්ටි මීටර් 65කට නොඅඩු නොවන්නා වූ ද, විෂ්කම්භය පහළින් සෙන්ටිමීටර් 35කට සහ ඉහළින් සෙන්ටි මීටර් 45කට අඩු නොවන්නා වූ ද කසළ භාජනයක හෝ ප්‍රමාණයෙන් සෙන්ටි මීටර් 60 x සෙන්ටි මීටර් 90 ක කලු පැහැති පොලිතීන් මල්ලක හෝ තැන්පත් කරනු ලැබිය යුතු ය.

02. 1 වන අතුරු ව්‍යවස්ථාවේ සඳහන් කිසියම් ස්ථානයක පදිංචිකරු -

(අ) ප්‍රාදේශීය සභාව විසින් කලින් කළ දැනුම් දෙනු ලබන කාලය ඇතුළත දිනපතාම 1 වන අතුරු ව්‍යවස්ථාවේ සඳහන් භාජනය මාර්ගයේ වාහන ගමනාගමනයට බාධා නොවන පරිදි එම ස්ථානයෙන් පිටත මාර්ගය අයිනේ තැබීමට සැලැස්විය යුතු ය. තව ද

,

(ආ) සභාවේ කසළ ශෝධන කම්කරුවන් විසින් භාජනය හිස් කරනු ලැබීමෙන් පැය භාගයක් ඇතුළත දී භාජනය රැගෙන යාමට සැලැස්විය යුතු ය.

03. 2 වන අතුරු ව්‍යවස්ථාවේ සඳහන් කාලවේලාවන් අතරතුරදී හැර 1 වන අතුරු ව්‍යවස්ථාවේ සඳහන් කිසිම කසළ භාජනයක් කිසිම තැනැත්තකු විසින් මාර්ගයෙහි තබනු නොලැබිය යුතු ය.

04. දරිද්‍රතාවය හේතුකොට ගෙන සභාව විසින් නිදහස් කරනු ලැබූ පදිංචිකරුවකු නොවන කසළ ශෝධන සේවාව මගින් සේවය සලකනු ලබන යම් ස්ථානක පදිංචිකරු විසින් සභාව ඒ සඳහා නියම කරනු ලබන කසළ ශෝධන ගාස්තුවක් සභාව වෙත මාස් පතා ගෙවනු ලැබිය යුතු ය.

05. ප්‍රාදේශීය සභාව විසින් එසේ කිරීමට යම් තැනැත්තකුට බලය පවරා ඇත්නම් මිස, කිසිම තැනැත්තකු විසින් ප්‍රාදේශීය සභා ප්‍රදේශය ඇතුළත යම් වීදියක් හෝ ප්‍රසිද්ධ ස්ථානයකින් දූවිලි, අලු, කුණු, රොඩු කසළ හෝ අපද්‍රව්‍ය එකතු කිරීම හෝ ඉවත් කරගෙන යාම කරනු නොලැබිය යුතු ය.

06. 1 වන අතුරු ව්‍යවස්ථාව හෝ 2 වන අතුරු ව්‍යවස්ථාව හෝ 5 වන අතුරු ව්‍යවස්ථාව හෝ කඩ කරන සෑම තැනැත්තකුම වරදකරු වන අතර, මහෙස්ත්‍රාත්වරයකුගේ ඉදිරියේ වරදකරු කරනු ලැබීම මත රුපියල් හත්සිය පනහකට නොවැඩි දඩයකින් දඬුවම් පමුණුවනු ලැබිය යුතුය.

07. මේ අතුරු ව්‍යවස්ථාවල කාර්යයන් සඳහා "ප්‍රාදේශීය සභාව" යන්නට ප්‍රාදේශීය සභාව විසින් එහි බලතල කාර්යයන් සහ කර්තව්‍යයන් පවරනු ලැබ ඇති යම් නිලධරයකු ඇතුළත් වේ.

***10. ගෙපත්වල ප්‍රමාණ ඉක්මවා වාසය කිරීම***

01. කිසියම් ගොඩනැගිල්ලක පදිංචිව සිටිය යුතුයැයි (මෙහි මින්මතු "සභාපතිවරයා" යනුවෙන් හඳුන්වනු ලබන) ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයාගේ මතය වන සංඛ්‍යාවට වැඩි සංඛ්‍යාවක් එම ගොඩනැගිල්ලෙහි පදිංචිව සිටින බව පෙනී යන සෑම අවස්ථාවකදීම එහි පදිංචිව සිටිය යුතු බවට සභාපතිවරයාගේ මතය වන සංඛ්‍යාව ඉක්මවා සිටින තැනැත්තන් සංඛ්‍යාව එම ගොඩනැගිල්ලෙන් ඉවත් විය යුතු යැයි සාභාපතිවරයා විසින් නියම කරනු ලැබීම නීත්‍යානුකූල වන්නේය. එවැනි නියමයක් කිරීමෙන් පසු යම් අවස්ථාවක එම ගොඩනැගිල්ලෙහි පදිංචිව සිටිය යුතු සංඛ්‍යාවට වඩා වැඩි තැනැත්තන් සංඛ්‍යාවක් එහි පදිංචිව සිටින බව පෙනී ගියහොත් එම ගොඩනැගිල්ලෙහි අයිතිකරු වරදට වරදකරු විය යුතු ය.

02. (i) පදිංචිය සඳහා ප්‍රයෝජනයට ගනු ලබන යම් ගොඩනැගිල්ලක් එහි පදිංචිකරුවන්ගෙන් සෞඛ්‍යයට අනතුරුදායක වන තරමට අධික ජනවාසයකින් යුක්ත යැයි සභාපතිවරයාට පෙනී ගියහොත්, එවැනි අධික ජන වාසයක් තහනම් කිරීමේ ආඥාවක් කරන ලෙස ඔහු විසින් මහෙස්ත්‍රාත්වරයා වෙත ඉල්ලීමක් කරනු ලැබිය හැකි ය. එවිට මහෙස්ත්‍රාත්වරයා විසින් ඔහු පැවැත්වීමට සුදුසුයැයි සලකන විභාගයකින් පසුව ආඥාවක් කිරීමෙන් එකී ආඥාවෙහි සඳහන් සති හයකට වැඩි නොවන කාල සීමාවක් තුළදී එම ගොඩනැගිල්ලේ නවාතැන්කරුවන්ගේ කුලී නිවැසියන්ගේ හෝ වෙනත් නේවාසිකයන්ගේ සංඛ්‍යාව අඩු කිරීමෙන් එහි අධික ජනවාසය හීන කරන ලෙස අණ කරනු ලැබිය හැකිය. එසේ නැතහොත් සාධාරණයි හෝ සුදුසුයැයි ඔහු සලකන වෙනත් ආඥාවක් කරනු ලැබිය හැකිය.

(ii) එකී ගොඩනැගිල්ලේ අයිතිකරු එය අතුරු කුලියට දී තිබේ නම්, එහි නවාතැන්කරුවන්ගේ, කුලී නිවාසියන්ගේ සහ වෙනත් නියම නේවාසිකයන්ගේ ගෙහිමියා මේ වගන්තියේ කාර්යයන් සඳහා ගොඩනැගිල්ලේ අයිතිකරු ලෙස සලකනු ලැබිය යුතු ය.

(iii) මේ අතුරු ව්‍යවස්ථාව යටතේ ආඥාවක් අනුව අයිතිකරු විසින් ගොඩනැගිල්ලෙන් ඉවත් වන ලෙස නියම කරනු ලැබූ විට සෑම කුලී නිවැසියෙකුම නවාතැන්කරුවකුම හෝ වෙනත් නේවාසිකයකුම එසේ ඉවත්ව යා යුතු ය.

*11. ලැගුම් නිවාස*

01. (i) ප්‍රාදේශීය සභාව විසින් ඒ සඳහා නිකුත් කරන ලද බලපත්‍රයක් මත මිස කිසිම තැනැත්තකු විසින් ප්‍රාදේශීය සභා ප්‍රදේශය තුළ ලැගුම් නිවාසයක් තබා නොගත යුතු ය.

(ii) මේ අතුරු ව්‍යවස්ථාවේ (i) වන ඡේදය යටතේ නිකුත් කරන ලද සෑම බලපත්‍රයක් ම 24 වන අතුරු ව්‍යවස්ථාව යටතේ කලින් අවලංගු කරනු ලැබුවහොත් මිස එය නිකුත් කරනු ලැබුවේ යම් වර්ෂයක් වෙනුවෙන් ද ඒ වර්ෂයේ දෙසැම්බර් මස තිස් එක් වන දිනයෙන් අවසන් විය යුතු ය.

02. කිසිම තැනැත්තකුට -

*(අ)* මහෙස්ත්‍රාත්වරයකු විසින් හෝ සමාදාන විනිශ්චයකාරවරයකු විසින් හෝ අත්සන් තබන ලද යහපත් චරිතයක් ඇති බවට සහතිකයක් ඔහු (මෙහි මින්මතු "සභාපතිවරයා" යනුවෙන් සඳහන් කරනු ලබන) ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා වෙත තැන්පත් කරයි නම්, හෝ ඔහු යහපත් චරිතයකින් යුක්ත තැනැත්තකු බවට ඔහු ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා අන් ලෙසකින් සෑහීමට පත් කරයි නම්; සහ

*(ආ)* බලපත්‍ර අවශ්‍ය ස්ථානයක පහත දැක්වෙන කොන්දේසිවලට එනම් -

(i) ස්ථානය ශක්තිමත් ලෙස ගොඩ නගා තිබිය යුතු බවට සහ එය හොඳින් අළුත්වැඩියා කර තිබිය යුතුව හැර සෑම කරාමයක්ම මනාවාතාශ්‍රයෙන් යුක්තව සහ හොඳින් ආලෝකය සපයා විවෘත කළ විට මතුපිට භූමි ප්‍රමාණයෙන් පහළොවක් එකකට අඩු නොවන වර්ග ඵලයකින් යුක්ත විවෘත කළ හැකි ජනේල සපයා තිබෙන බවට සහ සෑම කාමරයක්ම වර්ග මීටර් 11.15 ක අවම මතුපිට වර්ග ඵලයක් තිබෙන බවට;

(ii) සෑම කාමරයකටම සෑම කොටසකම බිත්ති උසින් මීටර් 3.05කට අඩු නොවන බවට සහ සුදු පිරියම් කර ඇති බවට;
(iii) පියසි කෙළවර පොළොවේ සිට යටත් පිරිසෙයින් මීටර් 1.83ක් විය යුතු බවට;
(iv) වහල යම් ස්ථිර ද්‍රව්‍යයකින් සෙවිලි කර ඇති බවට;
(v) දැවවලයෙන් කර ඇති කොටසක් තෙල් සායම් කොට හෝ සුදු පිරියම් කර හෝ ඇති බවට;
(vi) පොළොව සම්පූර්ණයෙන්ම සිමෙන්ති දමා ඇති බවට;
(vii) එම ස්ථානයට ප්‍රමාණවත් ජලාපවහන සපයා ඇති බවට;
(viii) නිවාසයේ අපද්‍රව්‍ය අඩංගු කිරීමට ප්‍රමාණවත් විශාලත්වයකින් යුත් කසල භාජනය සෑහෙන ගණනක් එම ස්ථානයේ සපයා ඇති බවට;
(ix) ස්ථානයට බලපත්‍ර ලබාගනු ලබන්නේ යම් තැනැත්තන් නතර කර ගැනීම සඳහා ද ඒ සෑම තැනැත්තන් දස දෙනකුට වෙනම වැසිකිළි එකකට නොඅඩු සංඛ්‍යාවක් තිබෙන පරිදි ප්‍රමාණවත් ස්නාන සහ වැසිකිළි පහසුකම් සලසා ඇති බවට;
(x) එම ස්ථානයට හොඳ ජල සැපයුමක් සලසා තිබෙන බවට සහ බොන වතුර සැපයුම සහ ස්නාන පහසුකම් දිය නාන තැනැත්තන් මගින් බීමට ගන්නා ජලය අපවිත්‍ර නොවන ආකාරයට සපයා ඇති බවට සහ;
(xi) එම ස්ථානයට දුම් පිටවීම සඳහා කාර්යක්ෂම පිටාරයක් කුස්සියක් ලෙස වෙන් කරන ලද වෙනම කාමරයක් තිබෙන බවට අනුකූල වන්නේ නම් මිස ලැගුම් නිවාසයක් තබා ගැනීමට සඳහා වූ බලපත්‍රයත් නිකුත් කරනු නොලැබිය යුතු ය.

03. ලැගුම් නිවාසයක සෑම බලපත්‍රලාභියකු විසින්ම තමන්ගේ නම ද බලපත්‍රයලත් ලැගුම් නිවාසය, යන වචන ද සිංහල, දෙමළ, ඉංග්‍රීසි භාෂාවලින් පැහැදිලිව පින්තාරු කරන ලද පුවරුවක් තම ස්ථානයෙහි පිටත ප්‍රකටව පෙනෙන ස්ථානයක සවිකර තබනු ලැබිය යුතු ය.

04. ලැගුම් නිවාසක සෑම බලපත්‍රලාභියකු විසින්ම ලැගුම් නිවාසවලට අදාල අතුරු ව්‍යවස්ථාවල සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවලින් පිටපතක් සහ බලපත්‍රය රාමුකර බලපත්‍රලත් ස්ථානයේ පැහැදිලිව පෙනෙන ස්ථානයක එල්ලා තැබීමට සලස්වනු ලැබිය යුතු ය. තව ද සභාපතිවරයා විසින් නැතහොත් ඔහු විසින් ලියවිල්ලකින් බලය පවරන ලද තැනැත්තකු විසින් සියලු සාධාරණ වේලාවල දී පරීක්ෂා කිරීම පිණිස ලබාගනු ලැබිය හැකි වන පරිදි සියලු සේවා නියුක්තයන්ගේ නම සහ ලිපිනය ලැයිස්තුවක් ඔහු විසින් තබා ගනු ලැබිය යුතු ය.

05. බලපත්‍රයට යාකර සභාපතිවරයා විසින් අත්සන් තබනු ලැබිය යුතු ලැගුම් නිවාසයේ සැලැස්මෙහි නිදන කාමර ලෙස නිශ්චිතව වෙන් කර ඇති කාමරවල හැර වෙනත් කිසිම කාමරයක යම් තැනැත්තකුට නිදා ගැනීමට අවසර දීම ලැගුම් නිවාසයක කිසිම බලපත්‍රලාභියකු විසින් කරනු නොලැබිය යුතු ය.

06. යම් කාමරයක නිදා ගැනීමට ඉඩදෙනු ලබන සංඛ්‍යාව ලෙස සැලැස්මෙහි සභාපතිවරයා විසින් නිශ්චය කොට දක්වා ඇති සංඛ්‍යාවට වැඩි තැනැත්තන් සංඛ්‍යාවකට යම් කාමරයක නිදා ගැනීමට, ලැගුම් නිවාසයක කිසිම බලපත්‍රලාභියෙකුට අවසර නොදිය යුතු ය. යම් කාමරයක් සඳහා නිශ්චිත තැනැත්තන් සංඛ්‍යාව කාමරයේ මතුපිට වර්ග ඵලයේ සෑම වර්ග මීටර් තිස් හතරක් සඳහාම එක් තැනැත්තකුට වැඩි නොවිය යුතු අතර මේ අතුරු ව්‍යවස්ථාවේ කාර්යයන් සඳහා වයස අවුරුදු දහයට අඩු ළමයින් දෙදෙනෙක් එක් තැනැත්තකු ලෙස ගණනන් ගත යුතු ය..

07. ලැගුම් නිවාසයක සෑම බලපත්‍රලාභියකුම කාමරයෙහි පරිමාණයන් සහ එහි නිදා ගැනීමට අවසර දෙනු ලබන තැනැත්තන්ගේ උපරිම සංඛ්‍යාව දැක්වෙන පුවරුවක් එක් එක් කාමරයෙහි සවිකර තිබිය යුතු ය.

08. ස්වාමි පුරුෂයා සහ භාර්යාවද දෙමව්පියන් සහ දරුවන් සම්බන්ධයෙන් වූ විට හැර වයස අවුරුදු දහයට වැඩි පුරුෂයන්ට සහ ස්ත්‍රීන්ට එකම නිදන කාමරයෙහි නතර වීමට, ලැගුම් නිවාසයක කිසිම බලපත්‍රලාභියකු අවසර නොදිය යුතු ය.

09. ලැගුම් නිවාසයක කිසිම බලපත්‍රලාභියකු එහි දුරාචාර කාර්යයක් සඳහා නතර වීමට ඉඩ නොදිය යුතු ය. එය තුළ නිසි පැවැත්ම සහ සදාචාර පවත්වාගෙන යනු ලැබීම ගැන ඔහු වගකිව යුතු ය.

10. බලපත්‍රලත් ස්ථානයේ නතරවන එක් එක් තැනැත්තන්ගේ නම්, රැකියාව, නිත්‍ය පදිංචි ස්ථානය, අන්තිම තාවකාලික හෝ ස්ථිර පදිංචිය සඳහන් ලේඛනයක් ලැගුම් නිවාසයක සෑම බලපත්‍ර ලාභියකු විසින්ම තබා ගනු ලැබිය යුතු ය.

11. ලැගුම් නිවාසයක සෑම බලපත්‍රලාභියකුම එක් එක් නිදන කාමරවල ජනෙල් එක් එක් දිනයේ යටත් පිරිසෙයින් පැය හතරක්වත් සම්පූර්ණ පළලට විවෘත කර තැබීමට සැලැස්විය යුතු ය.

එසේ වුවද ජනේල වසා තැබීම අවශ්‍ය වන තත්ත්වයක කාලගුණයක් පවතින විට බලපත්‍රලාභීන් විසින් යම් ජනේලයක් විවෘත කිරීමට සැලැස්වීම හෝ විවෘත කර තැබීමට සැලැස්වීම හෝ අවශ්‍ය නොවන්නේ ය.

12. සෑම වර්ෂයකදීම මාර්තු, ජුනි, සැප්තැම්බර් සහ දෙසැම්බර් යන මාසවලදී හතර වතාවක් සහ සභාපතිවරයා විසින් ලියවිල්ලකින් නියම කරනු ලබන වෙනත් අවස්ථාවල සෑම කාමරයකම අභ්‍යන්තර බිත්ති සහ සීලිං, හුණු පිරියම් කිරීමටද දැවයෙන් කල කොටස් හුණු පිරියම් කිරීමට ද ඒවා තෙල් සායම් කොට ඇත්නම් උනු ජලය සහ සබන් යොදා සේදීමටද ලැගුම් නිවාසයක සෑම බලපත්‍රලාභියකුම සැලැස්විය යුතු ය.

13. ලැගුම් නිවාසයකට සෑම බලපත්‍රලාභියකුම ලැගුම් නිවාසයේ සෑම කොටසක්ම එහි වටාපිටාව සහ කාණු හොඳින් අළුත්වැඩියා කර පිරිසිදුව සහ බලයලත් ස්ථානයේ යම් කාණුවකින්, වැසිකිළියකින්, කසල වලකින් හෝ වෙනත් පීඩාවකින් උද්ගත වන දුර්වායුවලින් තොරව තබා ගැනීමට සැලැස්විය යුතු ය. ගෘහ භාණ්ඩ භාජන සහ උපකරණ පිරිසිදු සහ සනීපාරක්ෂක තත්වයකින් තබා ගැනීමට ඔහු සැලැස්විය යුතු ය.

14. ලැගුම් නිවාසයකට සෑම බලපත්‍රලාභියකුම මධ්‍යහ්නයට පෙර දිනකට යටත් පිරිසෙයින් එක් වරක්වත් සෑම කාමරයක්ම, දොරස්සක්ම, හිණ පොළක්ම, බරාදයක්ම, කාණුවක්ම සහ ස්ථානයට අයත් ඉඩමක් ම අතුගෑමට සැලැස්විය යුතු ය.

15. ලැගුම් නිවාසයක සෑම බලපත්‍රලාභියකුම පිසින ලද සියලු ආහාර මැසි මදුරුවන්ට සහ කෘමීන්ට ඇතුළුවිය නොහැකි ආකාරයට තබා ගැනීමට සැලැස්විය යුතු ය.

16. ලැගුම් නිවාසයක සෑම බලපත්‍රලාභියකුම, සියලු කුණු රොඩු ගෘහය අපද්‍රව්‍ය, හෝ වෙනත් පීඩාකාරී ද්‍රව්‍ය ලෝහවලින් හෝ මල නොබැඳෙන යකඩින් හෝ සාදන ලද ආවරණ භාජනයට වහාම තැබීමටත්, දිනපතා එකී ස්ථානයෙන් ඉවත් කරනු ලැබීමටත්, සැලැස්විය යුතු ය. අපද්‍රව්‍ය ඇත්ත වශයෙන්ම එහි බහාලන අවස්ථාවලදී හැර, භාජනය සෑම විටම වසා තැබිය යුතු ය.

17. ලැගුම් නිවාසයක කිසිම බලපත්‍රලාභියකු විසින්, යම් බෝවන, ස්පර්ශයෙන් බෝවන, හෝ චර්මගත රෝගයකින් පෙළෙන කිසිම තැනැත්තෙකු තම ස්ථානයකට ඇතුළත් කර ගැනීම කරනු නොලැබිය යුතු ය.

18. (i) ලැගුම් නිවාසයක යම් තැනැත්තෙකුට, බෝවන ස්පර්ශයෙන් බෝවන හෝ චර්මගත රෝගයකින් වැළඳුන හොත් එම ලැගුම් නිවාසයේ බලපත්‍රලාභි විසින්, ඒ බව ලැගුම් නිවාසය පිහිටා ඇති කොට්ඨාසයේ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයා වෙත හෝ සභාපතිවරයා වෙත හෝ වහාම දැනුම් දෙනු ලැබිය යුතු ය. එම ලැගුම් නිවාසයේ බලපත්‍රලාභි විසින් සභාපතිවරයා විධාන ආකාරයට එම නිවාසය පොදු වියදමින් දුම් ගසා විෂබීජ නසා හුණු පිරියම් කිරීමට සැලැස්විය යුතු ය.

(ii) එම ස්ථානය පරීක්ෂා කරනු ලැබ රෝග බෝවීමෙන් එම ස්ථාන නිදහස් බවට සභාපතිවරයා විසින් සහතික කරනු ලබන තුරු (i) වන ඡේදයෙහි සඳහන් ලැගුම් නිවාසයක බලපත්‍රලාභියා විසින් කිසිදු ගනුදෙනුකරුවකු ඇතුළත් කර ගැනීම කරනු නොලැබිය යුතු ය.

19. ලැගුම් නිවාසයකට කිසිදු බලපත්‍රලාභියකු විසින්, ගොඩනැගිල්ල තුළ ගවයන්, එළුවන් හෝ කුකුළන් තබා ගැනීමට ඉඩ නොදිය යුතු ය.

20. ලැගුම් නිවාසයක සෑම බලපත්‍රලාභියකු විසින්ම එම නිවාසයට අයත් සෑම දිය වැසිකිළියක්ම හෝ අතු ගෙයකම ආසනය බිම සහ බිත්ති පිරිසිදු සහ සනීපාරක්ෂක තත්වයෙන් තබා ගැනීමේ කාර්යය සඳහා අවශ්‍යතාක් දුරට එම ආසනය බිම සහ බිත්ති කලින් කල පිරිසිදු කිරීමට සලස්වනු ලැබිය යුතු ය.

21. ලැගුම් නිවාසයක සෑම බලපත්‍රලාභියකුම එම නිවාසයේ පාවිච්චි කරනු ලබන සියලු පැදුරු සහ ඇඳ ඇතිරිලි කොට්ට මෙට්ට සහ සෑම ඇඳ ආවරණයක්ම පිරිසිදු හා සනීපාරක්ෂක තත්වයේ තබා ගැනීමේ කාර්යය සඳහා අවශ්‍ය වන තාක් දුරට එම පැදුරු ඇඳ ඇතිරිලි කොට්ට මෙට්ට සහ ඇඳ ආවරණ කලින් කල පිරිසිදු කරනු ලැබීමට සැලැස්විය යුතු ය.

22 (i) සභාපතිවරයා විසින් හෝ සභාපතිවරයා විසින් ඒ සඳහා සාමාන්‍යයෙන් හෝ විශේෂයෙන් ලියවිල්ලකින් බලය ආවරණය ලද ප්‍රාදේශීය සභාවේ වෙනත් යම් නිලධාරියකු විසින් හෝ සියලු සාධාරණ වේලාවල දී යම් ලැගුම් නිවාසයකට ඇතුළුව එය පරීක්ෂා කරනු ලැබීමට නීත්‍යානුකූල වන්නේය.

(i) ලැගුම් නිවාසයේ බලපත්‍රලාභි හෝ එය භාරව සිටින තැනැත්තා හෝ විසින් සභාපතිවරයාට හෝ සභාපතිවරයා විසින් ලියවිල්ලකින් බලය පවරනු ලද යම් නිලධාරයකුට ලැගුම් නිවාසයට ඇතුළුව පරීක්ෂා කිරීමට ඉඩදිය යුතු අතර, එම සභාපතිවරයා හෝ නිලධාරයාට අවශ්‍ය විය හැකි සියලු සහාය ඔහු විසින් ලබාදෙනු ලැබිය යුතු ය.

23. මෙම අතුරු ව්‍යවස්ථාවලින් කිසිවක් කඩ කරන සෑම තැනැත්තකුම වරදක් කරන අතර, නිසි අධිකරණයක වරදකරු කළ විට රුපියල් හත්සිය පනහකට නොවැඩි දඩයකින් ද වරද දිගටම කරගෙන යන අවස්ථාවක එසේ වරදකරු කරනු ලැබීමෙන් පසුව හෝ එම කඩකිරීම් පිළිබඳව අවධානය යොමු කරවමින් සභාපතිවරයාගෙන් හෝ සභාපතිවරයා විසින් බලය පවරන ලද නිලධාරියකුගෙන් ලියවිල්ලකින් වූ දැන්වීමක් භාරදීමෙන් පසුව, හෝ කඩ කිරීම දිගටම කරගෙන එක් එක් දිනය සඳහා රුපියල් දෙසිය පනහකට නොවැඩි අතිරේක දඩයකින් ද දඬුවම් කරනු ලැබිය යුතු ය.

24. නිසි අධිකරණ බලය ඇති අධිකරණයක් විසින් පනවනු ලබන වෙනත් යම් දණ්ඩනයකට අතිරේකව මේ අතුරු ව්‍යවස්ථාවලින් කිසිවක් දෙවරක් හෝ ඊට වැඩි අවස්ථා ගණනක හෝ කඩ කිරීම සම්බන්ධයෙන් වරදකරු වූ බලපත්‍රලාභියකුගේ බලපත්‍රය, එම අධිකරණය විසින් අවලංගු කරනු ලැබීම නීත්‍යානුකූල වන අතර, එම අවලංගු කිරීම වෙනුවෙන් යම් වන්දියක් ලබා ගැනීමේ අයිතියක් එම බලපත්‍රලාභියාට නොතිබිය යුතු ය.

### 12. අතුගෙවල් සහ වැසිකිළි ඉදිකිරීම සහ නඩත්තු කිරීම

01. යම් ස්ථානයක අයිතිකරු හෝ පදිංචිකරු විසින් (මෙහි මින් මතු "සභාපතිවරයා") යනුවෙන් හඳුන්වනු ලබන ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයාගෙන් ඒ සඳහා අවසර පත්‍රයක් ලබාගෙන ඇත්නම් මිස එම ස්ථානයෙහි යම් අතු ගෙයක් හෝ වැසිකිළියක් ඉදිකරනු නොලැබිය යුතු ය.

02. යම් තැනැත්තකු 1 වන අතුරු ව්‍යවස්ථාව යටතේ අවසර පත්‍රයක් සඳහා ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කරනු ලබන අවස්ථාවක ඔහු ඉදිකිරීමට අදහස් කරන අතුගෙයි හෝ වැසිකිළියක් හෝ සැලැස්මක් සහ පිරිවිතර සපයන ලෙස සභාපතිවරයා විසින් එම තැනැත්තාට නියම කරනු ලැබිය යුතු ය.

03. සභාපතිවරයා විසින් 1 වන අතුරු ව්‍යවස්ථාව යටතේ ප්‍රදානය කරනු ලබන අවසර පත්‍රයක් මගින් ප්‍රාදේශීය සභාව විසින් අනුමත කරන ලද වර්ගය සහ එම අවසර පත්‍රයෙහි නිශ්චිත කරනු ලැබ ඇති ස්ථානයෙහි එහි නිශ්චිත ආකාරයක අතුගෙයක් හෝ වැසිකිළියක් සපයන ලෙස ඉල්ලුම්කරුට විධාන කරනු ලැබිය හැකිය.

04. සභාපතිවරයාගෙන් අවසර පත්‍රයක් නොමැතිව හෝ 1 වන අතුරු ව්‍යවස්ථාව යටතේ නිකුත් කරන ලද අවසර පත්‍රයක නිශ්චිත කිසියම් නියමයකට පටහැනිව හෝ, යම් ස්ථානයක යම් අතුගෙයක් හෝ වැසිකිළියක් හෝ ඉදිකරනු ලැබ ඇත්නම්, සභාපතිවරයා විසින් ම එම ස්ථානයෙහි අයිතිකරු හෝ පදිංචිකරු හෝ වෙත භාරදෙනු ලබන ලියවිල්ලකින් වූ දැන්වීමක් මගින් එම අතුගෙය හෝ වැසිකිළිය එම දැන්වීමෙහි නිශ්චිත කාලසීමාව ඇතුළත වසා දමන ලෙස එම අයිතිකරුට හෝ පදිංචිකරුට විධාන කරනු ලැබිය හැකිය.

05. සභාපතිවරයා විසින් ලියවිල්ලකින් වූ දැන්වීමක් යම් ස්ථානයක පදිංචිකරු හෝ අයිතිකරු වෙත භාරදීමෙන් ප්‍රාදේශීය සභාව විසින් අනුමත කරන ලද පරිමානයක සහ වර්ගයක අතුගෙයක් හෝ වැසිකිළියක් එම දැන්වීමෙහි නිශ්චය කර ඇති ආකාරයට සහ එහි නිශ්චිත කර ඇති සම්බන්ධිත කාණු ඇතිව එම ස්ථානයෙහි ඉදිකරන ලෙස එම ස්ථානයේ අයිතිකරු හෝ පදිංචිකරු වෙත විධාන කරනු ලැබිය හැකිය.

06. සභාපතිවරයාගේ මතයට අනුව, යම් අතුගෙයක් හෝ වැසිකිළියක් -

*(අ)* ගොඩ නැගීමේ ව්‍යුහය සම්බන්ධයෙන් දෝෂ සහතික නම් ; හෝ
*(ආ)* එය පාවිච්චි කරනු ලබන්නේ යම් කාර්යයක් සඳහා ද ඒ කාර්යය සඳහා නුසුදුසු නම්; හෝ
*(ඇ)* සනීපාරක්ෂක නොවේ නම් හෝ සෞඛ්‍යට හානිකර නම්; හෝ
*(ඈ)* වසුරු ඉවත් කිරීම සඳහා ප්‍රාදේශීය සභාව විසින් සපයා ඇති මාර්ගයකට සම්බන්ධ නොවේ නම් හෝ ඉන් පහසුවෙන් සේවයක් සැපයිය නොහැකි නම්.

අතුගෙය හෝ වැසිකිළිය සපයා ඇති යම් ස්ථානයක් අයිතිකරු හෝ පදිංචිකරු වෙත භාර දෙනු ලබන ලියවිල්ලක් වූ දැන්වීමක් මගින් ඒ දැන්වීමේ නිශ්චිත කාලය ඇතුළත එහි සඳහන් ආකාරයට එම අතුගෙය හෝ වැසිකිළිය හෝ අළුත්වැඩියා කරන ලෙස, වෙනස් කරන ලෙස හෝ නැවත ඉදිකිරීමක් ලෙස සභාපතිවරයා විසින් එම අයිතිකරුට හෝ පදිංචිකරුට හෝ විධාන කරනු ලැබිය හැකිය.

07. අතුගෙයක්, වැසිකිළියක් සපයා ඇති යම් ස්ථානයක සෑම පදිංචිකරුවකුම, සියලුම කාල වේලාවලදීම එම අතුගෙය හෝ වැසිකිළිය සනීපාරක්ෂක තත්ත්වයකින් සහ හොඳ අළුත්වැඩියා කල තත්ත්වයකින් පවත්වාගත යුතු ය.

08. කිසියම් නිශ්චිත ප්‍රදේශයක වගුරු කාර්යක්ෂම ඉවත් කිරීම සඳහා එම ප්‍රදේශයේ ස්ථානවල අයිතිකරුවන් හෝ පදිංචිකරුවන් විසින් පටු මාවත් සපයනු ලැබිය යුතු යැයි ප්‍රාදේශීය සභාව විසින් යෝජනා සම්මුතියක් මගින් තීරණය කරනු ලබන කිනම් අවස්ථාවක වුවද, සභාපතිවරයා විසින් එම ප්‍රදේශය යම් ස්ථානයක අයිතිකරු හෝ පදිංචිකරු වෙත භාර දෙනු ලබන ලියවිල්ලකින් වූ දැන්වීමක් මඟින්, එම දැන්වීමෙන් නිශ්චිත කාලය තුළ කිසිදු විට මීටර් 30ට වැඩි නොවන පළලකින් යුක්ත එහි සඳහන් තත්වයක පටු මඟක් සභාපතිවරයා විසින් එම දැන්වීමෙහි නිශ්චිත කරනු ලබන ආකාරයකට සපයන ලෙස සභාපතිවරයා විසින් විධාන කරනු ලැබිය හැකිය.

09. යම් තැනැත්තකු විසින් ඉදිකිරීමට අදහස් කරන යම් ගොඩනැගිල්ලක යම් සැලැස්මක් සටහනක් හෝ පිරිවතරයක් සභාපතිවරයා විසින් අනුමත කිරීම සභාව විසින් අනුමත කරන ලද පරිමාණයක් සහ වර්ගයක අතුගෙයක් හෝ වැසිකිළියක් ඒ ගොඩනැගිල්ලෙහි ඉදිකිරීමට එම තැනැත්තා එකඟ වුවහොත්, මිස ප්‍රතික්ෂේප කරනු ලැබිය හැකිය.

10. යම් අතුරු ව්‍යවස්ථා යටතේ දැන්වීමක් භාර දෙනු ලැබුවේ යම් තැනැත්තකු වෙත ද ඒ සෑම තැනැත්තකුම ඒ දැන්වීමෙහි නිශ්චිත කාල සීමාව ඇතුළත ඒ දැන්වීමේ නියමයන්ට අනුව කටයුතු කළ යුතු ය.

11. මේ අතුරු ව්‍යවස්ථාවලින් කිසිවක් කඩ කරන සෑම තැනැත්තකුට වරදක් කරන අතර, එසේ වරකදරු කරනු ලැබීමේ දී රුපියල් හත්සිය පනහකට වැඩි නොවන දඩයකට ඔහු යටත් විය යුතු ය.

### 13. ග්‍රැමපොන්, ශබ්ද වාහිනී යන්ත්‍ර යනාදිය ක්‍රියා කරවීම

1. කිසිම තැනැත්තකු විසින් ප්‍රාදේශීය සභා ප්‍රදේශය ඇතුළත, ග්‍රැමෆෝනයක් ශබ්ද වාහිනී යන්ත්‍රයක්, ශබ්ද විකාශන යන්ත්‍රයක් හෝ ස්වයංක්‍රීය හෝ යාන්ත්‍රිකව ශබ්දය නිපදවන හෝ ප්‍රතිරාවය කරන වෙනත් උපකරණයක් ක්‍රියා කරවීමෙන් හෝ ක්‍රියා කරවීමට සැලැස්වීමෙන් හෝ ක්‍රියා කරවීමට වෙනත් තැනැත්තෙකුට ඉඩ දීමෙන්, එම ශබ්දයේ අධිකතාවය හෝ පුනරාවර්තය හෝ එහි අඛණ්ඩ ස්වභාවය හේතු කොටගෙන අසල්වාසී ස්ථානවල අයිතිකරුවනට පීඩාකාරී යන යම් ශබ්දයක් නිපදවීම හෝ එසේ කිරීමට සැලැස්වීම හෝ කරනු නොලැබිය යුතු ය.

2. ඉහත සඳහන් අතුරු ව්‍යවස්ථාව සම්බන්ධයෙන් කරනු ලබන සෑම කඩ කිරීමක් සඳහාම රුපියල් හත්සිය පනහකට නොවැඩි දඩයකින් දඬුවම් කළ යුතු ය.

3. එසේ වුවද, වීදියක්, ප්‍රසිද්ධ ස්ථානයක්, සාප්පුවක් හෝ ව්‍යාපාරික ස්ථානයක් හෝ මහජනයා ඇතුළත් කර ගනු ලබන්නා වූ ද යම් වීදියකට හෝ ප්‍රසිද්ධ ස්ථානයකට යාබද වූ ස්ථානයක් නොවන ස්ථානයක ඉහත කී පරිදි යම් උපකරණයක් ක්‍රිය කරවන, ක්‍රියා කරවීමට සලස්වන හෝ ක්‍රියාකරවීමට වෙනත් යම් තැනැත්තකුට ඉඩදෙන යම් තැනැත්තකුට විරුද්ධව එවැනි යම් කඩ කිරීමක් සම්බන්ධයෙන්,

*(අ)* ප්‍රාදේශීය සභාවේ "සභාපතිවරයා" වෙත පීඩාව බලපෑ අසල්වාසී ගෘහ මූලිකයන් තිදෙනෙකුට නොඅඩු සංඛ්‍යාවක් විසින් පීඩාව පිළිබඳව ලියවිල්ලකින් පැමිණිලි කර ඇත්නම්; සහ

*(ආ)* ලැබී ඇති පැමිණිල්ලෙහි ස්වභාවය සඳහන් කරමින් වහාම හෝ නිශ්චිත කාල සීමාවක් ඇතුළත හෝ පීඩාව නතර කරන ලෙස ඉල්ලමින් සභාපතිවරයා විසින් ඒ තැනැත්තා වෙත ලියවිල්ලකින් වූ දැන්වීමක් භාර දී ඇත්නම්, සහ

*(ඇ)* එම දැන්වීම ලැබුන විට වහාම හෝ නිශ්චිත කාල සීමාව ඇතුළත හෝ ඒ අනුව කටයුතු කිරීම ඒ තැනැත්තා පැහැර හැර හෝ මිස නඩු, කටයුතු පවරනු නොලැබිය යුතු ය.

### *14 හෝටල්*

1. (i) මෙහි මින් මතු "සභාපතිවරයා" යනුවෙන් හැඳින්වෙන, ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා විසින් තත් කාර්ය සඳහා නිකුත් කරන ලද බලපත්‍රයක් ඇතිව හැර කිසිම තැනැත්තකු විසින්, හෝටලයක් පවත්වා ගෙන නොයා යුතු ය.

(ii) මේ අතුරු ව්‍යවස්ථාවේ (1) වන ඡේදය යටතේ නිකුත් කරන ලද සෑම බලපත්‍රයක්ම, එය 22 වන අතුරු ව්‍යවස්ථාව යටතේ කලින් අවලංගු කරනු ලැබුවහොත් මිස එය නිකුත් කර ඇත්තේ නම් වර්ෂයක් සඳහා ද ඒ වර්ෂයේ දෙසැම්බර් මස තිස් එක් වන දින අවසාන වන්නේය.

2. බලපත්‍රය ලබාගැනීමට ඇති ස්ථානය මෙහි පහත දැක්වෙන කොන්දේසිවලට අනුකූල වන්නේ නම් මිස, කිසිම තැනැත්තකුට හෝටලයක්, පවත්වාගෙන යාම සඳහා බලපත්‍රයක් ලැබීමට හිමිකම් නොමැත.

- (i) ස්ථානය ශක්තිමත්ව ඉදිකර තිබිය යුතු අතර මනා අළුත්වැඩියා තත්වයෙන් තිබිය යුතු ය. තවද සෑම කාමරයකටම හොඳින් වාතාශ්‍රය සහ ආලෝකය සපයා තිබිය යුතු අතර, විවෘත කළහැකි ජනෙල් සවිකර තිබිය යුතුය. විවෘත කළ විට ජනෙල්වල වර්ග ප්‍රමාණය, කාමරයේ පොළොව මතුපිට වර්ග ප්‍රමාණයෙන් පහළොවෙන් එක් පංගුවකට වඩා අඩු නොවිය යුතුය. සෑම කාමරයකටම අවම භූමි ප්‍රමාණය වර්ග මීටර් 11.15 ක් විය යුතු ය ;
- (ii) සෑම කොටසකට සෑම කාමරයකම බිත්ති උසින් මීටර් 3.05කට නොඅඩු විය යුතු අතර, හුණු පිරියම් කර තිබිය යුතු ය;
- (iii) අගුව පොළොව මට්ටමේ සිට යටත් පිරිසෙයින් මීටර් 1.83ක් උසින් විය යුතු ය;
- (iv) වහළ යම් ස්ථිර ද්‍රව්‍යයකින් තනා තිබිය යුතු ය;
- (v) ලීයෙන් කළ සියලු කොටස් තෙල් සායම් හා හෝ හුණු පිරියම් කර තිබිය යුතු ය;
- (vi) බිම්මහලෙහි බිම සම්පූර්ණයෙන් සිමෙන්ති දමා තිබිය යුතු ය;
- (vii) ස්ථානයට ප්‍රමාණවත් ජලාප්‍රවහයක් සපයා තිබිය යුතු ය;
- (viii) ස්ථානයට ප්‍රමාණවත් විශාලත්වයකින් යුත් කසළ භාජන, නිවාසයෙන් ඉවතලන ද්‍රව්‍ය දැමීම සඳහා ප්‍රමාණවත් සංඛ්‍යාවක් තිබිය යුතු ය;
- (ix) සියලු සෞඛ්‍යාරක්ෂක අවශ්‍යතා සපුරාලීමට සඳහා ප්‍රමාණවත් ස්නානය කිරීමේ සහ වැසිකිළි පහසුකම් ද සපයා තිබිය යුතු ස්ථානය සඳහා බලපත්‍රය ලබාගන්නේ තැනැත්තන් යම් සංඛ්‍යාවක්ගේ ඉඩ පහසුකම් සඳහා ද ඒ සෑම දස දෙනෙකුටම යටත් පිරිසෙයින් එක් වැසිකිළියක් බැගින් වනසේ එම වැසිකිළි පහසුකම් සමන්විත විය යුතු ය;
- (x) ස්ථානයකට සුදුසු ජලසම්පාදනයන් සපයා තිබිය යුතුය. ස්නානය කරන තැනැත්තන් නිසා බීමට සපයා ඇති ජලය අපවිත්‍රවීම වැලැක්වන සේ බීමට ගන්නා ජලය සැපයුම සහ ස්නානය කිරීමේ ඉඩ පහසුකම් පිළියෙල කර තිබිය යුතු ය;
- (xi) මැනවින් දුම් පිටවන දුම් කවුළුවක් සහිත මුළුතැන් ගෙයක් ලෙස වෙන් කරන ලද වෙනම කාමරයක් ස්ථානයෙහි තිබිය යුතු ය;

03. (1) යම් හෝටලයක් සඳහා බලපත්‍රයක් නිකුත් කර ඇති කාලසීමාව තුළ යම් අවස්ථාවක ඒ හෝටලයේ කාර්ය සඳහා පාවිච්චි කරන ගොඩනැගිල්ල (2) වන අතුරු ව්‍යවස්ථාවේ විධිවිධාන වලට අනුකූල නොවන තත්වයකට පත් වුවහොත් ඒ ගොඩනැගිල්ල එකී විධිවිධාන වලට අනුකූල තත්වයකට පත් කිරීම සඳහා අවශ්‍ය සියලු දෑ දැක්වීමේ නිශ්චිත කොට දැක්වෙන දිනයකට පෙර සිදු කරන ලෙස නියම කරන දැන්වීමක් සභාපතිවරයා විසින් හෝටලයේ බලපත්‍රධාරියා වෙත භාර කරවීමට සැලැස්විය යුතු ය.

(2) මේ අතුරු ව්‍යවස්ථාවේ (1) වන ඡේදය යටතේ ලිඛිත දැන්වීමක් භාරදෙනු ලැබූ කිසිම හෝටල් බලපත්‍රලාභියෙක් ඒ දැන්වීමේ නිශ්චිත කොට දැක්වෙන කාලය ඇතුළත ඒ දැන්වීම අනුව කටයුතු කිරීම පැහැර නොහැරිය යුතු ය.

(3) මේ අතුරු ව්‍යවස්ථාවේ (1) වන ඡේදය යටතේ වූ කවර හෝ දැන්වීමක් බලපත්‍රධාරියෙකු හෝටල් ව්‍යාපාරය කරගෙන යන ස්ථානයේ ඇලවූවහොත් හෝ බලපත්‍රධාරියා විසින් ඒ ස්ථානයේ සේවයේ නියුක්ත කර ඇති තැනැත්තෙකු වෙත තබා ගියහොත් එය බලපත්‍රධාරියාට භාරදෙනු ලැබ ඇතැයි සැලකිය යුතු ය.

04. සෑම හෝටල් බලපත්‍රධාරියෙකුම හෝටල පිළිබඳ වන මේ අතුරු ව්‍යවස්ථාවල සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවලින් වූ පිටපතක් රාමුකර, හෝටලයේ ප්‍රකටව පෙනෙන තැනක එල්ලා තැබීමට සැලැස්විය යුතුය. ඔහු විසින් ඔහුගේ සියලුම සේවා නියුක්තයන්ගේ නම සහ ලිපින දැක්වෙන ලැයිස්තුවක් සභාපතිවරයා විසින් හෝ ඔහු විසින් බලය දෙන ලද යම් තැනැත්තකු විසින් හෝ සියලු යුක්ති සහගත වේලාවන්හි පරීක්ෂා කළ හැකි වන සේ බලපත්‍රයක් ස්ථානයෙහි තබා ගත යුතු ය.

05. හෝටලයක් සඳහා වන සෑම බලපත්‍රයකට ඒ බලපත්‍ර ලත් ස්ථානයේ සැලැස්මක් අමුණා තැබීමට, සභාපතිවරයා විසින් සැලැස්විය යුතු අතර, ඒ සැලැස්මේ නිදන කාමර සහ ඒ එක් කාමරයේ බිම් ප්‍රමාණයන් එක් තැනැත්තකු සඳහා වන ඉඩ ප්‍රමාණය වර්ග මීටර් 3.72 කට වැඩි වන පරිදි ඒ එක් එක් කාමරයේ නිදා ගැනීමට අවසර ඇති තැනැත්තන් සංඛ්‍යාව පෙන්නුම් කළ යුතුය. වයස අවුරුදු, දහයට අඩු ළමයින් දෙදෙනෙකු මේ අතුරු ව්‍යවස්ථාවේ කාර්ය සඳහා එක් තැනැත්තකු ලෙස ගණන් ගත යුතු ය.

06. බලපත්‍රයට අමුණා ඇති හෝටලයේ සැලැස්ම, නිදන කාමර ලෙස නිශ්චිතව වෙන්කර ඇති කාමරයට හැර කිසිම තැනැත්තකුට හෝටලයේ නිදා ගැනීමට කිසිම හෝටල බලපත්‍රධාරියෙකු විසින් ඉඩ නොදිය යුතු ය.

07. සැලැස්මේ නිශ්චිතව දැක්වෙන සංඛ්‍යාවට වැඩි තැනැත්තන් සංඛ්‍යාවකට කිසිම කාමරයක නිදා ගැනීමට කිසිම හෝටල් බලපත්‍රධාරියෙකු විසින් ඉඩ නොදිය යුතු ය.

08. බලපත්‍රලත් ස්ථානයෙහි නතර වී සිටින එක් එක් තැනැත්තාගේ නම, රක්ෂාව, උපන් ස්ථානය සහ අවසාන තාවකාලික හෝ ස්ථිර ලිපිනය දැක්වෙන ලේඛනයක් සෑම හෝටල් බලපත්‍රධාරියෙකු විසින් ම තබාගත යුතු ය.

09. එක් එක් නිදන කාමරයේ ජනෙල්, සෑම දිනයකම යටත් පිරිසෙයින් පැය 4ක් වත් සම්පූර්ණයෙන් විවෘත කර තැබීමට සෑම හෝටල බලපත්‍රධාරියෙකු විසින්ම සැලැස්විය යුතු ය.

එසේ වුවද, කාලගුණ තත්වය අනුව ජනේල වසා තැබීම අවශ්‍ය වන අවස්ථාවන්හීදී යම් ජනේලයක් විවෘත කළ යුතු යයි හෝ විවෘත කර තැබිය යුතු යැයි බලපත්‍රධාරියාට නියම නොකළ යුතු ය.

10. සෑම හෝටල් බලපත්‍රධාරියෙකු විසින්ම අවුරුද්දකට වරක් දෙසැම්බර් මාසයේ දී සභාපතිවරයා විසින් ලියවිල්ලකින් නියම කරනු ලැබිය හැක. වෙනත් යම් වේලාවන්හිදී ද, සෑම කාමරයකම ඇතුළත බිත්ති හුණු පිරියම් කිරීමටත් ලීයෙන් කළ කොටස් හුණු පිරියම් කිරීමට හෝ තෙල් සායම් ආදිය කර ඇත්නම් සබන් යොදා උණුවතුරෙන් සේදීමටත් සැලැස්විය යුතු ය.

11. සෑම හෝටල් බලපත්‍රධාරියෙකු විසින්ම හෝටලයේ සෑම කොටසක්ම සහ එය වට ඇති කාණු පිරිසිදුව සහ මනා අළුත්වැඩියාවෙන් යුතුව ඇති කාණුවකින් වැසිකිළියකින් හෝ බලපත්‍රයක් ස්ථානයේ ඇති වෙනත් පීඩාකාර තැනකින් මතුවන දුර්ගන්ධයකින් තොරව ද තබා ගැනීමට සැලැස්විය යුතු ය.

12 (1) සෑම හෝටල් බලපත්‍රධාරියෙකු විසින්ම මධ්‍යාහ්නයට පෙර යටත් පිරිසෙයින් දවසකට වරක්වත් සෑම කාමරයක් දොරස්සක්, හිණිලෙසත්, ආලින්දයක් සහ කාණුවක් ද බලපත්‍රලත් ස්ථානයට අයත් ඉඩම ද අතු ගෑමට සැලැස්විය යුතු ය.

(2) සෑම හෝටල් බලපත්‍රධාරියෙකු විසින්ම සියලු කැලිකසල ගෘහ අපද්‍රව්‍ය සහ වෙනත් පීඩාකාරී දෑ, අප්‍රමාදව සින්ක් තහඩුවෙන් හෝ ගැල්වනයිස් යකඩයෙන් තැනූ ආවරණය කළ අපරාගම්‍ය භාජනයකට දැමීමට සැලැස්විය යුතු අතර, ඒවා බලපත්‍රලත් ස්ථානයෙන් දිනපතාම ඉවත් කරනු ලැබීමටද සැලැස්විය යුතු ය. එම කැලිකසල ගෘහ අපද්‍රව්‍ය හෝ පීඩාකාරී දෑ භාජනයකට බහාලන අවස්ථාවේදී හැර අන් සෑම වේලාවකම ඒ භාජනය වසා තැබිය යුතු ය.

13. පිසින ලද සියලු ආහාර මැස්සන්ගෙන් සහ වෙනත් කෘමීන්ගෙන් ආරක්ෂාවන පරිදි තැබීමට සෑම හෝටල් බලපත්‍රධාරියෙකුම විසින් ම සැලැස්විය යුතු ය.

14. යම් ආසාදන ස්පර්ශක හෝ චර්මගත රෝගයකින් පෙළෙන කිසිම තැනැත්තකු බලපත්‍රලත් ස්ථානයට කිසිම බලපත්‍රධාරියෙකු වීම, පිටින් ඇතුළුකර නොගත යුතු ය.

15. හෝටලයේ සිටින යම් තැනැත්තෙක් යම් ආසාදන හෝ ස්පර්ශගත රෝගයකින් රෝගී වුවහොත් ඒ හෝටලයේ බලපත්‍රලාභියා ඒ බව හෝටලය පිහිටා ඇති කොට්ඨාසයේ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයාට හෝ සභාපතිවරයාට හෝ අප්‍රමාදව දැනුම්දිය යුතු අතර, හෝටලය හිස් නොකරන ලෙස සභාපතිවරයා විසින් නියම කරනු ලැබුවහොත් බලපත්‍රධාරියා විසින් එය එසේ හිස් කළ යුතු ය.

තවද, ඒ ආසාදනයට පාත්‍ර වූ තැනැත්තා විසින් පාවිච්චි කරන ලද ඇඳ ඇතිරිලි, රෙදිපිළි වෙනත් භාණ්ඩවල විෂබීජ නැසීමට හෝ අවශ්‍ය වුවහොත්, ඒවා විනාශ කිරීමට ද සභාපතිවරයා විධාන කරන ආකාරයට, මහජන මුදලින් එය ද ධූමායනය කිරීමට, එහි විෂබීජ නැසීමට සහ හුණු ආලේප කිරීමට ඒ බලපත්‍රධාරියා විසින් ඉඩදෙනු ලැබිය යුතු ය.

16. ආසාදක හෝ ස්පර්ශක රෝගයකින් පෙළෙන තැනැත්තකු සොයාගනු ලැබූ හෝටලයකට, කිසිම හෝටල බලපත්‍රධාරියෙකු විසින් ඒ බලයලත් ස්ථානය ආසාදනයෙන් තොර බවට සභාපතිවරයා විසින් පරීක්ෂා කර සහතික කරන තෙක්, කිසිම ගනුදෙනුකාර අනුග්‍රාහකයෙකු භාර නොගත යුතුයි.

17. හෝටලය ඇතුළත ගවයින්, එළුවන් හෝ කුකුළන් තබා ගැනීමට කිසිම හෝටල බලපත්‍රධාරියෙකු විසින් ඉඩ නොදිය යුතු ය.

18. සෑම හෝටල බලපත්‍රධාරියෙකුම, බලපත්‍රලත් ස්ථානය මීයන්ගෙන්, දඩාවතේ යන බල්ලන්ගෙන්, බළලුන්ගෙන් සහ ගවයන්ගෙන් ද මැස්සන්ගෙන්, මදුරුවන්ගෙන් සහා රෝගී වාහක කෘමීන්ගෙන් ද තොරව තබා ගත යුතු ය.

19 (1) සභාපතිවරයා හෝ සභාපතිවරයා විසින් තත් කාර්ය සඳහා පොදුවේ හෝ විශේෂයෙන් බලය දෙන ලද ප්‍රාදේශීය සභාවේ යම් නිලධාරියෙකු හෝ විසින් සියලු යුක්තිසහගත වේලාවන්හිදී කවර හෝ හෝටලයකට ඇතුළුවීම සහ එය පරීක්ෂා කිරීම නීත්‍යානුකූල වන්නේය.

(2) සභාපතිවරයාට හෝ හෝටලයක් පවත්නා ස්ථානයකට ඇතුළු වී එය පරීක්ෂා කිරීමට ලියවිල්ලකින් බලය දෙනු ලැබූ යම් නිලධාරියෙකු හෝටලයේ බලපත්‍රධාරියා හෝ හෝටලය භාරව සිටින තැනැත්තා හෝ විසින් ඉඩදිය යුතු අතර, සභාපතිවරයාට හෝ ඒ වෙනත් නිලධාරියාට අවශ්‍ය විය හැකි සියලු සහාය සපයනු ලැබිය යුතු ය.

20. හෝටල් සම්බන්ධයෙන් වන මේ කවර හෝ අතුරු ව්‍යවස්ථාවක් පිළිබඳව වන සෑම උල්ලංඝනය කිරීමක්ම රුපියල් හත්සිය පණහක් නොඉක්මවා වන දඩයකින් ද ඒ උල්ලංඝනය දිගටම කරගෙන යන අවස්ථාවක, වරදකරු කරනු ලැබීමෙන් පසුව හෝ සභාපතිවරයා විසින් නැතහොත් සභාපතිවරයා විසින් බලය දෙන ලද නිලධාරියෙකු විසින් ඒ උල්ලංඝනය කෙරෙහි අවධානය යොමු කරන ලිඛිත දැන්වීමක් භාර කරවනු ලැබීමෙන් පසු හෝ ඒ වරදක් තවදුරටත් කරගෙන යන සෑම දිනයක් වෙනුවෙන්ම රුපියල් දෙසිය පණහක් නොඉක්මවන දඩයකින් ද, දඬුවම් කරනු ලැබීමට යටත් වන්නේය.

21. නිසි බලය ඇති අධිකරණයක් විසින් නියම කරනු ලැබිය හැකි වෙනත් යම් දඬුවමකට අමතරව හෝටල් සම්බන්ධයෙන් වන යම් අතුරු ව්‍යවස්ථාවක් කඩ කිරීම සම්බන්ධයෙන් දෙවරක් හෝ ඊට නොවැඩි වාර ගණනක් වරදකරු කරනු ලැබූ බලධාරියෙකුගේ බලපත්‍රය ඒ අධිකරණයක් විසින් අවලංගු කිරීම නීත්‍යානුකූල වන අතර, අවලංගු කිරීම වෙනුවෙන් කිසි වන්දියක් ලැබීමට ඒ බලපත්‍රධාරියාට හිමිකමක් නොමැති විය යුතු ය.

**15. බත්කඩ, ආපනශාලා සහ තේ හෝ කෝපි**

01. (1) (මෙහි මින්මතු "සභාපතිවරයා" යනුවෙන් සඳහන් කරනු ලබන) ප්‍රාදේශීය සභාපතිවරයා විසින් තත්කාර්යය සඳහා නිකුත් කරන ලද බලපත්‍රයක් මත මිස කිසිම තැනැත්තෙකු විසින් බත්කඩයක්, ආපනශාලායක් හෝ තේ හෝ කෝපි කඩයක් පිහිටුවීම හෝ එහි ව්‍යාපාරය කරගෙන යෑම නොකළ යුතු ය.

(2) මෙම අතුරු ව්‍යවස්ථාව (1) වන ඡේදය යටතේ නිකුත් කරන ලද සෑම බලපත්‍රයක්ම 25 වන අතුරු ව්‍යවස්ථාව යටතේ කලින් අවලංගු කරනු ලැබුවහොත්, මිස එම බලපත්‍රය නිකුත් කිරීමට විෂය වූ වර්ෂයේ දෙසැම්බර් තිස් එක් වන දින කාල අවසාන විය යුතුයි.

(3) සෑම බලපත්‍රයක්ම නිකුත් කිරීම ප්‍රාදේශීය සභා විසින් කලින් කල නියම කරනු ලබන ගාස්තුවලට යටත් විය යුතුයි.

02. බලපත්‍රය නිකුත් කරන ලද ස්ථානය පහත සඳහන් කොන්දේසිවලට අනුකූල වන්නේ නම් මිස, බත් කඩයක් හෝ ආපනශාලාවක් හෝ තේ හෝ කෝපි කඩයක් පවත්වා ගෙන යෑම සඳහා වූ බලපත්‍රයක් ලැබීමට කිසි තැනැත්තෙකු හිමිකම් නොලැබිය යුතුයි. එම කොන්දේසි මෙසේය.

6 (1) එම ස්ථානය මනා අළුත්වැඩියා තත්වයකින් ද මනා වාතාශ්‍රයකින් ද මනා ආලෝකයකින් ද යුක්තව පැවතිය යුතු අතර, සෑම කාමරයක්ම වර්ග මීටර් 11.15ක මතුපිට ප්‍රදේශයක් තිබිය යුතුය. විවෘත කළ හැකි ජනෙල් සෑම කාමරයකම සපයා තිබිය යුතු අතර, එම ජනෙල්, එම ජනෙල් විවෘත කළ විට ඒවායේ වර්ග ප්‍රමාණය මතුපිට ප්‍රදේශයේ පහළොවෙන් එකකට නොඅඩු විය යුතුයි.

(2) සෑම කොටසකම සෑම කාමරයකම බිත්ති උසින් මීටර් 2.4කට නොඅඩු විය යුතු අතර, එම බිත්ති ගඩොලින්, ගලින් හෝ කබොක් වලින් තනා ඇතුළු පැත්තේ හුණු කපරාරු කර හුණු හා තිබිය යුතු ය.

(3) පියසි කෙලවරවල් බිම් මට්ටමේ සිට යටත් පිරිසෙයින් මී. 1.83 කට උසින් තිබිය යුතු ය.

(4) වහලය යම් ස්ථිර ද්‍රව්‍යයකින් තනා තිබිය යුතුය.

(5) ලී වලින් සාදන ලද සියලු කොටස්වල තෙල් සායම් ගා හෝ හුණු ගා තිබිය යුතු ය.

(6) මුළු බිම් ප්‍රදේශයටම සිමෙන්ති දමා තිබිය යුතුය.

(7) එම ස්ථානයට මනා ජලාපවහනයක්ද සනීපාරක්ෂක කසල භාජනයක් ද ප්‍රමාණවත් වැසිකිලි පහසුකම් ද සපයා තිබිය යුතුය.

03. (1) යම් බත් කඩයක්, ආපන ශාලාවක් හෝ තේ හෝ කෝපි කඩයක් සඳහා බලපත්‍රයක් නිකුත් කරනු ලැබ ඇති කාලය තුළ යම් අවස්ථාවකදී එම බත්කඩයේ, ආපනශාලාවේ හෝ තේ හෝ කෝපි කඩයේ කාර්යය සඳහා භාවිතා කරනු ලබන යම් ගොඩනැගිල්ලක් 2 වැනි අතුරු ව්‍යවස්ථාවේ විධිවිධානවලට අනුකූලව පැවැත්වීම අවසානවන අවස්ථාවක, දැන්වීමේ නිශ්චිතව සඳහන් දිනයකට පෙර එම ගොඩනැගිල්ල, එම විධිවිධානවලට අනුකූලවන තත්ත්වයට ගෙනඒම සඳහා අවශ්‍ය සියලු දේ කරන ලෙස නියම කෙරෙන දැන්වීමක් එම බත් කඩයේ, ආපනශාලාවේ හෝ තේ හෝ කෝපි කඩයේ බලපත්‍රලාභියාට භාරදෙනු ලැබීමට සභාපතිවරයා විසින් හෝ ඔහු විසින් ලියවිල්ලකින් බලය පවරන ලද යම් තැනැත්තකු විසින් හෝ සැලැස්විය හැකිය.

(2) මේ අතුරු ව්‍යවස්ථාව (1) වැනි ඡේදය යටතේ ලිඛිත දැන්වීමක් භාරදෙනු ලැබූ කිසිම තැනැත්තෙකු එහි නිශ්චිතව සඳහන් කාලසීමාව ඇතුළත එම දැන්වීමට අනුකූලව කටයුතු කළ යුතුය.

(3) මේ අතුරු ව්‍යවස්ථාවේ (1) වැනි ඡේදය යටතේ ලිඛිත වූ යම් දැන්වීමක්, බලපත්‍රලාභියා බත් කඩයේ, ආපනශාලාවේ හෝ තේ, කෝපි කඩයේ, ව්‍යාපාරය කරගෙන යන ස්ථානයේ අලවනු ලැබුවහොත් එය බලපත්‍රලාභියා විසින් එම ස්ථානයේ සේවයේ යොදවනු ලැබ ඇති යම් තැනැත්තෙකු වෙත තබා ගියහොත් එම දැන්වීම බලපත්‍රලාභියා වෙත භාරදෙනු ලැබූ ලෙස සැලකිය යුතුය.

(4) බත් කඩයක, ආපනශාලාවක හෝ තේ හෝ කෝපි කඩයක සෑම බලපත්‍රලාභියකුම විසින් ඔහුගේ ස්ථානයේ පිටපැත්තේ ප්‍රකටව පෙනෙන ස්ථානයක සිංහලෙන්, දෙමළෙන් සහ ඉංග්‍රීසියෙන් ඔහුගේ නම සහ "බලපත්‍රලත් කඩය" හෝ "බලපත්‍රලත් ආපනශාලාව" හෝ "බලපත්‍රලත් තේ සහ කෝපි කඩය" යන වචන පැහැදිලිව පෙනෙන ආකාරයට අඳිනලද පුවරුවක් සවිකළ යුතුය.

(5) බත් කඩයක, ආපනශාලාවක, තේ හෝ කෝපි කඩයක සෑම බලපත්‍රලාභියකු විසින්ම, බත්කඩ, ආපනශාලාවක හෝ තේ හෝ කෝපි කඩ සම්බන්ධයෙන් අදාළ වන මේ අතුරු ව්‍යවස්ථාවල පිටපතක් සිංහලෙන්, දෙමළෙන් හෝ ඉංග්‍රීසියෙන් භාෂාවලින් ද බලපත්‍රය ද රාමු කරවා එම ස්ථානයේ ප්‍රධාන තැනක එල්ලා තැබිය යුතුය. එම ස්ථානයේ සේවයේ යොදවනු ලැබ සිටින සියලුම සේවා නියුක්තයන්ගේ නම සහ ලිපිනය ඇතුළත් ලැයිස්තුවක් සභාපතිවරයා විසින් හෝ ඔහු විසින් බලය දෙන ලද තැනැත්තෙකු විසින් සියලු සාධාරණ වේලාවන්වලදී පරීක්ෂාකර බැලිය හැකි වනු පිණිස එම ස්ථානයේ තබා තිබිය යුතුය.

(6) බත් කඩයක්, ආපනශාලාවක හෝ තේ හෝ කෝපි කඩයක සෑම බලපත්‍රලාභියකු විසින්ම, බලපත්‍රලත් ස්ථානයේ කොටසක් වන සෑම කාමරයකම බිත්තිවල හා සීලිමේ සෑම අවුරුද්දකට එක්වරක් දෙසැම්බර් මාසයේ දී හුණු ගෑමට සැලැස්විය යුතුය. ලී වලින් තැනූ කොටස්වල හුණු ගෑමට හෝ ඒවායේ තෙල් සායම් ගා ඇත්නම් යටත් පිරිසෙයින් අවුරුද්දකට එක් වරක්වත් දෙසැම්බර් මාසයේ දී සභාපතිවරයා විසින් හෝ ඔහු විසින් ලියවිල්ලකින් බලය දෙන ලද යම් තැනැත්තෙකු විසින් නියම කරනු ලබන වෙනත් කාලවල දී උණුදියෙන් සහ සබන් වලින් සේදීමට හෝ සැලැස්විය යුතුය.

(7) බත් කඩයක, ආපනශාලාවක හෝ තේ හෝ කෝපි කඩයක සෑම බලපත්‍රලාභියකු විසින්ම එම ස්ථානයේ සෑම කොටසක්ම ද, එහි වටපිටාව හා කාණු ද පිරිසිදුව ද මනා අලුත්වැඩියා තත්වයකින් ද බලපත්ලත් ස්ථානයේ ඇති කාණුවකින්, වැසිකිළියකින් කසල වලකින් හෝ වෙනත් පීඩාවකින් ඇතිවන දුර්ගන්ධයෙන් තොරවද පවත්වා ගැනීමට සැලැස්විය යුතුය. ආහාර හෝ පාන වර්ග පිළියෙල කිරීම, විකිණීම හෝ පරිභෝජනය කිරීම සඳහා භාවිතා කෙරෙන භාණ්ඩ, භාජන හා උපකරණ පිරිසිදු හා සනීපාරක්ෂක තත්වයකින් ද පවත්වා ගැනීමට සැලැස්විය යුතුය.

(8) යම් බත්කඩයක, ආපනශාලාවක හෝ තේ හෝ කෝපි කඩයක සෑම බලපත්‍රලාභියකු විසින්ම ආහාර හෝ පාන වර්ග පිළියෙල කිරීම, විකිණීම සහ පරිභෝජනය සඳහා වූ සියලු භාජන යටත්පිරිසෙයින් පැය විසිහතරකට වරක්වත් සබන් සහ ජලය යොදා සේදීමට සැලැස්විය යුතුය.

(9) යම් බත් කඩයක, ආපනශාලාවක හෝ තේ හෝ කෝපි කඩයක සෑම බලපත්‍රලාභියකු විසින්ම, ප්‍රයෝජනයට ගන්නා ලද සෑම භාජනයක්ම එසේ ප්‍රයෝජනයට ගැනීමෙන් පසුව වෙනත් තැනැත්තකු විසින් ප්‍රයෝජනයට ගැනීමට පළමුව ද වහාම සබන් හා ජලය යොදා සේදීමට සැලැස්විය යුතුය.

(10) යම් බත් කඩයක, ආපනශාලාවක හෝ තේ හෝ කෝපි කඩයක සෑම බලපත්‍රලාභියකු ම විසින් ව්‍යාපාර සහ ගෘහ කාර්යවලදී එකතුවන සියලු කැලි කසල අපාරගම්‍ය ද්‍රව්‍යයකින් තැනූ වැසූ භාජනයකට වහාම දැමීමට සැලැස්විය යුතු අතර, එම කැලිකසල දිනපතා එම ස්ථානයෙන් ඉවත් කිරීමට සැලැස්විය යුතුය. භාජනයේ කැලිකසල දමන අවස්ථාවේ දී හැර අන් සියලු වේලාවන්වල දී එම භාජනය ඔහු විසින් වසා තැබිය යුතුය. ඉවත දමන තේ, කෝපි, කිරි හෝ ආහාරවලින් ඉතිරි වන ද්‍රව්‍ය හෝ පිසීමේ දී ඉවතලන දේ සියල්ලම බිම නොදමා එම භාජනයට දැමීමට සැලැස්විය යුතුය.

(11) තේ, කෝපි හෝ කිරි භාරදෙන කවුන්ටරය හෝ වෙනත් ස්ථානයක තුත්තනාගම් හෝ වෙනත් අපාරගම්‍ය ද්‍රව්‍යයකින් ආවරණය කර ඇත්නම් මිස, එවැනි කවුන්ටරයක් හෝ ස්ථානයක් කිසිම බත් කඩයක, ආපනශාලාවක හෝ තේ හෝ කෝපි කඩයක බලපත්‍රලාභියකු විසින් එම කාර්යය සඳහා භාවිතා නොකළ යුතුය.

(12) ස්ථානයට පැමිණෙන තැනැත්තන් මෙන් ම සේවා නියුක්තයින් විසින් ද පහසුවෙන් ප්‍රයෝජනයට ගත හැකි වන පරිදි වූ සනීපාරක්ෂක කසල භාජනයක් ද යටත්පිරිසෙයින් පඩික්කම් දෙකක් ද යම් බත් කඩයක, ආපන ශාලාවක හෝ තේ හෝ කෝපි කඩයක සෑම බලපත්‍රලාභියකු විසින් බලපත්‍රලත් ස්ථානයේ සෑම වේලාවකම තබා තිබිය යුතුය.

(13) යම් බත් කඩයක, ආපන ශාලාවක හෝ තේ හෝ කෝපි කඩයක සෑම බලපත්‍රලාභියකු ම විසින් එම ස්ථානය මීයන්ගෙන්, දඩාවතේ යන බල්ලන්, බළලුන් සහ හරකුන්ගෙන්, මැස්සන්ගෙන් මදුරුවන්ගෙන් සහ රෝග කාරක කෘමීන්ගෙන් තොරව තබාගත යුතුය.

(14) යම් බත් කඩයක, ආපන ශාලාවක හෝ තේ හෝ කෝපි කඩයක සෑම බලපත්‍රලාභියකු ම විසින් එම ස්ථානයට ප්‍රමාණවත් වන පරිදි බීමට සුදුසු ජලය සැපයිය යුතුය.

(15) මැස්සන්ගෙන්, දූවිල්ලෙන් සහ කෘමි සතුන්ගෙන් දූෂිතවීම වැළැක්වෙන පරිදි තනන ලද භාජනයක ආහාර තබා ඇත්නම් මිස, යම් බත් කඩයක්, ආපන ශාලාවක් හෝ තේ හෝ කෝපි කඩයක බලපත්‍රලාභියකු විසින් ම ආහාර තැබීම, ගබඩා කිරීම හෝ විකිණීම සඳහා ප්‍රදර්ශනය කිරීම නොකළ යුතුය. ඔහු විසින් එම භාජනය පිරිසිදු සහ සනීපාරක්ෂක තත්ත්වයකින් පවත්වා ගත යුතුය.

(16) යම් බත්කඩයක, ආපනශාලාවක හෝ තේ හෝ කෝපි කඩයක් ස්ථානයෙහි බාල කළ කිරි කිසිවක් තබා ගැනීමට හෝ විකිණීම නොකළ යුතුය.

(17) මේ අතර ව්‍යවස්ථාවේ කාර්යය සඳහා බාලකල කිරි යන්නෙන් ජලය හෝ වෙනත් බාහිර ද්‍රව්‍යයක් එක් කල කිරි හෝ මේද නොවන කිරි ඝන ද්‍රව්‍ය සියයට 85කට අඩු හෝ කිරි මේද සියයට 35කට අඩු කිරි, එළකිරි හෝ මේද නොවන කිරි යන ද්‍රව්‍ය සියයට 9ට අඩු හෝ කිරි මේද සියයට 7ට අඩු මීකිරි අදහස් වේ. මේ අතුරු ව්‍යවස්ථාවේ කඩ කිරීමක් පිළිබඳව වගකිව යුතු තැනැත්තා බලපත්‍රධාරියා වන්නේ ය.

කෙළ ගැසීම සඳහා තබා ඇති පඩික්කමට හැර කිසිම තැනැත්තකු, බලපත්‍රලත් ස්ථානය ඇතුළත කෙළ නොගැසිය යුතුය.

(18) යම් ආසාදක, ස්පර්ශක හෝ චර්ම රෝගයකින් පෙළෙන හෝ ළඟදී පෙලුනාවූ කිසිම තැනැත්තකු, හෝ එවැනි රෝගයකින් පෙළෙන තැනැත්තකුට ළඟ දී සාත්තු කරමින් සිටි කිසිම තැනැත්තකු ආසාදක හෝ බීජෞෂණ කාලය අවසන් වනතුරු බලපත්‍රලත් ස්ථානයට ඇතුලුවීමේ හෝ ආහාර හෝ බීම වර්ග සකස් කිරීමේ හෝ විකිණීමෙහි ලා සහභාගී නොකළ යුතුය.

(19) බත්කඩයක, ආපනශාලාවක හෝ තේ හෝ කෝපි කඩයක කිසිම බලපත්‍රලාභියකු විසින් 17 වැනි වන අතුරු ව්‍යවස්ථාවේ හෝ 18 වැනි ව්‍යවස්ථාවේ විධිවිධාන කඩ කිරීමට කිසිම තැනැත්තකුට දැන දැනම ඉඩ නොදිය යුතුය.

(20) සභාපතිවරයා විසින් හෝ ඔහු විසින් ලියවිල්ලකින් බලය දෙන ලද යම් තැනැත්තෙකු විසින් හා බත්කඩය, ආපනශාලාව හෝ තේ හෝ කෝපි කඩයේ බලපත්‍රලාභියා විසින් අත්සන් කරන ලද ලියාපදිංචි කිරීමේ කාඩ්පතක් ආහාර ගෙන යන තැනැත්තාගේ සන්තකයේ ඇත්නම් මිස ද, ආහාර වැසූ කූඩයක, ටින් භාජනයක හෝ සුදුසු වෙනත් භාජනයක බහා ගෙන යන්නේ නම් මිස ද, යම් පිසූ ආහාර බලපත්‍රලත් ස්ථානයේ සිට වෙළඳාම ප්‍රවාහනය කිරීමට කිසිම බත්කඩයක, ආපනශාලාවක හෝ තේ හෝ කෝපි කඩයක බලපත්‍රලාභියෙකු විසින් කිසිම තැනැත්තෙකුට ඉඩ නොදිය යුතුය.

(21) යම් ආහාරයක් අඩංගු කරන අවස්ථාවේ දී එම ආහාර ගෙන යාම සඳහා භාවිතා කෙරෙන සෑම වාහනයක්, කූඩයක්, ටින් භාජනයක් හෝ වෙනත් සෑම භාජනයක්ම පිරිසිදුව පවතින බවට බත් කඩය, ආපනශාලාවක හෝ තේ හෝ කෝපි කඩයක සෑම බලපත්‍රලාභියකු වග බලා ගත යුතුය.

(22) යම් බත්කඩයක, ආපනශාලාවක හෝ තේ හෝ කෝපි කඩයක බලපත්‍රලාභියකු විසින් සභාපතිවරයා වෙත ඉල්ලුම් කළ විට, විකිණීමට, ආහාර ගෙන යාම සඳහා එම බලපත්‍රලාභියා විසින් සේවයේ යොදවනු ලබන සෑම තැනැත්තකුගේම ප්‍රයෝජනය සඳහා ලියාපදිංචි කිරීමේ කාඩ්පතක්, සභාපතිවරයා විසින් ගාස්තු අය කිරීමකින් තොරව නිකුත් කළ යුතුය.

(23) (i) සභාපතිවරයා හෝ සභාපතිවරයා විසින් තත් කාර්යය සඳහා ලියවිල්ලකින් පොදුවේ හෝ විශේෂිතව බලය දෙනලද ප්‍රාදේශීය සභාවේ යම් නිලධාරියෙකු යම් බත් කඩයක, ආපනශාලාවක හෝ තේ හෝ කෝපි කඩයකට සියලු සාධාරණ වේලාවන් ඇතුළත ඇතුළු වී පරීක්ෂා කිරීමේ නීත්‍යානුකූල වන්නේය.

(ii) බත්කඩයේ, ආපනශාලාවේ හෝ තේ හෝ කෝපි කඩයක බලපත්‍රලාභියා හෝ එම ස්ථානයේ භාරව සිටින තැනැත්තා, එම ස්ථානයට ඇතුළු වී පරීක්ෂා කිරීමට සභාපතිවරයා හෝ සභාපතිවරයාගෙන් ලියවිල්ලකින් බලයලත් තැනැත්තෙකුට ඉඩදිය යුතු අතර, අවශ්‍ය විය හැකි සියලු සහාය සභාපතිවරයාට හෝ එම නිලධරයාට දිය යුතුය.

(24) බත්කඩය, ආපනශාලා හෝ තේ හෝ කෝපි කඩවලට අදාල යම් අතුරු ව්‍යවස්ථාවලින් කිසිවක් සම්බන්ධයෙන් කෙරෙන සෑම කඩ කිරීමක්ම රුපියල් හත්සිය පණහකට නොවැඩි දඩයකින් ද, දිගටම කරගෙන යන කඩ කිරීමක් සම්බන්ධයෙන් වන විට, වරදකරු කරනු ලැබීමෙන් පසු හෝ එම කඩ කිරීම පිළිබඳව අවධානය යොමු කරමින් සභාපතිවරයාගෙන් සහ සභාපතිවරයා විසින් බලය දෙන ලද නිලධාරියෙකුගෙන් ලිඛිත දැන්වීමක් භාරදෙනු ලැබීමෙන් පසු එම කඩ කිරීම දිගටම සිදු කරගෙන යන සෑම දිනයක් සඳහා ම රුපියල් සියයකට නොවැඩි අතිරේක දඩයකින් ද දඬුවම් කරනු ලැබිය හැකිය.

(25) බත්කඩ, ආපනශාලා හෝ තේ හෝ කෝපි කඩවලට අදාළ මේ අතුරු ව්‍යවස්ථාවලින් යම් අතුරු ව්‍යවස්ථාවක් කඩ කිරීම සම්බන්ධයෙන් දෙවරක් හෝ ඊට වැඩි වාර ගණනක් වරදකරු කරනු ලැබ ඇති බලපත්‍රලාභියෙකුට අධිකරණය විසින් පවත්වනු ලබන වෙනත් යම් දඬුවමකට අතිරේකව ඔහුගේ බලපත්‍රය නිසි බලය ඇති අධිකරණයක් විසින් අවලංගු කිරීම නීත්‍යානුකූල වන අතර, එම අවලංගු කිරීම සම්බන්ධයෙන් කිසිම වන්දියක් ලැබීමට බලපත්‍රලාභියාට හිමිකමක් නොලැබිය යුතුය.

**16. බේකරි**

01. මේ අතුරු ව්‍යවස්ථාවල "බේකරි" යන්නෙන් විකිණීම සඳහා පාන්, විස්කෝතු හෝ රස කැවිලි සාදන යම් ස්ථානයක් අදහස් වන අතර, ඊට එවැනි ආහාර පිළියෙල කරනු ලබන හෝ එවැනි ආහාර පිළියෙල කිරීම සඳහා ද්‍රව්‍ය ගබඩා කර තිබෙන හෝ යම් ස්ථානයන් ද ඇතුළත් වේ.

02. (1) සභාපතිවරයා විසින් හෝ ඔහු විසින් ලියවිල්ලකින් බලය පවරන ලද යම් තැනැත්තකු විසින් හෝ ඒ සඳහා නිකුත් කරන ලද බලපත්‍රයක් මත මිස කිසිම තැනැත්තකු විසින් යම් බේකරියක් පිහිටුවීම හෝ බේකරි ව්‍යාපාරයක් පවත්වාගෙන යාම හෝ කරනු නොලැබිය යුතුය.

(2) මේ අතුරු ව්‍යවස්ථාවේ (1) වැනි ඡේදය යටතේ නිකුත් කරන ලද සෑම බලපත්‍රයක්ම 27 වැනි අතුරු ව්‍යවස්ථාව යටතේ කලින් අවලංගු කරනු ලැබුවහොත් මිස එය නිකුත් කරනු ලැබුවේ යම් වර්ෂයක් වෙනුවෙන් ද, ඒ වර්ෂයේ දෙසැම්බර් මස තිස් එක් වන දිනයෙන් අවසන් විය යුතුය.

(3) සෑම බලපත්‍රයක්ම නිකුත් කිරීම ප්‍රාදේශීය සභාව විසින් කලින් කල නියම කරනු ලබන ගාස්තුවට යටත් විය යුතුය.

03. බලපත්‍රය නිකුත් කරනු ලබන්නේ යම් ස්ථානයක් වෙනුවෙන් ද, ඒ ස්ථානය සහ බේකරියේ උපකරණ පහත දැක්වෙන කොන්දේසිවලට අනුකූල වන්නේ නම් මිස කිසිම තැනැත්තෙකුට බේකරියක් තබා ගැනීම සඳහා බලපත්‍රයක් ලබාගැනීමට හිමිකම් නොතිබිය යුතුය.

(1) (අ) ස්ථානය හොඳ අලුත්වැඩියා කල තත්වයෙන් තිබිය යුතු අතර, එහි මනා වාතාශ්‍රය ඇතිව හොඳින් ආලෝකය සපයා තිබිය යුතු අතර විවෘත කරනු ලැබූ විට වර්ගඵලය මතුපිට බිම් ප්‍රමාණයෙන් පහලොවෙන් එකකට නොඅඩු විවෘත කළ හැකි ජනේල සෑම කාමරයකම සපයා තිබිය යුතුය.
(ආ) සෑම කාමරයකම සෑම කොටසකම බිත්ති උසින් මීටර් 3.5කට අඩු නොවිය යුතු අතර ගඩොලින්, ගලින් හෝ කබොක්වලින් ඒවා ඉදි කොට එහි ඇතුළත හුණු කපරාරු කර හුණු පිරියම් කර තිබිය යුතුය.
(ඇ) පියසි කෙළවරට බිම සිට යටත් පිරිසෙයින් මීටර් 1.83ක් තිබිය යුතුය.
(ඈ) වහළ යම් ස්ථිර ද්‍රව්‍යයකින් තනා තිබිය යුතුය.
(ඉ) දැවයෙන් කළ කොටස්වල තෙල් සායම් ගා හෝ හුණු පිරියම් කර තිබිය යුතුය.
(ඊ) පොළොව සම්පූර්ණයෙන් ම සිමෙන්ති යොදා තිබිය යුතුය.
(උ) එම ස්ථානයට ප්‍රමාණවත් ජලප්‍රවහන සලසා තිබිය යුතුය.

(2) (අ) පිටි ඇණීම කරන කාමරයට වර්ග මීටර් 16.75කට අඩු නොවන මතුපිට බිම් ප්‍රමාණයක් තිබිය යුතු අතර බිත්තිවල ඇතුළු පැත්තේ මතුපිට පහතින් මීටර් 1.2ක් ඔප දැමූ උලු අල්ලා සිමෙන්තියෙන් කපරාරු කර තිබිය යුතුය.
(ආ) දොරවල් සහ ජනෙල් සහිත පිටි අනන කාමරයෙහි යටත් පිරිසෙයින් පැති දෙකක්වත් පළලින් මීටර් 2.14කට නොඅඩු නිදහස් පිටස්තර හිස් ඉඩකඩක් තිබිය යුතුය.
(ඇ) උදුනේ දොර කෙළින්ම පිටි අනන කාමරයට විවෘතව නොතිබිය යුතුය.
(ඈ) සෑම පිටි අනන කාමරයකටම කපරාරු කර හුණු පිරියම් කර ඇති හෝ එකට තද වූ තහඩුවලින් සෑදූ හුණු පිරියම් කර ඇති හෝ තෙල් සායම් ගා ඇති සිවිලිමක් සපයා තිබිය යුතුය.

(3) (අ) පාන් සෑදීමේ දී ප්‍රයෝජනයට ගන්නා තැටි මේස සහ සියලු භාජන බිම සහ බිත්ති සේදීමේ කාර්යය සඳහා එහා මෙහා ගෙන යාමට හැකි විය යුතුය.
(ආ) පාන් සෑදීමේ දී පාවිච්චි කරන මේසවල මතුපිට මනාව පදම් කරන ලද එකිනෙකට තදින් සවිකළ ලෑලිවලින් හෝ හානිකර නොවන අපාරගම්‍ය ද්‍රව්‍යයකින් හෝ සාදා තිබිය යුතුය.

(4) (අ) බේකරියට සනීපාරක්ෂක කසළ භාජනයක් පඩික්කම් දෙකක් සහ ප්‍රමාණවත් වැසිකිළි පහසුකම් සපයා තිබිය යුතුය.
(ආ) බේකරි කිසියම් වැසිකිළියකින්, කසළ වලකින්, පොහොර ගොඩකින් හෝ විවෘත ජලාපවහන කාණුවකින් යටත් පිරිසෙයින් මීටි 15.24කට ඈතින් තිබිය යුතුය.
(ඇ) බේකරියක් තුළ හෝ බේකරියට කෙළින්ම සම්බන්ධව හෝ කසළ වලක් වැසිකිළියක් හෝ අලු වලක් නොතිබිය යුතුය.

04. (i) යම් බේකරියක් සම්බන්ධයෙන් බලපත්‍රයක් නිකුත් කරනු ලැබ ඇත්තේ යම් කාල සීමාවක් සඳහා ද ඒ කාල සීමාව තුළ යම් අවස්ථාවක දී ඒ බේකරියේ කාර්යයන් සඳහා පාවිච්චි කරනු ලබන යම් ගොඩනැගිල්ලක් (3) වැනි අතුරු ව්‍යවස්ථාවේ විධිවිධානවලට අනුකූල වීම අවසන් කරන අවස්ථාවක සභාපතිවරයා විසින් හෝ ඔහු විසින් බලය පවරන ලද තැනැත්තෙකු විසින් හෝ එම බේකරියේ බලපත්‍රලාභී වෙත දැන්වීමක් භාරදීමට සලස්වා ඒ දැන්වීමේ නිශ්චිත දිනයකට පෙර එම ගොඩනැගිල්ල එම විධිවිධානවලට අනුකූල කිරීම සඳහා අවශ්‍ය සියලු දේ කරන ලෙස ඔහුට නියම කරනු ලැබිය හැකිය.

(ii) මේ අතුරු ව්‍යවස්ථාවේ (1) වැනි ඡේදය යටතේ ලියවිල්ලකින් වූ දැන්වීමක් භාරදෙනු ලැබුවේ යම් බේකරියක බලපත්‍රලාභියකුට ද ඒ බලපත්‍රලාභියා එම දැන්වීමෙහි නියමිත කාලය ඇතුළත එම දැන්වීමට අනුව කටයුතු කිරීම පැහැර නොහැරිය යුතුය.

(iii) (1) වැනි ඡේදය යටතේ වූ යම් දැන්වීමක් බලපත්‍රලාභී බේකරිය ව්‍යාපාරය පවත්වාගෙන යන ස්ථානයෙහි අලවා ඇත්නම් හෝ බලපත්‍රලාභී විසින් එම ස්ථානයෙහි සේවයේ නියුක්ත කර ගෙන සිටින යම් තැනැත්තෙකු වෙත භාර දී ඇත්නම් හෝ එය බලපත්‍රලාභී වෙත භාරදී ඇති ලෙස සලකනු ලැබිය යුතුය.

05. බේකරියක සෑම බලපත්‍රලාභියෙකු විසින්ම තම ස්ථානයෙහි පිටත ප්‍රකටව පෙනෙන පරිදි තම නම සහ බලපත්‍රලත් බේකරිය යන වචන පැහැදිලිව සිංහලෙන් දෙමළෙන් සහ ඉංග්‍රීසියෙන් පින්තාරු කරන ලද පුවරුවක් එල්ලා තැබිය යුතුය.

06. බේකරිය සෑම බලපත්‍රලාභියකු විසින්ම බේකරිවලට අදාළ සිංහලෙන්, දෙමළෙන්, ඉංග්‍රීසියෙන් වූ මේ අතුරු ව්‍යවස්ථාවල පිටපතක් රාමු කර බලපත්‍රලත් ස්ථානයෙහි පැහැදිලිව පෙනී යන ස්ථානයක එල්ලා තැබීමට සැලැස්විය යුතුය. තවද සභාපතිවරයා විසින් හෝ ඔහු විසින් බලය

පවරනු ලැබූ යම් තැනැත්තෙකු විසින් හෝ සියලු සාධාරණ වේලාවලදී පරීක්ෂා කිරීම පිණිස ලබාගනු ලැබිය හැකි වන පරිදි (පාන් වෙළෙන්දෙක් ඇතුලුව) සියලු සේවා නියුක්තයන් ගේ නම් සහ ලිපින ලැයිස්තුවක් ද බේකරියෙහි තබා ගැනීමට සැලැස්විය යුතුය.

07. බේකරියක සෑම බලපත්‍රලාභියකු විසින්ම බේකරියේ කොටසක් වන සෑම කාමරයක්ම බිත්ති සහ සීලිම අවුරුද්දකට වරක් දෙසැම්බර් මාසයේ දී හුණු පිරියම් කිරීමට ද දැවයෙන් කළ කොටස් යටත් පිරිසෙයින් අවුරුද්දකට වරක් දෙසැම්බර් මාසයේ දී හෝ සභාපතිවරයා විසින් හෝ ඔහු විසින් ලියවිල්ලකින් බලය පවරනු ලැබූ තැනැත්තා විසින් නියම කරනු ලැබුවහොත් වෙනත් යම් අවස්ථාවක දී හුණු පිරියම් කිරීමට හෝ ඒවායේ තෙල් සායම් ගා ඇත්නම් උණු වතුර සහ සබන් යොදා සේදීමට හෝ සලස්වනු ලැබිය යුතුය.

08. බේකරියක සෑම බලපත්‍රලාභියෙකු විසින්ම දිනපතාම බලපත්‍රයෙහි නිශ්චිත යම් වේලාවක දී ගෙබිම සහ බිත්තිවල උළු සහ සිමෙන්ති යෙදූ කොටස් ද, මේසවල මතුපිට ද සේදීමට සලස්වනු ලැබිය යුතුය. බේකරියේ සෑම කොටසක්ම ද එහි වටාපිටාව සහ කාණුද පිරිසිදු හා හොඳ අළුත් වැඩියා කළ තත්වයෙන් තබා ගැනීමටත් කිසියම් කාණුවකින්, වැසිකිළියකින් කසළ වලකින් හෝ බලපත්‍රලත් ස්ථානයේ වෙනත් යම් පීඩාවකින් උද්ගත වන දුර්වායුවලින් මත්තට තබා ගැනීමටත් ඔහු සැලැස්විය යුතුය. පාන් සෑදීමේ දී ප්‍රයෝජනයට ගන්නා ගෘහභාණ්ඩ සහ උපකරණ පිරිසිදු හා සනීපාරක්ෂක තත්ත්වයෙන් තබා ගැනීමට ඔහු සැලැස්විය යුතුය. ව්‍යාපාරයට අදාල සහ ගෘහය සියළු අපද්‍රව්‍ය දිනකට වරක් බේකරියකින් ඉවත්කොට පිරිසිදු කරනු ලැබිය යුතු අපාරගම්‍ය ආවරණිත භාජනයක වහාම තැන්පත් කිරීමට ඔහු සැලැස්විය යුතුය. අපද්‍රව්‍ය ඇත්ත වශයෙන්ම එහි බහාලන විට හැර භාජනය සෑම විටම වසා තැබිය යුතුය.

09. බේකරියක සෑම බලපත්‍රලාභියෙකුම පාන් නිෂ්පාදනය කිරීමේ දී හොඳ පිරිසිදු පිටි, ජලය සහ වෙනත් ද්‍රව්‍ය පාවිච්චි කළ යුතුය. මෙහි දක්වා ඇති ආහාරයට ඉදිකරන ලද වල්‍ය වේදිකාවක් මත ඔහු පිටි ගබඩා කළ යුතුය. වේදිකාව ඕනෑම පහසු දිගකින් සහ පළලකින් යුක්ත විය යුතුය. එය යටතේ පිරිසෙයින් මීටර් 9 උස පාද ආධාර කොට ගත් ඝන ලෑලි තනි තට්ටුවකින් යුක්ත විය යුතුය. වේදිකාවේ පාද ස්ථිරව පොළොවට සම්බන්ධකොට නොතිබිය යුතුය. මීයන් පාද දිගේ විත් ලෑලි තට්ටුවේ අයිනෙන් ඇතුලු වීම වැළැක්වෙන පරිදි ලෑලි සහිත මතු තට්ටුවේ කෙළවරවල් පහල රාමුවෙන් සෙන්ටි මීටර් 23ක් පිටතට නෙරා තිබිය යුතුය. මීයන්ට රැඳීමට ලෑලි සහිත මුහුණකට යටින් රාක්ක හෝ කුහර නොතිබෙන පරිදි වේදිකාව සාදනු ලැබිය යුතුය. වේදිකාව ඉවත් කොට එය යට ඇති පිටි ඉවත් කොට ශුද්ධ කළ හැකි වන පරිදි වේදිකාව ඉවත් කළ හැකි එකක් විය යුතුය. එය බිත්තියේ සිට යටත් පිරිසෙයින් සෙන්ටි මීටර් 23ක් ඈතින් තැබිය යුතුය.

10. බේකරියක සෑම බලපත්‍රලාභියෙකුම 9 වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් වේදිකාව යට සහ අවට ඉඩ ප්‍රමාණය සියලු බාධක වලින් තොරව තබා ගත යුතුය. ඔහු විසින් සනීපාරක්ෂක කසළ භාජනයක් සහ යටතේ පිරිසෙයින් පඩික්කම් දෙකක් බලපත්‍රලත් ස්ථානයට සපයනු ලැබිය යුතුය. පාන් නිෂ්පාදනයෙහි නිරතව සිටින්නන්ට පඩික්කම් වෙත පහසුවෙන් ලඟ විය හැකි ආකාරයට ඔහු පඩික්කම් තැබිය යුතු නමුත් ඒවා පිටි අනන කාමරයෙහි නොතැබිය යුතුය.

11. බේකරියක සෑම බලපත්‍රලාභියෙකුම බේකරිය මීයන්ගෙන් සහ කෘමීන්ගෙන් නිදහස්ව තබාගත යුතු අතර, එම ස්ථානයෙහි දක්නා ලැබෙන මීගුල් සහ වෙනත් කුහර බිඳුණු වීදුරු කැබලි වලින් පුරවා සිමෙන්තියෙන් කපරාරු කළ යුතුය.

12. කෙළ ගැසීම සඳහා සපයා ඇති පඩික්කමට හැර කිසිම තැනැත්තකු බේකරිය තුළ කෙළ ගැසීම නොකළ යුතුය.

13. කිසිම තැනැත්තකු කිනම් හේතුවක් නිසාවත් බේකරියක යම් සතකු හෝ පක්ෂියෙකු තබා නොගත යුතුය.

14. (1) බෝවන, ස්පර්ශයෙන් බෝවන හෝ චර්මගත රෝගයකින් පෙළෙන්නාවූ හෝ මෑතකදී එවැනි රෝගයකින් පෙළෙමින් සිටියාවූ හෝ එවැනි රෝගයකින් පෙළෙන යම් තැනැත්තෙකුට මෑතකදී ඇප උපස්ථාන කළාවූ කිසිම තැනැත්තකු රෝගය බෝවන්නා වූ හෝ විෂබීජ මෝරන්නාවූ කාල සීමාව අවසන් වන තුරු බලපත්‍රලත් ස්ථානයට ඇතුලුවීම හෝ එහි පාන් කිසිවක් නිෂ්පාදනය කිරීමට හෝ විකිණීමට සහභාගී වීම හෝ එහි සිට පාන් කිසිවක් ප්‍රවාහනය කිරීමෙහි නිරතවීම හෝ නොකළ යුතුය.

(2) බේකරියක් කිසිම බලපත්‍රලාභියකු මේ අතුරු ව්‍යවස්ථාවෙහි 1 වැනි ඡේදයේ විධිවිධාන යම් තැනැත්තකු විසින් කඩ කරනු ලැබීමට, දැනුවත්ව ඉඩ නොදිය යුතුය.

15. බේකරියක කිසිදු බලපත්‍ර ලාභියෙකු විසින්, පාන් සෑදීමට ගන්නා ද්‍රව්‍ය හැර යම් ගෘහභාණ්ඩ, ඇඳුම්, පැදුරු හෝ යම් ද්‍රව්‍ය පාන් පිළියෙල කරනු ලබන හෝ ගබඩා කර තබනු ලබන නැතහොත් පාන් සෑදීම සඳහා වූ ද්‍රව්‍ය ගබඩා කර තබනු ලබන කාමරයෙහි ගබඩා කර තැබීම හෝ තැබීමට ඉඩ දීම හෝ කරනු නොලැබිය යුතුය.

16. බේකරියෙහිම බිමෙහි එම ගොඩනැගිල්ලෙහිම කොටසක් වන බිමෙහි හෝ යම් ස්ථානයක්, බේකරියක යම් බලපත්‍රලාභියකු විසින්, නිදාගන්නා ස්ථානයක් ලෙස පාවිච්චි කිරීම හෝ එසේ පාවිච්චි කිරීමට ඉඩ දීම එම ස්ථානය පාන් පිළියෙල කරන හෝ ගබඩා කර තබන හෝ ඒවායේ ද්‍රව්‍ය ගබඩා කර තබන හෝ ස්ථාන වලින් පොළවේ සිට සීලිම දක්වා ව්‍යාප්ත වන පරිදි වෙන් කරන ද්‍රව්‍යවලින් ඵලදායී ලෙස වෙන්කර ඇත්නම් සහ එම නිදා ගන්නා ස්ථානයට විවෘත කළ විට පොළොවේ මතුපිට ඉඩ ප්‍රමාණයක් පහළොවෙන් එකකට අඩු නොවන බාහිර ජනේලයක් සපයා ඇත්නම් මිස කරනු නොලැබිය යුතුය.

17. පාන් පිළියෙල කිරීමේ දී සහ සෑදීමේ දී සේවයෙහි නියුක්ත කර ගන්නා සෑම තැනැත්තෙකුම පාන් සෑදීමේ ක්‍රියාවලියෙහි නිරත වීමට පෙර තම නිය ශුද්ධ කර, අත් සෝදා ගතයුතු අතර පපුව සහ සිරුර ආවරණය කරන පිරිසිදු සුදු ඒප්‍රනයක් සහ පිරිසිදු සුදු කැප් තොප්පියක් හෝ ජටාවක් ඔහු පැළැඳ සිටිය යුතුය.

18. බේකරියක සෑම බලපත්‍රලාභියකුම පිරිසිදු ජලය, පිරිසිදු තුවා, නිය බුරුසු සහ සබන් සපයා තිබිය යුතු අතර ඒවා පාන් නිෂ්පාදනයෙහි නිරත වන තැනැත්තන්ට පහසුවෙන් ලබගත හැකි ආකාරයට තැබිය යුතුය.

19. බේකරියක සෑම බලපත්‍රලාභියෙකුම බලපත්‍රලත් ස්ථානයට ඇති තරම් බීමට ගන්නා ජලය සැපයිය යුතුය.

20. නිසි පරිදි සාදන ලද පිරිසිදු වීදුරු අල්මාරි තුළ මැස්සන්ගෙන් දූවිලි වලින් සහ කෘමි සතුන්ගෙන් තොරව පාන් තබා ඇත්නම් මිස බේකරියක කිසිම බලපත්‍රලාභියෙකු විසින් බලයලත් ස්ථානයෙහි පාන් විකිණීම සඳහා තැබීම හෝ තැබීමට සැලැස්වීම හෝ කරනු නොලැබිය යුතුය.

21. බේකරියක සෑම බලපත්‍රලාභියෙකු විසින් ම බලපත්‍රලත් ස්ථානයේ පැහැදිලිව පෙනෙන ස්ථානයක තරාදියක් සහ ප්‍රමිති බරින් යුත් මිනුම් පඩි එල්ලා තැබිය යුතුය. යම් ගැණුම්කරුවෙකු ඉල්ලා සිටියහොත් එකී ස්ථානයේ විකුණන හෝ විකිණීම පිණිස තබා ඇති හෝ පාන්වල බර කිරා දිය යුතුය.

22. සභාපතිවරයා විසින් හෝ ඔහු විසින් බලය පවරන ලද තැනැත්තෙකු විසින් ද බේකරියේ බලපත්‍රලාභී විසින් ද, අත්සන් තබන ලද ලියාපදිංචි කිරීමේ කාඩ්පතක් යම් තැනැත්තෙකු සතුව ඇත්නම් මිස විකිණීම සඳහා තම බේකරියේ සිට පාන් ප්‍රවාහනය කිරීමට කිසිම තැනැත්තකුට බේකරියක කිසිම බලපත්‍රලාභියකු ඉඩ නොදිය යුතුය.

23. බේකරියක බලපත්‍රලාභි විසින් සභාපතිවරයා වෙත කරනු ලබන ඉල්ලීමක් මත එම බලපත්‍රලාභී විසින් විකිණීම සඳහා පාන් ප්‍රවාහනය කිරීම පිණිස සේවයෙහි නියුක්ත කරගනු ලබන සෑම තැනැත්තෙකු විසින්ම පාවිච්චි කරනු ලැබීම සඳහා වූ ලියාපදිංචි කාඩ්පත් එම තැනැත්තා යම් බෝවෙන හෝ ස්පර්ශයෙන් බෝවෙන රෝගයකින් නිදහස් නම් පමණක් ඒ සභාපතිවරයා විසින් අය කිරීමකින් තොරව නිකුත් කරනු ලැබිය හැකිය. එම කාඩ්පත් නිකුත් කරනු ලැබුවේ යම් වර්ෂයක් වෙනුවෙන් ද ඒ වර්ෂයේ දෙසැම්බර් මස තිස් එක් වන දිනයෙහි ඒවා අවසන් විය යුතුය.

24. වසන ලද වාහනයක හෝ වසන ලද කූඩයක ටින් භාජනයක වෙනත් සුදුසු භාජනයක හැර තම බලපත්‍රලත් ස්ථානයෙන් විකිණීම සඳහා පාන් කිසිවක් ප්‍රවාහනය කරනු ලැබීමට බේකරියක කිසිම බලපත්‍රලාභියකු ඉඩ නොදිය යුතුය. එසේ ප්‍රවාහනය කිරීමට පෙර බලපත්‍රධාරී එම වාහනය, කූඩය ටින් භාජනය හෝ වෙනත් භාජනය පරීක්ෂා කර එය පිරිසිදු හා සනීපාරක්ෂක තත්ත්වයක ඇති බවට ඔහු සෑහීමට පත් විය යුතුය.

25. (i) සභාපතිවරයා විසින් හෝ ඒ සඳහා සභාපතිවරයා විසින් ලියවිල්ලකින් බලය පවරන ලද යම් නිලධාරියෙකු විසින් හෝ සියලු සාධාරණ වේලාවලදී සහ පිටි ඇනීමේ හෝ බේක් කිරීමේ ක්‍රියාවලිය කරගෙන යන ඕනෑම වේලාවකදී බේකරියකට ඇතුළුව, එය පරීක්ෂා කරනු ලැබීම නීත්‍යානුකූල වන්නේය.

(ii) බේකරියෙහි බලපත්‍රලාභී හෝ බේකරිය භාරව සිටින්නා හෝ විසින් සභාපතිවරයාට හෝ සභාපතිවරයා විසින් ලියවිල්ලකින් බලය පවරන ලද යම් නිලධාරියකුට බේකරියට ඇතුළුව එය පරීක්ෂා කිරීමට ඉඩදිය යුතු අතර, එම සභාපතිවරයාට හෝ නිලධාරියාට හෝ අවශ්‍ය විය හැකි සියළු සහාය ලබාදිය යුතුය.

26. බේකරිවලට අදාලව මේ අතුරු ව්‍යවස්ථාවලින් කිසිවක් පිළිබඳව කරනු ලබන සෑම කඩ කිරීමක්ම සඳහා රුපියල් හත්සිය පණහක් නොඉක්මවන දඩයකින් ද, කඩ කිරීම දිගටම කරගෙන යන විටක වරදකරු කරනු ලැබීමෙන් පසුව හෝ එම කඩ කිරීම පිළිබඳව අවධානය යොමු කරවමින් සභාපතිවරයා විසින් හෝ සභාපතිවරයා විසින් බලය පවරන ලද නිලධාරියකු විසින් හෝ ලියවිල්ලකින් වූ දැන්වීමක් භාරදෙනු ලැබීමෙන් පසුව කඩ කිරීම දිගටම කරගෙන යන සෑම දිනයක් සඳහාම රුපියල් සියයක් නොඉක්මවන අතිරේක දඩයකින් ද දඬුවම් කරනු ලැබිය යුතුය.

27. නිසි අධිකරණ බලය ඇති අධිකරණයක් විසින් පනවනු ලැබිය හැකි වෙනත් යම් දණ්ඩනයකට අතිරේකව බේකරිවලට අදාල මෙම අතුරු ව්‍යවස්ථාවලින් කිසිවක් කඩ කිරීම සම්බන්ධයෙන් දෙවරක් හෝ ඊට වැඩි වාරයක් වරදකරු කරනු ලැබූ බලපත්‍රලාභීයකුගේ බලපත්‍රය අධිකරණය විසින් අවලංගු කිරීම නීත්‍යානුකූල වන්නේය. එවැනි අවලංගු කිරීමක් සම්බන්ධයෙන් බලපත්‍රලාභී කිසියම් වන්දියකට හිමිකමක් නොලැබිය යුතුය.

### 17. කිරි පට්ටි හා කිරි වෙළඳාම

01. (i) කිසිම තැනැත්තකු (මෙහි මින්මතු "සභාපතිවරයා" යනුවෙන් සඳහන් කරනු ලබන) ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා විසින් නිකුත් කරන ලද කිරිපට්ටි සඳහා වූ බලපත්‍රයක් යටතේ මිස කිරි පට්ටියක් පවත්වා නොගත යුතුය.

(ii) මේ අතුරු ව්‍යවස්ථාවේ (1) වැනි ඡේදය යටතේ නිකුත් කරන ලද සෑම බලපත්‍රයක්ම 38 වැනි අතුරු ව්‍යවස්ථාව යටතේ කලින් අවලංගු කරනු ලැබුවහොත් මිස එම බලපත්‍රය නිකුත් කිරීමට විෂය වූ වර්ෂයේ දෙසැම්බර් මස තිස් එක්වන දින අහෝසි විය යුතුය.

02. බලපත්‍රය අදාල වන ස්ථානය පහත දැක්වෙන කොන්දේසි වලට අනුකූලව තබා ඇත්නම් මිස කිසිම තැනැත්තකු කිරිපට්ටියක් පවත්වාගෙන යාම සඳහා වූ බලපත්‍රයක් ලැබීමට හිමිකම් නොලැබිය යුතුය. එම කොන්දේසි නම්:-

*(අ)* ස්ථානය හොඳ අලුත්වැඩියා තත්ත්වයකින් පැවතිය යුතු අතර හොඳින් වාතාශ්‍රය හා ආලෝකය සපයා තිබිය යුතුය.

*(ආ)* කිරිපට්ටියේ ගොඩනැගිල්ලේ බිත්ති සහ වහලය යම් ස්ථිර ද්‍රව්‍යයකින් සාදා තිබිය යුතුය.

*(ඇ)* ලී වලින් සාදන ලද කොටස් වලට තෙල් සායම් හෝ හුණු ආලේප කර තිබිය යුතුය.

*(ඈ)* බිමට සිමෙන්ති දමා හෝ යම් තද අපාරගම්‍ය ද්‍රව්‍යයක් අල්ලා තිබිය යුතුය.

*(ඉ)* ස්ථානයේ ප්‍රමාණවත් ජලාපවහනය සලසා තිබිය යුතුය.

*(ඊ)* කිරි පට්ටියේ ප්‍රයෝජනය සඳහා පහසු දුර ප්‍රමාණයක් දූෂිතවීමෙන් ආරක්ෂිත පිරිසිදු ජලය ප්‍රමාණවත් සැපයුමක් තිබිය යුතුය.

(උ) හරකුන් තැබීම සඳහා වූ සෑම ගොඩනැගිල්ලක් හෝ මඩුවක්ම ගඩොලින් ගලින් හෝ කබුක්වලින් තැනිය යුතුය. බිත්ති සහ කාණුවල හුණු ගා තිබිය යුතු අතර පොලව මට්ටමේ සිට මීටර් 1.22ක් උසට සිමෙන්තියෙන් කපරාරු කර තිබිය යුතුය. වහලය ස්ථිර ද්‍රව්‍යයකින් තනා තිබිය යුතුය. බිමට ගඩොල් හෝ ගල් අල්ලා සිමෙන්ති කොන්ක්‍රීට් හෝ තාර දමා තිබිය යුතුය. මුත්‍රා සෝදන ජලය හා වැසි ජලය වැසූ භාජනවලට ගලා යන පරිදි සුදුසු ද්‍රව්‍යයකින් කාණු සාදා තිබිය යුතුය.

(ඌ) කිරි කාමරය සුදුසු ස්ථානයකද ගව මඩු සහ වෙනත් ගොඩනැගිලිවලින් මී. 7.62කට නොඅඩු දුරකින් ද පිහිටිය යුතුය.

(එ) කිරි කාමරයේ බිම සිමෙන්ති දමා තිබිය යුතු අතර බිම සහ බිත්ති සම්බන්ධවන ස්ථාන කවාකාර හැඩයට සකස් කර තිබිය යුතුය. කිරි කාමරයේ බිත්ති මී. 2.14ට නොඅඩු උසකින් යුක්ත විය යුතු අතර බිත්ති ගඩොලින්, ගලෙන් හෝ කබුක්වලින් බැඳ ඇතුල් පැත්තේ හුණු කපරාරු කර හෝ හුණු ආලේප කර තිබිය යුතුය. කිරි කාමරයේ යටත් පිරිසෙයින් එකිනෙකට ඉදිරියෙන් පිහිටි බිත්ති දෙකවත් විවෘත පෙදෙසකට යාබදව පිහිටිය යුතුය. දූවිලි ඇතුළුවීම වැළැක්වීම සඳහා උඩින් දාර බේරූ ලෑලි වලින් සීලිං ගසා තිබිය යුතු අතර එහි තෙල් සායම් ගා තිබිය යුතුය. පියසි කෙළවර පොලව මට්ටමේ සිට යටත් පිරිසෙයින් මී. 1.83කට ඉහළින් විය යුතුය. යටතේ පිරිසෙයින් එක් ජනේලයක් සහ දොරක් තිබිය යුතුය. ජනේල ප්‍රදේශයේ ක්ෂේත්‍රඵලය බිම් මතුපිට ඉඩ ප්‍රමාණයෙන් පහලොවෙන් පංගුවකට නොඅඩු විය යුතු අතර ජනේල ප්‍රදේශය මැස්සන්ට ඇතුළු විය නොහැකි වන පරිදි වසා තිබිය යුතුය. දොර ජනේලයට මුහුණ ලා පිහිටිය යුතු අතර එය හොඳින් වැසෙන සේ සවිකර එහි මැස්සන් ඇතුළු නොවන පරිදි දැල් ගසා තිබිය යුතුය.

(ඒ) සෑම කිරි කාමරයකටම මේසයක් තිබිය යුතු අතර එහි මතුපිට කිරිගරුඬ, පතුරු පාෂාණ තුන්තනාගම් හෝ වෙනත් අපරගම්‍ය ද්‍රව්‍යයකින් වසා තැබිය යුතුය.

(ඔ) කිරි කාමරයකට සනීපාරක්ෂක කසළ භාජනයක් සපයා තිබිය යුතුය.

(ඕ) කිරි කාමරයක කිසියම් වැසිකිලියක් කසළ වලකින් පෝර ගොඩකින් හෝ විවෘත කසළ කාණුවකින් යටතේ පිරිසෙයින් මී. 30.5ක දුර ප්‍රමාණයකට ඈතින් පිහිටිය යුතුය.

(ක) කිරි කාමරය තුළ හෝ කිරි කාමරයට කෙළින්ම සම්බන්ධ වන පරිදි කසළ වලක් වැසිකිළියක් හෝ අළු වලක් නොතිබිය යුතුය.

(2) එක් එක් කිරි පට්ටියට බලපත්‍ර අපේක්ෂා කරන්නේ එළදෙනුන් කීදෙනෙකු සඳහාද යන වග බලපත්‍රය සඳහා ඉදිරිපත් කරන ඉල්ලුම් පත්‍රයේ සඳහන් කළ යුතු අතර එම ගණන ගව මඩුවේ ඉඩ ප්‍රමාණයට ප්‍රමාණුකූල විය යුතුය. එක් එක් එළදෙන සඳහා මී. 2.44ක බිම් ප්‍රමාණයක් සහ සෙ. මී. 1135ක අවකාශ ප්‍රමාණයක් ඉඩ හැරිය යුතුය.

(3) කිරි පට්ටියට බලපත්‍රයක් නිකුත් කර නැති කාල පරිච්ඡේදය තුළ යම් අවස්ථාවක එම කිරි පට්ටියේ කාර්යය සඳහා භාවිතා කෙරෙන යම් ගොඩනැගිල්ලක් 2 වන අතුරු ව්‍යවස්ථාවේ විධිවිධානවලට අනුකූල නොවන බවට පත්ව ඇත්නම් එම ගොඩනැගිල්ල එම විධිවිධානවලට අනුකූල තත්වයට ගෙන ඒම සඳහා අවශ්‍ය සියළු දේ දැන්වීමේ නිශ්චිතව සඳහන් දිනයට පෙර ඉටු කරන ලෙසට දැන්වීමක් කිරි පට්ටියේ බලපත්‍ර ලාභියාට භාර දීමට සභාපතිවරයා විසින් කටයුතු කළ හැකිය.

(2) මේ අතුරු ව්‍යවස්ථාවේ (1) වන ඡේදය යටතේ ලිඛිත දැන්වීමක් බාරදෙනු ලැබූ කිසිම කිරි පට්ටි බලපත්‍රලාභියෙකු එම දැන්වීමේ නිශ්චිතව සඳහන් කාල සීමාව ඇතුළත එම දැන්වීමට අනුකූලව ක්‍රියා කිරීම පැහැර නොහැරිය යුතුය.

(3) මේ අතුරු ව්‍යවස්ථාවේ (1) වන ඡේදය යටතේ වූ යම් දැන්වීමක්, බලපත්‍රලාභියා, කිරිපට්ටි ව්‍යාපාරය කරගෙන යන ස්ථානයේ අලවා තැබුවහොත් හෝ එය බලපත්‍රලාභියා විසින් ඒ ස්ථානයේ සේවයේ යොදවා ඇති යම් තැනැත්තෙකු වෙත තැබුවහොත් හෝ එය බලපත්‍රලාභියා වෙත තැබුවහොත් හෝ එය බලපත්‍රලාභියා වෙත නිසිලෙස භාරදුන් ලෙස සලකනු ලැබිය යුතුය.

04. සෑම කිරිපට්ටිලාභියෙකුම තමාගේ නමද "බලපත්‍රලත් කිරිපට්ටිය" යන වචන සිංහලෙන්, දෙමලෙන් සහ ඉංග්‍රීසි යෙන්ද පැහැදිලිව ඇඳ ඇත්තාවූ පුවරුවක් තමාගේ ස්ථානයේ පිටත හොඳින් පෙනෙන සවිකර තැබිය යුතුයි.

05. සෑම කිරිපට්ටි බලපත්‍රලාභියෙකුම විසින් කිරිපට්ටිවලට අදාල මේ අතුරු ව්‍යවස්ථාවල පිටපතක් සිංහළෙන් දෙමළෙන් සමඟ ඉංග්‍රීසියෙන් ද මේ බලපත්‍රය ද රාමු කරවා කිරි පට්ටියේ හොඳින් පෙනෙන ස්ථානයක එල්ලා තැබීමට සැලැස්විය යුතුය. තවද (කිරි වෙළඳුන් ඇතුලුව) කිරිපට්ටියේ සේයේ නියුක්තව සිටින සියලු සේවා නියුක්තයින්ගේ නම් සහ ලිපිනයන් ඇතුළත් ලැයිස්තුවක් සියළු සාධාරණ වේලාවන්වලදී සභාපතිවරයා විසින් හෝ ඔහු විසින් බලයලත් වෙනත් තැනැත්තෙකු විසින් පරීක්ෂා කර බැලිය හැකි වීම සඳහා කිරිපට්ටියේ තබාගත යුතුය.

06. සෑම කිරිපට්ටි බලපත්‍රලාභියෙකු එම කිරි පට්ටියේ කොටසක් වන සෑම කාමරයකම බිත්ති අවුරුද්දකට දෙවතාවක් ජූලි සහ දෙසැම්බර් මාසවලදී හුණු ගෑමට සැලැස්විය යුතුය. ලී වලින් තැනූ කොටසේ යටත් පිරිසෙයින් අවුරුද්දට දෙවතාවක් ජූනි සහ දෙසැම්බර් මාස වලදී ද සභාපතිවරයා විසින් ලියවිල්ලක් මගින් නියම කරනු ලබන වෙනත් අවස්ථාවන්හිදී ද උණුවතුර සහ සබන් යොදා ඔහු විසින් සේදවිය යුතුය.

07. සෑම කිරිපට්ටි බලපත්‍රලාභියෙකුම කිරි කාමරයේ බිම සහ මේසය මතුපිට යටත් පරිසෙයින් දිනකට එක්වරක්වත් සේදවිය යුතුය.

08. සෑම කිරිපට්ටි බලපත්‍රලාභියෙකුම කිරිපට්ටියේ ප්‍රයෝජනයට ගන්නා හෝ කිරිපට්ටියට අයිති සියළු භාජන භාණ්ඩ සහ වෙනත් අවශ්‍ය උපකරණ පිරිසිදුව තබා ගැනීමට සැලැස්විය යුතු ය.

09. සෑම කිරිපට්ටි බලපත්‍රලාභියෙකුම කිරිපට්ටියේ සෑම කොටසක්මද එහි වටපිටාව සහ කාණු ද පිරිසිදුව සහ මනා අලුත්වැඩියා තත්ත්වයකින් තබා ගැනීමට සැලැස්විය යුතු ය.

10. සෑම කිරිපට්ටි බලපත්‍රලාභියෙකුම කිරි දමා පිටතට යවන සියලුම භාජන පිරිසිදු කිරීමටද පිරිසිදු ද්‍රව්‍යයකින් නිසි ලෙස වැසීමට ද සැලැස්විය යුතු අතර ගමනේ ද කිරි අපිරිසිදු වීම වැළැක්වීමට නිසි සියළු පූර්වාරක්‍ෂාව යෙදිය යුතු ය.

11. සෑම කිරිපට්ටි බලපත්‍රලාභියෙකුම කිරි තබා ගැනීම සඳහා වීදුරු පෝසිලේන් ඔප දැමූ විට ඉනැමල් යකඩ, ගැල්වනයිස් කල යකඩ හෝ ටින් භාණ්ඩ භාවිතා කල යුතු අතර එවැනි භාණ්ඩ ගව මඩුවේ තැබීමට ඉඩ නොදිය යුතු ය.

12. සෑම කිරිපට්ටි බලපත්‍රලාභියෙකුම යටත් පිරිසෙයින් දිනකට එක් වරක්වත් සියලු ගොම, කසළ, මුත්‍රා සහ සෝදන ජලය කිරි පට්ටියෙන් ඉවත් කිරීමටද ඒවායින් පීඩාවක් නොවන ආකාරයට ඒවා බැහැර කිරීමටද සැලැස්විය යුතු ය.

13. කිසිම හේතුවක් නිසා කිරිපට්ටි බලපත්‍රලාභියකු කිසිම සතකු හෝ පක්ෂියකු කිරි කාමරයේ තබා නොගත යුතු ය.

14. කිසිම කිරිපට්ටි බලපත්‍රලාභියෙකු කිරි භාජන, බටර් භාජන, මෝරු සාදන භාජන වෙන් කිරීමේ උපකරණ හෝ කිරිපට්ටියේ වෙනත් භාණ්ඩ ඒවායින් අපේක්ෂිත කාර්යය හැර වෙනත් කාර්යකට යෙදවීමට ඉඩ නොදිය යුතු අතර, යටත් පිරිසෙයින් දිනකට එක් වරක් වත් ඒවා පැහෙන ජලය යොදා පිරිසිදු කිරීමට සැලැස්විය යුතු ය.

15. යම් ස්පර්ශක, ආසාදන හෝ චර්ම රෝගයකින් පෙළෙන හෝ ළඟදී පෙලුනාවූ හෝ එවැනි රෝගයකින් පෙළෙන තැනැත්තකුට සාත්තු කිරීමෙහි මෑතකදී යෙදී සිටියාවූ කිසිම තැනැත්තෙකු එම රෝගය බෝවීමේ කාලය සහ බීජෝපන කාලය ඉකුත් වන තුරු කිරිපට්ටියකට ඇතුළුවීම හෝ කිරි සකස් කිරීම විකිණීම හෝ ප්‍රවාහනය කිරීම නොකළ යුතු ය.

16. කිරිපට්ටි බලපත්‍රලාභියෙකු හෝ කිරි පට්ටිය භාරව හෝ එහි පාලනය භාරව සිටින කිසිම තැනැත්තකු විසින් යම් ස්පර්ශක ආසාදක හෝ චර්ම රෝගයකින් පෙළෙන හෝ ළඟදී පෙලෙමින් සිටි හෝ එවැනි රෝගයකින් පෙළෙන තැනැත්තෙකුට මෑතකදී සාත්තු කරමින් සිටි යම් තැනැත්තකු එම රෝග බෝවීමේ සහ බීජෝපන කාලය ඉකුත් වන තුරු දැනුවත්ව සේවයේ යෙදවීම හෝ කිරිපට්ටි භූමියට ඇතුළු වීමට ඉඩදීම හෝ නොකළ යුතු ය.

17. සෑම කිරිපට්ටි බලපත්‍රලාභියෙකු ම එම කිරි පට්ටිය සඳහා අවශ්‍ය ජලය -

(අ) පොදු ජලය සැපයුම් ක්‍රමයක් තිබෙන අවස්ථාවක නම් එම පොදු ජලසැපයුම් ක්‍රමයෙන් ලබා ගත යුතු අතර, එවැනි අවස්ථාවකදී ලඟම පිහිටි ප්‍රධාන ජල නලයේ සිට නල දැමීම විය යුතු අතර, එයින් සපයා ගන්නා ජලය ගොඩනැගිල්ල ඇතුළත ජල කරාම මගින් ලබාගත යුතු ය. නැතහොත්

(ආ) පොදු ජල සම්පාදන ක්‍රමයක් නැති අවස්ථාවක නම් පිරිසිදු ජලය සෑහෙන ප්‍රමාණයක් සැපයිය හැකි සුදුසු ජල මූලාශ්‍රයකින් ලබාගත යුතු ය.

18. පොදු ජල සැපයුමකින් හැර වෙනත් ප්‍රභවයකින් ජලය ලබා ගන්නා සෑම කිරිපට්ටි බලපත්‍රලාභියෙකුම පොදු ජල සැපයුමක් ඇති කරන ලද වහාම එම පොදු ජල සැපයුමෙන් ජලය ලබාගත යුතු ය.

19. කිරි දොවන අවස්ථාවේදී එළදෙනගේ කිරි බුරුල්ල හා තනපුඩු පිරිසිදුව පවතින්නේ නම් ද එමෙන්ම කිරි දොවන පුද්ගලයාගේ අත් පිරිසිදුව හා සියලු ආසාදන සහ දූෂිත වීම් වලින් තොරව පවතින්නේ නම් ද මිස, වෙළඳාම සඳහා කිසිම එළදෙනකුගෙන් කිරි දෙවීමට සැලැස්වීම කිසිම කිරිපට්ටි අවසර පත්‍රලාභියෙකුම විසින් නොකළ යුතු ය .

20. කිරිපට්ටි බලපත්‍රලාභියා විසින් ස්වකීය කිරිපට්ටියේ සේවයේ යොදවා ඇති තැනැත්තන් අතර යම් ස්පර්ශක හෝ ආසාදන රෝගයක් ඇති වුවහොත් හෝ එසේ සැකකරනු ලැබුවහොත් ඒ පිළිබඳ සභාපතිවරයාට නොපමාව දැන්වීමක් කළ යුතු ය.

21. (1) ස්වකීය කිරිපට්ටියේ යම් සතකුට ස්පර්ශක හෝ ආසාදන රෝගයක් වැළඳුන විට සෑම කිරිපට්ටි බලපත්‍රලාභියෙකු විසින්ම නොපමාව ඒ කාරණය ගැන සභාපතිවරයාට දැන්වීමක් කළ යුතු ය. රෝගය බෝවීම හෝ රෝගී සතා සමඟ සම්බන්ධවීම වැළැක්වීම සඳහා බලපත්‍රලාභියා විසින් ස්පර්ශක හෝ ආසාදන රෝගයකින් පෙළෙන හෝ පෙළෙන බවට සැකකරනු ලබන ඔහුගේ කිරිපට්ටියේ සිටින යම් සතකු නොපමාව අනෙක් සතුන්ගෙන් ඈත් කිරීමට සැලැස්වීම කළ යුතු ය.

(2) යම් ස්පර්ශක හෝ ආසාදන රෝගයක් පැතිරුණු විට එම රෝගය පැතිරීම පාලනය කිරීම සඳහ සභාපතිවරයා හෝ වෙනත් නිසි බලධරයෙකු විසින් දෙනු ලබන උපදෙස් සෑම කිරිපට්ටි අවසර පත්‍රලාභියෙකු විසින්ම ක්‍රියාත්මක කළ යුතු ය.

(3) කිරි බුරුල්ලේ හෝ අන් තැනක ඇතිවන ක්ෂය රෝගයෙන් තිවුස්තන ප්‍රදාහයෙන්, කුර හා මුඛ රෝගයකින් ඇන්ත්‍රැක්ස් රෝගයකින්, කිරි බුරුල්ලේ ඇන්ටිනොමයිකොසිස් රෝගයෙන් පෙළෙන යම් සතෙකුගේ කිරි විකිණීම හෝ විකිණීමට ඉඩ දීම හෝ විකිණීමට හෝ මනුෂ්‍ය පරිභෝජනයට ඇති යම් වෙනත් සතුන්ගේ කිරිවලට එකතු කිරීම හෝ එකතු කිරීමට ඉඩදීම නොකල යුතු ය.

22. සෑම කිරිපට්ටි බලපත්‍රලාභියෙකු විසින්ම තණකොළ හා පිදුරු හැර සියළුම ගව ආහාර මීයන්ට ඇතුළුවිය නොහැකි සුදුසු භාජනවල තබා තිබිය යුතු ය.

23. (1) කිසිම කිරිපට්ටි බලපත්‍රලාභියෙකු විසින් විකිණීමට ඇති කිරි, කිරි කාමරයේ හැර වෙනත් තැනක තැබීමට ඉඩ නොදිය යුතු ය.

(2) කිසිම කිරිපට්ටි බලපත්‍රලාභියෙකු විසින් කිරි කාමරය කිරි ගබඩා කර තැබීමේ සහ සකස් කිරීමේ කාර්යය හැර වෙනත් කිසිම කාර්යයක් සඳහා භාවිතා කිරීම හෝ භාවිතා කිරීමට ඉඩදීම නොකළ යුතු ය.

24. කිසිම කිරිපට්ටි බලපත්‍රලාභියෙකු විසින් ජලය හෝ වෙනත් බාහිර ද්‍රව්‍යයක් හෝ ද්‍රව්‍යයන් එකතු කිරීමෙන් කිරි බාල නොකළ යුතු ය. තවද බාල කළ කිරි විකුණුම හෝ විකිණීමට ඉදිරිපත් කිරීම, ප්‍රදර්ශනය කිරීම හෝ ඇවිදීමෙන් විකිණීම හෝ විකිණීමට භාරදීම ඔහු විසින් නොකළ යුතු ය.

25. යොදය ඉවත් කළ කිරි "යොදය ඉවත් කළ කිරි යනුවෙන් " සිංහලෙන් සහ ඊට සමාන වචන දෙමළෙන් සහ ඉංග්‍රීසියෙන් නිරවුල්වද පැහැදිලිව ද හොඳින් පෙනෙන සේද ලේබල් ගසා ඇති භාජනයක අඩංගු කර එසේ වූ කිරි වශයෙන් විකුණනු ලබන්නේ නම් මිස, කිසිම කිරිපට්ටි බලපත්‍රලාභියෙකු විසින් යොදය ඉවත් කළ කිරි විකිණීම, විකිණීමට ඉදිරිපත් කිරීම හෝ ඇවිදීමෙන් විකිණීම නොකළ යුතු ය.

26. බලපත්‍ර ලත් කිරිපට්ටියක සිටින එළදෙනුන් ගෙන් හැර වෙනත් එළදෙනුන්ගෙන් ලබාගත් කිරි කිසිම කිරි පට්ටියක් බලපත්‍රලාභියෙකු විසින් විකිණීම හෝ සැපයීම නොකළ යුතු ය.

27. සභාපතිවරයාට සෞඛ්‍ය වෛද්‍ය නිලධාරියාට, මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයාට හෝ තත් කාර්යය සඳහා සභාපතිවරයා විසින් පොදුවේ හෝ විශේෂිත ව බලය පවරන ලද වෙනත් යම් නිලධාරියෙකුට බලපත්‍රලත් කිරිපට්ටියකින් හෝ කිරි විකුණන, විකිණීම සඳහා ප්‍රදර්ශනය කරන ඇවිදීමෙන් විකුණන හෝ භාරදෙන යම් තැනැත්තෙකුගෙන් විශ්ලේෂණ සඳහා කිරි සාම්පලයක් එහි වටිනාකම ගෙවා ලබාගැනීමට හිමිකම තිබිය යුතු අතර, වටිනාකම ගෙවනු ලැබූ විට විශ්ලේෂණය සඳහා එවැනි සාම්පලයක් විකිණීමට කිසිම කිරිපට්ටි බලපත්‍රලාභියෙකු හෝ ලියාපදිංචි වෙළෙන්දෙකු හෝ වෙනත් තැනැත්තෙකු විසින් ප්‍රතික්ෂේප නොකළ යුතු ය.

28. තමාට සභාපතිවරයා විසින් නිකුත් කළ බලපත්‍රයක් යටතේ මිස කිසිම තැනැත්තෙකු විසින් පරිපාලන ප්‍රදේශය ඇතුළත වූ යම් ස්ථානයක් කිරි විකිණීම සඳහා භාවිතා නොකළ යුතු ය.

29. කිරි විකුණන ස්ථානය එම කාර්යය සඳහා සුදුසු බවට අදාල පරිපාලන ප්‍රදේශයේ සෞඛ්‍ය වෛද්‍ය නිලධරයා විසින් නිර්දේශ කර ඇත්නම් මිස කිසිම තැනැත්තෙකු 28 වන අතුරු ව්‍යවස්ථාව යටතේ බලපත්‍රයක් ලැබීමට හිමිකම් නොලැබිය යුතු ය.

30. 28 වන අතුරු ව්‍යවස්ථාව යටතේ නිකුත් කරන ලද සෑම බලයත්‍රයක්ම එය නිකුත් කිරීමට විෂය වූ වර්ෂයේ දෙසැම්බර් මස තිස් එක් වන දින දක්වා වලංගුව පැවතිය යුතු ය.

31. සභාපතිවරයා විසින් පවත්නා වර්ෂය සඳහා නිසිලෙස තමා වෙත නිකුත් කරන ලද ලියාපදිංචි කිරීමේ කාඩ්පතක් තමන් ලඟ ඇත්නම් මිස කිසිම තැනැත්තෙකු අදාල පරිපාලන ප්‍රදේශය ඇතුලත විකිණීම සඳහා කිරි භාරදීම ගෙන යාම හෝ ඇවිදීමෙන් විකිණීම නොකල යුතු ය.

32. 31 වන අතුරු ව්‍යවස්ථාව යටතේ ලියාපදිංචි කිරීමේ කාඩ්පතක් නිකුත් කරනු ලබන තැනැත්තා වෛද්‍ය නිලධරයෙකු විසින් පරීක්ෂා කරනු ලැබ එම තැනැත්තා යම් ආසාදන හෝ ස්පර්ශක හෝ චර්ම රෝගයකින් නොපෙලෙන බවට තීරණය කරනු ලැබ ඇත්නම් මිස, එම තැනැත්තාට එම කාඩ්පත් නිකුත් කිරීම සභාපතිවරයා විසින් ප්‍රතික්ෂේප කළ යුතු ය.

(අ) සේවා යෝජකයාගේ නම සහ ලේඛනයේ අංකය,
(ආ) සේවකයාගේ හෝ අනුයෝජිතයාගේ නම සහ ඔහුගේ මාපටඟිලි සළකුණ

33. පවත්නා වර්ෂය සඳහා නිසි ලෙස නිකුත් කරන ලද කාඩ් පත පරීක්ෂා කිරීම සඳහා ඉදිරිපත් කරන ලෙස මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයාගේ තත් කාර්ය සඳහා සභාපතිවරයා විසින් විශේෂිතව හෝ පොදුවේ බලය දෙන ලද යම් තැනැත්තෙකු විසින් නියම කරන ලද විට, එම කාඩ්පත ඉදිරිපත් කිරීම ප්‍රාදේශීය සභා ප්‍රදේශය ඇතුලත කිරි භාර දෙන හෝ විකිණීම සඳහා ගෙන යන හෝ ඇවිදීමින් විකුණන කිසිම තැනැත්තෙකු විසින් ප්‍රතික්ෂේප කිරීම හෝ පැහැර හැරීම නොකළ යුතු ය.

34. කිසිම තැනැත්තෙකු විසින් පරිපාලන දිස්ත්‍රික්කය ඇතුලත පහත දැක්වෙන දේ විකිණීම සඳහා -

(1) (අ) සියයට 3.5කට අඩු මේද නොවන කිරි ඝන ද්‍රව්‍ය හෝ සියයට 3.5කට කිරි අඩංගු යම් එළකිරි,
(ආ) සියයට 9කට අඩු මේද නොවන කිරි ඝන ද්‍රව්‍ය හෝ සියයට 7කට අඩු කිරි මේද අඩංගු මීකිරි

(2) "යොදය ඉවත් කළ කිරි" යනුවෙන් සිංහලෙන් හා ඊට සමාන දෙමළෙන් හෝ ඉංග්‍රීසියෙන් පැහැදිලිවද හොඳින් පෙනෙන සේද ලේබල් ගසා ඇති භාජනයක අඩංගු කර යොදය ඉවත් කළ කිරි වශයෙන් විකුණන්නේ නම් මිස යම් යොදය ඉවත් කළ කිරි

(3) ජලය හෝ වෙනත් බාහිර ද්‍රව්‍යයක් ද්‍රව එකතු කර බාලකළ කිරි එසේ වුවද, යම් තේ හෝ කෝපි කඩයක හෝ ආපන ශාලාවක භූමියේ සිට පරිභෝජනය සඳහා තේ , කෝපි හෝ කොකෝවා එකතු කරන ලද කිරි මේ අතුරු ව්‍යවස්ථාවේ කාර්යය සඳහා බාල කළ කිරි වශයෙන් සළකනු නොලැබිය යුතුය.

(4) කඩදාසි හෝ වෙනත් අපාරගම්‍ය ද්‍රව්‍යයකින් කට නොවැසූ බෝතල්වල අඩංගු කිරි,

36. (1) සියළු සාධාරණ වේලාවල් වලදී යම් කිරි පට්ටියකට හෝ කිරි විකුණන වෙනත් යම් ස්ථානයකට හෝ සභාපතිවරයා හෝ තත් කාර්යය සඳහා සභාපතිවරයාගේ ලියවිල්ලකින් පොදුවේ හෝ විශේෂිතව බලය දෙන ලද ප්‍රාදේශීය සභාවේ වෙනත් නිලධාරියෙකු හෝ ඇතුළුවී එම කිරි පට්ටිය හෝ ස්ථානය පරීක්ෂා කිරීම නීත්‍යානුකූල වන්නේය.

(2) සභාපතිවරයාට හෝ සභාපතිවරයාගෙන් ලියවිල්ලක් මගින් බලයලත් යම් නිලධාරියෙකුට ස්ථානයට ඇතුළුවී පරීක්ෂා කිරීමට බලපත්‍රලාභියා හෝ කිරිපට්ටිය භාරව සිටින තැනැත්තා විසින් ඉඩ දිය යුතු අතර සභාපතිවරයාට හෝ එම නිලධරයාට අවශ්‍ය සියළු සහාය දිය යුතුය.

37. කිරි පට්ටිවලට අදාල මෙම අතුරු ව්‍යවස්ථා අතරින් යම් අතුරු ව්‍යවස්ථාවක් සම්බන්ධයෙන් වූ සෑම උල්ලංඝනය කිරීමක් සඳහා රුපියල් හත්සිය පනහකට නොවැඩි දඩයකින් දඬුවම් කරනු ලැබිය හැකි අතර නොකඩවා කරගෙන යන උල්ලංඝනය කිරීමක් සම්බන්ධයෙන් වන විට වරදකරු කරනු ලැබීමෙන් පසු හෝ එම උල්ලංඝනය කිරීම සම්බන්ධයෙන් අවධානය යොමු කරවමින් සභාපතිවරයාගෙන් හෝ සභාපතිවරයා විසින් බලය දෙන ලද නිලධාරියෙකුගෙන් වූ ලිඛිත දැන්වීමක් භාරදෙනු ලැබීමෙන් පසු එම උල්ලංඝනය කිරීම නොකඩවා කර ගෙන යනු ලබන සෑම දිනයකට රුපියල් දෙසිය පනහකට නොවැඩි අතිරේක දඩයකින් දඬුවම් කරනු ලැබිය යුතුය.

38. නිසි අධිකරණ බලය ඇති අධිකරණයක් විසින් පනවනු ලබන වෙනත් දඬුවමකට අතිරේකව කිරි පට්ටිවලට සහ කිරි වෙළඳාමට අදාල මේ අතුරු ව්‍යවස්ථාවලින් යම් අතුරු ව්‍යවස්ථාවක් දෙවරක් හෝ ඊට වැඩි වාර ගණනක් කඩ කිරීම සම්බන්ධයෙන් වරදකරු කරනු ලැබූ යම් බලපත්‍රලාභියෙකුගේ බලපත්‍රය එම අධිකරණය විසින් අවලංගු කිරීම සම්බන්ධයෙන් කිසිම වන්දියකට බලපත්‍රලාභියා හිමිකම් නොලැබිය යුතුය.

### 18. ආහාර විකිණීම

01. කිසිදු තැනැත්තෙකු විසින් යම් පිසූ ආහාරයක් තිරිඟු පිටිවලින් සෑදූ කෑම රස කැවිලි, පැණි රස කැවිලි, සරුවත්, පැණිබීම කල්තබා ගැනීමට සකස් කළ පළතුරු හෝ ලෙලිගැසූ, පොතු ගැලවූ, කැපූ හෝ අන්‍යාකාරයකින් වහාම පරිභෝජනය සඳහා පිළියෙල කරන ලද පළතුරු දූවිල්ලෙන්, මැස්සන්ගෙන් හෝ රෝග බෝ කරන කෘමීන්ගෙන් ආරක්ෂා වන පරිදි ස්ථිර ද්‍රව්‍යයකින්, සෑදූ පෙට්ටියක හෝ භාජනයක තබා ගෙන හැර ඇවිද විකිණීම සඳහා තැබීම හෝ ප්‍රදර්ශනය කිරීම නොකළ යුතුය. ඔහු විසින් සෑම විටම එවැනි පෙට්ටියක් හෝ භාජනයක් පිරිසිදු තත්ත්වයෙන් තබා ගත යුතු අතර, එහි ද්‍රව්‍ය තැබීමේ හෝ පිරිසිදු කිරීමේ කාර්යය හැර එය විවෘත කර තැබීමට නොසැලැස්විය යුතුය.

02. කිසිදු තැනැත්තෙකු විසින් යම් ආහාර ද්‍රව්‍යයක් ඒ තත්ත්වයෙන්ම විකිණීමේ අදහස ඇතිව ඒ ආහාර ද්‍රව්‍යය සෞඛ්‍යයට හානිකර වූ යම් මූලික ද්‍රව්‍යයක් සමග හෝ වෙනත් ද්‍රව්‍යයක් සමඟ මිශ්‍ර කිරීම, පාට කිරීම සායම් පෙවීමට හෝ කුඩු කිරීම හෝ වෙනත් යම් තැනැත්තෙකු විසින් එසේ මිශ්‍ර කිරීමට, පාට කිරීමට, සායම් පෙවීමට හෝ කුඩු කිරීමට , නිය කිරීමට හෝ ඉඩදීම නොකළ යුතු අතර, කිසිදු තැනැත්තෙකු විසින් එසේ මිශ්‍ර කරන ලද පාට කරන ලද සායම් පොවන ලද හෝ කුඩු කරන ලද ද්‍රව්‍යයක් විකිණීම නොකළ යුතුය.

03. (1) විකිණීමට තබා තිබෙන හෝ ප්‍රදර්ශනය කර තිබෙන මස්, කුකුල්මස් අළුත් හෝ ලුණු දැමූ හෝ ටින් වල ඇසුරු හෝ අයිස් දැමූ මාළු දඩමස්, එළවළු, පළතුරු, පිසූ ආහාර, තිරිඟු පිටියෙන් තැනූ ආහාර, රස කැවිලි, පැණි රස කැවිලි, සරුවත්, පැණිබීම, එළකිරි, මුද්‍රවන ලද කිරි හෝ වෙනත් ආහාර සහ බීම වර්ග මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයා විසින් හෝ තත් කාර්යය සඳහා ප්‍රාදේශීය සභාව විසින් පත්කරන ලද වෙනත් යම් නිලධාරියෙකු විසින් පරීක්ෂා කර බැලීම නීත්‍යානුකූල වන්නේය. තවද, ඒ ආහාර හෝ බීම මනුෂ්‍ය පරිභෝජනය සඳහා අයෝග්‍ය හෝ නුසුදුසු බව ඒ නිලධාරියාට පෙනී ගියහොත් ඒ ද්‍රව්‍ය තහනමකට ගෙන සෞඛ්‍ය වෛද්‍ය නිලධාරියා වෙත යැවීමද නීත්‍යානුකූල වන්නේය.

(2) (1) වන ඡේදය යටතේ තහනමට ගන්නා ලද යම් ආහාර හෝ බීම ද්‍රව්‍යයක් මනුෂ්‍ය පරිභෝජනය සඳහා අයෝග්‍ය බව සෞඛ්‍ය වෛද්‍ය නිලධාරියා විසින් සහතික කරනු ලැබුවේ නම් ඒ ද්‍රව්‍ය තහනමට ගන්නා ලද්දේ යම් තැනැත්තෙකුගේ සන්තකයෙන් ද ඒ තැනැත්තාට වන්දි ගෙවීමක් නොමැතිව විනාශකරනු ලැබිය යුතුය.

04. 1 වන අතුරු ව්‍යවස්ථාව කඩ කරන යම් තැනැත්තෙකු වරදකට වරදකරු වන අතර, නිසි අධිකරණ බලය ඇති අධිකරණයකදී වරදකරු කරනු ලැබීමෙන් පසු රුපියල් හත්සිය පනහකට නොවැඩි දඩයකට යටත් විය යුතුය. තවද නොකඩවා කරන වරදක් සම්බන්ධයෙන් වන විට වරදකරු කරනු ලැබීමෙන් පසු හෝ ඒ කඩ කිරීම ගැන අවධානය යොමු කරවමින් සභාපතිවරයාගෙන් හෝ ප්‍රාදේශීය සභාව විසින් බලය පවරන ලද නිලධාරියෙකුගෙන් ලිඛිත දැන්වීමක් භාර දීමෙන් පසු නොකඩවා දිගටම වරද කරගෙන යන සෑම දිනයක් සඳහාම රුපියල් දෙසිය පනහකට නොවැඩි දඩයකට ද ඒ තැනැත්තා යටත් විය යුතුය.

### 19. මාළු විකිණීම

1. (1) තත්කාර්ය සඳහා ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද බලපත්‍රයක් මත මිස කිසිදු තැනැත්තෙකු විසින් මාළු විකිණීම සඳහා (වෙළඳ පොලක් හැර) යම් සාප්පුවක් හෝ ස්ථානයක් භාවිතා නොකළ යුතුය.

(2) මේ අතුරු ව්‍යවස්ථාවේ (1) වන ඡේදය යටතේ කළින් අවලංගු කලේ නම් මිස ඒ බලපත්‍රය නිකුත් කරන ලද්දේ කවර වර්ෂයක් සඳහා ද ඒ වර්ෂයේ දෙසැම්බර් මස තිස් එක් වන දිනෙන් අවසන් විය යුතුය.

2. බලපත්‍රය ලබාගැනීම සඳහා වූ ස්ථානය සහ ඒ වෙළඳ සැලේ ඇති උපකරණ පහත සඳහන් කොන්දේසිවලට අනුකූල වෙතොත් මිස මාළු වෙළඳ සැලක් පැවැත්වීම සඳහා බලපත්‍රයක් ලබාගැනීමට කිසිදු තැනැත්තෙකුට හිමිකම් නොතිබිය යුතුය.

(අ) ගොඩනැගිල්ල (මෙහි මින් මතු "සභාපතිවරයා" යයි සඳහන් කරනු ලබන) ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා විසින් අනුමත කරන ලද සැලැස්මකට අනුකූල වනසේ සාදනු ලැබිය යුතුය.

(ආ) ස්ථානය යහපත් ප්‍රතිසංස්කරණ තත්වයෙන් සහ හොඳින් වාතාශ්‍රිතව හා හොඳට ආලෝකමත්ව තිබිය යුතු අතර, සෑම කාමරයකටම විවෘත කළ හැකි විවෘත කළ විට මුළු භූමි ප්‍රමාණයෙන් පහළොවෙන් පංගුවකට නොඅඩු ක්ෂේත්‍ර ඵලයකින් යුත් ජනෙල් යොදා තිබිය යුතුය.

(ඇ) සෑම කාමරයකම සෑම කොටසකම බිත්ති මීටර් 2.14කට නොඅඩු උසකින් විය යුතු අතර පිඟන් ගඩොල් හෝ සිමෙන්ති බදාමයක් හෝ යොදා ඇති කොටස් හැර හුණු බදාමයක් යොදා හුණු ගා තිබිය යුතුය.

(ඈ) සියළුම පියසි නෙත්ති යටත් පිරිසෙයින් බිම සිට මීටර් 1.83 ක් උසට තිබිය.

(ඉ) ලීයෙන් කළ සෑම කොටසකට තෙල් සායම් ගා තිබිය යුතුය.

(ඊ) ගෙබිම මැදපු සිමෙන්තියෙන් සාදා තිබිය යුතු අතර සිමෙන්තියෙන් බැඳ සිමෙන්ති ආලේප කළ කාණුවකට බිම එක් වන ජලය බැස ගොස් බාල්දියකට එක් රැස්වූ ආකාරයකට බෑවුමක් සහිත විය යුතුය.

(උ) මාළු තබන සෑම මේසයක්ම මතුපිට සින්ක් හෝ වෙනත් අපාරගම්‍ය ද්‍රව්‍යයකින් ආවරණය කර තිබිය යුතුය.

(ඌ) ස්ථානයට සනීපාරක්ෂක කසල භාජනයක් සහ සෑහෙන වැසිකිළි පහසුකම් සපයා තිබිය යුතුය.

(එ) ස්ථානය වැසිකිලියක, වැසිකිලිවලක, පොහොර ගොඩක හෝ විවෘත කසල කාණුවක සිට අඩු වශයෙන් මීටර් 15.24 ක් දුරින් පිහිටා තිබිය යුතුය.

(ඒ) ස්ථානය ඇතුලත හෝ ඒ හා කෙළින්ම සම්බන්ධ වන පරිදි හෝ යම්කිසි වැසිකිලි වලක්, වැසිකිලියක් හෝ අළු වලක් නොතිබිය යුතුය.

3. සෑම මාළු වෙළඳසැල් බලපත්‍රලාභියෙකු විසින්ම ස්වකීය ස්ථානයෙහි පිටතින් ප්‍රකටව තැනක සිංහල දෙමළ සහ ඉංග්‍රීසි භාෂා වලින් ඔහුගේ නම හා "බලපත්‍රලත් මාළු වෙළඳසැල" යන වචන පැහැදිලිව පින්තාරු කළ ඵලකයක් සවි කර තිබිය යුතුය.

4. සෑම මාළු වෙළඳසැල් බලපත්‍රලාභියෙකු විසින්ම, මෙම අතුරු ව්‍යවස්ථාවල සිංහල, දෙමළ හා ඉංග්‍රීසි පිටපතක් රාමුකර බලපත්‍රලත් ස්ථානයෙහි ප්‍රකට තැනක එල්ලා තැබීමට සැලැස්විය යුතුය.

5. තවද, ඔහු විසින් මාළු වෙළෙන්දන් ඇතුළුව, සියළු සේවකයන්ගේ නම් සහ ලිපිනයන් අඩංගු ලැයිස්තුවක් සෑම වේලාවන්හිම පරීක්ෂා කළ හැකි පරිදි, ඒ ස්ථානයෙහි තැබිය යුතුය.

6. පිඟන් ගඩොල් අල්ලා ඇති හෝ සිමෙන්ති බදාමයක් යොදා ඇති කොටස් හැර මාළු වෙළඳසැලට අයත් වන සෑම කාමරයක බිත්තිවල හුණු ගෑම සහ ලීයෙන් කළ සියළුම කොටස්වල හුණු ගෑම හෝ තෙල්සායම් ගා තිබේ නම්, උණු වතුර සහ සබන් යොදා සේදීම අඩුම වශයෙන් අවුරුද්දකට දෙවරක් සහ ප්‍රාදේශීය සභාව විසින් ලියවිල්ලකින් නියම කරනු ලැබිය හැකි වෙනත් යම් වේලාවන්හිදී සෑම මාළු වෙළඳ සැල් බලපත්‍රලාභියෙකු විසින්ම සිදු කළ යුතුය.

7. සෑම මාළු වෙළඳසැල් බලපත්‍රලාභියෙකු විසින්ම බලපත්‍රයෙහි නියම කර ඇති යම් වේලාවක දිනපතා එක් වරක් ගෙබිම, බිත්තියෙහි පිඟන් ගඩොල් අල්ලා ඇති හෝ සිමෙන්ති ගා ඇති කොටස, මේස මතුපිට සහ මාළු කැපීමට ගන්නා ලී කොට හොඳට අතුල්ලා සේදීමට සැලැස්විය යුතුය. මාළු එල්ලා තැබීමට ගන්නා කොකු සියල්ලම ඔප දමා මළකඩ බැඳීමෙන් නිදහස්ව තැබීමටද ඔහු විසින් සැලැස්විය යුතුය.

8. සෑම මාළු වෙළඳසැල් බලපත්‍රලාභියෙක් විසින්ම මාළු වෙළඳසැලට අයත් සෑම කොටසක් ඒ අවට කාණු, ගෘහ භාණ්ඩ, භාජන ආදිය සහ මාළු ගබඩා කිරීම, පිළියෙල කිරීම හෝ වෙළඳාම් කිරීම සම්බන්ධයෙන් ප්‍රයෝජනයට ගන්නා උපකරණ හොඳ තත්වයකින් සහ පිරිසිදුව තැබිය යුතු අතර, යම් කිසි කාණුවක්, වැසිකිලියක් වැසිකිලි වලකින් හෝ වෙනයම් ආපදාවක් ඇතිවන දුගඳකින් තොරව තැබිය යුතුය.

9. සෑම මාළු වෙළඳසැල් බලපත්‍රලාභියෙකු විසින්ම, ස්ථානයෙහි සේවයෙහි නියුක්ත කර සිටින අය විසින් පහසුවෙන් ප්‍රයෝජනයට ගතහැකි වන පරිදි ඒ මාළු වෙළඳ සැලෙහි සනීපාරක්ෂක කසල භාජනයක් සහ යටත් පිරිසෙයින් එක් පඩික්කමක්වත් තැබීමට සැලැස්විය යුතුය.

10. සෑම මාළු වෙළඳසැල් බලපත්‍රලාභියෙකු විසින්ම සින්ක් හෝ ගැල්වනයිස් යකඩ වලින් සෑදූ ආවරණය කළ භාජනයක සියළුම ව්‍යාපාරයීය සහ ගෘහස්ථ වගා බහාලීමට සහ බලයලත් ස්ථානයෙන් දිනපතා ඉවත්කිරීමට, සැලැස්විය යුතුය. එකී භාජනයට නියම වශයෙන් කැලි කසල බහාලන විට හැර අනික් සෑම වේලාවකම එය වසා තැබීමට ඔහු විසින් සැලැස්විය යුතුය.

11. සෑම මාළු වෙළඳසැල් බලපත්‍රලාභියෙකු විසින් බලපත්‍රලත් ස්ථානය මීයන්ගෙන්, දඩාවතේ යන බල්ලන්ගෙන්, බළලුන්ගෙන්, හා ගවයන්ගෙන් මැස්සන්ගෙන් සහ රෝග බෝ කරන කෘමීන්ගෙන් තොරව තැබීම කළ යුතුය.

12. කිසිදු තැනැත්තෙකු විසින් බලපත්‍රලත් ස්ථානයෙහි සත්වයින් හෝ පක්ෂීන් තබා ගැනීම නොකළ යුතු ය.

13. කිසිදු තැනැත්තෙකු විසින් මාළු වෙළඳසැලක් තුල ඒ සඳහා තබා ඇති පඩික්කමට හැර කෙළ ගැසීම නොකළ යුතු ය.

14. ආසාදක, ස්පර්ශක හෝ චර්මගත රෝගයකින් පෙළෙන්නාවූ හෝ මෑතකදී පෙළුණු හෝ එවැනි රෝගයකින් පෙළෙමින් සිටි යම් කිසි තැනැත්තෙකුට මෑතකදී උපස්ථාන කළ කිසිම තැනැත්තෙකු විසින් මාළු වෙළඳ සැලකට ඇතුල්වීම හෝ එහි මාළු ගබඩා කිරීම, පිළියෙල කිරීම හෝ වෙළඳාම් කිරීම හෝ එතැනින් හෝ එතැනට මාළු ප්‍රවාහනය කිරීම නොකළ යුතු ය.

15. කිසිදු මාළු වෙළඳසැල් බලපත්‍රලාභියෙක් විසින් 12 වන අතුරු ව්‍යවස්ථාව හෝ 13වන අතුරු ව්‍යවස්ථාව හෝ 14 වන අතුරු ව්‍යවස්ථාව කඩ කිරීමෙහි ලා යම් තැනැත්තෙකුට ගුප්තානුකූලතාව දැක්වීම හෝ කඩ කිරීමට ඉඩදීම හෝ නොකළ යුතු ය.

16. මාළු ගබඩා කිරීම, පිළියෙල කිරීම හෝ විකිණීම සඳහා ප්‍රයෝජනයට ගනු ලබන ඒවා හැර, බලපත්‍ර ලත් ස්ථානයෙහි යම් ගෘහභාණ්ඩ රෙදි නිදන පැදුරු හෝ වෙනත් භාණ්ඩ කිසිදු තැනැත්තෙකු විසින් නොතැබිය යුතුය.

17. කිසිදු මාළු වෙළඳසැලක බලපත්‍රලාභියෙකු විසින්, මාළු වෙළඳසැල හා සම මට්ටමේ සහ එකම ගොඩනැගිල්ලේ කොටසක් වන යම් කිසි ස්ථානයක්, බිම සිට සිවිලිම දක්වාවූ වෙන් කිරීමකින් මාළු වෙළඳ සැලෙන් වෙන් කර තිබේ නම් මිස සහ විවෘත කළ විට මුළු භූමි ප්‍රමාණයෙන් පහළොවෙන් පංගුවකට නොඅඩු ක්ෂේත්‍රඵලයකින් යුතු බාහිර ජනේලයක් සපයා තිබේ නම් මිස, නිදන ස්ථානයක් ලෙස පාවිච්චි කිරීමට ඉඩ නොදිය යුතු ය.

18. සෑම මාළු වෙළඳසැල් බලපත්‍රලාභියෙකු විසින්ම, බලපත්‍රලත් ස්ථානයෙහි බීමට සුදුසු ජලය සෑහෙන ප්‍රමාණයක් සපයා තිබිය යුතු ය.

19. සෑම මාළු වෙළඳසැල් බලපත්‍රලාභියෙකු විසින්ම, බලපත්‍රලත් ස්ථානය දිනපතා පෙ.ව. 7.00 සිට ප.ව. 7.00 දක්වා මාළු විකිණීම පිණිස විවෘත කර තැබිය යුතු ය.

20. කිසිදු මාළු වෙළඳසැල් බලපත්‍රලාභියෙකු විසින්, සභාපතිවරයා විසින් සහ මාළු වෙළඳසැල් බලපත්‍රලාභියා විසින් අත්සන් තබන ලද ලියාපදිංචි කිරීමේ කාඩ්පතක් තමා වෙත තිබේනම් මිස, යම් තැනැත්තෙකුට බලපත්‍රලත් ස්ථානයේ සිට විකිණීම පිණිස මාළු ප්‍රවාහනය කිරීමට ඉඩ නොදිය යුතු ය.

21. කිසිදු මාළු වෙළඳසැල් බලපත්‍රලාභියෙක් විසින්, ආවරණය කළ වාහනයක හෝ ආවරණය කළ කූඩයක ටින් එකක් හෝ වෙනත් සුදුසු භාජනයක තබාගෙන මිස මාළු කිසිවක් විකිණීම පිණිස සිය බලපත්‍රයක් ස්ථානයේ සිට ප්‍රවාහනය කිරීමට ඉඩ නොදිය යුතු ය. එවැනි වාහනයක්, කූඩයක් ටින් එකක් හෝ වෙනත් භාජනයක් සියලු කල්හි පිරිසිදුව හා යෝග්‍ය ලෙස තබාගෙන ඇති බවට ඔහු විසින් වගබලා ගතයුතු ය.

22. මාළු වෙළඳසැල් බලපත්‍රලාභියා විසින් ඉල්ලීම් කළ විට එවැනි බලපත්‍රලාභියෙක් විසින් මාළු විකිණීම පිණිස ප්‍රවාහන කිරීම සඳහා සේවයට බඳවා ගෙන සිටිනු ලබන සෑම තැනැත්තෙකු විසින්ම ප්‍රයෝජනයට ගැනීම පිණිස ලියාපදිංචි කිරීමේ කාඩ්පත් සභාපතිවරයා විසින් නොමිලයේ නිකුත් කිරීම නීත්‍යානුකූල වන්නේය.

23. සභාපතිවරයා විසින් හෝ සභාපතිවරයා විසින් ඒ සඳහා පොදුවේ හෝ විශේෂිතව බලය පවරන ලද යම් නිලධාරියෙකු විසින් සියළු සාධාරණ වේලාවක් තුළදී මාළු වෙළඳාම සඳහා වූ යම් සාප්පුවකට හෝ ස්ථානයකට ඇතුල් වී එය පරීක්ෂා කිරීම නීත්‍යානුකූල වන්නේය.

(2) මාළු විකිණීම සඳහා වූ සාප්පුවේ හෝ ස්ථානයේ බලපත්‍රලාභියා විසින් හෝ එය භාරව සිටින තැනැත්තා විසින් සභාපතිවරයාට හෝ සභාපතිවරයා විසින් ලියවිල්ලකින් බලය පවරන ලද යම් නිලධාරියෙකුට ඒ ස්ථානයට ඇතුල්වීමට සහ පරීක්ෂා කර බැලීමට ඉඩදිය යුතු අතර, සභාපතිවරයාට හෝ ඒ නිලධාරියාට අවශ්‍ය විය හැකි සියළු වක්‍ර සහය දෙනු ලැබිය යුතු ය.

24. මාළු විකිණීමට අදාල වූ මෙම අතුරු ව්‍යවස්ථාවල යම් අතුරු ව්‍යවස්ථාවක සෑම කඩ කිරීමක්ම වෙනුවෙන්, රුපියල් හත්සිය පනහකට නොවැඩි දඩයකින් ද, නොකඩවා කරන වරදක් සම්බන්ධයෙන් වරදකරු කරනු ලැබීමෙන් පසු හෝ එය කඩ කිරීම ගැන අවධානය යොමු කරමින් සභාපතිවරයාගෙන් හෝ සභාපතිවරයා විසින් බලය පවරන ලද නිලධාරියෙකුගෙන්, ලිඛිත දැන්වීමක් භාරදීමෙන් පසු නොකඩවා දිගටම වරද කර ගෙනයන සෑම දිනයක් සඳහාම රුපියල් දෙසිය පනහකට නොවැඩි දඩයකින් ද දඬුවම් කරනු ලැබිය යුතු ය.

25. නිසි අධිකරණ බලයක් ඇති අධිකරණයක් විසින් පනවනු ලැබිය හැකි වෙනත් යම් දඬුවමකට අතිරේකව මාළු වෙළඳාම් කිරීමට අදාල මෙම අතුරු ව්‍යවස්ථාවල යම් අතුරු ව්‍යවස්ථාවක් දෙවරක් හෝ ඊට වැඩි වාර ගණනක් කඩ කිරීම වෙනුවෙන් වරදකරු කරනු ලැබූ බලපත්‍රලාභියෙකුගේ බලපත්‍රය ඒ අධිකරණය විසින් අවලංගු කිරීම නීත්‍යානුකූල වන අතර, ඒ අවලංගු කිරීම වෙනුවෙන් බලපත්‍රලාභියාට යම් වන්දියක් ලැබීමට හිමිකමක් නොතිබිය යුතු ය.

**20. මස් විකිණීම**

01. (1) තත් කාර්යය සඳහා ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද බලපත්‍රයක් මත මිස කිසිදු තැනැත්තෙකු විසින් මස් විකිණීම සඳහා (වෙළඳ පොලක් හැර) යම් සාප්පුවක් හෝ ස්ථානයක් භාවිතා නොකළ යුතු ය.

(2) මේ අතුරු ව්‍යවස්ථාවේ (1) වන ඡේදය යටතේ නිකුත් කරන ලද සෑම බලපත්‍රයක්ම 25 වන අතුරු ව්‍යවස්ථාව යටතේ කලින් අවලංගු කලේ නම් මිස ඒ බලපත්‍රය නිකුත් කරන ලද්දේ කවර වර්ෂයක් සඳහා ද ? ඒ වර්ෂයේ දෙසැම්බර් මස තිස් එක් වන දිනෙන් අවසන් විය යුතු ය.

02. බලපත්‍රය ලබාගැනීම සඳහා වූ ස්ථානය සහ ඒ වෙළඳසැලේ ඇති උපකරණ පහත සඳහන් කොන්දේසිවලට අනුකූල වෙතොත් මිස, මස් වෙළඳ සැලක් පැවැත්වීම සඳහා බලපත්‍රයක් කිසිම තැනැත්තකුට නිකුත් නොකළ යුතු ය.

(1) ගොඩනැගිල්ල සභාපතිවරයා විසින් අනුමත කරන ලද සැලැස්මට අනුකූල වනසේ සාදනු ලැබිය යුතු ය.

(2) ස්ථානය යහපත් ප්‍රතිසංස්කරණ තත්වයෙන් සහ හොඳින් වාතාශ්‍රිතව සහ හොඳට අලෝකමත්ව තිබිය යුතු අතර, සෑම කාමරයකම විවෘත කළ හැකි විවෘත කළ විට මුළු බිම් ප්‍රමාණයෙන් පහළොවෙන් පංගුවකට නොඅඩු ක්ෂේත්‍රඵලයකින් යුතු ජනේල සපයා තිබිය යුතු ය.

(3) සෑම කාමරයකම සෑම කොටසකම බිත්ති උසින් අඩි හතකට නොඅඩු විය යුතු අතර, ගඩොල්, කළුගල් හෝ කබුක්ගලින් සාදා එහි ඇතුළත හුණු බදාමක් යොදා හුණු ගා තිබිය යුතුය. ඒ එක් එක් බිත්තියේ ඇතුල්පැත්තේ පහළ කොටස බිම සිට මීටර් 1.2ක් උසට පිඟන් ගඩොලින් හෝ සිමෙන්ති බදාමයෙන් ආවරණය කර තිබිය යුතු ය.

(4) සියළුම පියසි නෙත්ති බිම සිට මීටර් 1.8ක් උසට තිබිය යුතු ය.

(5) වහළ යම්කිසි ස්ථිර ද්‍රව්‍යයකින් සාදා තිබිය යුතු ය.

(6) සියලුම ලීයෙන් කළ කොටස්වල තෙල් සායම් හෝ හුණු ගා තිබිය යුතු ය.

(7) බිම් සම්පූර්ණයෙන්ම සිමෙන්ති දමා තිබිය යුතු ය.

(8) ස්ථානයට ප්‍රමාණවත් ජලාපවහනයක් තිබිය යුතු ය.

(9) බිම සහ බිත්ති පිරිසිදු කිරීමේ කාර්යය සඳහා මේස සහ අනිකුත් සියලුම ගෘහ භාණ්ඩ එහා මෙහා ගෙන යා හැකි විය යුතුය.

(10) මස් තබන සෑම මේසයක්ම මතුපිට සින්ක් හෝ වෙනත් අපාරගම්‍ය ද්‍රව්‍යයකින් ආවරණය කර තිබිය යුතු ය.

(11) ස්ථානයට ප්‍රමාණවත් වැසිකිසි පහසුකම් ද, සනීපාරක්ෂක කසළ භාජනයක් සහ යටතේ පිරිසෙයින් එක් පඩික්කමක් ද සපයා තිබිය යුතු ය.

(12) ස්ථානය පොදු මහා මාර්ගයක, වැසිකිළියක, වැසිකිළිවලක පෙහොර ගොඩක හෝ විවෘත කාණුවක සිට අඩු වශයෙන් මීටර් 15.24ක් දුරින් පිහිටා තිබිය යුතු ය.

(13) ස්ථානය තුළ හෝ ඒ හා කෙළින්ම සම්බන්ධ වන පරිදි කිසිදු වැසිකිළියක් හෝ අළුවලක් නොතිබිය යුතු ය.

03. සෑම මස් වෙළඳසැල් බලපත්‍රලාභියෙකු විසින්ම ස්වකීය ස්ථානයෙහි පිටතින් ප්‍රකටව පෙනෙන තැනක සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවලින් ඔහුගේ නම සහ "බලපත්‍රලත් මස් වෙළඳසැල" යන වචන පැහැදිලිව පින්තාරු කල එලකයක් සවිකර තිබිය යුතු ය.

04. සෑම මස් වෙළඳසැල් බලපත්‍රලාභියෙකු විසින්ම මෙම අතුරු ව්‍යවස්ථාවල සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි පිටපතක් රාමුකර බලපත්‍රලත් ස්ථානයෙහි ප්‍රකට තැනක එල්ලා තැබීමට සැලැස්විය යුතු ය.

05. පිඟන් ගඩොල් අල්ලා ඇති හෝ සිමෙන්ති බදාමක් යොදා ඇති කොටස් හැර මස් වෙළඳසැලට අයත් වන සෑම කාමරයක බිත්තිවල හුණුගෑම සහ ලීයෙන් කළ සියළුම කොටස්වල හුණු ගෑම හෝ තෙල් සායම් ගා තිබේ නම්, උනු වතුර සහ සබන් යොදා සේදීම අඩුම වශයෙන් අවුරුද්දකට දෙවරක් සහ ප්‍රාදේශීය සභාව විසින් ලියවිල්ලකින් නියම කරනු ලැබිය හැකි වෙනත් යම් වේලාවන්හිදී සෑම මස් වෙළඳසැල් බලපත්‍රලාභියෙකු විසින්ම සිදුකලයුතු ය.

06. සෑම මස් වෙළඳසැල් බලපත්‍රලාභියෙකු විසින්ම බලපත්‍රයෙහි නියම කර ඇති යම් වේලාවක දිනපතා එක්වරක් ගෙබිම බිත්තියෙහි පිඟන් ගඩොල් අල්ලා ඇති හෝ සිමෙන්ති ගා ඇති කොටස, මේස මතුපිට සහ මස් කැපීමට ගන්නා ලී කොට හොඳට අතුල්ලා සේදීමට සැලැස්විය යුතුය. මස් එල්ලා තැබීමට ගන්නා කොකු සියල්ලම ඔප දමා මලකඩ බැඳීමෙන් නිදහස්ව තැබීමට ද ඔහු විසින් සැලැස්විය යුතු ය.

07. සෑම මස් වෙළඳසැල් බලපත්‍රලාභියෙකු විසින්ම මස් වෙළඳසැලට අයත් සෑම කොටසක්, ඒ අවට කාණු, ගෘහ භාණ්ඩ, භාජන ආදිය සහ මස් ගබඩා කිරීම, පිළියෙල කිරීම හෝ වෙළඳාම් කිරීම සම්බන්ධයෙන් ප්‍රයෝජනයට ගන්නා උපකරණ හොඳ තත්වයෙන් සහ පිරිසිදුව තැබිය යුතු අතර යම්කිසි කාණුවකින්, වැසිකිලියකින් හෝ වෙනයම් ආපදාවකින් ඇතිවන දුගඳකින් තොරව තැබිය යුතු ය.

08. සෑම මස් වෙළඳසැල් බලපත්‍රලාභියෙකු විසින්ම ස්ථානයෙහි සේවයෙහි නියුක්ත කර සිටිනවුන් විසින් පහසුවෙන් ප්‍රයෝජනයට ගත හැකි වන පරිදි ඒ මස් වෙළඳසැලේ සනීපාරක්ෂක කසල භාජනයක් සහ යටතේ පිරිසෙයින් එක් පඩික්කමක්වත් තැබීමට සැලැස්විය යුතු ය.

09. සෑම මස් වෙළඳසැල් බලපත්‍රලාභියෙකු විසින්ම, සින්ක් හෝ ගැල්වනයිස් සෑදූ ආවරණය කළ භාජනයක ව්‍යාපාරයීය සහ ගෘහස්ථ කැලි කසල බහාලන විට හැර අනිත් සෑම වේලාවකම එය වසාතැබීමට ඔහු විසින් සැලැස්විය යුතු ය.

10. සෑම මස් වෙළඳසැල බලපත්‍රලාභියෙකු විසින්ම බලපත්‍ර ලත් ස්ථානය, මීයන්ගෙන්, දඩාවතේ යන බල්ලන්ගෙන් හා ගවයන්ගෙන්, මැස්සන්ගෙන්, මදුරුවන්ගෙන් සහ වෙනත් රෝග බෝ කරන කෘමීන් ගෙන් තොරව තබාගත යුතු ය.

11. කිසිදු තැනැත්තෙකු විසින් බලපත්‍රලත් ස්ථානයෙහි සත්වයින් හෝ පක්ෂීන් තබා ගැනීම නොකළ යුතු ය.

12. කිසිදු තැනැත්තෙකු මස් වෙළඳ සැල තුළ ඒ සඳහා තබා ඇති පඩික්කමට හැර කෙළ ගැසීම නොකළ යුතු ය.

13. ආසාදන, ස්පර්ශක හෝ චර්මගත රෝගයකින් පෙලෙන්නාවූ හෝ මෑතක දී පෙලුනු හෝ එවැනි රෝගයකින් පෙළෙමින් සිටි යම් කිසි තැනැත්තෙකුට මෑතකදී උපස්ථාන කළ කිසිදු තැනැත්තෙකු විසින් මස් වෙළඳ සැලකට ඇතුල්වීම හෝ එහි මස් ගබඩාකිරීම, පිළියෙල කිරීම හෝ වෙළඳාම් කිරීම හෝ එතැනින් හෝ එතැනට මස් ප්‍රවාහනය කිරීම නොකළ යුතු ය.

14. කිසිදු මස් වෙළඳසැල් බලපත්‍රලාභියෙකු විසින් 12 වන අතුරු ව්‍යවස්ථාව හෝ 13 වන අතුරු ව්‍යවස්ථාව යම් තැනැත්තෙකු විසින් කඩ කිරීමට දැන දැනම ඉඩ නොදිය යුතු ය.

15. මස් ගබඩා කිරීම, පිළියෙල කිරීම හෝ විකිණීම සඳහා ප්‍රයෝජනයට ගනු ලබන ඒවා හැර බලපත්‍රලත් ස්ථානයෙහි යම් ගෘහ භාණ්ඩ, රෙදි, නිදන පැදුරු හෝ වෙනත් භාණ්ඩ කිසිදු තැනැත්තෙකු විසින් නොතැබිය යුතු ය.

16. කිසිදු මස් වෙළඳසැලක බලපත්‍ර ලාභියෙකු විසින් මස් වෙළඳසැල හා සම මට්ටමේ සහ එකම ගොඩනැගිල්ලේ කොටසක් වන යම් කිසි ස්ථානයක් බිම සිට සීලිම දක්වා වූ වෙන් කිරීමකින් මස් වෙළඳ සැලෙන් වෙන්කර තිබේ නම් මිස සහ විවෘත කළ මුළු භූමි ප්‍රමාණයෙන් පහළොවෙන් පංගුවකට නොඅඩු ක්ෂේත්‍ර ඵලයකින් යුතු බාහිර ජනේලයක් සපයා තිබේ නම් මිස නිදන ස්ථානයක් ලෙස පාවිච්චි කිරීමට ඉඩ නොදිය යුතු ය.

17 සෑම මස් වෙළඳසැල් බලපත්‍රලාභියෙකු විසින් බලපත්‍රලත් ස්ථානයෙහි බීමට සුදුසු ජලය සෑහෙන ප්‍රමාණයක් සපයා තිබිය යුතු ය.

18. සෑම මස් වෙළඳසැල් බලපත්‍රලාභියෙකු විසින්ම ප්‍රාදේශීය සභා ප්‍රදේශය තුළ පිහිටි පොදු ඝාතන මඩුවකදී මරණු ලැබ (201 වැනි අධිකාරය වූ) ගෝඝාතක ආඥාපනතේ 21 වන වගන්තිය යටතේ යථාපරිදි ප්‍රකාශිත සහ ප්‍රකාශයට පත් කරන ලද්දාවූ සතුන්ගේ මස් හෝ එකී ආඥාපනතේ 11 වැනි වගන්තිය යටතේ නිසි බලධරයා විසින් තත් කාර්යය සඳහා පත්කරන ලද ස්ථානයකදී මරණ ලද සතුන්ගේ මස් හෝ එකී ආඥාපනතේ 14 වන වගන්තිය යටතේ අවසර පත්‍රයක් යටතේ මරණ ලද සතුන්ගේ මස් හැර වෙනත් මස් කිසිවක් බලපත්‍ර ලත් ස්ථානයෙහි විකිණීම හෝ විකිණීම සඳහා ප්‍රදර්ශනය කිරීම නොකළ යුතු ය.

19. සෑම මස් වෙළඳසැල් බලපත්‍රලාභියෙකු විසින්ම, බලපත්‍රලත් ස්ථානය දිනපතා පෙ. ව. 7.00සිට පෙ. ව. 10.00 දක්වාත් ප. ව. 3.00 සිට ප. ව. 4.00 දක්වාත් මස් විකිණීම පිණිස විවෘතව තැබිය යුතු ය.

20. කිසිදු මස් වෙළඳසැලක බලපත්‍රලාභියෙකු විසින් (මෙහි මින් මතු "සභාපතිවරයා" යනුවෙන් සඳහන් කරනු ලබන) ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා විසින් සහ මස් වෙළඳසැල් බලපත්‍රලාභියා විසින් අත්සන තබන ලද ලියාපදිංචි කිරීමේ කාඩ්පතක් තමා වෙත තිබේ නම් මිස, යම් තැනැත්තෙකුට බලපත්‍රලත් ස්ථානයේ සිට විකිණීම පිණිස මස් ප්‍රවාහනය කිරීමට ඉඩ නොදිය යුතු ය.

21. කිසිදු මස් වෙළඳසැලක බලපත්‍රලාභියෙකු විසින්, ආවරණය කළ වාහනයක හෝ වැසූ කූඩයක, ටින් එකක හෝ වෙනත් සුදුසු භාජනයක තබාගෙන මිස මස් කිසිවක් විකිණීම පිණිස බලපත්‍රලත් ස්ථානයේ සිට ප්‍රවාහනය කිරීමට ඉඩ නොදිය යුතු ය. එවැනි වාහනයක්, කූඩයක්, ටින් එකක් හෝ වෙනත් භාජනයක් සියළු කල්හි පිරිසිදුව සහ යෝග්‍ය ලෙස තබාගෙන ඇති බවට ඔහු විසින් වගබලා ගත යුතු ය.

22. මස් වෙළඳසැල් බලපත්‍රලාභියා විසින් ඉල්ලුම් කළවිට එවැනි බලපත්‍රලාභියෙකු විසින් මස් විකිණීම පිණිස ප්‍රවාහනය කිරීම සඳහා සේවයට බඳවා ගෙන ඇති සෑම තැනැත්තෙකු විසින්ම ප්‍රයෝජනයට ගැනීම පිණිස ලියාපදිංචි කිරීමේ කාඩ්පත් ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරනු ලැබිය යුතු ය.

23. (1) සභාපතිවරයා විසින් හෝ සභාපතිවරයා විසින් ඒ සඳහා පොදුවේ හෝ විශේෂිතව බලය පවරන ලද සභාවේ යම් නිලධාරියෙකු විසින් හෝ සියලු සාධාරණ වේලාවක් තුළදී මස් වෙළඳාම සඳහා වූ යම් සාප්පුවකට හෝ ස්ථානයකට ඇතුල්වීම සහ එය පරීක්ෂා කර බැලීම නීත්‍යානුකූල වන්නේය.

(2) මස් විකිණීම සඳහා වූ සාප්පුවේ හෝ ස්ථානයේ බලපත්‍රලාභියා විසින් හෝ එය භාරව සිටින තැනැත්තා විසින් සභාපතිවරයාට හෝ සභාපතිවරයා විසින් ලියවිල්ලකින් බලය පවරන ලද යම් නිලධාරියෙකුට ඒ ස්ථානයට ඇතුල්වීමට සහ පරීක්ෂා කර බැලීමට ඉඩදිය යුතු අතර, සභාපතිවරයාට හෝ නිලධාරියාට අවශ්‍ය විය හැකි සියළු සහය දෙනු ලැබිය යුතු ය.

24. මෙම අතුරු ව්‍යවස්ථාවල යම් අතුරු ව්‍යවස්ථාවක් කඩ කරන සෑම තැනැත්තෙක්ම රුපියල් හත්සිය පනහකට නොවැඩි දඩයකින් ද නොකඩවා කරන වරදක් සම්බන්ධයෙන් වන විට වරදකරු කරනු ලැබීමෙන් පසු හෝ ඒ කඩ කිරීම ගැන අවධානය යොමු කරමින්, සභාපතිවරයාගෙන් හෝ ප්‍රාදේශීය සභාව විසින් බලය පවරන ලද නිලධාරියෙකුගෙන් ලිඛිත දැන්වීමක් භාරදීමෙන් පසු නොඩකවා දිගටම වරද කරගෙන යන සෑම දිනයක් සඳහාම රුපියල් දෙසිය පනහකට නොවැඩි දඩයකින් ද දඬුවම් කරනු ලැබිය යුතු ය.

25. නිසි අධිකරණ බලයක් ඇති අධිකරණය ක් විසින් පනවනු ලබන වෙනත් යම් දඬුවමකට අතිරේකව මස් වෙළඳාම් කිරීමට අදාල මෙම අතුරු ව්‍යවස්ථාවල යම් අතුරු ව්‍යවස්ථාවක් දෙවරක් හෝ ඊට වැඩි වාර ගණනක් කඩ කිරීම වෙනුවෙන් වරදකරු කරනු ලැබූ බලපත්‍රලාභියාගේ බලපත්‍රය අධිකරණය විසින් අවලංගු කිරීම නීත්‍යානුකූල විය යුතු අතර, ඒ අවලංගු කිරීම බලපත්‍රලාභියාට යම් වන්දියක් ලැබීමට හිමිකමක් නොතිබිය යුතු ය.

**21. අප්‍රසන්න හා අන්තරාදායක වෙළඳාම්**

01. මෙම අතුරු ව්‍යවස්ථාවල "අප්‍රසන්න හා අන්තරාදායක වෙළඳාම් " යන්නෙන් සභාවේ යෝජනා සම්මතියකින් එසේ නිශ්චිතව සඳහන් කර මෙම අතුරු ව්‍යවස්ථාවල උපලේඛනයේ ඇතුලත් කරනු ලබන යම් වෙළඳාමක් අදහස්වේ.

02. (1) කිසිදු තැනැත්තෙකු විසින්, තමාගේ තත් කාර්යය සඳහා ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද බලපත්‍රයක් දරන්නෙකු වේ නම් මිස ප්‍රාදේශීය සභා ප්‍රදේශ තුළ ආසන්න හෝ අන්තරාදායක වෙළඳාමක් කරගෙන නොයා යුතු ය.

(2) මේ අතුරු ව්‍යවස්ථාවේ (1) ඡේදය යටතේ නිකුත් කරන ලද බලපත්‍රයක් 16 වන අතුරු ව්‍යවස්ථාව යටතේ කලින් අවලංගු කරන ලද්දේ නම් මිස එය නිකුත් කිරීමට යෙදුනේ කුමන වර්ෂයක් සඳහා ද, ඒ වර්ෂයේ දෙසැම්බර් මස 21 වැනි දායින් අවසන් විය යුතු ය.

03. (1) වෙළඳාම කර ගෙන යනු ලබන ස්ථානය සෞඛ්‍ය වෛද්‍ය නිලධාරියා විසින් හෝ ඔහු විසින් බලය පවරන ලද වෙනත් යම් තැනැත්තෙකු විසින් අනුමත කරන ලද්දේ නම් මිස, සහ

(2) ඒ ස්ථානය සහ ඒ වෙළඳාමේ කාර්යය සඳහා භාවිතයට ගනු ලබන යම් ගොඩනැගිල්ලක් වේ නම් ඒ ගොඩනැගිල්ල පහත සඳහන් වන කොන්දේසිවලට අනුකූල වන්නේ නම් මිස කිසිදු තැනැත්තෙකුට අප්‍රසන්න හෝ අන්තරාදයක වෙළඳාම කර ගෙන යාමට බලපත්‍රයක් නිකුත් නොකළ යුත්තේය.

(අ) ස්ථානය හොඳ ප්‍රතිසංස්කරණ තත්වයකින් සහ හොඳට වාතාශ්‍රිතව සහ හොඳින් ආලෝකමත් කර තිබිය යුතු අතර, විවෘත කළ විට මුළු බිම් ප්‍රමාණයෙන් පහළොවෙන් පංගුවකට නොඅඩු වන ප්‍රමාණයක ජනෙල් සෑම කාමරයකටම සපයා තිබිය යුතු ය.

(ආ) සෑම කාමරයකටම බිත්ති සෑම කොටසකම උසින් මීටර් 2.14 ට නොඅඩු විය යුතු අතර, ගඩොල් ගල් හෝ කබුක්වලින් සාදා තිබිය යුතු ය. ඇතුල්පැත්ත අඩු වශයෙන් පොළොවේ සිට මීටර් 02ක් උසට සිමෙන්ති බදාම යොදා තිබිය යුතු අතර ඇතුල් පැත්තේ ඉතිරි කොටස හුණු බදාම යොදා හුණු ගා තිබිය යුතු ය.

(ඇ) සෑම පියසි කෙළවරක්ම පොළොවේ සිට මීටර් 1.83ක් උසට තිබිය යුතු ය.

(ඈ) වහලය යම්කිසි ස්ථිර ද්‍රව්‍යයකින් සාදා තිබිය යුතු ය.

(ඉ) ලී කර්මාන්ත සියල්ල තෙල් සායම් ගා හෝ හුණු ගා තිබිය යුතු ය.

(ඊ) බිම මුළුමනින්ම සිමෙන්ති දමා තිබිය යුතු ය.

(උ) ස්ථානයෙහි ප්‍රමාණවත් තරම් කාණු සපයා තිබිය යුතු ය.

(ඌ) ස්ථානයට සනීපාරක්ෂක කසල භාජනයක් සහ ප්‍රමාණවත් වැසිකිලි පහසුකම් සපයා තිබිය යුතු ය.

(එ) වෙළඳාම කරගෙන යාමට ඇති ස්ථානයෙහි ඇතුලත විදුලි කම්බි ඇදීම හා එහි සවිකර ඇති ආරක්ෂක උපාංග සම්බන්ධයෙන් ඒ ස්ථානය (විදුලිය) අධිකාරිවරයා විසින් හෝ කාර්මික නිලධාරියා හෝ සභාපතිවරයා විසින් බලය පවරන ලද වෙනත් යම් නිලධාරියෙකු විසින් අනුමත කර තිබිය යුතු ය.

04. (මෙහි මින්මතු ''බලපත්‍රධාරියා'' ද යනුවෙන් හැඳින්වෙන) අප්‍රසන්න හෝ අන්තරාදායක වෙළඳාමක් වෙනුවෙන් වූ සෑම බලපත්‍රධාරියෙකු විසින් ම ඒ වෙළඳාම කරගෙන යාම සඳහා අවශ්‍ය වන්නාවූ සියළු ද්‍රව්‍ය දුගඳ හැමීම හෝ'වෙනයම් පීඩාවක් ඇතිවීම වලක්වන අයුරින් ගබඩා කර තැබිය යුතු ය.

05. සෑම බලපත්‍රධාරියෙකු විසින්ම යම්කිසි නිෂ්පාදන මාර්ගයකදී පිටවන යම්කිසි අප්‍රසන්න වාෂ්ප හෝ ගෑස් ඒවා විහිදී යාමේදී හානිකර හෝ අප්‍රසන්නකර ප්‍රතිඵල ඇතිවීමට ඉඩක් නොමැති වන අන්දමින් හා උසකින් වායු ගෝලයට මුදාහැරීම කළ යුතු ය. නැතහොත් කෙළින්ම ගින්දර හෝ සනීකරණ උපකරණයක් තුලින් පිටවීමට ඉඩ තැබිය යුතු ය.

06. සෑම බලපත්‍රධාරියෙකු විසින්ම, එවැනි ව්‍යාපාරයක් පවත්වාගෙන යන ස්ථානය සඳහා ප්‍රමාණවත් කාණු සැපයිය යුතු අතර, ඒ කාණු ක්‍රියාකාරක තත්ත්වයෙන් තබා ගැනීමත්, දිනපතා සේදීමට සැලැස්වීමක් කළ යුතුය.

07. සෑම බලපත්‍රධාරියෙකු විසින්ම ඒ වෙළඳාම කරගෙන යනු ලබන ස්ථානයෙහි බිම යම් කිසි අපාරගම්‍ය ද්‍රව්‍යයකින් සෑදීමටත් හොඳ ප්‍රතිසංස්කරණ තත්ත්වයෙන් පවත්වාගෙන යාමටත්, දිනපතා ශුද්ධ පවිත්‍ර කිරීමටත් සැලැස්විය යුතු ය.

08. සෑම බලපත්‍රධාරියෙකු විසින්ම, ඒ වෙළඳාම කරගෙන යන්නාවූ ස්ථානයෙහි බිත්ති අපවිත්‍ර දෑ උරා ගැනීමෙන් ආරක්ෂා වන පරිදි, යහපත් තත්ත්වයකින් තබාගත යුතු අතර වර්ෂයක් පාසා ඒවායේ හුණු ගෑ යුතු ය.

09. සෑම බලපත්‍රධාරියෙකුම ඒ වෙළඳාම සඳහා ප්‍රයෝජනයට ගන්නා වූ උපකරණ සහ භාජන ඇතුළුව සියළු උපකරණ පිරිසිදුව තැබීමටත්, හැකි සෑම අවස්ථාවකදීම දිනපතා පිරිසිදු කිරීමටත් කටයුතු කළ යුතු ය.

10. සෑම බලධාරියෙකු විසින්ම, ඒ වෙළඳාම කරගෙන යනු ලබන ස්ථානයෙන්, කසල අතු ගා එකතු වූ බොල් රොඩු සමග අපතේ ගිය ද්‍රව්‍ය සහ අතුරු නිෂ්පාදන, ඒවා ස්ථානයේ වැඩිමනත් ව්‍යාපාර කටයුතුවලට වහාම යොදවන්නේ නම් මිස, ආවරණය කළ භාජනවල බහා ස්ථානයෙන් දිනපතා ඉවත් කරවිය යුතු ය.

11. සෑම බලපත්‍රධාරියෙකු විසින්ම ගම් හෝ වෙනත් ද්‍රව්‍යයක් සේදීම හෝ පෙඟවීම සඳහා ප්‍රයෝජනයට ගනු ලබන ටැංකි දුගඳ හැමීම වැළැක්වීම පිණිස අවශ්‍ය වන පරිදි හිස් කොට ශුද්ධ කළ යුතු ය.

12. කිසිදු බලපත්‍රධාරියෙකු විසින් යම්කිසි ගංගාවක්, දිය පාරක්, ඇලක්, සොරොව්වක්, ළිඳක්, වැවක් හෝ යම් විවෘත ජල ප්‍රදේශයක් තුළට යම් අපවිත්‍ර, දුගඳ හමන හෝ අප්‍රසන්න ජලය හෝ වෙනත් දියරයක් යැවීමෙන් හෝ එතුළට ගලා යාමට සැලැස්වීමෙන් හෝ යම්කිසි අප්‍රසන්න ද්‍රව්‍යයක් එහි සේදීමෙන් හෝ වෙන යම්කිසි අන්දමකින් හෝ එවැනි ගංගාවක්, දිය පාරක්, ඇලක්, සොරොව්වක්, ළිඳක්, වැවක් හෝ විවෘත ජල ප්‍රදේශයක් අපවිත්‍ර කිරීම නොකළ යුතු ය.

13. සභාපතිවරයා විසින් හෝ තත් කාර්යය සඳහා සභාපතිවරයා විසින් පොදුවේ හෝ විශේෂයෙන් බලය පවරන ලද ප්‍රාදේශීය සභාවේ යම් නිලධාරියෙකු විසින් සියළු සාධාරණ වේලාවක් තුළදී අප්‍රසන්න හෝ අන්තරාදායක වෙළඳාමක් කරගෙන යන ස්ථානයකට ඇතුල්වී පරීක්ෂා කර බැලීම නීත්‍යානුකූල වන්නේය. තවද, එවැනි පරීක්ෂණයක් කිරීම සඳහා බලපත්‍රලාභියා විසින් හෝ එහි භාරකාරිත්වය දරන තැනැත්තා විසින් ඉඩ දිය යුතුය.

14. මෙම අතුරු ව්‍යවස්ථාවල කඩ කරන සෑම තැනැත්තෙකුම නිසි අධිකරණ බලය ඇති අධිකරණයකින් වරදකරු කරනු ලැබූ විට රුපියල් පන්සිය පනහකට නොවැඩි දඩයකින් දඬුවම් කරනු ලැබිය යුතු ය. තවද, ඒ කඩ කිරීම ගැන අවධානය යොමු කරමින් සභාපතිවරයා විසින් හෝ සභාපතිවරයා විසින් බලය පවරන ලද නිළධරයෙකු විසින් ලිඛිත දැන්වීමක් භාරදීමෙන් පසු කඩ කිරීම දිගටම කරගෙන යන සෑම දිනයක් සඳහාම රුපියල් දෙසිය පණහකට නොවැඩි අතිරේක දඩයකින් දඬුවම් කරනු ලැබිය යුතුය.

15. අධිකරණය විසින් පනවනු ලැබිය හැකි වෙනත් යම් දඬුවමකට අතිරේකව, අප්‍රසන්න හා අන්තරාදායක වෙළඳාම් වලට අදාළ මෙම අතුරු ව්‍යවස්ථාවල යම් අතුරු ව්‍යවස්ථාවක් කඩකිරීම වෙනුවෙන් දෙවරක් හෝ ඊට වැඩි වාර ගණනක් වරදකරු කරනු ලැබූ බලපත්‍රධාරියෙකුගේ බලපත්‍රය නිසි අධිකරණ බලය ඇති අධිකරණයක් විසින් අවලංගු කිරීම නීත්‍යානුකූල වන්නේය. තවද, එවැනි බලපත්‍රධාරියෙකුට එසේ අවලංගු කිරීම පිළිබඳව කිසිදු වන්දියකට හිමිකම් නොලැබිය යුතු ය.

*උපලේඛනය*

1.
2.
3.
4.
5.

**22. අයිස් කර්මාන්තශාලා**

01. (1) තත්කාර්යය සඳහා (මෙහි මින්මතු ''සභාපතිවරයා'' යයි සඳහන් කරනු ලබන) ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා විසින් නිකුත් කරන ලද බලපත්‍රයක් මත හැර කිසිදු තැනැත්තෙකු විසින් ප්‍රාදේශීය සභා ප්‍රදේශය තුළ අයිස් කර්මාන්ත ශාලාවක් තබා නොගත යුතුය.

(2) මේ අතුරු ව්‍යවස්ථාවේ (1) වන ඡේදය යටතේ නිකුත් කරන ලද සෑම බලපත්‍රයක්ම 17 වන අතුරු ව්‍යවස්ථාව යටතේ කලින් අවලංගු කරන ලද්දේ නම් මිස එය නිකුත් කිරීමට යෙදුනේ කුමන වර්ෂයක් සඳහා ද ඒ වර්ෂයේ දෙසැම්බර් මස 31 වන දායින් අවසන් විය යුතු ය.

02. බලපත්‍රයක් ලබා ගැනීම සඳහා වන ස්ථානය පහත සඳහන් කොන්දේසිවලට අනුකූලව වෙතොත් මිස කිසිදු කර්මාන්ත ශාලාවක් සඳහා බලපත්‍රයක් ලැබීමට හිමිකම් නොලැබිය යුතු ය.

(1) (අ) ස්ථානය හොඳ ප්‍රතිසංස්කරණ තත්වයෙන් සහ හොඳට වාතාශ්‍රිතව හා හොඳින් ආලෝකමත් කර තිබිය යුතු අතර විවෘත කළ විට මුළු බිම් ප්‍රමාණයෙන් පහළොවෙන් පංගුවකට නොඅඩුවන ප්‍රමාණයක ජනෙල් සෑම කාමරයකට තිබිය යුතු ය.

(ආ) සෑම කාමරයකම බිත්ති සෑම කොටසක්ම මීටර් 2.14ට නොඅඩු උසින් විය යුතු අතර, ගඩොල් ගල් හෝ කබුක් වලින් සාදා එහි ඇතුළත හුණු බදාමයක් යොදා හුණු ගා තිබිය යුතු ය.

(ඇ) සෑම පියසි කෙළවරකම පොළොවේ සිට අඩු වශයෙන් මීටර් 1.83ක් උසට තිබිය යුතු ය.

(ඈ) වහළය යම්කිසි ස්ථිර ද්‍රව්‍යයකින් සාදා තිබිය යුතු ය.

(ඉ) ලීයෙන් කළ කොටස් තෙල් සායම් ගා හෝ හුණු ගා තිබිය යුතු ය.

(ඊ) බිම මුළුමනින්ම සිමෙන්ති දමා තිබිය යුතු ය.

(උ) ස්ථානයෙහි ප්‍රමාණවත් තරම් කාණු සපයා තිබිය යුතු ය.

(ඌ) එවැනි කර්මාන්තශාලාවක එක් කාමරයක් අයිස් සෑදීම සඳහා පමණක් යොදාගත යුතු ය.

(එ) අපිරිසිදු වීමෙන් ආරක්ෂිත මාර්ගයකින් ලබාගන්නා ලද සෑහෙන ජල සැපයුමක් ස්ථානයට ලබාදිය යුතු අතර, සංග්‍රමණයේදී අපිරිසිදු මුළුමනින්ම ආරක්ෂා වන පරිදි සෑහෙන ප්‍රවාහන විධි සහ එම ජලය රැස් කිරීම පිණිස නිසි අයුරින් සාදන ලද ටැංකි හෝ ජලාශයක් සපයා තිබිය යුතු ය.

(ඒ) කර්මාන්ත ශාලාවට සනීපාරක්ෂක කසල භාජනයක් සපයා තිබිය යුතු අතර ප්‍රමාණවත් වැසිකිළි පහසුකම් ද සමග යටත් පිරිසෙයින් පඩික්කම් දෙකක්වත් සපයා තිබිය යුතු ය.

(ඔ) කර්මාන්ත ශාලාව, යම්කිසි වැසිකිලියක් මුත්‍රවලකින් ගව මඩුවකින් පොහොර වලකින් හෝ විවෘත කාණුවකින් අඩු වශයෙන් මීටර් 15.24ක දුරින් පිහිටා තිබිය යුතු ය.

(ඕ) කර්මාන්ත ශාලාව හා එක එල්ලේම සම්බන්ධව පිහිටි යම්කිසි වැසිකිළියක්, මුත්‍රා වලක්, ගවමඩුවක්, පොහොර වලක් අළු වලක් නොතිබිය යුතු ය.

(2) ඉන්ධන ගබඩා කිරීම සඳහා විශේෂ කාමරයක් හෝ ස්ථානයක් සපයා තිබිය යුතු අතර, අයිස් සාදන ගබඩා කර තිබෙන හෝ බෙදා හැරීම පිණිස තබා තිබෙන කර්මාන්ත ශාලාවේ යම්කිසි කාමරයක් මැදින් නොයා ඉන්ධන ද්‍රව්‍ය එහි ගෙන යා හැකි පරිදි සහ එහි සිට පෝරණුවට ගෙන යා හැකි පරිදි ඒ කාමරය හෝ ස්ථානය පිහිටා තිබිය යුතු ය.

(3) අයිස් සෑදීම ප්‍රයෝජනයට ගනු ලබන ජලය සභාපතිවරයා විසින් අනුමත කරන ලද සුදුසු පිල්ටරයක් තුළින් යැවිය යුතු අතර එය යන්ත්‍රාගාරයට සම්බන්ධකර තිබිය යුතු ය. එසේ වුවද අනුමත කරන ලද ජලසම්පාදන ක්‍රමයකින් ලබාගන්නා ජලය සම්බන්ධයෙන් මෙම ඡේදය ක්‍රියාත්මක කිරීමෙන් නිදහස් කිරීමේ බලය සභාපතිවරයා වෙත තිබිය යුතු ය.

03. සෑම අයිස් කර්මාන්තශාලා බලපත්‍රලාභියෙකු විසින්ම තමාගේ නම සහ බලපත්‍රලත් අයිස් කර්මාන්තශාලාව යන වචන සිංහල දෙමළ හා ඉංග්‍රීසි භාෂා වලින් පැහැදිලිව පින්තාරු කර ඇති එලකයක් ස්ථානයෙහි පිටත ප්‍රකට තැනක සවිකර තැබිය යුතු ය.

04. අයිස් කර්මාන්ත ශාලාවක සෑම බලපත්‍රලාභියෙකු විසින්ම අයිස් කර්මාන්ත ශාලාවට අදාළ මෙම අතුරු ව්‍යවස්ථාවල සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා වලින් පිටපත් සහ බලපත්‍රයද රාමුකර ඒ ස්ථානයෙහි ප්‍රකටව පෙනෙන තැනක ප්‍රදර්ශනය සඳහා තැබිය යුතු ය. තවද ඒ ස්ථානයේ සේවයේ යොදවා ඇති සියළු තැනැත්තන්ගේ නම් සහ ලිපිනයන් ද සහිත ලැයිස්තුවක් සියලු සාධාරණ වේලාවන්හිදී සභාපතිවරයා විසින් හෝ ඔහු විසින් බලය පවරන ලද යම් තැනැත්තෙකු විසින් පරීක්ෂා කර බැලීමට හැකිවන පරිදි ඒ ස්ථානයෙහි තැබීමට සැලැස්විය යුතු ය.

05. කර්මාන්ත ශාලාවට අයත් වන සෑම කාමරයක ම බිත්තිවල සහ ලී කර්මාන්තවල අවුරුද්දකට වරක් දෙසැම්බර් මාසයේ දී හුණු ගෑම සෑම අයිස් කර්මාන්ත ශාලා බලපත්‍ර ලාභියෙකු විසින් ම කරවිය යුතු ය. තීන්ත ගා තිබේ නම් උණු වතුර සහ සබන් යොදා අවුරුද්දකට වරක් දෙසැම්බර් මාසයේ දී සහ සභාපතිවරයා විසින් නියෝග කළ වෙනත් වේලාවන්හි දී සේදීම කළ යුතු ය.

06. අඩු ගණනේ සෑම දිනකටම වරක්වත් කර්මාන්ත ශාලාවේ බිම සේදීම සෑම අයිස් කර්මාන්තශාලා බලපත්‍රලාභියෙකු විසින් ම කළ යුතු ය.

07. සෑම අයිස් කර්මාන්ත ශාලා බලපත්‍රලාභියෙකු විසින්ම කර්මාන්තශාලාවේ සෑම කොටසක් ම එහි වටා පිටාව කාණු ලී බඩු, භාජන සහ අයිස් සෑදීමට භාවිතා කරන උපකරණ පිරිසිදුව හා හොඳ තත්ත්වයෙන් තබා ගැනීමට සැලැස්විය යුතු ය.

08. අයිස් සෑදීමේ දී භාවිතා කරන ද්‍රව්‍ය හෝ භාණ්ඩ හැරුණු විට වෙන කිසිවක් කර්මාන්තශාලාවට ඇතුලු කිරීම කිසිදු අයිස් කර්මාන්ශාලා බපලත්‍ර ලාභියෙකු විසින් නොකළ යුතු ය.

09. වයස අවුරුදු දාහතරකට අඩු යම් තැනැත්තෙකු කිසිදු අයිස් කර්මාන්තශාලා බලපත්‍ර ලාභියෙකු විසින් සිය කර්මාන්ත ශාලාවෙහි සේවයෙහි නියුක්ත නොකළ යුතු ය.

10. බෝවන රෝගයකින්, වසංගත රෝගයකින් හෝ සමේ රෝගයකින් පෙළෙන්නාවූ හෝ ළඟදී පෙලුනාවූ හෝ එබඳු රෝගයකින් පෙළෙන රෝගියකුට සාත්තු කිරීමෙහි යෙදී සිටියාවූ කිසිදු තැනැත්තෙකු විසින් එකී රෝගය බෝවීමට හා රෝග බීජයක් මෝරනු ලැබීමට ගතවන කාලසීමාව පසුවන තෙක් ඒ කර්මාන්තශාලාවට ඇතුළුවීම හෝ අයිස් සෑදීම, ඇල්ලීම, විකිණීම හෝ ප්‍රවාහනය කිරීම නොකළ යුතු ය.

11. සෑම අයිස් කර්මාන්තශාලා බලපත්‍රලාභියෙකු විසින් ම සියලු මළකැළි කසල, මුත්‍රා සහ ගව මඩුව වැසිකිළි හෝ කර්මාන්ත ශාලාවේ යම් කොටසක් සේදූ ද්‍රව්‍ය දිනකට යටත් පිරිසෙයින් එක් වරක්වත් ඒවායින් පීඩාවක් ඇති නොවීම පිණිස ඉවත් කර සුදුස්සක් කිරීමට සැලැස්විය යුතු ය.

12. අයිස් කර්මාන්තශාලාවක කිසිදු බලපත්‍ර ලාභියෙකු විසින් කවර හෝ ව්‍යාජයක් මත කර්මාන්තශාලාව තුළ යම් සතෙකු හෝ කුරුල්ලෙකු තබා ගැනීම නොකළ යුතු ය.

13. සභාපතිවරයා විසින් හෝ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයා විසින් හෝ ඒ සඳහා සභාපතිවරයා විසින් ලියවිල්ලකින් බලය පවරන ලද යම් තැනැත්තෙකු විසින් එවැනි කර්මාන්ත ශාලාවක් විවෘතව පවත්නා ඕනෑම වේලාවක යම් කර්මාන්ත ශාලාවකට ඇතුල්වී එහි සාදන අයිස් වලින් ලබාගන්නා ලද වතුර සාම්පල ගැනීම නීත්‍යානුකූල විය යුතු අතර එවැනි සාම්පල ගැනීමට අවසර දීම යම් අයිතිකරුවෙකු හෝ එවැනි කර්මාන්ත ශාලාවක් භාරව සිටින තැනැත්තෙකු විසින් ප්‍රතික්ෂේප නොකළ යුතු ය.

14. මනුෂ්‍ය පරිභෝජනය සඳහා අයෝග්‍ය හෝ නුසුදුසු ජලය අයිස් සෑදීම සඳහා යම් බලපත්‍රලාභියෙකු විසින් භාවිතයට නොගත යුතු ය.

15. (1) සභාපතිවරයා විසින් හෝ ඒ සඳහා සභාපතිවරයා විසින් ලියවිල්ලකින් පොදුවේ හෝ විශේෂයෙන් බලය පවරන ලද ප්‍රාදේශීය සභාවේ යම් නිලධාරියෙකු විසින් සියළු සාධාරණ වේලාවක් තුළදී යම් අයිස් කර්මාන්ත ශාලාවකට ඇතුළු වී පරීක්ෂා කිරීම නීත්‍යානුකූල විය යුතු ය.

(2) බලපත්‍රලාභියා විසින් හෝ අයිස් කර්මාන්තශාලාව භාරව සිටින තැනැත්තන් විසින් සභාපතිවරයාට හෝ සභාපතිවරයා විසින් බලය පවරන ලද යම් නිලධාරියෙකුට අයිස් කර්මාන්තශාලාවට ඇතුළු වී එය පරීක්ෂා කිරීමට ඉඩදිය යුතු අතර සභාපතිවරයාට හෝ නිලධාරියාට අවශ්‍ය වියහැකි සියලු සහය ඔහු විසින් දිය යුතු ය.

16. මෙම අතුරු ව්‍යවස්ථාවල යම් අතුරු ව්‍යවස්ථාවක් කඩ කරන සෑම තැනැත්තකු ම නිසි අධිකරණ බලය ඇති අධිකරණයන් විසින් වරදකරු කරනු ලැබූ විට රුපියල් හත්සිය පනහකට නොවැඩි දඩයකට යටත් විය යුතු ය. තව ද ඒ කඩකිරීම නොකඩවා කරගෙන යන අවස්ථාවක වරදකරු කිරීමෙන් පසු ඒ කඩ කිරීම ගැන අවධානය යොමු කරමින් සභාපතිවරයා විසින් හෝ සභාපතිවරයා විසින් බලය පවරන ලද නිලධාරියෙකු විසින් ලිඛිත දැන්වීමක් භාර දීමෙන් පසු කඩ කිරීම දිගටම කරගෙන යන සෑම දිනයක් සඳහාම රුපියල් දෙසිය පනහකට අතිරේක දඩයකින් ද දඬුවම් කරනු ලැබිය යුතු ය.

17. අධිකරණය විසින් පනවනු ලැබිය හැකි වෙනත් යම් දඬුවමකට අයිස් කර්මාන්ත ශාලාවලට අදාළ මෙම අතුරු ව්‍යවස්ථාවල යම් අතුරු ව්‍යවස්ථාවක් කඩ කිරීම වෙනුවෙන් දෙවරක් හෝ ඊට වැඩි වාර ගණනක් වරදකරු කරනු ලැබූ බලපත්‍රලාභියෙකුගේ බලපත්‍රය නිසි අධිකරණ බලය ඇති අධිකරණයක් විසින් අවලංගු කිරීම නීත්‍යානුකූල වන්නේ ය.

**23. සිසිල්බීම කර්මාන්ත ශාලා**

01. (1) තත් කාර්යය සඳහා මෙහි මින් මතු "සභාපතිවරයා" යනුවෙන් සඳහන් කරනු ලබන ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා විසින් නිකුත් කරන ලද බලපත්‍රයක් මත හැර කිසිදු තැනැත්තෙකු විසින් ප්‍රාදේශීය සභා ප්‍රදේශය තුළ යම් සිසිල්බීම කර්මාන්ත ශාලාවක් පිහිටුවීම හෝ තබා ගැනීම නොකළ යුතු ය.

(2) මෙම අතුරු ව්‍යවස්ථාවේ (1) වැනි ඡේදය යටතේ නිකුත් කරන ලද සෑම බලපත්‍රයක් ම, 22 වැනි වගන්තිය යටතේ කලින් අවලංගු කරන ලද්දේ නම් මිස එය නිකුත් කිරීමට යෙදුනේ කුමන වර්ෂයක් සඳහා ද ඒ වර්ෂයේ දෙසැම්බර් මස 31 වැනි දායින් අවසන් විය යුතු ය.

(3) සෑම බලපත්‍රලාභියෙකු ම ප්‍රාදේශීය සභාව විසින් කලින් කළ නියම කරනු ලබන ගාස්තුවක් ගෙවීමට යටත් විය යුතු ය.

02. බලපත්‍රයක් ලබාගැනීම සඳහා වන ස්ථානය පහත සඳහන් කොන්දේසිවලට අනුකූල වෙතොත් මිස කිසිදු තැනැත්තෙකුට සිසිල් බීම කර්මාන්ත ශාලාවක් සඳහා බලපත්‍රයක් ලැබීමට හිමිකම් නැත්තේ ය.

(1) *(අ)* ස්ථානය හොඳ ප්‍රතිසංස්කරණ තත්ත්වයකින් සහ හොඳට වාතාශ්‍රිතව සහ හොඳින් ආලෝකමත් කර තිබිය යුතු අතර, විවෘත කළ විට මුළු බිම් ප්‍රමාණයෙන් පහළොවෙන් පංගුවකට නොඅඩුවන ප්‍රමාණයක ජනෙල් සෑම කාමරයකට ම සපයා තිබිය යුතු ය.

*(ආ)* සෑම කාමරයක ම බිත්ති සෑම කොටසක් ම මීටර් 2.14ට නොඅඩු උසින් විය යුතු අතර ගඩොල් ගල් හෝ කබුක් වලින් සාදා එහි ඇතුළත හුණු බදාමයක් යොදා හුණු ගා තිබිය යුතු ය.

*(ඇ)* සෑම පියසි කෙළවරක්ම පොළොවේ සිට අඩු වශයෙන් මීටර් 1.83ක් උසට තිබිය යුතු ය.

*(ඈ)* වහලය යම්කිසි ස්ථිර ද්‍රව්‍යයකින් සාදා තිබිය යුතු ය.

*(ඉ)* ලීයෙන් කළ කොටස් තෙල් සායම් ගා හෝ හුණු ගා තිබිය යුතු ය.

*(ඊ)* බිම මුළුමනින්ම සිමෙන්ති දමා තිබිය යුතු ය.

*(උ)* ස්ථානයෙහි ප්‍රමාණවත් තරම් කාණු සපයා තිබිය යුතු ය.

(2) යටත් පිරිසෙයින් එක කාමරයක්වත් සිසිල් බීම සෑදීම සඳහා වෙන්කරනු ලැබ තිබිය යුතුය.

(3) සිසිල් බීම නිෂ්පාදනයෙහි ලා ප්‍රයෝජනයට ගන්නා සිරප් සාරයෙන් සහ රසායනික ද්‍රව්‍ය ගබඩා කිරීම සඳහා මැස්සන්ගෙන් ආරක්ෂිතව වෙනම කාමරයක් තිබිය යුතුය.

(4) බෝතල සේදීම සඳහා වෙනම කාරමයක් සපයා තිබිය යුතුය.

(5) කාර්මාන්තශාලාවේ භාවිතයට ගන්නා වූ ජලය අපිරිසිදු වීමෙන් ප්‍රමාණවත් ලෙස ආරක්ෂිත ස්ථානයකින් ලබා ගත යුතු ය. එම ජලය කර්මාන්ත ශාලාවට ලැබෙන්නට සැලැස්වීමේ දී අපවිත්‍ර නොවීමට වගබලා ගත යුතු ය. එම ජලය කර්මාන්ත ශාලාවේ නිසි අයුරින් සාදන ලද ටැංකිවල හෝ ජලාශයන්හි ගබඩා කර තැබිය යුතු ය.

(6) සිසිල් බීම නිෂ්පාදනයේ දී (සහ ඒ හා සම්බන්ධ යම්කිසි නිෂ්පාදන ක්‍රියා මාර්ගයක දී) සහ බෝතල, අමතර උපකරණ සහ භාජන සේදීමේ දී ප්‍රයෝජනයට ගන්නා ජලය සභාපතිවරයා විසින් අනුමත කරන ලද සුදුසු පිල්ටරයක් තුළින් යැවීමට සැලැස්විය යුතු අතර, එය යන්ත්‍රාගාරයට සම්බන්ධකර තිබිය යුතුය. එම ජලය රසායනික හා ක්ෂුද්‍ර ජීව පරීක්ෂණයකින් පිරිසිදු හා යෝග්‍ය බවට ඔප්පු විය යුතු ය.

එසේ වුව ද අනුමත කළ පොදු ජල සැපයුමකින් ලබා ගන්නා ජලය මේ අතුරු ව්‍යවස්ථාවෙන් නිදහස් කිරීමට සභාපතිවරයාට බලය ඇත්තේ ය.

(7) *(අ)* සිසිල් බීම කර්මාන්තශාලාවට සනීපාරක්ෂක කසල භාජනයක් සපයා තිබිය යුතු අතර එහි සේවය කරන තැනැත්තන් සෑම දස දෙනෙකුට එක වැසිකිළියකට නොඅඩු වනසේ ප්‍රමාණවත් වැසිකිළි පහසුකම් සපයා තිබිය යුතු ය.

*(ආ)* සිසිල් බීම කර්මාන්ත ශාලාව යම්කිසි වැසිකිළියකින් මුත්‍රා වලකින්, ගවමඩුවකින්, පොහොර ගොඩකින් හෝ විවෘත කාණුවකින් අඩු වශයෙන් මීටර් 15.24ක දුරින් පිහිටා තිබිය යුතු ය.

*(ඇ)* සිසිල් බීම කර්මාන්තශාලාව තුළ හෝ ඒ හා කෙළින් සම්බන්ධ වන සේ මුත්‍රා වලක්, වැසිකිළියක්, ගව මඩුවක්, හෝ අළු වලක් නොතිබිය යුතු ය.

3. (1) සිසිල් බීම කර්මාන්ත ශාලාවක් වෙනුවෙන් බලපත්‍රයක් නිකුත් කිරීමට යෙදී ඇති කාල සීමාව තුළ කවර හෝ වේලාවක දී ඒ කර්මාන්ත ශාලාවේ කාර්යය සඳහා භාවිතා කරන යම් ගොඩනැගිල්ලක් 2 වැනි අතුරු ව්‍යවස්ථාවේ විධිවිධාන වලට අනුකූලව අවසන් වුවහොත් සභාපතිවරයා විසින් දැන්වීමේ නිශ්චිතව සඳහන් කරනු ලබන දිනයට පෙරාතුව ඒ ගොඩනැගිල්ල එකී විධිවිධාන වලට අනුකූල වන සියලු දේවල් කරන ලෙස කර්මාන්ත ශාලාවේ බලපත්‍ර ලාභියාට නියම කෙරෙන දැන්වීමක් සභාපතිවරයා විසින් භාර දෙනු ලැබීමට සැලැස්විය යුතු ය.

(2) මේ අතුරු ව්‍යවස්ථාවේ (1) ඡේදය යටතේ ලිඛිත දැන්වීමක් භාර දෙනු ලැබූ සිසිල් බීම කර්මාන්තශාලාවක කිසිදු බලපත්‍රලාභියෙකු විසින් ඒ දැන්වීමේ නිශ්චිතව සඳහන් කාල සීමාව තුළ ඒ දැන්වීමේ නියමයන් ඉටු කිරීම පැහැර නොහැරිය යුතු ය.

(3) (1) වැනි ඡේදය යටතේ වූ දැන්වීම බලපත්‍රලාභියා විසින් සිසිල් බීම කර්මාන්තශාලා ව්‍යාපාරය කරගෙන යන්නා වූ ස්ථානයේ එය ඇලවීමට යෙදුණේ නම් හෝ ඒ ස්ථානයේ බලපත්‍රලාභියා විසින් සේවයෙහි යොදවා සිටින යම් තැනැත්තෙකුට එය භාර දීමට යෙදුණේ නම් ඒ දැන්වීම බලපත්‍රලාභියා වෙත යථා පරිදි භාරදුන් ලෙස සලකනු ලැබිය යුතු ය.

(4) සෑම සිසිල් බීම කර්මාන්තශාලා බලපත්‍රලාභියෙකු විසින් ම ඔහුගේ නම සහ "බලපත්‍රලත් සිසිල් බීම කර්මාන්ත ශාලාව" යන වචන සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන භාෂා වලින් පැහැදිලිව පින්තාරු කළ එලකයක් ස්ථානයෙහි ප්‍රකට තැනක සවිකර තැබිය යුතු ය.

(5) සෑම සිසිල් බීම කර්මාන්තශාලා බලපත්‍රලාභිය කු විසින් ම මෙම අතුරු ව්‍යවස්ථාවල සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා වලින් වූ පිටපතක් සහ බලපත්‍රය රාමුකර ඒ ස්ථානයෙහි ප්‍රකටව පෙනෙන තැනක ප්‍රදර්ශනය සඳහා තැබිය යුතු ය.

තව ද, ඒ ස්ථානයෙහි සේවය කරන (සිසිල් බීම වෙළෙන්දන් ද ඇතුළුව) සියලු තැනැත්තන්ගේ නම් හා ලිපිනයන් සහිත ලැයිස්තුවක් සියලු සාධාරණ වේලාවන්හි දී සභාපති විසින් හෝ ඔහු විසින් බලය දෙන ලද යම් තැනැත්තෙකු විසින් පරීක්ෂා කර බැලීමට හැකිවන පරිදි තබා තිබිය යුතු ය.

06. සෑම සිසිල් බීම කර්මාන්ත ශාලා බලපත්‍රලාභියෙකු විසින් ම අවුරුද්දකට වරක් දෙසැම්බර් මාසයේ දී සිසිල් බීම කර්මාන්ත ශාලාවට අයත් සෑම කාමරයකට ම බිත්තිවල හුණු ගෑම සිදු කළ යුතු ය. යටත් පිරිසෙයින් අවුරුද්දක් පාසා දෙසැම්බර් මාසයේ දී සහ සභාපතිවරයා විසින් හෝ ඔහු විසින් ලියවිල්ලකින් බලය පවරන ලද වෙනත් යම් තැනැත්තෙකු විසින් නියම කරනු ලබන වෙනත් වේලාවන් හි දී ලී කර්මාන්ත ශාලා හුණු ගෑම හෝ තෙල් සායම් ගා තිබේ නම් ඒවා උණුවතුර සහ සබන් ගා සේදීම හෝ කළ යුතු ය.

07. සෑම සිසිල් බීම කර්මාන්තශාලා බලපත්‍රලාභියකු විසින් ම යටත් පිරිසෙයින් දිනකට වරක්වත් කර්මාන්ත ශාලාවේ බිම සේදීම කළ යුතු ය.

08. සෑම සිසිල් බීම කර්මාන්තශාලා බලපත්‍ර ලාභියකු විසින් ම කර්මාන්ත ශාලාවේ ප්‍රයෝජනයට ගන්නා සියලුම බෝතල් පහත සඳ**හන්** අන්දමින් මැනවින් සේදීමට සැලැස්විය යුතු ය.

ලේබල් ඉවත් කිරීම සහ මූලික සේදීමේ කටයුතු සඳහා එක් ටැංකියක් සහ අවසන් වරට සේදීම සඳහා ටැංකියක් වශයෙන් බෝතල් සේදීම පිණිස වෙන වෙනම ටැංකි දෙකක් තිබිය යුතු ය. නල මාර්ගයෙන් වූ ජල සැපයුමක් තිබේ නම් අවසන් වරට සේදීම ගලා යන ජලයෙන් සිදු කළ යුතු ය.

09. සෑම සිසිල් බීම කර්මාන්තශාලා බලපත්‍ර ලාභියකු විසින්ම කර්මාන්තශාලවේ සෑම කොටසක් ඒ අවට කාණු, ගෘහ භාණ්ඩ සහ භාජන ආදී උපකරණ සහ සිසිල් බීම නිෂ්පාදනයෙහි ලා ප්‍රයෝජනයට ගන්නා උපකරණ පිරිසිදුව සහ හොඳ ප්‍රතිසංස්කරණ තත්වයෙන් තබා ගැනීමට සැලැස්විය යුතුය.

10. සිසිල්බීම නිෂ්පාදනය සඳහා භාවිතයට ගන්නා ද්‍රව්‍ය හෝ උපකරණ හැර වෙනත් ද්‍රව්‍ය හෝ උපකරණ කිසිවක් සිසිල්බීම කර්මාන්තශාලා බලපත්‍රලාභියෙකු විසින් කර්මාන්තශාලාවට නොගත යුතු ය.

11. කිසිදු සිසිල් බීම කර්මාන්තශාලා බලපත්‍රලාභියෙකු විසින්, අපිරිසිදු, අහියෝග හෝ බාල තත්වයෙන් වූ කිසිදු ද්‍රව්‍යයක් කර්මාන්තශාලවේ භාවිතය පිණිස නොගත යුතුය.

12. සෑම සිසිල්බීම කර්මාන්තශාලා බලපත්‍රලාභියෙකු විසින් ම කර්මාන්තශාලාවේ භාවිතයට ගනු ලබන ද්‍රව්‍ය කුඩා සතුන්ගෙන් ආරක්ෂිත අල්මාරිවල හෝ රාක්කවල තැබීමට කටයුතු යෙදිය යුතු ය.

13. සිසිල් බීම වර්ගයේ ම, නිෂ්පාදනය කළ ස්ථානය, කර්මාන්තශාලා අයිති තැනැත්තාගේ නම සහ සභාපතිවරයා විසින් කර්මාන්තශාලාවට දී ඇති අංකය සඳහන් ලේබලයක් සිසිල්බීම බහා ඇති සෑම බෝතලයක ම යෙදීම සෑම සිසිල් බීම කර්මාන්තශාලා බලපත්‍රලාභියෙකු විසින් ම කළ යුතු ය.

14. කිසිදු සිසිල්බීම කර්මාන්තශාලා බලපත්‍රලාභියෙකු විසින් ඒ සිසිල් බීම කර්මාන්ත ශාලාවේ වයස අවුරුදු 14ට අඩු කිසිම තැනැත්තෙකු සේවයෙහි නොයෙදිය යුතු ය.

15. යම් බෝවන රෝගයකින්, ස්පර්ශයකින් බෝවන රෝගයකින් හෝ චර්මගත රෝගයකින් පෙළෙන හෝ ළඟ දී පෙළුණු කිසිදු තැනැත්තෙකු හෝ එවැනි රෝගයකින් පෙළුණු යම්කිසි තැනැත්තෙකුට ළඟ දී සාත්තු කළ කිසිදු තැනැත්තෙකු සිසිල් බීම කර්මාන්තශාලාවකට ඇතුළත් නොවිය යුතු අතර සිසිල් බීම සෑදීම, විකිණීම හෝ ප්‍රවාහනය කිරීම පිළිබඳ කටයුතු වල නොයෙදිය යුතු ය.

16. සෑම සිසිල් බීම කර්මාන්තශාලා බලපත්‍රලාභියෙකු විසින් සිසිල් බීම බෝතල් කිරීමේ යෙදෙන සෑම තැනැත්තෙකු විසින් ම එසේ යෙදී සිටිය දී දැල් යෙදූ ආවරණයක් මුහුණට යොදා ගැනීමට සහ අත්වල පිරිසිදු අත්මේස් පැළැඳ ගෙන සිටීමට සැලැස්විය යුතු ය.

17. සිසිල් බීම සෑදීමේ දී භාවිතා කරන සිරප්, සාරයන්, රසායනික සහ වෙනත් ද්‍රව්‍ය ගබඩා කිරීම පිණිස, වීදුරු, පිඟන් මැටි, ඔප දැමූ පිඟන් මැටි ඇනමල් කළ වානේ, ගැල්වනයිස් වානේ හෝ ටින් වලින් සෑදූ භාජන සෑම සිසිල් බීම කර්මාන්තශාලා බලපත්‍රලාභියෙකු විසින් භාවිතයට ගත යුතුය. ඔහු විසින් මෙම භාජන වෙන යම්කිසි කාර්යයන් සඳහා ප්‍රයෝජනයට නොගත යුතු අතර, ඒවා ඒ සඳහා වෙන්කර ඇති ස්ථානයක තැබිය යුතු ය.

18. සෑම සිසිල් බීම කර්මාන්තශාලා බලපත්‍රලාභියෙකු විසින් ම, සියලු මළ, කැලි කසල සහ මුත්‍රා සහ ගව මඩු, වැසිකිළි හෝ කර්මාන්තශාලාවේ යම් කොටසක් ස්ේදූ ද්‍රව්‍ය දිනකට යටත් පිරිසෙයින් එක් වරක්වත්, ඒවායින් පීඩාවක් ඇති නොවීම පිණිස ඉවත් කර සුදුස්සක් කිරීමට සැලැස්විය යුතු ය.

19. සභාපතිවරයා විසින් හෝ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයා විසින් ඒ සඳහා සභාපතිවරයා විසින් ලියවිල්ලකින් බලය පවරන ලද යම් තැනැත්තෙකු විසින්, ඒ ස්ථානය විවෘතව පවත්නා ඕනෑම වේලාවක යම් සිසිල් බීම අලෙවි හලකට ඇතුල්වීම ද, ඒ ස්ථානයෙහි නිෂ්පාදනය කරනු ලබන හෝ වෙළඳාමට තබා තිබෙන ඕනෑම වර්ගයක සිසිල් බීමවල සාම්පලයක්, ඒ සඳහා ගෙවිය යුතු ගාස්තුව ගෙවීමෙන් පසු ලබා ගැනීම ද, නීත්‍යානුකූල වන්නේ ය. කිසිදු බලපත්‍රලාභියෙකු විසින් හෝ ඒ ස්ථානය භාරව සිටින තැනැත්තෙකු විසින් සාම්පල් ගැනීම ප්‍රතික්ෂේප නොකළ යුතු ය.

20. මෙම අතුරු ව්‍යවස්ථාවල යම් අතුරු ව්‍යවස්ථාවක් කඩ කරන සෑම තැනැත්තෙකු ම නිසි අධිකරණ බලය ඇති අධිකරණයකින් වරදකරු කරනු ලැබූ විට රුපියල් හත්සිය පනහකට නොවැඩි දඩයකින් දඬුවම් කරනු ලැබීමට යටත් විය යුතු ය. තව ද, ඒ කඩ කිරීම, නොකඩවා කර ගෙන යන අවස්ථාවක වරදකරු කිරීමෙන් පසු හෝ ඒ කඩ කිරීම ගැන අවධානය යොමු කරමින් සභාපතිවරයා විසින් හෝ සභාපතිවරයා විසින් බලය පවරන ලද නිලධාරියෙකු විසින් ලිඛිත දැනුම් දීමක් භාරදීමෙන් පසු කඩ කිරීම දිගට ම කර ගෙන යන සෑම දිනයක් සඳහා ම රුපියල් දෙසිය පනහකට නොවැඩි අතිරේක දඩයකින් ද දඬුවම කරනු ලැබිය යුතු ය.

21. අධිකරණය විසින් පනවනු ලැබිය හැකි වෙනත් යම් දඬුවමකට අතිරේකව, සිසිල්බීම කර්මාන්තශාලා වලට අදාළ මෙම අතුරු ව්‍යවස්ථාවල යම් අතුරු ව්‍යවස්ථාවක් කඩ කිරීම වෙනුවෙන් දෙවරක් හෝ ඊට වැඩි වාර ගණනක් වරදකරු කරනු ලැබූ බලපත්‍ර ලාභියෙකුගේ බලපත්‍රය නිසි අධිකරණ බලය ඇති අධිකරණයක් විසින් අවලංගු කිරීම නීත්‍යානුකූල වන්නේ ය.

24. මැලේරියාව වැලැක්වීම සහ මදුරුවන් විනාශ කිරීම

01. මදුරුවන්ගෙන් බෝවෙන රෝග වැලැක්වීමේ කාර්යය සඳහා සෑම ස්ථානයක ම පදිංචිකරු විසින් -

(i) සියලු නොවැසූ ටින්, බෝතල්, පෝච්චි, පෙට්ටි, ප්ල්ස්ටික් කෑන්, ඉවත දැමූ ටයර්, පොල් ලෙලි, පොල් කටු සහ ජලය රැස්වී රඳා පැවතීමට පුළුවන් ඒ ස්ථානයේ ඇති වෙනත් භාණ්ඩ ඉවත් කරවීමට, විනාශ කරවීමට හෝ අන්‍යාකාරයකින් සාර්ථක ලෙස බැහැර කර දැමීමට සැලැස්විය යුතු ය.

(ii) ඒ ස්ථානයේ ඇති සියලු වැහි පීලිවල පහතට වැටෙන පයිප්පවල සහ කාණුවල ජලය ගලා යාම පිළිබඳ සියළු අවහිරකම් ඉවත් කරවිය යුතු ය.

(iii) ඒ ස්ථානයේ ඇති සියලු ජල බඳුන්, ටැංකි සහ ජලය එක්තැන් තබන වෙනත් භාජන මනා ප්‍රතිසංස්කරණ තත්ත්වයකින් පවත්වාගෙන යාමට ද ඒවා මදුරුවන්ගෙන් ආරක්ෂා වන පරිදි වසා තැබීමට හෝ ආවරණය කර තැබීමට ද, නැතහොත් ඒවායේ මදුරුවන් බෝවීම වලක්වන තත්ත්වයකින් තබා ගැනීමට ද ප්‍රාදේශීය සභාවේ යම් නිලධාරියෙකු පරීක්ෂා කර බැලීමේ කාර්යය සඳහා, මදුරුවන් බෝවීම වැලැක්වීම සඳහා අවශ්‍ය විය හැකි කටයුතු කර ගෙන යාම සඳහාත් ඒවාට පහසුවෙන් සහ ආරක්ෂා සහිත යා හැකි ප්‍රවේශයක් ඇති කිරීමට ද කටයුතු සැලැස්විය යුතු ය.

(iv) ඒ ස්ථානයේ ඇති සියලුම ළිං යහපත් ප්‍රතිසංස්කරණ තත්ත්වයෙන් පවත්වාගෙන යා යුතු අතර මදුරුවන් බෝ නොවීම පිණිස වසා හෝ ආවරණය කර තැබීමට හෝ මදුරුවන් බෝවීම වලක්වාලන තත්ත්වයකින් තබා ගැනීමට කටයුතු සැලැස්විය යුතු ය.

(v) හිස් කිරීමට පිළිවන් ආකාරයෙන් ඒ ස්ථානයේ සාදා ඇති යම් කෘතිම පොකුණක් ඒ ස්ථානයේ වේ නම්, එය යටත් පිරිසෙයින් සතියකට එක් වරක්වත් හිස් කළ යුතු ය.

(vi) ඒ ස්ථානය මැදින් ගලා යන සියලුම ජල මාර්ග, ගංගා ඇලවල් සහ වතුර බැස යන කාණුවල ජලය එකතු වී සිටින දිය කඩිති සෑදීම වැලැක්වීමට පිළිවන් වන අයුරින් ඒවා නඩත්තු කළ යුතු ය.

(viii) සියලුම ගල්වලවල් සහ මැණික් ගැරු වලවල් ඒවායේ ජලය එකතුවීම වලක්වන ආකාරයෙන් පවත්වාගෙන යා යුතු ය.

(viii) ඒ ස්ථානයේ යම් අනියම් ජලය එකතුවීමක් වේ නම් එය බැස යාමට සැලැස්විය යුතු ය.

(ix) ආහාර පිණිස හෝ අලංකාරය සඳහා වවනු ලබයන පැලෑටි හැර අනෙකුත් සියලු ලඳු කැලෑ හෝ යටි වගා සහ වෘක්ෂලතා ආදිය මනුෂ්‍ය වාසස්ථානයක් වශයෙන් භාවිතා කරන යම් ගොඩනැගිල්ලක හෝ ඉදි කිරීමක සිට මීටර් 5.4ක අර්ධ විෂ්කම්භයක් ඇතුළත හෝ ඒ ස්ථානයේ සෑම කොටසක් ම ඉවත් කරනු ලැබිය යුතු ය.

(x) “දිය පරඬැල්” ,“කොද පාසි ”, “තෙල් පාසි”, “බරවා පාසි”හෝ “නනයා විරද්දි” යනුවෙන් සාමාන්‍යයෙන් ප්‍රදේශය තුළ හඳුන්වන ජලජ පැලෑටි හෝ මදුරුවන් බෝවීමට ඉඩකඩ සලසන බව කලින් කල දක්නට ලැබෙන වෙනත් යම් ජලජ පැලෑටියක් හෝ පැලෑටි ඉවත්කොට විනාශ කර දැමිය යුතු ය.

(xi) මේ නියෝගවල X වැනි ජේදයේ සඳහන් කරන ලද පැලෑටි, යම් ජල මාර්ගයක් දිගේ පාවී යාම නවත්වන පරිදි සුදුසු බාධක ඉදිකිරීමෙන් ඒවා පැතිරීම වලක්වා ලිය යුතු ය.

(xii) වැසිකිලි , දියවලවල් , දිය උරන වලවල්, මුද්‍රා තැබූ වලවල් සහ ඒවායේ වටපිටාව ද, ඇතුළු ඒ ස්ථානයේ ඇති සියලු වැසිකිලි, මදුරුවන් බෝවීම වලක්වාලන තත්ත්වයෙන් පවත්වාගෙන යා යුතු ය. තව ද,

(xiii) සියලු පොල් ලෙලි වලවල් සහ කොරල් වලවල් වදුරුවන් බෝවීම වලක්වාලන තත්ත්වයෙන් පවත්වාගෙන යා යුතු ය.

02. (මෙහි මින්මතු "සභාපතිවරයා " යනුවෙන් සඳහන් කරනු ලබන) ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා විසින් හෝ තත් කාර්යය සඳහා පොදුවේ හෝ විශේෂයෙන් ලිඛිතව බලය දෙන ලද යම් නිලධාරියකු විසින් හිරු නැගීමෙන් සහ හිරු බැසීමට පෙර යම් වේලාවක දී යම් ස්ථානයක ට ඇතුල් වී පහත දැක්වෙන කරුණු සහතික කර ගැනීම පිණිස ඒ ස්ථානය පරීක්ෂා කර බැලිය යුතු ය.

(i) ඒ ස්ථානයේ පදිංචිකරු විසින් අතුරු ව්‍යවස්ථාවල නියමයන් පිළිපැද තිබේද යන වග,

(ii) ඒ ස්ථානයේ මදුරුවන් බෝවීම වැලැක්වීම සඳහා සහ විනාශ කිරීම සඳහා යම් පියවර ගැනීම අවශ්‍ය වේ නම් ඒ පියවර මොනවාද යන වග,

(iii) ඒ ස්ථානය මදුරුවන් ගැවසෙන ස්ථානයක් ද යන වග, හෝ

(iv) ඒ ස්ථානයෙහි කෘමි නාශක ඉසීම සාර්ථක ලෙස කර තිබේ ද යන වග.

03. සභාපතිවරයා විසින් හෝ තත් කාර්යය සඳහා ඔහු විසින් විශේෂයෙන් හෝ පොදුවේ ලිඛිතව බලය දෙන යම් නිලධාරියෙකු විසින් යම් ස්ථානයක් පදිංචිකරුට යථා පරිදි දැන්වීමක් කිරීමෙන් පසු, දවල් කාලයේ දී හෝ රාත්‍රි කාලයේ දී රෝගී තැනැත්තන්ගෙන් සහ එවැනි තැනැත්තන් ඇසුරු කළ බවට සැක සිතෙන තැනැත්තන්ගෙන් ලේ සාම්පල් ලබා ගැනීමේ කාර්යය සඳහා ඒ ස්ථානයට ඇතුල් විය හැකිය.

04. සභාපතිවරයා විසින් හෝ ඔහු විසින් තත් කාර්යය සඳහා විශේෂයෙන් හෝ පොදුවේ ලිඛිතව බලය දෙන ලද යම් නිලධාරියෙකු විසින් අවශ්‍ය වේ යැයි සලකනු ලබන එවැනි පරීක්ෂණයකින් පසු ඒ දැන්වීමේ නිශ්චිතව දක්වන කාල සීමාවන් ඇතුළත පහත දැක්වෙන කාර්යය හෝ පියවර අතුරින් එක් කාර්යයක් හෝ පියවරක් හෝ ඊට වැඩි කාර්යයන් හෝ පියවර ගණනක් ක්‍රියාත්මක කරන ලෙස හෝ ඉටු කරන ලෙස ලිඛිත දැන්වීමකින් ඒ ස්ථානයේ අයිතිකරුට හෝ පදිංචිකරුට නියම කරනු ලැබිය හැකිය.

(i) ඒ ස්ථානයේ ඇති සියලු වැහිපීලි පහතට වැටෙන පයිප්ප සහ කාණු අළුත්වැඩියා කිරීම,

(ii) ඒ අයිතිකරුට හෝ පදිංචිකරුට අවශ්‍ය විය හැකි යම් ජල ටැංකියක්, ටැංකියක් හෝ කෘතිම පොකුණක් කලින් කල හිස් කිරීමට පිළිවන් වන අයුරු සෑදීම හෝ නැවත සෑදීම,

(iii) එවැනි යම් ජල ටැංකියක, ටැංකියක හෝ පොකුණක තාවකාලිකව, ජලය බැස්සවීම හා පවිත්‍ර කිරීම සහ එය ඒ අයිතිකරු හෝ පදිංචිකරු විසින් පාවිච්චියට නොගන්නා විට වසා තැබීම ,

(iv) මදුරුවන් බෝ වීම වලක්වන තත්වයෙන් යම් ළිඳක් පිරිසිදු කිරීම හා පවත්වාගෙන යාම,

(v) ඒ ස්ථානයේ ඇති යම් හැරූ වලක්. පාවිච්චි නොකරන ලද ළිඳක් වැසිකිලිවලක්, පොකුණක් හෝ වෙනත් ජල එකතු වන තැනක් පුරවා වසා දැමීම හෝ එවැනි ජලය ගලා බැස යන හෝ මදුරු නාශක ඉස නිවාරණය කිරීම ,

(vi) ඒ ස්ථානයේ වලවල් ගුල් සහ පහත් බිම් කොටස් පුරවා දැමීම ,

(vii) ඒ ස්ථානයේ ඇති වගුරු බිම්, ජල මාර්ග සහ ජලය රැඳී තිබෙන කොටස් පුරවා දැමීම හෝ ඒවායේ ජලය බැස්සවීම හෝ මදුරු පිලව් නාශක ඉසීමෙන් ඒවා නිවාරණය කිරීම,

(viii) ඒ දැන්වීමේ නිශ්චිතව සඳහන් කර ඇති ප්‍රමාණයෙන් සහ කාල පරතරයක් තුළ ඒ ස්ථානයෙහි කෘමි නාශක ඉසීම,

(ix) මදුරුවන් විනාශ කිරීම සහ බෝවීම වැලැක්වීම පිණිස අවශ්‍ය යැයි නිසි බලධරයා විසින් හෝ බලය පවරන ලද නිලධාරියා විසින් සලකනු ලබන සහ ඒ දැන්වීමේ නිශ්චිතව සඳහන් කර ඇති වෙනත් කටයුත්තක් කිරීම හෝ පියවරක් ගැනීම ,

(x) "දිය පරඬැල්", "කොළ පාසි", "තෙල් පාසි" "බරවා පාසි"හෝ "නනයා විරද්දි" යනුවෙන් සාමාන්‍යයෙන් ප්‍රදේශය තුළ හඳුන්වන ජලජ පැලෑටි හෝ මදුරුවන් බෝවීමට ඉඩකඩ සලසන බව කලින් කල දක්නට ලැබෙන වෙනත් යම් ජලජ පැලෑටියක් හෝ පැලෑටි ඉවත් කොට විනාශ කර දැමිය යුතු ය.

(xi) මේ ව්‍යවස්ථාවේ x වැනි ජේදයේ සඳහන් කරන ලද පැලෑටි, යම් ජල මාර්ගයක් දිගේ පාවී යාම නවත්වන පරිදි සුදුසු වූ බාධක ඉදි කිරීම ඒවා පැතිරීම වලක්වාළීම.

(2) මේ අතුරු ව්‍යවස්ථාවේ (1) වැනි ජේදය යටතේ දැන්වීමක් භාර දෙන ලද යම් ස්ථානයක් අයිතිකරු විසින් හෝ පදිංචිකරු විසින් ඒ දැන්වීමේ නිශ්චිතව සඳහන් කර ඇති කාලය තුළ දී එකී නියමයන් ඉදි කරනු ලැබිය යුතු ය.

05. සිය ලේවල මැලේරියා පරිපෝෂිතයා හෝ ලේවල, මුත්‍රාවල හෝ වෙනත් ශරීර ද්‍රව්‍යයක බරවා ක්ෂුද්‍ර ජීවීන් ඇති බව සොයා දැනගත් යම් තැනැත්තෙකුට ඒ බලධරයා දැන්වීමේ නිශ්චිතව සඳහන් කරන ස්ථානයක දී හෝ චිකිත්සාගාරයක දී ඒ තැනැත්තා ඒ මැලේරියා පරිපෝෂිත වලින් හෝ බරවා ක්ෂුද්‍ර ජීවීන්ගෙන් මිදෙන තුරු, සුදුසු නිවාරණ ප්‍රතිකාර ගන්නා ලෙස ලිඛිත දැන්වීමක් මගින් සභාපතිවරයා විසින් නියම කරනු ලැබිය හැකිය.

06. (1) සභාපතිවරයාගේ ලිඛිත අනුමැතිය ඇතිව සහ ඒ ස්ථානයේ මදුරුවන් බෝවීම වැලැක්වීම සඳහා ඒ නිළධාරියා විසින් දෙනු ලබන ලිඛිත උපදෙස් වලට අනුකූලව හැර යම් ස්ථානය, අයිතිකරු විසින් හෝ පදිංචිකරු විසින්, එහි යම් ළිඳක් හෑරීම හෝ ටැංකියක් පොකුණක් ජල භාජනයක් වතුර මලක් හෝ වතුර රඳවා තබන වෙනත් ස්ථිර භාජනයක් ඉදි කිරීම නොකළ යුතු ය.

(2) මෙම අතුරු ව්‍යවස්ථාවේ (1) ජේදයේ විධිවිධාන වලට පටහැනිවන සේ යම් අළුත් ළිඳක් හෑරීම හෝ ටැංකියක් හෝ පොකුණක් ජල භාජනයක් වතුර මලක් හෝ වතුර රැස්කරන වෙනත් ස්ථිර භාජනයක් ඉදි කිරීම කරනු ලැබූ අවස්ථාවක, සභාපතිවරයා විසින්

ඒ ස්ථානයේ අයිතිකරු වෙත හෝ පදිංචිකරු වෙත භාරදෙනු ලබන ලිඛිත දැන්වීමක් මගින්, ඒ දැන්වීමේ නිශ්චිතව සඳහන් කරනු ලැබූ කාලයක් තුල දී ඒ ළිඳ, ටැංකිය පොකුණ ජල භාජනය, වතුර මල හෝ භාජන පුරවා වසා දමන ලද හෝ අන්‍යාකාරයෙන් විනාශ කර දමන ලෙස හෝ නැතහොත් ඒ කාලය ඇතුළත හෝ ඒ දැන්වීමේ සඳහන් කරනු ලබන ආකාරයට එය වෙනස් කරන ලෙස නියම කරනු ලැබිය හැකිය.

(3) මේ අතුරු ව්‍යවස්ථාවේ (2) ඡේදය යටතේ දැන්වීමක් භාර දෙනු ලැබූ යම් ස්ථානයක අයිතිකරු හෝ පදිංචිකරු විසින් එහි නිශ්චිතව සඳහන් කර ඇති කාලය තුළ ඒ දැන්වීමේ නියමයන් ඉටු කළ යුතු ය.

07. (1) 4 වැනි හෝ 6 වැනි අතුරු ව්‍යවස්ථාව යටතේ යම් දැන්වීමක් යම් ස්ථානයක අයිතිකරුට හෝ පදිංචිකරුට භාරදීම පුද්ගලිකව භාර දීමෙන් හෝ ඒ අයිතිකරු සමග හෝ පදිංචිකරු සමග එකට ජීවත්වන යම් වැඩිහිටියෙකු වෙත රැඳවීමෙන් හෝ ඒ දැන්වීම ඒ ස්ථානයේ හොඳින් පෙනෙන තැනක ඇලවීමෙන් හෝ ක්‍රියාත්මක කළ හැකිය.

(2) යම් ස්ථානයක් සම අයිතිකරුවන් දෙදෙනෙකු හෝ ඊට වැඩි ගණනක් විසින් හවුලේ අධි වාසය දරන අවස්ථාවක, එම අයිතිකරුවන්ගෙන් එක් අයිතිකරුවකු 1 වන අතුරු ව්‍යවස්ථාවේ නියමයන් සහ 4 වැනි හෝ 6 වැනි අතුරු ව්‍යවස්ථාව යටතේ ඔවුනතුරින් යම් අයෙකුට භාරදෙනු ලබන යම් දැන්වීමක නියමයන් ඉටු කිරීම සම්බන්ධයෙන් යම් පැහැර හැරීමකට හෝ ඉටු නොකර සිටීමකට වෙන් වෙන් ව වගකිව යුතු ය.

(3) 4 වැනි හෝ 6 වැනි අතුරු ව්‍යවස්ථාව යටතේ දැන්වීමක් භාරදෙනු ලැබූ යම් ස්ථානයක අයිතිකරු විසින් හෝ පදිංචිකරු විසින් ඒ දැන්වීමේ නිශ්චිතව සඳහන් කර ඇති කාලය තුළ ඒ දැන්වීමේ නියමයන් ඉටු කිරීම අතපසු කරන හෝ ඉටු නොකරන අවස්ථාවක, සභාපතිවරයා විසින් හෝ ඒ දැන්වීම නිකුත් කරන නිලධාරියා විසින් හෝ සභාපතිවරයා විසින් නිලධරයා විසින් තත් කාර්ය සඳහා ලියවිල්ලකින් බලය පවරන ලද යම් තැනැත්තකු විසින් හිරු නැගීමෙන් පසු සහ හිරු බැසීමට කලින් ඕනෑම වේලාවක අවශ්‍යය විය හැකි සහායකයින් සහ සේවකයන් සමග ඒ ස්ථානයට ඇතුල් වී ඒ දැන්වීමේ නිශ්චිතව සඳහන් කර ඇති කටයුතු හෝ පියවර ක්‍රියාත්මක කිරීම හෝ සිදු කිරීම නැතහොත් ක්‍රියාත්මක කිරීමට හෝ සිදු කිරීමට සැලැස්වීම කරනු ලැබිය හැකිය.

(4) යම් ස්ථානයක අයිතිකරු හෝ පදිංචිකරු වෙත 4 වැනි හෝ 6 වැනි අතුරු ව්‍යවස්ථාව යටතේ භාර දෙන ලද දැන්වීමක නිශ්චිතව සඳහන් යම් කටයුත්තක් හෝ පියවරක් සභාපතිවරයා විසින් හෝ සභාපතිවරයා හෝ ඒ ඒ දැන්වීම නිකුත් කළ නිලධාරියා වෙනුවෙන් ක්‍රියාත්මක කළ විට හෝ ඉටු කළ විට ඒ කටයුතු හෝ පියවර ක්‍රියාත්මක කිරීමෙහිලා හෝ ඉටු කිරීමෙහිලා දරන්නට සිදු වූ වියදමේ ප්‍රමාණය, ඒ අයිතිකාරයා හෝ පදිංචිකාරයා විසින් සභාපතිවරයා වෙත ගෙවිය යුතු ය. සභාපතිවරයා විසින් සිය අත්සන යටතේ ඒ සඳහා ලියවිල්ලකින් කරනු ලබන ඉල්ලීමකින් පසු දින 14ක් ඇතුලත ඒ මුදල අයිතිකරු හෝ පදිංචිකරු විසින් නොගෙවුවහොත් එය ප්‍රාදේශීය සභාවට ලැබිය යුතු ණයක් ලෙස ඒ අයිතිකරුගෙන් හෝ පදිංචිකරුගෙන් අයකර ගනු ලැබිය යුතු ය.

08. මේ අතුරු ව්‍යවස්ථාවල කිසිවක් යටතේ සිය කාර්යය නිත්‍යානුකූ ලෙස ක්‍රියාත්මක කිරීමේ දී කිසිදු තැනැත්තෙකු විසින් දැන දැනම හෝ සිතා මතාම සභාපතිවරයාට හෝ බලයලත් නිලධාරියාට අවහිරකිරීම හෝ බාධා කිරීම නොකළ යුතු ය.

09. කිසිම තැනැත්තකු විසින් දැන දැනම හෝ හිතාමතාම මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ කරගෙන යනු ලබන යම් මදුරු මර්ධන පියවරක කාර්යක්ෂමතාවය හීන කරන්නා වූ හෝ එය ක්ෂය වී යාමට සලස්වන්නාවූ හෝ යම්කිසි ක්‍රියාවක් නොකළ යුතු ය.

10. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස මෙම අතුරු ව්‍යවස්ථාවල -

"පදිංචිකරු " යන්නෙන් යම් ස්ථානයක පදිංචිව සිටින්නා වූ හෝ තමාම වෙනුවෙන් හෝ තවත් අයෙකු වෙනුවෙන් නියෝජිතයෙකු වශයෙන් හෝ එහි භාරකාරත්වය, කළමණාකරණය හෝ පාලනය දරන තැනැත්තකු අදහස් වන නමුත් නවාතැන්කරුවකු ඇතුළත් නොවේ.

"අයිතිකරු" යන්නට සම අයිතිකරුවකු හා සම අයිතිකරුවකු සහ බදු කරුවකු ද යම් ස්ථානයක කුලියට හෝ එලදාවකට කවර වූ ආකාරයක අයිතියකින් හිමිකම් ඇති යම් තැනැත්තකු ද ඇතුලත් වේ.

" ස්ථානය" යන්නට යම් ඉඩමක්, නිවසක්, ගොඩනැගිල්ලක් හෝ ඉදි කිරීමක් ඇතුලත්වන අතර එහි පිහිටියාවූ ද යම් පොකුණක ටැංකියක වැවක, ජල මාර්ගයක, කාණුවක හෝ ගඟක නිම්නය ද වතුර මතුපිට ඇත්තාවූ හෝ නොමැත්තාවූ කවර ආකාරයක හෝ යම් බෝට්ටුවක් ද ඇතුලත් වේ.

**25. ස්පර්ශක සහ ආසාදන රෝග**

01. වසූරිය, කොළරාව, හෝ වෙනත් ස්පර්ශක හෝ ආසාදන රෝගයකින් යම් තැනැත්තකු පෙලෙන්නාවූ ද එම තැනැත්තා නිවසේ අනෙක් අය ගෙන් වෙන්කර තැබීමේ මාර්ගයක් නොමැත්තාවූ ද අවස්ථාවක හෝ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරියාගේ අදහස් අනුව එකී තැනැත්තා නවත්වා ගෙන සිටීම අනෙක් අයට අන්තරාකාරි වන අවස්ථාවක එවැනි යම් තැනැත්තෙකු යම් රෝහලකට හෝ වෙන්කර තැබීමේ නිවාසයකට යවන ලස එකී තැනැත්තා සිටින නිවසේ ගෘහ මූලිකයාට ලිඛිතව දැන්වීමකින් විධාන කිරීම නිත්‍යානුකූල විය යුතු ය. ඒ ගෘහ මූලිකයා වහා ඒ අනුව ක්‍රියා කළ යුතු ය.

02. එම රජයේ රෝහල හෝ වෙන්කර තැබීමේ නිවාසය වෙනුවට එම තැනැත්තා හෝ ඔහුගේ මිත්‍රයන් හෝ කැමති වන්නා වූ ද එකී සෞඛ්‍ය වෛද්‍ය නිලධාරියා විරුද්ධ නොවන්නාවූ ද යම් ප්‍රදේශයකට ඒ තැනැත්තා ගෙන යාමට සභාපතිවරයා විසින් අවසර දීම නිත්‍යානුකූල විය යුතු ය.

03. (2) වන අතුරු ව්‍යවස්ථාවේ විධිවිධාන සලස්වා ඇති පරිදි සභාපතිවරයාගේ අනුමැතිය ඇතිව හැර, යම් තැනැත්තකු විසින් වසූරිය, කොළරාව හෝ වෙනත් ස්පර්ශක ආසාදන රෝගයකින් පෙලෙන තැනැත්තෙකු එම තැනැත්තා සිටින ස්ථානයෙන් වෙනත් යම් නිවසකට හෝ ස්ථානයකට ගෙනයාම හෝ ගෙන යෑමට උපකාර වීම නොකරනු ලැබිය යුතු ය.

04. සභාපතිවරයා විසින් සපයා ඇති සියලු ආරෝග්‍යශාලා සහ වෙන්කර තැබීමේ නිවාස වසූරිය, කොළරාව හෝ වෙනත් ස්පර්ශක හෝ ආසාදන රෝගවලින් පෙලෙන තැනැත්තන් භාර ගැනීම සඳහා භාවිතා කරනු ලබන අතර නිරෝධායතනය යටතේ තැබිය යුතු ය. ඒ රෝහලේ හෝ වෙන්කර තැබීමේ නිවාසයේ ප්‍රධාන වෛද්‍ය නිලධාරියාගේ අනුමැතිය ඇතිව මිස නිසි ලෙස පත්කරන ලද උපස්ථායකයන් නොවන කිසිම තැනැත්තෙකුට එවැනි යම් ආරෝග්‍යශාලාවකට හෝ වෙන් කර තැබීමේ නිවාසයකට ඇතුළු වීමට හෝ ඉඩදෙනු නොලැබිය යුතු ය.

05. ආපසු යාමට සුදුසු තත්ත්වයක සිටින බව මෙම සෞඛ්‍යය වෛද්‍ය නිලධාරියා විසින් සහතික කරනු ලැබුවහොත් මිස එවැනි යම් රෝහලක් හෝ වෙන්කර තැබීමේ නිවාසයක් වෙතින් කිසිම රෝගියකු මුදාහැරීම හෝ පිටවීමට ඉඩදීම නොකළ යුතුය.

06. සුවවී ගෙන එන රෝගීන්ට ස්නානය කිරීම සඳහා සපයා ඇති ස්ථානවල හැර කිසිම පොදු ස්ථානයක ස්නානය කිරීමට එවැනි කිසිම රෝගියෙකුට ඉඩ දෙනු නොලැබිය යුතුය.

07. වසූරිය හෝ කොළරාව හෝ වෙනත් ස්පර්ශක හෝ ආසාදන රෝගයකින් පෙලෙමින් සිටි යම් තැනැත්තකු ඉවත් කරනු ලැබුවේ යම් නිවසක හෝ ගොඩනැගිල්ලක සිටද, එම නිවස හෝ ගොඩනැගිල්ල පිරිසිදු කිරීමේ සහ බීජානුහරණය කිරීමේ කාර්යය සඳහා අවශ්‍ය යැයි සලකනු ලබන විට එම රෝගියා ඉවත් කරගත් ඉක්බිතිවම සභාපතිවරයා හෝ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරියා විසින් ප්‍රමාණවත් යයි සලකනු ලබන දින හතකට නොඅඩු කාලයක් එම සභාපතිවරයා විසින් හෝ වෛද්‍ය නිලධාරියා විසින් එම නිවස හෝ ගොඩනැගිල්ල නිරෝධායතනය යටතේ තැබිය යුතුය. සෞඛ්‍ය වෛද්‍ය නිලධාරියාගේ අනුමැතිය ඇතිව මිස, කවර හෝ කාර්යයක් සඳහා එම ගොඩනැගිල්ලකට ඇතුලුවීමට හෝ පිටවීමට නිසි ලෙස පත්කරන ලද උපස්ථායකුට හැර, වෙනත් කිසිම තැනැත්තෙකුට ඉඩ නොදිය යුතුය. ඉහත කී පරිදි නිරෝධායතනය යටතේ තබන ලද යම් ගොඩනැගිල්ලක වාසය කරන තැනැත්තන් නඩත්තු කිරීමේ වියදම දැරීම අවශ්‍ය යයි තීරණය කරනු ලැබුවහොත් එම වියදම ප්‍රාදේශීය සභාව විසින් දැරිය යුතුය.

08. යම් ගොඩනැගිල්ලක් වඩාත් ක්‍රියාත්මක ලෙස නිරෝධායනය යටතේ තැබීම සඳහා එම ගොඩනැගිල්ල වැටකින් හෝ සභාපතිවරයා හෝ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරියා විසින් සුදුසු යයි සලකන වෙනත් ආකාරයකින් වැට බැඳ ආවරණය කිරීම හෝ එම ගොඩනැගිල්ල අසලින් වැටී ඇති යම් පාරක් වීදියක් අඩි පාරක් හෝ මාර්ගයක් අවහිර කර මිනිසුන් ගමන් කිරීම වැළැක්වීම අවශ්‍ය නම් සභාපතිවරයා විසින් හෝ එකී වෛද්‍ය නිලධාරියා විසින් එසේ කිරීම නිත්‍යානුකූල විය යුතුය.

09. කොළරාව, වසූරිය හෝ වෙනත් භයානක ස්පර්ශක හෝ ආසාධන රෝගයක් පැතිර පවත්නා අවධියකදී යම් මහජන ආරෝග්‍යශාලාවක් තුළ වෙන් කිරීමේ නිවාසයක් තුළ හෝ ඉහත විධිවිධානසලස්වා ඇති පරිදි නිරෝධායනය යටතේ තබන ලද ගොඩනැගිල්ලක් තුළ මිනිසුන් එකතුවීම හෝ රැස්වීම වැලැක්වීමට සභාපතිවරයා හෝ දිස්ත්‍රික්කයේ මහෙස්ත්‍රාත්වරයාට බලය තිබිය යුතුය.

10. වසූරිය කොළරාව හෝ වෙනත් භයානක ස්පර්ශක හෝ ආසාධන රෝගයකින් මියගිය තැනැත්තකුගේ මළසිරුරක් මී. 180කට අඩු ගැඹුරක නොවැලලිය යුතුය.

11. මේ අතුරු ව්‍යවස්ථා කිසිවක් කඩකරන තැනැත්තකු නිසි අධිකරණ බලය ඇති අධිකරණයකින් වරදකරු කරනු ලැබූ විට රු. 750 කට නොවැඩි දඩයකින් දඬුවම් කරනු ලැබිය හැකි අතර කඩකිරීම දිගටම කරගෙන යන අවස්ථාවකදී වරදකරු කරනු ලැබීමෙන් පසු හෝ එම කඩකිරීමට අවධානය යොමුකරවමි. සභාපතිවරයා විසින් හෝ සභාපතිවරයා විසින් බලය දෙන නිලධරයෙකු විසින් ලිඛිත දැන්වීමක් භාරදෙනු ලැබීමෙන් පසු එම කඩකිරීම දිගටම කරගෙන යන සෑම දිනයකටම රු. 250 කට නොවැඩි අතිරේක දඩයකින් දඬුවම් කරනු ලැබේය යුතුය.

**26. පොදු නාන ස්ථානය**

01. ජලය ස්නානය කිරීමේ කාර්ය සඳහා යොදා ගන්නාවූ ද මහජනයාට විවෘතව ඇත්තාවූ ද සෑම ළිඳක්ම මීටර් 0.6096 කට නොඅඩු උසකින් යුත් ආරක්ෂක තාප්පයක් සහිත විය යුතු අතර එම තාප්පය පිටත පොලොව මට්ටමෙන් පහතට මී . 0.6096ක් ගැඹුරට සිමෙන්ති යොදා තිබිය යුතුය.

02. ඒ සෑම පොදු ළිඳක් වටා ආසන්නව ඇති බිම, ජලය පොළොවට උරා නොගෙන නිසි පිටවානකට ගලා යන පරිදි ඉදිකර ඇති කාණුවකට බැස යා හැකි වන සේ, බෑස්මක් සහිතව ගල් අල්ලා තිබිය යුතුය.

03. ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයෙන් එක් පක්ෂයක් ප්‍රයෝජනය සඳහා ප්‍රාදේශීය සභාව විසින් නාන ස්ථානයක් වශයෙන් වෙන්කොට ඇති එවැනි යම් පොදු ළිඳක් හෝ වෙනත් ස්ථානයක්, අනෙක් පක්ෂයට අයත් කිසිම තැනැත්තෙකු නෑම සේදීම හෝ ඒ ළිඳක් හෝ ස්ථානයක ජලය වෙනත් යම් ආකායකින් ප්‍රයෝජනයට ගැනීම නොකළ යුතුය.

04. ඉහත කී යම් පොදු ළිඳක් නෑම සඳහා ප්‍රයෝජනයට ගන්නා බාල්දිවල සෑම හය මාසයකට වරක්වත් තීන්ත ආලේප කළයුතු අතර, ඒවා දිනපතා පිරිසිදු කළ යුතුය.

05. හොරි හෝ වෙනත් යම් ආසාධන හෝ ස්පර්ශක රෝගයකින් පෙලෙන හෝ එවැනි රෝගයකින් මෑතදී සුවය ලැබූ කිසිම තැනැත්තෙක් එවැනි යම් පොදු ළිඳකින් හෝ නාන ස්ථානයක් වශයෙන් ප්‍රාදේශීය සභාව විසින් වෙන්කර ඇති යම් ස්ථානයක නෑම, සේදීම හෝ එහි ජලය වෙනත් කවර හෝ ආකාරයකින් ප්‍රයෝජනයට ගැනීම නොකළ යුතුය.

06. නාන ස්ථානයක් වශයෙන් වෙන් කර ඇති යම් ස්ථානයක, හෝ ඒ ආසන්නයේ කිසිම ගවයෙකු, අශ්වයෙකු, එළුවකු, ඌරෙකු බැටළුවෙකු, සුනඛයෙකු හෝ වෙනත් යම් සතෙකු සේදීම හෝ සේදීමට සැලැස්වීම හෝ කවර වූ හෝ කාර්යයක් සඳහා එවැනි යම් ස්ථානයකට එවැනි කිසිම සතෙකු දක්කාගෙන යාම, පැන්නීම හෝ ගෙනයාම කිසිම තැනැත්තෙකු විසින් නොකළ යුතුය.

07. එවැනියම් පොදු ළිඳක් හෝ ඒ ආසන්නයේ හෝ නාන ස්ථානයක් වශයෙන් ප්‍රාදේශීය සභාව විසින් වෙන්කර ඇති ස්ථානයකට හෝ ශරීර කෘත්‍යය කිරීමෙන් කිසිම තැනැත්තෙකු විසින් පීඩාවක් සිදු නොකළ යුතුය.

08. එවැනි යම් පොදු ළිඳක අයිතිකරු හෝ බදු කරුද මෙයට ඉහතින් වූ අතුරු ව්‍යවස්ථාවල නියමයන් වල ක්‍රියාකල යුතු අතර, ඒවා කිසිම ආකාරයකින් උල්ලංඝනය කිරීමට ඉඩ නොදිය යුතුය.

09. මේ අතුරු ව්‍යවස්ථාව පිළිබඳ සෑම කඩ කිරීමක් සම්බන්ධයෙන්ම මහෙස්ත්‍රාත්වරයකු විසින් රු. 750ක් නොඉක්මවන දඩයකින් දඬුවම් කරනු ලැබිය හැකි විය යුතු ය.

## 27. ලොන්ඩරි

01. මේ අතුරු ව්‍යවස්ථාවල "ලොන්ඩරිය" යන්නෙන් රෙදි සෝධකයකු ලෙස ව්‍යාපාරය හෝ කර්මාන්තය කරගෙන යන යම් තැනැත්තකු විසින් රෙදි සේදීම වේලීම සහ මැදීම යන කාර්යයන් සඳහා පාවිච්චි කරන කවර හෝ වර්ගයක ගොඩනැගිල්ලක් හෝ යම් ඉඩමක්, ස්ථානයක් හෝ පරිශ්‍රයක් අදහස් වන අතර, එවැනි යම් රෙදි ගබඩා කිරීම සහ පාවිච්චි කරන යම් ගොඩනැගිල්ලක් ද එවැනි තැනැත්තකු විසින් ඔහුගේ ව්‍යාපාරය හෝ කර්මාන්තයේ කාර්යය සඳහා ප්‍රයෝජනයට ගන්නා යම් ළිඳක්, ටැංකියක්, හෝ ජලය ලබා ගන්නා වෙනත් ප්‍රභවයක් ඊට ඇතුලත් වේ.

02. බලපත්‍රය ලබා ගැනීමට අදහස් කරන්නේ යම් ස්ථානයක් සඳහා ද, ඒ ස්ථානය මෙහි පහත දැක්වෙන කොන්දේසිවලට අනුකූලනොවන්නේ නම් ලොන්ඩරියක් සඳහා බලපත්‍රයක් ලබා ගැනීමට කිසිම තැනැත්තෙකුට හිමි කමක් නොමැත.

(i) එම භූමිය ප්‍රාදේශීය සභාව විසින් අනුමත කළ යුතු ය.

(ii) එම ස්ථානය මනා අළුත් වැඩියාවෙන් යුතුව සහ මනා වාතාශ්‍රයෙන් යුතුව තිබිය යුතු අතර, විවෘත කළ විට එය බිම වර්ග ප්‍රමාණයෙන් පහලොවෙන් පංගුවකට අඩු නොවිය යුතු ජනෙල් සෑම කාමරයකටම සපයා තිබිය යුතු ය.

(iii) සෑම කොටසකටම සෑම කාමරයකම, බිත්ති උසින් මීටර් 2.14 ට අඩු නොවිය යුතු අතර හුණු බදාම යොදා හුණු ආලේපකර හෝ පින්තාරු කර හෝ තිබිය යුතු ය.

(iv) අඟුව, යටත් පිරිසෙයින් පොළොවේ සිට මීටර් 1.83 ක් උසින් තිබිය යුතු ය.

(v) පිළිවෙළින් කිළිටි රෙදි සහ සේදූ රෙදි සඳහා වෙන වෙනම කාමර සපයා තිබිය යුතු අතර, කාමරවල බිම සිමෙන්ති දමා සහ බිත්ති යටත් පිරිසෙයින් පොළොවේ සිට මීටර් 1.83ක් උසට සිමෙන්ති කපරාරු කර තිබිය යුතු ය.

(vi) ස්ථානයට වෙනම ජල සම්පාදනයක් තිබිය යුතු ය.

(vii) නල ජල සැපයුමක් ස්ථානයට ඇත්නම්, රෙදි සේදීමේ සියලු කටයුතු සඳහා ඒ ජලය ප්‍රයෝජනයට ගත යුතු ය.

(viiii) ස්ථානයෙහි සේවයෙහි නියුක්ත කර සිටින තැනැත්තන් යටත් පිරිසෙයින් සෑම දස දෙනෙකුට එක වැසිකිළියකට අඩු නොවන පරිදි ස්ථානයට ප්‍රමාණවත් වැසිකිළි සංඛ්‍යාවක් සපයා තිබිය යුතු ය.

(ix) ස්ථානය, ඉවත දමන ජලය එක් රැස්ව පල් වීමෙන් තොර විය යුතු ය.

(x) ස්ථානයෙහි යම් කොටසක් ගෘහ කාර්යයක් සඳහා ප්‍රයෝජනයට ගනු ලැබේනම් නිදා ගැනීම සහ කෑම පිසීම සඳහා වෙනම සහ ප්‍රමාණවත් කාමර සපයා තිබිය යුතු ය.

සෑම ලොන්ඩරි බලපත්‍රධාරියකු විසින් ම එම ස්ථානයේ පිට පැත්තේ ප්‍රකටව පෙනෙන තැනක ඔහුගේ නම සහ "ලියාපදිංචි කළ ලොන්ඩරිය" යන වචන සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවලින් පින්තාරු කර පුවරුවක් සවිකර තැබිය යුතු ය.

3. සෑම ලොන්ඩරි බලපත්‍රධාරියෙක් ම .-

1. ලොන්ඩරි පිළිබඳ වන මේ අතුරු ව්‍යවස්ථාව, සිංහල, දෙමළ, සහ ඉංග්‍රීසි භාෂාවලින් වූ පිටපතක් සහ ඔහුට නිකුත් කර ඇති බලපත්‍රයේ පිටපතක් රාමුකර, එම ස්ථානයේ හොඳින් පෙනෙන තැනක ප්‍රදර්ශනය කිරීමට සැලැස්විය යුතු ය. තවද,

2. ඒ ස්ථානයේ සේවයේ නියුක්ත කර ඇති සියලු තැනැත්තන්ගේ නම් සහ ලිපින ලැයිස්තුවක් සියලු යුක්ති සහගත වේලාවන්හි දී පරීක්ෂාකර බැලිය හැකිවන පරිදි, එම ස්ථානයෙහි තැබීමට සැලැස්විය යුතු ය.

5. ප්‍රාදේශීය සභාව විසින් වෙන්කර දෙනු ලැබිය හැකි විශේෂ ස්ථානයක හැර, වෙනත් කිසිම ස්ථානයක කිසිම ලොන්ඩරි බලපත්‍රලාභියකු විසින් රෙදි සේදීම නොකළ යුතු ය.

6. (i) සෑම ලොන්ඩරි බලපත්‍රලාභියකුම තමාගේ පවුලේ හෝ ගෘහයෙහි යම් ආසාධන, ස්පර්ශක හෝ චර්ම රෝගයක් ඇති වූ විට, ඒ බව, එය ඇති වී පැය 24ක් ඇතුළත ඔහු විසින් ප්‍රාදේශීය සභාවේ සභාපති වරයාට වාර්තා කළ යුතු ය.

(ii) ලොන්ඩරි බලපත්‍රලාභියකුට හෝ ඔහුගේ පවුලේ හෝ ගෘහයේ යම් සාමාජිකයෙකුට හෝ යම් ආසාධන හෝ ස්පර්ශක රෝගයක් වැලඳුන විටක, ඔහු වහාම ලොන්ඩරියේ සියලු වැඩ නතර කළ යුතු අතර, එම රෝගය වැලඳීමෙන් පසු, එම රෝගය

පවත්නා අතරතුරදී ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා ගේ විශේෂ අවසරයක් ඇතිව හැර, ලොන්ඩරියට රෙදි කිසිවක් භාරගැනීමට හෝ ලොන්ඩරියෙන් රෙදි කිසිවක් පිටතට යැවීමට හෝ ඉඩනොදිය යුතු ය.

7. ලොන්ඩරියක සෑම බලපත්‍රලාභියකුම ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා විසින් නියමකරනු ලැබූ විට, ඔහු රෙදි සේදීමේ සේවය සපයන්නේ යම් තැනැත්තන්ට, ඒ තැනැත්තන්ගේ ලැයිස්තුවක් සැපයිය යුතු ය.

8. (1) සෑම ලොන්ඩරි බලපත්‍රලාභියකු ම ලොන්ඩරියේ සෑම කොටසක් ම ද, ලොන්ඩරියේ කාර්ය සඳහා පාවිච්චි කරන එහි අවට ද, කාණු, ගෘහ භාණ්ඩ, භාජන සහ සියලු උපකරණ පිරිසිදුව සහ මනා අළුත්වැඩියා තත්ත්වයෙන් තබාගත යුතු ය.

(2) සෑම ලොන්ඩරි බලපත්‍රලාභියෙකුම කිලිටි රෙදි කාමරයේ ඇතුල් පැත්ත, අවුරුද්දකට වරක් හුණු ගෑමට හෝ පින්තාරු කිරීමට සැලැස්විය යුතු ය.

9. (1) කිසිම ලොන්ඩරි බලපත්‍රධාරියකු, කිලිටි රෙදි ගබඩා කිරීම සඳහා නිශ්චිතව සලසා ඇති කාමරයේ හැර වෙනත් කිසිම තැනක කිලිටි රෙදි ගබඩාකර නොතැබිය යුතු ය.

(2) කිසිම ලොන්ඩරි බලපත්‍රධාරියකු විසින් සේදූ රෙදි ඒ සඳහා විශේෂයෙන් සලසා ඇති කාමරය හැර වෙනත් යම් කාමරයක තැබීමට ඉඩ නොදිය යුතු ය.

10. මේ කවර හෝ අතුරු ව්‍යවස්ථාවක් පිළිබඳව වන සෑම උල්ලංඝනය කිරීමක් ම රු. 750 ක් නොඉක්මවන දඩයකින් ද, එම උල්ලංඝනය දිගටම කරගෙන යන අවස්ථාවක, අධිකරණයක් විසින් වරදකරු කිරීමෙන් පසු හෝ ඒ උල්ලංඝනය කෙරෙහි අවධානය යොමු කරමින් ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා විසින් හෝ ප්‍රාදේශීය සභාව විසින් බලය පවරන ලද නිලධරයකු විසින් හෝ ලිඛිත දැන්වීමක් භාරදෙනු ලැබීමෙන් පසුව, ඒ උල්ලංඝනය කරගෙන යන සෑම දිනයක් වෙනුවෙන් රු. 250 ක් නොඉක්මවන දඩයකින් දඬුවම් කරනු ලැබීමට යටත් වන්නේ ය.

## 28. සංචාරක වෙළෙන්දෝ

1. (මහි මින්මතු සභාපතිවරයාගේ යනුවෙන් සඳහන් කරනු ලබන) ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා විසින් තත්කාර්ය සඳහා නිකුත් කරන ලද බලපත්‍රයක් මත හැර කිසිම තැනැත්තකු විසින් යම් වීදියක් හෝ පොදු පිට්ටනියක, උද්‍යානයක් හෝ විවෘත භූමියක හෝ කරත්ත හෝ මෝටර් වාහන නතරකර තැබීම සඳහා වෙන් කර ඇති හෝ ප්‍රයෝජනයට ගන්නා යම් පොදු වාහන නැවතුම්පලක කවර වූ හෝ භාණ්ඩයක් විකිණීම හෝ වෙළඳාම සඳහා එහා මෙහා ගෙනයාම හෝ නොකළ යුතු ය.

2. සභාපතිවරයා විසින් 6 හෝ 8 වන අතුරු ව්‍යවස්ථාව යටතේ අවලංගු කරනු ලැබුවහොත් මිස, මේ අතුරු ව්‍යවස්ථාව යටතේ නිකුත් කරන ලද සෑම බලපත්‍රයක් ම, එය නිකුත් කර ඇත්තේ යම් වර්ෂයක් වෙනුවෙන් ද, ඒ වර්ෂයේ දෙසැම්බර් මස 31 වැනි දිනදී අවසන් වන්නේ ය.

3. බලපත්‍රයක් සඳහා වන සෑම ඉල්ලුම්පත්‍රයක් සමග, ඉල්ලුම්කරුගේ උඩුකයේ පමණක් 2 1/2x 2" ප්‍රමාණයේ ඡායාරූප පිටපත් දෙකක් ඉදිරිපත් කළ යුතු ය. ඉල්ලුම්පත්‍රය ලැබුනු විට ලේකම්වරයා විසින්, යෝග්‍යයයි ඔහු සලකන විමසීම් කිරීමට සලස්වනු ලැබිය හැකි අතර, ඉල්ලුම්කරු සුදුසු නොමැතිනම්, ඉල්ලුම්පත්‍රය ප්‍රතික්ෂේප කරනු ලැබිය හැකිය. බලපත්‍රයක් සඳහා වූ ඉල්ලුම්පත්‍රය සභාපතිවරයා විසින් අනුමත කරනු ලැබූවිට ඉල්ලුම්පත්‍රය සමග ඉදිරිපත්කර ඇති ඡායාරූප පිටපත් දෙකෙන් එකක් ඉල්ලුම්කරුට නිකුත්කරන බලපත්‍රයකට ඇලවිය යුතු අතර, අනෙක් පිටපත ඉල්ලුම්පත්‍රය සමග ප්‍රාදේශීය සභා කාර්යාලයේ තබාගත යුතු ය.

4. බලපත්‍රයක් නිකුත් කිරීම සඳහා රු. 50 වාර්ෂික බලපත්‍ර ගාස්තුවක් අය කරනු ලැබේ.

5. ප්‍රාදේශීය සභාව විසින් නිශ්චය කරනු ලැබිය හැකි ගාස්තු ප්‍රමාණයන් සහ කොන්දේසි මත ආගමික උත්සව සඳහා හෝ වෙනත් යම් ජාතික උත්සව සමයක් සඳහා හෝ වෙළඳුන්ට සහ සංචාරක වෙළෙඳුන්ට සභාපතිවරයා විසින් තාවකාලික බලපත්‍ර නිකුත් කිරීම නිත්‍යානුකූල වන්නේ ය.

6. නිකුත් කරන ලද බලපත්‍රයක් මේ අතුරු ව්‍යවස්ථාවේ විධිවිධාන කඩ කිරීමේ හේතුව මත සභාපතිවරායා විසින් ප්‍රත්‍යාදිෂ්ඨ කිරීම හෝ අවලංගු කිරීම කරනු ලැබිය හැකිය.

7. මේ අතුරු ව්‍යවස්ථාව යටතේ නිකුත් කරන ලද සෑම බලපත්‍රයක්ම මෙහි උපලේඛනයේ දැක්වෙන කොන්දේසි වලට යටත් වන්නේ ය.

8. බලපත්‍ර නිකුත් කිරීමට අදාලව නියම කර ඇති කොන්දේසි කඩ කිරීම සම්බන්ධයෙන් බලපත්‍රධාරියා දෙවන වරට හෝ තදනන්තරව වරදකරු කරනු ලැබීමේ දී මේ අතුරු ව්‍යවස්ථාව යටතේ නිකුත් කර ඇති බලපත්‍රයක් අධිකරණයක් විසින් අවලංගු කරනු ලැබීමට යටත් වන්නේ ය.

9. අධිකරණය විසින් බලපත්‍රයක් අවලංගු කරනු ලැබූ අවස්ථාවක, ඒ බලපත්‍රය අළුත් කිරීමට අවසරයක් දෙනු නොලැබේ. එමෙන් ම බලපත්‍රය සඳහා ගෙවන ලද ගාස්තුවෙන් කිසි කොටසක් ආපසු ගෙවීම ද කරනු නොලැබේ.

10. සංචාරක වෙළඳ බලපත්‍රයක් ලබා නොගෙන යම් භාණ්ඩයක් හෝ භාණ්ඩ විකුණන හෝ වෙළඳාම සඳහා එහා මෙහා ගෙන යන කවර හෝ තැනැත්තෙක්, සභාපතිවරයා විසින් තත් කාර්යය සඳහා බලය පවරනු ලැබ ඇති ප්‍රාදේශීය සභාවේ නිලධාරියකු විසින්, පිටමං කරනු ලැබීමට සහ ඒ භාණ්ඩ හෝ භාණ්ඩ විකිණීමෙන් හෝ වෙළඳාම සඳහා එහා මෙහා ගෙන යාමෙන් වළක්වනු ලැබීමට යටත් වන්නේ ය.

11. මේ අතුරු ව්‍යවස්ථාවල විධිවිධාන උල්ලංඝනය කරන යම් තැනැත්තෙක් රු. 750 ක් නොඉක්මවන දඩයකින් දඬුවම් කරනු ලැබීමට යටත් වන්නේ ය.

*උපලේඛනය*

(1) බලපත්‍රධාරියකු විසින් කවර හෝ දිනයක පෙ. ව. 6.00ත් ප. ව. 7.00ත් අතර කාලය තුළ හැර කිසිම භාණ්ඩයක් විකිණීම හෝ වෙළඳාම සඳහා එහා මෙහා ගෙන යාම නොකළ යුතු ය.

(2) බලපත්‍රධාරියකු විසින් ඔහුගේ ව්‍යාපාරයේ කාර්ය සඳහා හිසමත ගෙන යා හැකි ප්‍රමාණය පමණක් ගෙන යා යුතු අතර, ඒ සඳහා පාවිච්චි කරන පෙට්ටියේ හෝ බඳුනේ කිසිම එක් පැත්තක දිග මීටර් 0.91කට වැඩි නොවිය යුතු ය.

(3) වෙළඳාම සඳහා ආහාර ද්‍රව්‍ය එහා මෙහා ගෙන යන අවස්ථාවක ඒ සඳහා පාවිච්චි කරන පෙට්ටිය හෝ බඳුන සියලුම පැතිවලින් ආවරණය කර තිබිය යුතු අතර, ඒ ආහාර ද්‍රව්‍ය දූවිලි හෝ මැස්සන් මාර්ගයෙන් ආසාධනයකට පාත්‍රවීම වළක්වනු පිණිස යාකල වැස්මක් සහිත විය යුතු ය.

(4) තමාගේ වෙළඳ භාණ්ඩ ප්‍රචාරය කිරීම පිණිස බලපත්‍රධාරියා විසින් යම් මෙගාපොනයක් ලවුඩ්ස්පීකරයක් හෝ අරුම්පිලිපයරයක් හෝ වෙනත් ඒ සමාන උපකරණයක් පාවිච්චි නොකල යුතු ය.

(5) බලපත්‍රයේ නිශ්චයකොට දැක්වෙන ප්‍රදේශය හැර වෙනත් කිසි ප්‍රදේශයක බලපත්‍රධාරියා විසින් කිසි භාණ්ඩයක් විකිණීම හෝ වෙළඳාම සඳහා එහා මෙහා ගෙන යාම හෝ නොකළ යුතු ය.

(6) මේ අතුරු ව්‍යවස්ථාව යටතේ නිකුත් කරන ලද බලපත්‍රයක් බලපත්‍රධාරියා විසින් වෙනත් යම් තැනැත්තකුට පැවරීම නොකළ යුතු ය.

(7) බලපත්‍රධාරියා විසින් යම් වීදියක් වාහන ගමනා ගමනයට හෝ යම් වීදියක පදික වේදිකාව පාවිච්චි කරන පයින් ගමන් කරන්නන්ට හෝ බාධාවක් සිදු නොකළ යුතු අතර, කවර හෝ පොලිස් නිලධාරියකු ග්‍රාමසේවා නිලධාරියකු හෝ තත් කාර්ය සඳහා සභාපතිවරයා විසින් බලය පවරන ලද ප්‍රාදේශීය සභාවේ යම් නිලධරයකු විසින් නියම කරනු ලැබූ විටක ඔහු යම් වීදියකින් හෝ පදික වේදිකාවකින් ඉවත් විය යුතු ය.

**29. ගව ගාල්**

1. (1) සභාපතිවරයා විසින් තත් කාර්යය සඳහා නිකුත් කරන ලද බලපත්‍රයක් මත හැර කිසිම තැනැත්තකු විසින් ගවගාලක් තබා නොගත යුතු ය.

(2) 11 වන අතුරු ව්‍යවස්ථාව යටතේ කලින් අවලංගු කරනු ලැබවහොත් මිස මේ අතුරු ව්‍යවස්ථාවේ (1) වන ජේදය යටතේ නිකුත් කරන ලද සෑම බලපත්‍රයක් ම, එය නිකුත් කරන ලද්දේ යම් වර්ෂයක් සඳහා ද ඒ වර්ෂයේ දෙසැම්බර් මස තිස්එක් වන දින දී අවසාන වන්නේ ය.

(3) සෑම බලපත්‍රයක්ම සභාව විසින් කලින් කල නියම කරනු ලැබිය හැකි ගාස්තුවකට යටත් වන්නේ ය.

2. බලපත්‍රය ලබා ගැනීමට ඇත්තේ යම් ස්ථානයක් සඳහා ද, ඒ ස්ථානය පහත දැක්වෙන කොන්දේසිවලට අනුකූල වන්නේ නම් මිස, කිසිම තැනැත්තෙකුට ගාලක් තබා ගැනීම පිණිස බලපත්‍රයක් ලැබීමට හිමිකම් නොමැත.

(1) ස්ථානය මට්ටම් කර ජලය බැස යන පරිදි සකස් කර තිබිය යුතු අතර, බිම තද හා මට්ටම්ව සිටින සේ ගල් අතුරා හෝ කළුගල් දමා තහවුරු කර තිබිය යුතු ය.

(2) ගාලක ගවයන් සඳහා ඉඩපහසුව සැපයීමට අදහස් කර ඇති සෑම ගොඩනැගිල්ලක් හෝ මඩුවක් ම ගඩොලින්, ගලින් හෝ කබොක් ගලින් තැනිය යුතු අතර, බිත්තී සහ කුළුණු හුණු පිරියම් කර, පොළොව මට්ටමේ සිට මීටර් 1 x 22 උසට සිමෙන්තියෙන් කපරාරු කර තිබිය යුතු ය. පොළොව සිමෙන්ති බදාමෙන් ගඩොල් හෝ ගල් අතුරා හෝ සිමෙන්ති කොන්ක්‍රීට් යොදා හෝ ගල්තාර යොදා හෝ තිබිය යුතු ය. ගවමුත්‍ර, බෝවන ජලය සහ වැසි ජලය, ආවරණය කල ග්‍රාහක එකකට හෝ වැඩි ගණනකට ගලා යාමට ඉහත කී හා සමාන ආකාරයකට තනන ලද කාණු සපයා තිබිය යුතු ය.

(3) බීම සඳහා සහ ස්ථානය සේදීම සඳහා ප්‍රමාණවත් ජලසම්පාදනයක් එම ස්ථානයට සපයා තිබිය යුතු ය.

(4) ස්ථානයට ප්‍රමාණවත් වැසිකිළි පහසුකම් තිබිය යුතු ය.

3. සෑම ගවගාල් බලපත්‍රධාරියකුම "බලපත්‍ර ලත් ගාල" යන වචන සහ බලපත්‍රධාරියාගේ නම ද, සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂා වලින් පැහැදිලිව පින්තාරු කර පුවරුවක් තමාගේ ගව ගාලෙහි පිට පැත්තේ ප්‍රකටව පෙනෙන ස්ථානයක සවිකර තිබිය යුතුය.

4. සෑම ගවගාල් බලපත්‍රධාරියකු ම ගවගාල් පිළිබඳ මේ අතුරු ව්‍යවස්ථාවල සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂා වලින් පැහැදිලිව පින්තාරුකර පුවරුවක් තමාගේ ගව ගාලෙහි පිටපැත්ත් ප්‍රකටව පෙනෙන ස්ථානයක සවිකර තැබිය යුතු ය.

5. සෑම ගවගාල් බලපත්‍රධාරියකු ම ගාලේ බිත්ති සහ කුළුණු සෑම වර්ෂයකම දෙසැම්බර් මාසයේ දී හුණු පිළියම් කිරීමට හෝ තාර ආලේප කිරීමට සැලැස්විය යුතු ය.

6. සෑම ගවගාල් බලපත්‍රධාරියකු ම ගාල සහ එහි ඇති සියලු ගොඩනැගිලි මනා අළුත්වැඩියාවෙන් ද, පිරිසිදු සහ සෞඛ්‍යාරක්ෂක තත්ත්වයෙන් ද තබා ගැනීමට සහ දිනපතා ම සේදීමට සහ අමදීමට සැලැස්විය යුතු ය.

7. සෑම ගවගාල් බලපත්‍රධාරියකුම, ස්ථානය පිරිසිදුව හා සෞඛ්‍යාරක්ෂිත තත්වයෙන් තබාගත හැකි වන පිණිස සියලු ගොම සහ වෙනත් අපද්‍රව්‍ය දිනපතාම වරින් වර සහ කෙටි කාල සීමාවකට වරක් බැගින් එකතු කිරීමට සැලැස්විය යුතු අතර, එසේ එකතු කරන ලද ගොම හා අපද්‍රව්‍ය යම් ස්ථිර ද්‍රව්‍යයකින් තැනූ ආවරණය කළ ග්‍රාහක එකක හෝ වැඩි ගණනක තැන්පත් කළ යුතු ය.

8. සෑම ගව ගාල් බලපත්‍රධාරියකුම සියලු ගොම, අපද්‍රව්‍ය මුත්‍රා සහ සේදූ ජලය දිනකට යටත් පිරිසෙයින් එක්වරක්වත් ඉවත්කර ඒවා මගින් පීඩාවක් නොවන පරිදි ඒවා බැහැර කිරීමට සැලැස්විය යුතු ය.

9 (1) සභාපතිවරයා විසින් හෝ තත්කාර්ය සඳහා සභාපතිවරයා විසින් පොදුවේ හෝ විශේෂයෙන් ලියවිල්ලකින් බලය පවරනු ලැබූ ප්‍රාදේශීය සභාවේ යම් නිලධාරියකු විසින් කවර හෝ ගවගාලකට යුක්ති සහගත වේලාවන් තුළ ඇතුළු වී එය පරීක්ෂා කිරීම නිත්‍යානුකූල වන්නේ ය.

(2) සභාපතිවරයාට හෝ සභාපතිවරයා විසින් ලියවිල්ලකින් බලය පවරනු ලැබූ නිලධරයකුට ස්ථානයට ඇතුළු වී පරීක්ෂා කිරීමට බලපත්‍රධාරියා විසින් හෝ ගව ගාල් භාරව සිටින තැනැත්තා විසින් හෝ ඉඩදෙනු ලැබිය යුතු අතර, සභාපතිවරයාට හෝ එවැනි නිලධරයෙකුට හෝ අවශ්‍ය විය හැකි සියලුම සහය දිය යුතු ය.

10. ගවගාල් සම්බන්ධයෙන් වන මේ අතුරු ව්‍යවස්ථා අතුරෙන් යමක් පිළිබඳව සෑම කඩකිරීමක් සම්බන්ධයෙන් ම වරදකරු කරනු ලැබීමේ දී රු. 250.00ක් නොඉක්මවන දඩයකින් දඬුවම් කරනු ලැබිය හැකි අතර, ඒ වරද දිගටම කරගෙන යන අවස්ථාවක දී වරදකරු කරනු ලැබීමෙන් පසුව හෝ ඒ කඩකිරීම කෙරෙහි අවධානය යොමු කරමින් සභාපතිවරයා විසින් බලය දෙන ලද නිලධරයකුගෙන් ලිඛිත දැන්වීමක් භාරදෙනු ලැබීමෙන් පසුව හෝ ඒ වරද කරගෙන යන එක් එක් දිනය වෙනුවෙන් රු. 100 ක් නොඉක්මවන අතිරේක දඩයකින් දඬුවම් කරනු ලැබිය හැකිය.

11. ගවගාල් සම්බන්ධයෙන් වන මේ අතුරු ව්‍යවස්ථා අතුරෙන් යමක් කඩකිරීම සම්බන්ධව දෙවරක් හෝ ඊට වැඩි වාර ගණනක් වරදකරු කරනු ලැබූ බලපත්‍රධාරියකුට නිසි බලය ඇති අධිකරණයක් විසින් නියම කරනු ලැබිය හැකි යම් දඬුවමකට අතිරේකව, එසේ වරදකරු කරනු ලැබූ බලපත්‍රලාභියාගේ බලපත්‍රය, ඒ අධිකරණය විසින් අවලංගු කිරීම වෙනුවෙන් කිසිදු වන්දියක් ලැබීමට ඒ බලපත්‍රලාභියාට හිමිකමක් නොමැත්තේ ය.

**30. පක්ෂීන් සහ වෙනත් සතුන් හා මල් ආදිය විනාශ කිරීම**

1. මේ අතුරු ව්‍යවස්ථාවල "දඩයම් සතුන් " යන්නෙන් ගෝණුන් , තිත්මුවන්, රතු හෝ බුරන මුවන්, වෙල්මුවන්, මොණරුන් ලංකා වලිකුකුළන් කබරගොයන් තලගොයන් සහ විනෝදය හෝ ආහාරය සඳහා දඩයම් කරනු ලබන කවර හෝ වල්සතකු හෝ පක්ෂියකු අදහස් වන අතර, ඒ සතුන් ඊට ඇතුලත් වේ.

2. ප්‍රාදේශීය සභාවේ ප්‍රදේශය ඇතුලත, 1909 වන සත්ව ආරක්ෂණ ආඥාපනත යටතේ ලබාගතයුතු බලපත්‍රයකට අතිරේකව මෙහි මින්මතු සභාපතිවරයා යනුවෙන් සඳහන් කරනු ලබන ප්‍රාදේශීය සභාවේ සභාපති වරයාගේ ලිඛිත අවසර නොමැතිව කිසිම තැනැත්තෙකු විසින්,

(1) කපුටා (කෝවුස් කොරොනොඩෙයි කුල්මිනේටුස්) සහ ගොදුරු දඩයම් කරන පක්ෂීන් හැර වෙනත් කිසිම දඩයම් සතුන් හෝ කැළෑ පක්ෂියකු ගෙනයාම, මැරීම හෝ අල්ලා ගැනීම හෝ ගෙනයාමට මැරීමට හෝ අල්ලා ගැනීමට තැත්කිරීම හෝ කිසිම ආකාරයකින් ඔවුනට බාධාකිරීම ; හෝ

(2) කපුටා සහ ගොදුරු දඩයම් කරන පක්ෂීන් හැර වෙනත් කිසිම කැළෑ පක්ෂියෙකුගේ කූඩුවක්, පැටවුන් හෝ බිත්තර ගෙනයාම හෝ විනාශ කිරීම හෝ ගෙනයාමට නැතහොත් විනාශ කිරීමට තැත්කිරීම; හෝ

(3) යම් ගිනි අවියක් හෝ හුලන් තුවක්කුවක් පත්තු කිරීම හෝ කැටපෝලයක් පාවිච්චි කිරීම හෝ දඩයම් සතුන් හෝ කැළෑ පක්ෂීන් බිය ගැන්වීම හෝ පලවාහැරීම අරමුණු කරගෙන වෙනත් යම් ක්‍රියාවක් කිරීම නොකළ යුතු ය.

3. කිසිම තැනැත්තකු විසින් සභාපතිවරයාගේ ලිඛිත අවසරය නොමැතිව ප්‍රාදේශීය සභා ප්‍රදේශය ඇතුළත පිහිටි යම් මුඩු හෝ පොදු ඉඩමක හෝ විවෘත බිමක හෝ පොදු විනෝද භූමියක හෝ කිසියම් මල් පැලයක් හෝ ගසක් ඉදිකිරීම, විනාශකිරීම හෝ හිතාමතා මල් පැලයකට හෝ ගහකට හානි කිරීම නොකළ යුතු ය.

4. මීට ඉහතින් ඇති අතුරු ව්‍යවස්ථාවල කිසියම් විධිවිධානයක් උල්ලංඝනය කරන සෑම තැනැත්තෙක් ම රු. 750.00 නොඉක්මවන දඩයකින් දඬුවම් කළ හැකි වරදක් කරන්නේ ය.

**31. සත්ව හිංසා වැළැක්වීම**

1. කිසිම තැනැත්තකු විසින් -

*(අ)* යම් සතකුට කෲර ලෙස පහරදීම, හිංසා කිරීම, ප්‍රමාණය ඉක්මවා සතකු දැක්කීම, ප්‍රමාණය ඉක්මවා සතකු පිට උඩ යාම, අයථා ලෙස සතකුගෙන් ප්‍රයෝජන ගැනීම හෝ සතකුට වද හිංසා කිරීම නැතහොත් කෲර ලෙස පහරදීම, හිංසා කිරීම. ප්‍රමාණය ඉක්මවා දැක්කීමට, ප්‍රමාණය ඉක්මවා පිට උඩ යාමට, අයථා ලෙස ප්‍රයෝජන ගැනීමට හෝ වද හිංසා කිරීමට සැලැස්වීම හෝ එසේ කරවීම.

*(ආ)* යම් ක්‍රියාවක් හෝ නොකර හැරීමක් මගින් යම් සතකුට අනවශ්‍ය වේදනාවක් හෝ දුකක් දීම හෝ ,

*(ඇ)* යම් සතකු අනවශ්‍ය වේදනාවකට හෝ දුකට පත්වන ආකාරයට විකිණීම සඳහා ප්‍රදර්ශනය කිරීම හෝ එවැනි ආකාරයකින් නැතහොත් ඉරියව්වකින් යම් නැවක, බෝට්ටුවක, ඔරුවක නැතහොත් යම් වාහනයක, කූඩයක, පෙට්ටියක හෝ කූඩුවක හෝ වෙනත් යම් ආකාරයකට ගෙනයාම හෝ ගෙනයාමට සැලැස්වීම නොකළ යුතු ය.

2. මෙහි මින්මතු සභාපතිවරයා යනුවෙන් සඳහන් කරනු ලබන ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයාගේ හෝ තත්කාර්ය සඳහා සභාපතිවරයා විසින් බලය දෙන ලද යම් තැනැත්තකුගේ හෝ මතය අනුව යම් තැනැත්තෙක් 1 වැනි අතුරු ව්‍යවස්ථාවේ විධිවිධාන උල්ලංඝනය කරයි නම්, ඒ තැනැත්තා අනවශ්‍ය වේදනාවක් හෝ දුකක් සිදු කළ බව, සියලු කාර්ය සඳහා සැලකිය යුතු ය.

3. කිසිම තැනැත්තෙකු විසින්, නිරාහාරව තැබීමෙන්, අංග ඡේදනයෙන් හෝ වෙනත් වද හිංසා මගින් කිසිම සතකුට වේදනාවක් සිදු නොකළ යුතු ය.

4. අනවශ්‍ය ලෙස කෲර අන්දමින් කිසිම තැනැත්තකු විසින් කිසිම සතකු නොමැරිය යුතු ය.

5. කිසිම තැනැත්තකු විසින්, යම් රෝගයක්, අංගවිකලතාවක්, තුවාලයක්, වනයක් හෝ වෙනත් හේතුවක් නිසා වැඩක යෙදවීම අයෝග්‍ය යම් සතකු යම් වැඩක යෙදීම හෝ තමා සන්තකයේ හෝ තමාගේ පාලනය යටතේ සිටින එවැනි අයෝග්‍ය සතකු එසේ යොදා ගැනීමට අවසර දීම හෝ නොකළ යුතු ය.

6. තමා අයිතිකරු වන, රෝගී හෝ අබලතාවට පත් කිසිම සතකු යම් විදියක මිය යාමට කිසිම තැනැත්තකු විසින්, යුක්තිසහගත හේතුවක් නොමැතිව, ඉඩ නොදිය යුතු ය.

7. මේ අතුරු ව්‍යවස්ථාව යටතේ වරදක් සිදු කළ දින සිට මාස තුනක් ඉකුත්වීමෙන් පසුව ඒ වරද සම්බන්ධයෙන් නඩු පැවරීමක් නොකළ යුතු ය.

8. මේ කවර හෝ අතුරු ව්‍යවස්ථාවක් පිළිබඳව වන සෑම උල්ලංඝනය කිරීමක් රු. 75.00 ක් නොඉක්මවන දඩයකින් ද, එම උල්ලංඝනය දිගටම කරගෙන යන අවස්ථාවක, අධිකරණය විසින් වරදකරු කිරීමෙන් පසු ව හෝ ඒ උල්ලංඝනය කෙරෙහි අවධානය යොමු කරමින් ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා විසින් හෝ සභාපතිවරයා විසින් බලය පවරන ලද නිලධරයකු විසින් හෝ ලිඛිත දැන්වීමක් භාර දෙනු ලැබීමෙන් පසුව, ඒ උල්ලංඝනය කරගෙන යන සෑම දිනයක් වෙනුවෙන්ම රු. 250.00ක් නොඉක්මවන දඩයකින් දඬුවම් කරනු ලැබීමට යටත් වන්නේය.

### 32. ඝාතක මඩු

1. කිසිම සතකු, ඝාතනය කිරීමට යෝජිත බවට ප්‍රාදේශීය සභාවට පැය 48කට කලින් දැනුම් දීමක් කර ඇත්නම් සහ ඒ සතා ඝාතනය කිරීමට සුදුසු බවට (මෙහි මින්මතු රජයේ පශු වෛද්‍යවරයා යනුවෙන් සඳහන් කරනු ලබන) ප්‍රාදේශීය සභා ප්‍රදේශයේ රජයේ පශු වෛද්‍යවරයා හෝ (මෙහි මින්මතු "සභාපතිවරයා" යනුවෙන් සඳහන් කරනු ලබන) ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා විසින් තත්කාර්ය සඳහා බලය දෙන ලද වෙනත් යම් නිලධරයකු විසින් හෝ ලියවිල්ලකින් අනුමත කර ඇත්නම් මිස, ප්‍රාදේශීය සභාවේ බලපත්‍ර දේශය ඇතුළත ඝාතන මඩුවක ඝාතනය නොකළ යුතු ය.

2. ඝාතනය කිරීම සඳහා ගෙන එන ලද සතුන්, සෞඛ්‍ය නිලධරයා හෝ පශු වෛද්‍යවරයා හෝ ප්‍රාදේශීය සභාව විසින් තත්කාර්ය සඳහා පත් කරන ලද වෙනත් යම් නිලධරයකු විසින් හෝ පරීක්ෂා කළ යුතු අතර, සියලුම ගැබ්බර එළදෙනුන්, බැටළු දෙනුන්, සහ එළු දෙනුන් මෙන්ම මනුෂ්‍යාහාරය සඳහා ඝාතනය කිරීමට නුසුදුසු බව කවර හෝ හේතුවක් නිසා ඔහුට පෙනී යා හැකි වෙනත් යම් සතුන් ප්‍රතික්ෂේප කළ යුතු ය.

3. ඝාතනය කිරීමට නුසුදුසු යැයි ප්‍රතික්ෂේප කරන ලද සෑම සතකුම, එසේ ප්‍රතික්ෂේප කරනු ලැබූ වහාම, අයිතිකරු විසින් ඉවත් කරගනු ලැබිය යුතු ය.

4. 1 වැනි අතුරු ව්‍යවස්ථාව යටතේ, ඝාතනය කිරීම සඳහා අනුමත කරන ලද සතකු ඝාතනය කිරීමෙන් පසුව, එම සතාගේ මළකඳ රෝගයකට පාත්‍ර වී ඇති බව හෝ මනුෂ්‍ය පරිභෝජනය සඳහා අයෝග්‍ය බව පෙනී ගියහොත්, එය විකිණීම සඳහා ඉදිරිපත් කිරීම හෝ මනුෂ්‍ය පරිභෝජනය සඳහා ප්‍රයෝජනයට ගැනීම වළක්වනු පිණිස, එකී රජයේ පශු වෛද්‍යවරයා හෝ සභාපතිවරයා විසින් බලය පවරන ලද නිලධරයා හෝ විසින්, එය විනාශ කිරීම හෝ අන් ආකාරයකින් බැහැර කිරීමට හෝ සැලැස්විය යුතු ය.

5. මනුෂ්‍ය පරිභෝජනය සඳහා අයෝග්‍ය බවට ප්‍රකාශ කරන ලද යම් සතකුගේ මළකඳ හෝ එහි කොටසක් හෝ රජයේ පශු වෛද්‍යවරයාගේ හෝ සභාපතිවරයා විසින් බලය පවරන ලද නිලධාරියාගේ හෝ විධානය යටතේ හැර, කිසිම තැනැත්තකු විසින්, සතන මඩුවෙන් ඉවත් නොකළ යුතු ය.

6. කිසිම සතකු වෙනත් සතුන් ඉදිරියේ හෝ කලින් ඝාතනය කරන ලද සතකුගේ මළකඳ සතන මඩුවෙන් ඉවත් කරන තෙක් නැතහොත් එම කලින් සිදුකරන ලද ඝාතනය පිළිබඳ සලකුණු ඉවත් වන පරිදි එම ස්ථානය ශුද්ධ කරන තුරු, ඝාතනය කිරීමට සිටින සතාට නොපෙනෙන සේ මුවා කරන තෙක්, ඝාතනය නොකළ යුතු ය.

7. සින්ක් පෝරු ඇල්ලූ කරත්තයක හෝ ලොරියක හෝ හැර, කිසිම මස් වෙළඳ සල් බලපත්‍රධාරියකු විසින් ඝාතන මඩුවෙන් මස් කිසිවක් ප්‍රවාහනය කිරීම හෝ ප්‍රවාහනය කරවීම නොකළ යුතු ය.

8. ප්‍රාදේශීය සභාවේ ඝාතන මඩුවේ ඝාතනයකරනු නොලැබූ කිසිම ගවයකුගේ, බැටළුවකුගේ, එළුවකුගේ, ඌරකුගේ හෝ කැස්බෑවකුගේ, කිසිම මසක් විකිණීම සඳහා සභාපතිවරයාගේ විශේෂ බලපත්‍රයක් නොමැතිව ප්‍රාදේශීය සභා ප්‍රදේශය තුළට ගෙන නො ආයුතු ය. එසේ වුවද ආනයනය කරන ලද ශීත කළ මස් කෙරෙහි මේ අතුරු ව්‍යවස්ථාව අදාල නොවන්නේ ය.

9. එවැනි විශේෂ බලපත්‍රයක් මත ගෙන එන ලද කිසිම මසක්, එය රජයේ පශු වෛද්‍යවරයා විසින් හෝ තත්කාර්යය සඳහා සභාපතිවරයා විසින් බලය පවරන ලද තැනැත්තා හෝ ඝාතන මඩුව භාර පරීක්ෂකවරයා විසින් හෝ ප්‍රාදේශීය සභාවේ ඝාතන මඩුවේ දී පරීක්ෂා කර බලා, මනුෂ්‍ය ආහාරය සඳහා යෝග්‍ය බවට අනුමත කර ඇත්නම් මිස, කිසිම තැනැත්තකු විසින් විකිණීම හෝ විකිණීම සඳහා ඉදිරිපත් කිරීම නීත්‍යානුකූල නොවන්නේය.

තව ද, ඒ සෑම පරීක්ෂණයක් සඳහාම එසේ පරීක්ෂා කරන සෑම කිලෝ එකකටම රුපියල් දහයකට වැඩි නොවන ගාස්තුවක් නියම කර අයකර ගැනීමට ප්‍රාදේශීය සභාවට හිමිකම් ඇත්තේය. ඒ ගාස්තුව ගෙවනු ලැබූවිට මස් පරීක්ෂා කරන ලද බව ප්‍රකාශිත සහ ඒවා විකිණීමට අවසර දෙන සහතිකයක් ඒ නිලධාරියා විසින් නිකුත් කරනු ලැබිය යුතුය.

10. ප්‍රාදේශීය සභාවේ ඝාතන මඩුවක ඝාතනය කරන ලද කිසිම සතකුගේ මස් කිසිවක් හෝ මීට පූර්ව අතුරු ව්‍යවස්ථාවේ විධිවිධාන සලසා ඇති පරිදි පරීක්ෂා කරන ලද මස් කිසිවක් ඒ ඝාතනය හෝ පරීක්ෂා කිරීම සහතික කරන්නා වූ ද, රජයේ පශු වෛද්‍යවරයා හෝ තත් කාර්යය සඳහා සභාපතිවරයා විසින් බලය පවරන ලද තැනැත්තා හෝ ඝාතන මඩුව භාර පරීක්ෂකවරයා හෝ විසින් අත්සන් කරන ලද්දා වූ මෙහි පරිශිෂ්ටයේ "උ" ආකෘතියෙහි පාස්පතක් නොමැතිව කිසිම තැනැත්තකු විසින් ඉවත්කර නොගත යුතු අතර, යම් බලපත්‍රලත් මස් වෙළෙන්දකුට ඒ බලපත්‍ර නිකුත් කිරීම රජයේ පශු වෛද්‍යවරයාගේ හෝ තත් කාර්යය සඳහා සභාපතිවරයා විසින් බලය පවරන ලද තැනැත්තාගේ කාරිය වන්නේ ය.

11. තමා විසින් පරීක්ෂා කරන ලද සියලුම ගවයන් පිළිබඳව, ඔවුන්ගේ විස්තර සහ හංවඩුව හා පරිශිෂ්ඨයේ "ඌ" ආකෘතියෙහි දැක්වෙන වෙනත් විස්තර පෙන්වන රෙජිස්ටරයක් ඝාතන මඩුව භාර පරීක්ෂකවරයා විසින් තබා ගත යුතුය. ඒ රෙජිස්ටරය මහජනයාට බලාගත හැකි විය යුතුය.

12. පරීක්ෂණය සඳහා ගෙන එන සෑම ගවයකු වෙනුවෙන්ම අයිතිය තහවුරු කිරීමේ සහතිකයක් ඉදිරිපත් කරන ලෙස රජයේ පශු වෛද්‍යවරයා හෝ සභාපතිවරයා විසින් තත් කාර්යය සඳහා බලය දෙන ලද තැනැත්තා හෝ ඝාතන මඩුව භාර පරීක්ෂකවරයා හෝ විසින් ගවයාගේ අයිතිකරුට දන්වා සිටිය යුතු අතර, එකී සහතිකය සතා ලබා ගන්නේ හෝ මිළට ගන්නේ යම් තැනැත්තකුගෙන් ද, නැතහොත් තැනැත්තාගෙන් ද ඒ තැනැත්තා හෝ තැනැත්තන් විසින් අත්සන් තබා තිබිය යුතුය. තව ද, එකී සතා පිළිබඳ විස්තර ද එකී තැනැත්තා හෝ තැනැත්තන් පදිංචි ස්ථානය පිළිබඳ විස්තර ද එහි ඇතුළත් විය යුතු අතර, සාක්ෂිකරුවන් දෙදෙනකු විසින් එය අත්සන් කර තිබිය යුතුය. ඒ සාක්ෂිකරුවන් දෙදෙනාගෙන් එක් කෙනෙකු සතා ලබාගත් ප්‍රදේශයේ ග්‍රාමසේවා නිලධාරිවරයා විය යුතුය. මෙකී සහතික හෝ වවුචර රජයේ පශු වෛද්‍යවරයාගේ කාර්යාලයට ඉදිරිපත් කළ යුතුය.

13. ඉහත කී පරිදි යම් සතකු ප්‍රදර්ශනය පිණිස තබා තිබිය දී හෝ ඝාතනය කිරීමට පෙර ප්‍රාදේශීය සභාවේ ඝාතන මඩුව තුළ සිටිය දී යම් තැනැත්තකු ඒ සතා පිළිබඳව හිමිකම් පෑවහොත්, රජයේ පශු වෛද්‍යවරයා හෝ ඝාතන මඩුව භාරව සිටින පරීක්ෂකවරයා හෝ වෙනත් බලයලත් තැනැත්තකු හෝ විසින් එකී සතා ඝාතනය කිරීමට නැවැත්වීමට සැලැස්විය යුතු අතර, එසේ හිමිකම් පාන්නවුන් විසින් පැය 24ක් ඇතුළත ඔහුගේ හිමිකම් පෑම පිළිබඳ විස්තර සහ ඔහුගේ ලිපිනය ද රජයේ පශු වෛද්‍යවරයා හෝ ඝාතන මඩුව භාර පරීක්ෂකවරයා හෝ වෙනත් බලයලත් තැනැත්තා හෝ අවශ්‍ය යැයි සලකා වෙනත් විස්තරයක් වේනොත් එය ද ලියවිල්ලකින් ඉදිරිපත් කරන ලෙස, එසේ හිමිකම් පාන තැනැත්තාට නියම කළ යුතු බව ද මෙයින් නියම කරනු ලැබේ.

14. රජයේ පශු වෛද්‍යවරයා හෝ ඝාතන මඩුව භාර පරීක්ෂකවරයා හෝ බලය පවරනු ලැබූ වෙනත් තැනැත්තා හෝ වෙත ඒ විස්තර සපයනු ලැබූ වහාම ඒ සතා මහෙස්ත්‍රාත්වරයා වෙත ඉදිරිපත් කිරීමට සැලැස්විය යුතු අතර, එවිට ඒ හිමිකම් පෑම සම්බන්ධයෙන් මහෙස්ත්‍රාත්වරයා විසින් ලඝු විභාගයක් පවත්වා විනිශ්චය දිය යුතුය. හිමිකම් පාන්නා ඉහත නියමිත පරිදි ඔහුගේ හිමිකම් පිළිබඳව විස්තර සැපයීමට අපොහොසත් වුවහොත් පැය විසිහතරක කාලසීමාව ඉකුත් වූ පසුව ඒ සතා ඝාතනය කිරීම පිණිස රජයේ පශු වෛද්‍යවරයා හෝ වෙනත් බලයලත් තැනැත්තා විසින් අවසර දීම නීත්‍යානුකූල වන්නේය.

15. පහත සඳහන් ගාස්තු ගෙවිය යුතුය :-

(අ) මී ගවයකු හෝ ගවයකු සඳහා ඝාතන අවසර පත්‍ර ගාස්තු සහ ප්‍රදර්ශනය බඩු ගාස්තුව ;
(ආ) මී ගවයකු හෝ ගවයකු සඳහා හදිසි ඝාතන අවසර පත්‍ර ගාස්තුව ;
(ඇ) බැටළුවකු හෝ එළුවකු සඳහා ඝාතන සහ ප්‍රදර්ශන මඩු ගාස්තුව ;
(ඈ) බැටළුවකු හෝ එළුවකු සඳහා හදිසි ඝාතන අවසර පත්‍ර ගාස්තුව ;
(ඉ) මී ගවයකුගේ හෝ ගවයකුගේ මළකඳ සහ බොකු ප්‍රවාහනය කිරීමේ ගාස්තු ;
(ඊ) බැටළුවකුගේ, එළුවකුගේ හෝ ඌරකුගේ මළකඳ හා බොකු ප්‍රවාහනය කිරීමේ ගාස්තු ;
(උ) බැටළුවකුගේ, එළුවකුගේ, ඌරකුගේ මළකඳ සහ බොකු වෙළඳ පොළෙන් පිටත ප්‍රවාහනය කිරීමේ ගාස්තු.

අවසර පත්‍ර නිකුත් කිරීමේ ගාස්තුව සහ වෙනත් ගාස්තු ප්‍රාදේශීය සභාව විසින් කලින් කළ නිකුත් කිරීම නීත්‍යානුකූල වන්නේ ය.

16. බලපත්‍රලත් ඝාතකයකු නොවන කිසිම තැනැත්තකු විසින් සභාපතිවරයාගෙන් ලත් විශේෂ බලපත්‍රයක් නොමැති හෝ ඒ බලපත්‍රයේ නියමයන්ට පටහැනිව යම් සතකු හෝ ඌරකු ඝාතනය නීත්‍යානුකූල නොවන්නේය. එවැනි සෑම බලපත්‍රයක් සඳහාම මුද්දර ගාස්තුවට අතිරේකව ප්‍රාදේශීය සභාව විසින් කලින් කළ නිශ්චය කරනු ලැබිය හැකි ගාස්තුවක් අයකරනු ලැබිය හැක්කේ ය.

17. මේ අතුරු ව්‍යවස්ථාවල කවර හෝ විධිවිධානයක් උල්ලංඝනය කරන කවර හෝ තැනැත්තෙක් වරදකරු කරනු ලැබූ විට රු. 750ක් නොඉක්මවන දඩයකට යටත් වන්නේ ය.

18. පද සම්බන්ධය අනුව අන්‍යාර්ථයක් අවශ්‍ය වේ නම් මිස :-

"සතා" යන්නෙන් ගවයන්, බැටළුවන්, එළුවන්, ඌරන් සහ කැස්බෑවන් අදහස් වේ ;

"ගවයන් " සහ "බලපත්‍රලත් ඝාතකයා " යන යෙදුම්වල හෝ ඝාතන ආඥාපනතේ පිළිවෙලින් ඒවාට දී ඇති අර්ථයම ඇත්තේ ය.

**ඝාතන මඩු පිළිබඳ අතුරු ව්‍යවස්ථාවල 10 වැනි අතුරු ව්‍යවස්ථාව යටතේ "උ" ආකෘති පත්‍රය**

...................... පදිංචි .................. නමැති අය ........................ විසින් පරීක්ෂාකොට අවසර දීමෙන් පසු අද දින ගවයන් ..................... දෙනකු ඝාතනය කරන ලදුව (හෝ අවස්ථාවෝචිත පරිදි, ප්‍රාදේශීය සභා ප්‍රදේශයෙන් පිටත දී ඝාතනය කරන ලද ගවයන් ............. ගේ මස්, පරීක්ෂණය සඳහා ඉදිරිපත් කරන ලදුව) අංක ..................... දරන වාහනයෙන් ඔහු විසින් ගෙනයන එම මස් අංක ...................... දරන වෙළෙඳ සැළට භාරගැනීමට අවසර දෙනු ලැබේ.

______________________________,
ප්‍රාදේශීය සභාවේ ඝාතන මඩුව භාර පරීක්ෂක.

20 ..................... දින,
.......................... ප්‍රාදේශීය සභාවේ දී ය.

**ඝාතන මඩු පිළිබඳ අතුරු ව්‍යවස්ථාවල 61 වැනි අතුරු ව්‍යවස්ථාව යටතේ "උ" ආකෘති පත්‍රය**

**19 ................ දින.................... විසින් පරීක්ෂා කරන ලද ගවයින් පිළිබඳ ලේඛනය**

| විස්තරය | වර්ණය | වයස | නිවරන | | ඝාතකයාගේ නම | වෙනත් කරුණු |
|---|---|---|---|---|---|---|
| | | | දකුණු පැත්ත | වම් පැත්ත | | |
| | | | | | | |

**33. පොදු වෙළඳ පලවල්**

1. මේ අතුරු ව්‍යවස්ථාවල "වෙළඳපොල ප්‍රදේශ" යන යෙදුමෙන්, යම් පොදු වෙළෙඳපළක් සඳහා වෙළඳ පළ ප්‍රදේශයක් ලෙස ප්‍රාදේශීය සභාවක් විසින් ප්‍රකාශයට පත්කරන ලද ප්‍රදේශය අදහස් වේ.

2. මේ අතුරු ව්‍යවස්ථාව යටතේ ප්‍රාදේශීය සභාවක අධිකාරය මත හෝ ඒ යටතේ නිකුත්කරන ලද අවසර පත්‍රයක් හෝ ටිකට් පතක් දරන්නකු හෝ දරන්නකුගේ සේවකයකු නැතහොත් අනුයෝජිතයකු වන්නේ නම් මිස හෝ ඒ අවසර පත්‍රය හෝ ටිකට්පතක නියමයන්ට සහ කොන්දේසිවලට අනුකූල නොවන වෙනත් ආකාරයට කිසිම තැනැත්තකු විසින් පොදු වෙළඳපලේ කඩ පිලක්, ආසනයක් හෝ ඉඩ ප්‍රමාණයන් පාවිච්චි කිරීම හෝ පරිහරණය කිරීම නොකළ යුතුය. තව ද, ඒ සේවකයකුගේ හෝ අනුයෝජිතයකුගේ හෝ නම ප්‍රාදේශීය සභා කාර්යාලයෙන් ලියාපදිංචි කර ඇත්නම් මිස ඒ සේවකයකු හෝ අනුයෝජිතයකු එවැනි යම් කඩපිලක්, ආසනයක් හෝ ඉඩ ප්‍රමාණයක් පාවිච්චි කිරීම හෝ පරිහරණය කිරීම නොකළ යුතුය.

3. (1) පොදු වෙළඳ පොළෙහි කඩපිලක ආසනයක හෝ ඉඩ ප්‍රමාණයක කුලී නිවැසියාව මාසයකට නොඅඩු කාලසීමාවක් සඳහා වන්නා වූ සෑම කාරණයක දී ම මෙහි "අ" උපලේඛනයේ "අ" ආකෘති පත්‍රය අනුව දිනපතා නිකුත් කරන්නා වූ ද, නිකුත් කරන ලද කාල සීමාව සඳහා පමණක් ප්‍රයෝජනයට ගත හැක්කා වූ ද, ටිකට් පතක් මගින් බලය පවරා දෙනු ලැබේ.

(2) පොදු වෙළඳපොළෙහි කඩපිලක්, ආසනයක් හෝ ඉඩ ප්‍රමාණයක් එක් මාසයකට අඩු කාලසීමාවක් සඳහා පාවිච්චි කිරීම හෝ පරිහරණය කිරීම වෙනුවෙන් මෙහි "අ" උපලේඛනයේ "ආ" ආකෘති පත්‍රය අනුව දිනපතා නිකුත් කරන්නා වූ ද, නිකුත් කරන ලද කාල සීමාව සඳහා පමණක් ප්‍රයෝජනයට ගත හැක්කා වූ ද, ටිකට් පතක් මගින් බලය පවරා දෙනු ලැබේ.

(4) අවසර පත්‍රයක් හෝ ටිකට් පතක් දරන සෑම තැනැත්තෙකුම ප්‍රාදේශීය සභාව විසින් ඒ සඳහා නියම කරන ලද අනුප්‍රමාණ අනුව වන කුලියක් හෝ ගාස්තුවක් ගෙවිය යුතුය.

(5) වෙළඳ පොළ පරිශ්‍රය ප්‍රයෝජනයට ගැනීම වෙනුවෙන් ගෙවිය යුතු කුලී සහ ගාස්තු එකතු කිරීමට ප්‍රාදේශීය සභාව විසින් නිළධාරියකු නියුක්ත නොකළහොත් එම සභාව විසින් ඒ කුලී සහ ගාස්තු එකතු කිරීමේ අයිතිවාසිකම යම් අනුමත තැනැත්තෙකුට —

*(අ)* පෞද්ගලික ගිවිසුමක් මගින් ; හෝ
*(ආ)* ටෙන්ඩර් කැඳවීමෙන්; හෝ
*(ඇ)* ඒ අයිතිවාසිකම් ප්‍රසිද්ධ වෙන්දේසියට දැමීමෙන් හෝ

බදු දෙනු ලැබිය හැකිය.

6. (1) පොදු වෙළඳපොලෙහි එක් එක් කඩපිල, අසනය හෝ ඉඩ ප්‍රමාණය සඳහා ගෙවිය යුතු කුලිය හෝ ගාස්තුව මෙහි පහත සඳහන් කර ඇති වේලාවන්හි දී, අවස්ථාවෝචිත පරිදි ප්‍රාදේශීය සභාවට හෝ එවැනි කුලී හෝ ගාස්තු එකතු කිරීම සඳහා ප්‍රාදේශීය සභාව විසින් පත්කරන ලද නිලධාරියාට හෝ (මෙහි මින්මතු "සභාපතිවරයා" යනුවෙන් සඳහන් කරනු ලබන) ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයාගේ ලිඛිත අනුමැතිය ඇතිව බදුකරුට හෝ කල් මත්තෙන් ගෙවිය යුතුය.

(2) ඒ කුලිය හෝ ගාස්තුව —

*(අ)* අවසර පත්‍රයක් නිකුත් කරනු ලබන අවස්ථාවක එය නිකුත් කරන වේලාවේ දී හෝ ඒ අවසර පත්‍රය නිකුත් කරනු ලබන කාල සීමාවේ එක් එක් ලිත් මාසයේ පළමුවැනි දිනයේ දී, මාසික වාරික මගින් ;

*(ආ)* ටිකට් පතක් නිකුත් කරනු ලබන අවස්ථාවක, එය නිකුත් කරන වේලාවේ දී ගෙවිය යුතුය.

එසේ වුව ද, අවසර පත්‍ර දරන්නෙකුගෙන් ලැබිය යුතු යම් කුලියක් ගෙවීම සඳහා, ප්‍රමාණවත් හේතු මත ඔහුටත් එක් සතියක් නොඉක්මවන කාලයක් කල්දිය හැකි අතර, ඒ කාලය ඉකුත් වූ විට අයවිය යුතු මුදල, අවසර පත්‍රයේ කාල සීමාවෙන් කුලිය හිඟ හිටවා තිබුණ එක් එක් දිනය වෙනුවෙන් රුපියලක අතිරේක කුලියක් සමග ඉල්ලා සිටි විට ගෙවීමට ඔහු යටත් වන්නේ ය.

7. (1) අවසර පත්‍රයක් හෝ ටිකට් පතක් දරන්නෙකු විසින්, සභාපතිවරයාගේ ලිඛිත අවසරය නොබලා—

*(අ)* ඒ අවසර පත්‍රය හෝ ටිකට් පත වෙනත් තැනැත්තෙකුට පැවරීම ; හෝ

*(ආ)* තමාට ලැබී ඇති කඩ පිලෙහි ආසනයෙහි හෝ ඉඩ ප්‍රමාණයෙහි යම් කොටසක් අතුරු කුලියට දීම නොකළ යුතුය.

(2) සිදුකර ඇතැයි කියන පැවරීමක් හෝ අතුරු කුලියක් යටතේ කිසිම තැනැත්තෙකු විසින්, පොදු වෙළඳ පොළක යම් කඩ පිලක් ආසනයක් හෝ ඉඩ ප්‍රමාණයක් සභාපතිවරයාගේ ලිඛිත අවසරය නොමැතිව පාවිච්චි කිරීම හෝ පරිහරණය කිරීම නොකළ යුතුය.

8. එක් මාසයක් ඉක්මවන යම් කාල සීමාවකට අවසර පත්‍රයක් දරන සෑම තැනැත්තෙක්ම ඔහුගේ කුලී නිවැසියාට අවසන් කිරීමට තීරණය කළ විට ප්‍රාදේශීය සභාවට එක් ලිත් මාසයක් කලින් දැනුම්දීමක් කළ යුතුය. නැතහොත් එම දැනුම්දීම වෙනුවට එක් මාසයක කුලිය ගෙවිය යුතුය.

9. අවසර පත්‍ර සහිත කඩපිලක් ඇති සෑම තැනැත්තෙක්ම —

*(අ)* ආහාර ද්‍රව්‍ය හෝ බීම විකිණීම සඳහා තබා ඇති හෝ ප්‍රදර්ශණය කර ඇති බංකුවක්, රාක්කයක්, කවුන්ටරයක් හෝ මේසයක් ම දිනපතාම ඉතා හොඳින් පිරිසිදු කිරීමට ද, මස් හෝ මාළු විකිණීම සඳහා තබා ඇති හෝ ප්‍රදර්ශණය කර ඇති පුවරුවක් දිනපතාම සූරා සේදීමට ද සැලැස්විය යුතුය.

*(ආ)* ස්ථානය මීයන්ගෙන්, දඩාවතේ යන බල්ලන්ගෙන්, බළලුන්ගෙන්, හරකුන්ගෙන් සහ මැස්සන්ගෙන් ද, රෝග වාහක කෘමීන්ගෙන් ද තොරව තබා ගත යුතුය ;

10. අවසර පත්‍රයක් හෝ ටිකට් පත්‍රයක් දරන කිසි තැනැත්තෙක් —

*(අ)* පොදු වෙළඳපොළකට පැමිණෙන කිසිම තැනැත්තෙකු කිසිම නිග්‍රහයකට, හිරිහැරයකට, ගැහැටකට හෝ ප්‍රමාදයකට පාත්‍ර නොකළ යුතුය ;

*(ආ)* යම් චර්මගත, ස්පර්ශක හෝ ආසාදන රෝගයකින් පෙලෙත් ද තමාගේ කඩපිල ආසන්නය හෝ ඉඩ ප්‍රමාණය පරිහරණය කිරීම හෝ එවැනි යම් රෝගයකින් පෙලෙන යම් තැනැත්තෙකු, ඒ කඩපිලෙහි ආසනයෙහි හෝ ඉඩ ප්‍රමාණයෙහි සේවයේ යෙදවීම හෝ එය පරිහරණය කිරීමට එවැනි තැනැත්තෙකුට ඉඩ දීම නොකළ යුතුය ;

*(ඇ)* සභාපතිවරයාගේ ලිඛිත අවසරය නොමැතිව තමාගේ කඩපිලෙහි, ආසනයෙහි හෝ ඉඩ ප්‍රමාණයෙහි යම් කොටසක් කොටු කිරීම හෝ යම් ආවරණයක් හෝ වියනක් ඉදි කිරීම හෝ ඒ කඩ පිලෙහි, ආසනයෙහි හෝ ඉඩ ප්‍රමාණයෙහි තාවකාලික හෝ ස්ථිර යම් වෙනසක් කිරීම නොකළ යුතුය ;

*(ඈ)* සභාපතිවරයාගේ ලිඛිත අවසරය නොමැතිව ප්‍රාදේශීය සභාවේ දේපළක් නොවන යම් පෙට්ටියක්, මේසයක්, පුටුවක් හෝ වෙනත් එවැනි භාණ්ඩයක් තමාගේ කඩපිලට ගෙන ඒම හෝ එහි තබා ගැනීම හෝ ඒ කඩපිලෙහි, ආසනයෙහි හෝ ඉඩ ප්‍රමාණයෙහි රාක්ක හෝ වෙනත් සවි කිරීම් සෑදීම නොකළ යුතුය ;

*(ඉ)* අවසර පත්‍රයෙහි හෝ ටිකට් පතෙහි නිශ්චිතව සඳහන් නොවන යම් භාණ්ඩයක්, හෝ ප්‍රාදේශීය සභාව විසින් තහනම් කර ඇති යම් භාණ්ඩයක් හෝ අපත්‍ය හෝ යම් ආකාරයකින් මහජන සෞඛ්‍යයට හානිකර භාණ්ඩය හෝ තමාගේ කඩපිලෙහි, ආසනයෙහි, හෝ ඉඩ ප්‍රමාණයෙහි ප්‍රදර්ශණය කිරීම හෝ විකිණීම සඳහා තැබීම නොකළ යුතුය ;

*(ඊ)* මාළු කටු, වරල් හෝ කොරළ කිසිවක් හෝ යම් ඉවත දමන ද්‍රව්‍ය, කැලිකසළ හෝ අතු ගා ඉවත් කරන ද්‍රව්‍ය යමක් කාණුවකට හෝ වෙළඳපොළ පරිශ්‍රයෙහි යම් කොටසක් මත නොදැමිය යුතුය ;

*(උ)* යම් සතකුගේ සමක් හෝ වරල්, වේලීමේ හෝ පදම් කිරීමේ කාර්යය සඳහා වෙළෙඳපොළ පරිශ්‍රයේ කිසි කොටසක අනාවරණය කර නොතැබිය යුතුය ;

*(ඌ)* වෙළෙඳපොළ පරිශ්‍රය තුළ මාළු වේලීම, ලුණු දැමීම හෝ අයිස් දැමීම නොකළ යුතුය.

11. පොදු වෙළඳපොළක් ඇතුලත හෝ එහි පරිශ්‍රයෙහි කිසිම තැනැත්තකු —

*(අ)* ඉවුම්පිහුම් කිසිවක් නොකළ යුතුය ;
*(ආ)* බීමත්ව හෝ නොහික්මුණු ආකාරයෙන් හැසිරෙමින් නොසිටිය යුතුය. ඝෝෂා කිරීම හෝ කලබල ඇති කිරීම නොකළ යුතුය ; වෙනත් තැනැත්තකු සමග දබර කිරීම හෝ අපහාසාත්මක, අපවාදාත්මක හෝ අශිෂ්ඨ වචන පාවිච්චි නොකළ යුතුය ;
*(ඇ)* සිගා කෑම නොකළ යුතුය ;
*(ඈ)* සතුටුදායක හේතු දැක්වීම කළ නොහැකි වූ නිකරුනේ හැසිරීම හෝ වෙළඳපල පාලක විසින් හෝ ප්‍රාදේශීය සභාවේ නිලධාරියෙකු විසින් හෝ ගම්පතිවරයෙකු හෝ පොලිස් කොස්තාපල්වරයෙකු විසින් හෝ සභාපතිවරයාගේ නීත්‍යානුකූල නියමයන් මත ක්‍රියාකරන තැනැත්තකු විසින් හෝ පිටවන ලෙස අණකරනු ලැබීමෙන් පසුව රැඳී සිටීම නොකළ යුතුය.

12. කිසිම තැනැත්තෙක් —

*(අ)* වෙළඳපොළ ගොඩනැගිල්ලේ කිසිම කොටසකට හෝ ගෘහ භාණ්ඩවලට හෝ ලාම්පුවලට හෝ පොදු වෙළඳපොළ තුළ හෝ අවට ඇති ප්‍රාදේශීය සභාවේ දේපළවලට හෝ හානියක් හෝ විරූප කිරීමක් නොකළ යුතුය ;
*(ආ)* පොදු වෙළඳපොළක ප්‍රයෝජනය සඳහා සපයා ඇති ජලය අපවිත්‍ර කිරීම, කෙලෙසීම හෝ නාස්ති කිරීම ද ඒ ජලයෙන් තමාම හෝ යම් සතෙකු, හෝ රෙදි හෝ භාණ්ඩයක් සේදීම ද නොකළ යුතුය ;
*(ඇ)* වෙළඳපොල පරිශ්‍රය තුලට යම් සුනඛයෙකු හෝ වාහනයක් හෝ ගෙන නොයා යුතුය.

13. (1) පොදු වෙළඳපොළක කඩපිලක්, ඉඩ ප්‍රමාණයක් හෝ ආසනයක් පරිහරණය කිරීම වෙනුවෙන් ගෙවිය යුතු කුලී හෝ ගාස්තු ලැයිස්තුවක් සභාපතිවරයා විසින් වෙළඳපොළෙහි ප්‍රකටව පෙනෙන ස්ථානයක ප්‍රදර්ශනය කරවිය යුතුය.

(2) කිසිම වෙළඳපොළ පාලකයකු හෝ බදුකරුවකු හෝ කුලී හෝ ගාස්තු එකතු කිරීමට බදුකරු විසින් පත් කරන ලද තැනැත්තකු-

*(අ)* ඉහත කී ලැයිස්තුවේ නිශ්චය කොට දැක්වෙන ප්‍රමාණයට වඩා වැඩි මුදලක් කුලී හෝ ගාස්තු වශයෙන් ඉල්ලා සිටීම හෝ ලබා ගැනීම නොකළ යුතුය ;
*(ආ)* තමා වෙත පැවරී ඇති හෝ භාරවී ඇති යම් කාර්යයක් ඉටු කිරීමේ හෝ බලයක් ක්‍රියාත්මක කිරීමේ නියෝගය මේ තැනැත්තකු අනවශ්‍ය පීඩාකර සැලකිල්ලකට පාත්‍ර නොකළ යුතුය.

14. කිසියම් කුලියක් හෝ ගාස්තුවක් පිළිබඳව වන කවර හෝ මත භේදයක් විභාග කොට ඒ පිළිබඳ සුදුසු යැයි තමාට පෙනී යන නියමයක් කිරීමට සභාපතිවරයාට බලය ඇත්තේ ය.

15. (1) සභාපතිවරයා හෝ තත් කාර්ය සඳහා ඔහු විසින් බලය පවරන ලද යම් නිලධරයෙකු හෝ විසින් පොදු වෙළඳපොළක් පරීක්ෂා කිරීමත්, එහි යම් කඩපිලක්, ආසනයක් හෝ ඉඩ ප්‍රමාණයක් පාවිච්චි කරන හෝ පරිහරණය කරන කවර හෝ තැනැත්තකුට නිකුත් කර ඇති අවසර පත්‍රය හෝ ටිකට් ඉදිරිපත් කරන ලෙස නියම කිරීමක් නීත්‍යානුකූල වන්නේ ය.

(2) සභාපතිවරයා විසින් හෝ තත් කාර්යය සඳහා ඔහු විසින් යථා පරිදි බලය පවරනු ලැබූ නිලධරයෙකු විසින් හෝ ඉල්ලා සිටිනු ලැබූ වහාම අවසර පත්‍රය හෝ ටිකට්පත පරීක්ෂා කිරීම සඳහා ඉදිරිපත් කිරීම අවසර පත්‍රයක් හෝ ටිකට් පතක් දරන්නෙකුගේ යුතුකම වන්නේ ය.

**පෞද්ගලික වෙළෙඳපොලවල් සහ වෙනත් බලයලත් ස්ථාන**

16. යම් පොදු වෙළෙඳපොලක, වෙළෙඳපොල ප්‍රදේශය ඇතුලත කිසිම තැනැත්තකු විසින්, ඒ වෙළෙඳපොල හැර වෙනත් ස්ථානයක මස්, කුකුළු ආදී සතුන් මාළු, පළතුරු හෝ එළවළු විකිණීම හෝ විකිණීම සඳහා ඉදිරිපත් කිරීම හෝ ප්‍රදර්ශනය කිරීම නොකළ යුතුය. එසේ වුව ද මේ අතුරු ව්‍යවස්ථාවේ පූර්වයෙන් ඇති විධිවිධාන පහත සඳහන් ඒවාට අදාල නොවන්නේය :-

*(අ)* නියමිත ස්ථානයක වෙළෙඳාම් නොකරන හෝ එම වෙළෙඳාම් කටයුතු සඳහා ප්‍රසිද්ධ පාරවල හෝ පොදු ස්ථාන ආසන්නයේ ස්ථානයක් තහවුරු කර නොගන්නා සංචාරක වෙළෙන්දන් විසින් කුකුළු ආදී සතුන්, පළතුරු හෝ එළවළු විකිණීම,
*(ආ)* බලපත්‍රලත් සංචාරක වෙළෙන්දන් විසින් වෙළෙඳපොල ප්‍රදේශය ඇතුලත මාළු විකිණීම,
*(ඇ)* බත් කඩයක හෝ, තේ හෝ කෝපි කඩයක හෝ පළතුරු කඩයක, බලපත්‍රලාභියා විසින් ඒ ස්ථානයේම පරිභෝජනය සඳහා විකිණීම,
*(ඈ)* පොදු වෙළෙඳපොල හැර වෙනත් යම් බලයලත් ස්ථානයක ඌරු මස්, පළතුරු හෝ එළවළු විකිණීම,
මේ ඡේදයේ ''අවසරලත් ස්ථානය'' යන්නෙන් තත්කාර්යය සඳහා ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද බලපත්‍රවලින් බලය දෙන ලද කවර හෝ ස්ථානයක් අදහස් වේ.

(2) (1) වැනි ඡේදයේ සඳහන් සෑම බලපත්‍රයක්ම -

(අ) මෙහි "ආ" උපලේඛනයෙහි ඇති ආකෘතියට සාරානුකූල විය යුතුය; තව ද
(ආ) ඒ බලපත්‍රයෙහි නිශ්චය කොට දැක්වෙන එක් මාසයකට නොඅඩු සහ මාස 12 ක් නොඉක්මවන කාල සීමාවක් තුළ බලපැවැත්විය යුතුය.

(3) (1) *(අ)* ඡේදයේ සඳහන් බලපත්‍රයක් සඳහා ප්‍රාදේශීය සභාව විසින් නියම කර ඇති ගාස්තුව ගෙවන තෙක් ඒ ඡේදය යටතේ බලපත්‍රයක් නිකුත් නොකල යුතු ය.

(4) සෑම බලපත්‍රලාභියකුම ඔහුගේ විකුණුම් සේවකයන්ගේ නම්, ප්‍රාදේශීය සභා කාර්යාලයේ ලියාපදිංචි කර තැබිය යුතු ය.

(5) ප්‍රාදේශීය සභා කාර්යාලයේ නම ලියාපදිංචි කර නොමැති කිසිම විකුණුම් සේවකයකු කිසිම බලයලත් ස්ථානයක කිසි විකිණීමේ කටයුත්තකට සහභාගී නොවිය යුතු ය.

17. ප්‍රාදේශීය සභාව විසින් තත් කාර්යය සඳහා නිකුත් කරන ලද බලපත්‍රයක් දරන්නකු නම් මිස, කිසිම තැනැත්තකු විසින්, වෙළෙඳ ප්‍රදේශය ඇතුළත මස් හෝ මාළු කිසිවක් විකිණීම සඳහා එහා මෙහා ගෙන යාම නොකල යුතුය. එවැනි බලපත්‍රයක් ආසාධන, ස්පර්ශක හෝ චර්මගත රෝගයකින් පෙළෙන කිසිම තැනැත්තකුට නිකුත් නොකළ යුතු ය.

සාමාන්‍ය විධිවිධාන

18. පොදු ඝාතක මඩුවක ඝාතනය කරනු නොලැබූ කිසිම සතකුගේ මළකඳක් හෝ මස් කිසිවක්, කිසිම තැනැත්තකු විසින්, ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත කිසිම පොදු වෙළෙඳපොලකට හෝ පෞද්ගලික වෙළෙඳපොලකට හෝ වෙනත් ස්ථානයකට ගෙන ඒම හෝ වෙළෙඳාම සඳහා ප්‍රදර්ශනය කිරීම හෝ විකිණීම හෝ නොකල යුතු ය :

එසේ වුව ද, දිවයිනට ආනයනය කරන ලද ශීත කළ මස් විකිණීම හෝ දඩමස් විකිණීම හෝ කෙරෙහි මේ අතුරු ව්‍යවස්ථාව අදාළ නොවිය යුතු ය.

19. (1) පොදු වෙළඳපොලක කඩ පිලක්, ව්‍යාපාර කටයුතු සඳහා පෙරවරු 6.00 සිට ප.ව. 9.00 දක්වා විවෘත කර තැබීම ඒ කඩ පිලක් සඳහා අවසර පත්‍රය දරන සෑම තැනැත්තකුගේම කාර්යය වන්නේය;

(2) ඒ කිසිම අවසරපත්‍රධාරියකු විසින්ම යුක්ති සහගත හේතුවක් නොමැතිව මහජනයාට සේවය සැපයීම හිතාමතාම පැහැර හැරීම හෝ ප්‍රතික්ෂේප කිරීම නොකළ යුතු ය;

20. (1) මේ අතුරු ව්‍යවස්ථාව අතුරින් යම් අතුරු ව්‍යවස්ථාවක් කඩ කිරීම සම්බන්ධයෙන් දෙවන වරට තදනන්තරව නිසි බල ඇති අධිකරණයක් විසින් අවසරපත්‍රධරයෙකු වරදකරු කිරීමේ දී මේ අතුරු ව්‍යවස්ථාව යටතේ නිකුත් කර ඇති යම් අවසරපත්‍රයක් ඒ අධිකරණය විසින් අවලංගු කිරීම නීත්‍යානුකුල වන්නේය;

(2) *(අ)* අවසරපත්‍ර අවලංගු කරනු ලැබ ඇති තැනැත්තකුට හෝ මේ අතුරු ව්‍යවස්ථාව කඩ කිරීම සම්බන්ධයෙන් වරදකරු කරනු ලැබ ඇති තැනැත්තකුට අළුතින් අවසර පත්‍රයක් නිකුත් කිරීම; හෝ

*(ආ)* මේ අතුරු ව්‍යවස්ථාව කඩ කිරීමක් සම්බන්ධයෙන් වරදකරු කරනු ලැබ ඇති යම් තැනැත්තකුට අළුතෙන් ටිකට්පතක් නිකුත් කිරීම, ප්‍රාදේශීය සභාව විසින් ප්‍රතික්ෂේප කරනු ලැබිය හැකිය.

21. සභාපතිවරයා විසින් හෝ ප්‍රාදේශීය සභාවේ කවර හෝ නිලධරයෙකු විසින්, යම් වෙළෙඳපොලක් පරීක්ෂා කිරීම සහ අපත්‍ය ආහාරයක් ලෙස ඔහුට පෙනී යන්නා වූ ද ඒ වෙළෙඳපොලහි විකිණීම සඳහා ඉදිරිපත් කර හෝ ප්‍රදර්ශනය කර ඇත්තා වූ ද, යම් ආහාර ද්‍රව්‍යයක් තහනමට ගෙන ඒ ආහාර ද්‍රව්‍ය සෞඛ්‍ය වෛද්‍ය නිලධාරියා වෙත යැවීම නීත්‍යානුකූල වන්නේය. තව ද, එසේ තහනමට ගන්නා ලද යම් ආහාර ද්‍රව්‍යයක් අපත්‍ය ආහාරයක් බවට ඒ නිලධාරියා විසින් සහතික කරනු ලැබුවහොත්, එය තහනමට ගන්නා ලද්දේ යම් තැනැත්තෙකු සන්තකයේ තිබියදී, ද ඒ තැනැත්තාට වන්දි ගෙවීමකින් තොරව, ඒ ද්‍රව්‍ය විනාශ කර දැමිය හැකිය.

22. වෙළඳපොල පාලනය සඳහා හෝ එහි කුළිය හෝ ගාස්තු එකතු කිරීම සඳහා ප්‍රාදේශීය සභාව විසින් පත්කර ඇති වෙළඳපොල පාලකට හෝ වෙනත් නිළධරයෙකුට හෝ තැනැත්තකුට හෝ ඔහුගේ කාර්යය ඉටු කිරීමේ දී කිසිම තැනැත්තකු විසින් විරෝධය පෑම, බාධා කිරීම, අවහිර කිරීම හෝ අතවර කිරීම නොකළ යුතු ය.

23. මේ අතුරු ව්‍යවස්ථාව පිළිබඳව වන යම් උල්ලංඝනය කිරීමක් රුපියල් හත්සිය පනහක් නොඉක්මවන දඩයකින් සහ එම උල්ලංඝනය දිගටම කර ගෙන යන අවස්ථාවක නිසි බලය ඇති අධිකරණයක් විසින් වරදකරු කිරීමෙන් පසුව හෝ ඒ උල්ලංඝනය කෙරෙහි අවධානය යොමු කරමින් සභාපතිවරයා විසින් යවන දැන්වීමක් භාර කරවීමෙන් පසුව හෝ ඒ උල්ලංඝනය කරගෙන යන එක් එක් දිනය වෙනුවෙන් රුපියල් දෙසීය පනහක් නොඉක්මවන දඩයකින් දඬුවම් කරනු ලැබීමට යටත් වන්නේය.

**"අ" උපලේඛනය**

**"අ" ආකෘති පත්‍රය**

*3(1) වැනි අතුරු ව්‍යවස්ථාව*

ගෙවන ලද ගාස්තුව...................................................................................................
................................................ පදිංචි............................................................. වන, මෙය දරන තැනැත්තාට, මෙහි පසුපිටෙහි සඳහන් කොන්දේසිවලට යටත්ව..................
දිනයෙන් අවසන් වන මාස.......................... ක කාල සීමාවක් සඳහා වෙළඳපොළෙහි............................. විකිණීම පිණිස අංක.................................. දරන කඩපිල/ඉඩ ප්‍රමාණය දැරීමට මෙයින් අවසර දෙනු ලැබේ.

____________________

ප්‍රාදේශීය සභාවේ සභාපති.

(ආකෘති පත්‍රයේ පිටුපස)

(1) කඩ පිලෙහි/ඉඩ ප්‍රමාණයෙහි කිසිම සතෙකු හෝ පක්ෂියෙකු තබා ගැනීම හෝ එය තුළට සතෙකු හෝ පක්ෂියෙකු ගෙන ඒම නොකළ යුතු ය.
(2) ප.ව. 9.00 න් පසුව කඩ පිලෙහි/ඉඩ ප්‍රමාණයෙහි ගිනි දැල්වීමට හෝ ආලෝකයක් දැල්වීමට අවසර නොදිය යුතු ය.
(3) ප.ව. 9.00 න් පසුව කිසිම තැනැත්තෙකු කඩ පිලක හෝ වෙළෙඳ පොලෙහි හෝ රැඳී නොසිටිය යුතු ය.
(4) කවර හෝ දිනයක ප.ව. 9.00 න් පසුවත් ඊළඟ දිනයේ පෙ.ව. 6.00 ත් අතරතුර කඩපිලෙහි/ඉඩ ප්‍රමාණයෙහි තබා යන භාණ්ඩ යමක් පිළිබඳ අවදානම අවසරපත්‍ර දරන්නාගේ වගකීම වන්නේය.
(5) මේ කොන්දේසි කඩ කිරීම, අතුරු ව්‍යවස්ථා යටතේ වෙනම් යම් දණ්ඩනයකට අතිරේක, මේ අවසරපත්‍රය දරන්නාගේ කුලී නිවැසියාට අවසාන කරනු ලැබීමට යටත් වීමට හේතු විය හැකිය.

*"ආ" ආකෘති පත්‍රය*

*3(2) වැනි අතුරු ව්‍යවස්ථාව*

පරිහරණය කිරීමේ ටිකට් පත

ගෙවන ලද ගාස්තුව..........................................................

...................................................................................... පදිංචි............................................................... වන මෙය දරන තැනැත්තාට, මෙහි පසුපිටෙහි සඳහන් කොන්දේසිවලට යටත්ව................................. දිනයෙන් අවසන් වන මාස....................................................... ක කාල සීමාවක් වෙළඳපොලෙහි......................................... විකිණීම පිණිස අංක.................. දරන කඩපිල/ඉඩ ප්‍රමාණය පරිහරණය කිරීමට මෙයින් අවසර දෙනු ලැබේ.

__________________________,

ප්‍රාදේශීය සභාවේ සභාපති.

(ආකෘති පත්‍රයේ පසුපිට)

(1) කඩ පිලෙහි/ඉඩ ප්‍රමාණයෙහි කිසිම සතෙකු හෝ පක්ෂියෙකු තබා ගැනීම හෝ එය තුළට සතෙකු හෝ පක්ෂියෙකු ගෙන ඒම නොකළ යුතු ය.
(2) ප.ව. 9.00 න් පසුව කඩ පිලෙහි/ඉඩ ප්‍රමාණයෙහි ගිනි දැල්වීමට හෝ ආලෝකය දැල්වීමට අවසර නොදිය යුතු ය.
(3) ප.ව. 9.00 න් පසුව කිසිම තැනැත්තෙකු කඩ පිලක හෝ වෙළඳ පොලෙහි හෝ රැඳී නොසිටිය යුතු ය.
(4) කවර හෝ දිනක ප.ව. 9.00 න් පසුවත් ඊළඟ දිනයේ පෙ.ව. 6.00 ත් අතරතුර කඩ පිලෙහි/ඉඩ ප්‍රමාණයෙහි තබා යන භාණ්ඩ යමක් පිළිබඳ අවදානම, අවසර පත්‍රය දරන්නාගේ වගකීම වන්නේ ය.
(5) මේ කොන්දේසි කඩ කිරීම, අතුරු ව්‍යවස්ථාව යටතේ වෙනත් යම් දණ්ඩනයකට අතිරේකව, මේ අවසර පත්‍රය දරන්නාගේ කුලී, නිවැසියාව අවසාන කරනු ලැබීමට යටත් වීමට හේතු විය හැකි ය.

*34. ජල සම්පාදනය*

1. මෙම අතුරු ව්‍යවස්ථාව

ජල සම්පාදනයට සම්බන්ධ ව්‍යවහාර කෙරෙන "ගෘහ කාර්යය" යන්නට විකිණීම පිණිස හෝ කුළියට දීම පිණිස අශ්වයින් හෝ ගවයින් හෝ රථවාහන හෝ තබා ගෙන ඇති විට ඒ අශ්වයන් හෝ ගවයින් සඳහා වූ වතුර හෝ රථ වාහන සේදීම සඳහා වූ වතුර හෝ වතුර මලක් සඳහා හෝ පිහිණුම් තටාකයක් සඳහා හෝ සැරසිලි සඳහා යාන්ත්‍රික කාර්ය සඳහා හෝ වාරිමාර්ග සඳහා අවැසි ජලය ඇතුළත් නොවේ.

**මූලික කරුණු**

2. පොදු ජල කණුවකින් හෝ වතුර මල්වලින් හෝ පෞද්ගලික ප්‍රයෝජනය සඳහා වූ ජලනළයකින් හෝ මෙම අතුරු ව්‍යවස්ථාවලින් නියම කරන තිබෙන වෙනත් යම් අන්දමකින් හෝ හැර සභාවේ ජල කර්මාන්තයකින් ජලය ලබා නොගත යුතු ය.

**පොදු ජලකණු**

3. (1) සභාපතිවරයාගේ ලිඛිත අවසරයක් කළින් ලබාගෙන ඇත්නම් මිස :

*(අ)* කිසිම තැනැත්තෙකු විසින් අතින් අල්ලාගෙන යනු හෝ අතින් උසුලාගෙන යා හැකි භාජනයක් නොවන භාජනයකින් පොදු ජලකණුවලින් ජලය ගෙන යාම නොකළ යුතු ය.
*(ආ)* කිසිම තැනැත්තෙකු විසින් ජලය අපතේ යෑමට ඉඩ ඇති විය හැකි අන්දමේ යම් ප්‍රමාණයකින් හෝ ආකාරයකින් පොදු ජලකණුවලින් ජලය ගෙන යාම නොකළ යුතු ය.

4. කිසිම තැනැත්තෙකු විසින් පොදු ජල කනුවකට යම් හෝස් පයිප්පයක්, නළයක්, තහඩුවක්, හෝ වෙනයම් ස්වභාවික උපක්‍රමයක් තාවකාලිකව හෝ ස්ථිරව සම්බන්ධ නොකළ යුතු ය.

5. යම් පොදු ජලකණුවකට සවිකර ඇති හෝ එහි කොටසක් වන ස්වයංක්‍රීය (ඉබේ වැහෙන) වැල්වයක හෝ වෙනත් ස්වයංක්‍රීය උපකරණයක ස්වයංක්‍රීය ක්‍රියාකාරීත්වය තාවකාලිකව හෝ ස්ථිරව වැළැක්වෙන පරිදි ඒ වැල්වයට හෝ උපකරණයට අයුතු ලෙස බාධාවක් හෝ වෙනත් කිසිවක් කිසිම තැනැත්තෙකු විසින් නොකළ යුතු ය.

6. කිසිම තැනැත්තෙකු විසින් ගෘහ කාර්යයක් නොවන යම් කාර්යයක් සඳහා පොදු ජල කණුවකින් ජලය ගැනීම නොකළ යුතු ය.

7. යම් චර්ම රෝගයකින්, ස්පර්ශ රෝගයකින් හෝ ආසාදන රෝගයකින් පෙළෙන කිසිම තැනැත්තකු විසින් හෝ එවැනි තැනැත්තෙකු මැනක සාත්තු කළ කිසිම තැනැත්තකු විසින් හෝ යම් පොදු ජල කණුවකින් ජලය ගැනීම නොකළ යුතු ය.

8. කිසිම තැනැත්තකු විසින් තත් කාලයේ දී ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති හෝ සභාව විසින් නඩත්තු කරනු ලබන හෝ යම් ජලාශයක පොදු ජලකණුවක, වතුර මලක, ජල භාජනයක, නළයක හෝ වෙනත් ජල කර්මාන්තයක් හෝ ඒ අසල ස්නානය කිරීම හෝ තම ශරීරයේ යම් කොටසක සේදීම හෝ යම් සතෙකු හෝ වාහනයක්, රෙදි පිළි බඳුන් හෝ වෙනත් කවරාකාර වූ හෝ භාණ්ඩ සේදීම හෝ නොකළ යුතු ය.

### පෞද්ගලික ජල සේවාවන් හා සවි කිරීම් පිළිබඳ නියමයන්

09. මෙහි උපලේඛනයේ "අ" ආකෘතිය අනුව සභාපතිවරයා වෙත ඉල්ලීමක් කොට සභාපතිවරයාගේ ලිඛිත අනුමැතිය පළමුවෙන් ලබා ගෙන ඇතිව මිස කිසිම තැනැත්තෙකු විසින් -

(අ) අළුත් ජල සේවයක් ඉදිකිරීම හෝ ප්‍රාදේශීය සභාවේ ප්‍රධාන ජලනලවලින් හෝ ජල කර්මාන්තවලින් යම් පෞද්ගලික ස්ථානයකට අළුත් සේවා නලයක් දැමීම හෝ එම කාර්යය සඳහා යම් කර්මාන්තයක් ආරම්භ කිරීම;

(ආ) ප්‍රාදේශීය සභාවේ ප්‍රධාන ජලනළවලට හෝ ජල කර්මාන්තවලට සම්බන්ධ යම් පවත්නා සේවා නළයක් වෙනස් කිරීම, දීර්ඝ කිරීම පිරිසිදු කිරීම, හෝ අළුත් කිරීම,

නොකල යුතු ය.

10. 9 වැනි අතුරු ව්‍යවස්ථාව යටතේ සභාපතිවරයා විසින් අනුමත කරන ලද යම් කර්මාන්තයක්, සභාපතිවරයාගේ ලිඛිත උපදෙස්වලට අනුකූලව කළ යුතු අතර, සභාපතිවරයා විසින් අනුමත කරනු ලැබ ප්‍රාදේශීය සභාවේ නිල මුද්‍රාවෙන් මුද්‍රා තබා ඇත්නම්, මිස කිසිම සවි කිරීමක් හෝ උපකරණයක් එම කර්මාන්තය සඳහා භාවිතා නොකල යුතු ය.

11. ප්‍රාදේශීය සභාව විසින් යම් ඉල්ලුම්කරුවෙකුට දෙනු ලබන සම්බන්ධකයේ ප්‍රමාණය තීරණය කළ යුතු ය.

12. පෞද්ගලික ජල සේවයක් ඉදි කිරීම සඳහා භාවිතා කරන සියලුම නල ගැල්වනයිස් සිද්ධ යකඩවලින් හෝ තඹවලින් හෝ පී. වී. සී. ද්‍රව්‍යයකින් තැනූ නළ විය යුතු අතර ඒවා සභාපතිවරයා විසින් හෝ ඒ වෙනුවෙන් සභාපතිවරයා විසින් ලියවිල්ලකින් බලයලත් නිලධරයෙකු විසින් අනුමත කරනු ලබන ඝනකමකින් හා තත්වයකින් යුක්ත විය යුතු ය.

13. එකම බිමක ඇත්තා වූ ද ප්‍රාදේශීය සභාව විසින් එක් දේපළක් වශයෙන් තක්සේරු කරනු ලැබූ ඇත්තා වූ ද යම් ස්ථානයක ජලය සැපයීම සඳහා ප්‍රාදේශීය සභාවේ ප්‍රධාන ජලනලවලින් හෝ ජල කර්මාන්තවලින් එක් සේවා නළයකට වඩා වැඩි ගණනක් සම්බන්ධ නොකළ යුතු ය.

14. යම් ස්ථානයකට සවි කරනු ලබන සියළු ජල කරාම සභාපතිවරයා විසින් අනුමත කරනු ලබන ආකාරයක සහ ප්‍රමාණයක ජල කරාම විය යුතු ය.

15. ජලය කාන්දුවීමක් පහසුවෙන් පෙනෙන ආකාරයට සෑම ජල කරාමයකම අපමුඛය, විවෘත වූ ද හොඳින් පෙනෙන්නාවූ ද තැනක තිබිය යුතු අතර, එය කවර අවස්ථාවක දී වුවත් එයින් ජලය ලැබෙන යම් ජල භාජනයක හෝ ටැංකියක හෝ වෙනත් භාජනයක ඉහළම ජල මට්ටමට වඩා පහතින් නොපිහිටිය යුතුය.

16. ප්‍රාදේශීය සභාවේ ජල කර්මාන්තයට සම්බන්ධ කර ඇති යම් පෞද්ගලික ජල සේවාවක ජලනළවල හෝ ජලනළ හා උපකරණ හා සවි කිරීම් අතර සියලුම සන්ධිස්ථාන හොඳින් පාස්සා තිබිය යුතු ය.

17. සෑම නාන භාජනයකම, වැසිකිලි බේසමකම හෝ සොරොව් බේසමකම ප්‍රවේශ මුඛය එහි අපමුඛයට වෙන්ව පැහැදිලිව පෙනෙන සේ සවිකර තිබිය යුතු අතර, එය එම නාන භාජනයේ, වැසිකිලි බේසමේ හෝ සෙරොව් බේසමේ මුදුනේ සවිකර තිබිය යුතු ය.

18. සෑම ජල භාජනයකම ප්‍රවේශ මුඛය හෝ සැපයුම් නළය එම ජල භාජනයේ ඉහළම ජල මට්ටම ඉහළින් පිහිටන ආකාරයට සවිකර තිබිය යුතුය.

19. මේ අතුරු ව්‍යවස්ථා ක්‍රියාත්මකවන දිනයෙන් පසුව ;

(අ) ගෘහ කාර්ය සඳහා සපයනු ලබන ජලයෙන් යම් කොටසක් රඳවා තබා ගැනීම සඳහා ගැලුම් 100 ට වඩා වැඩි ධාරිතාවයක් ඇති ජල භාජනයක් කිසිම ස්ථානයක සවි නොකළ යුතු ය.

(ආ) යම් ස්ථානයක සවිකරන හෝ ඉදි කෙරෙන ජල භාජනයේ ප්‍රමාණය සහ සැලසුම ද එහි ඉදි කෙරෙන හෝ සවි කෙරෙන ජල භාජන ගණන ද සභාපතිවරයා විසින් කලින් අනුමත කරනු ලැබ ඇත්නම් මිස කිසිම ස්ථානයක කිසිම ජල භාජනයක් සවි කිරීම හෝ ඉදි කිරීම නොකළ යුතු ය.

20. ජල කර්මාන්තයෙන් ජලය සැපයෙන සෑම ජල භාජනයකටම කරාමයක් ද අනුමත ආකාරය සමතුලිතතා බෝල වෑල්වයක් ද සවිකර තිබිය යුතු අතර, ටැංකියේ ජලමට්ටම ටැංකියේ ගැට්ට හෝ උතුරා යන මට්ටමට සෙ.මී. 5ක් තිබියදී ජල සැපයුම නවතින ආකාරයට බෝල වෑල්වය සකස් කර තිබිය යුතු ය.

21. සෑම ජල භාජනයකටම පිටාර නළය ගොඩනැගිල්ලේ පිටතින් සවිකර තිබිය යුතු අතර, වතුර කාන්දුවීමක් පහසුවෙන් සොයා ගත හැකි වීම සඳහා එහි කෙළවර හොඳින් පෙනෙන තැනක සවිකර තිබිය යුතු ය. කිසිම හේතුවක් නිසා කිසිම ජල භාජනයකින් පිටාර නළය යම් කාණුවකට කසල කාණුවකට හෝ යම් නාන භාජනයක, සොරොව්වේ බේසමක හෝ වෙනත් සනීපාරක්ෂක උපකරණයක ඉවත යන ජලනළයකට හෝ වෙනත් යම් ජල භාජනයක පිටාර නළයකට හෝ සවි කර නොතිබිය යුතු ය. එක් එක් ජල භාජනයට වෙන් වෙන් වශයෙන් පිටාර නළ සවිකර තිබිය යුතු ය.

22. යම් ස්ථානයක සේවා නළය, ජල භාජනය හෝ වෙනත් සේවා සවි කිරීම් වෙනත් යම් ස්ථානයක සේවා නළයකට, ජල භාජනයකට හෝ වෙනත් සේවා සවි කිරීමකට සම්බන්ධ කර නොතිබිය යුතු ය.

23. ප්‍රාදේශීය සභාවෙන් ලබාගත් ප්‍රකාශිත අනුමතය නොමැතිව, යම් පෞද්ගලික ජල සේවාවක කොටසක් වන කිසිම පයිප්පයක් යම් බොයිලේරුවකට කන්ඩෙන්සරයකට හෝ වෙනත් යාන්ත්‍රික උපකරණයට කෙළින්ම සම්බන්ධ කර නොතිබිය යුතු ය.

*24. සෑම පෞද්ගලික ජල සේවාවකටම -*

*(අ)* ඝන පතුලකින් යුක්ත වූ ද ශක්තිමත් පිත්තල, තුවක්කු ලෝහ හෝ චීනවට්ටිවලින් තැබූ විරාම කරාමයක් සවිකර තිබිය යුතු අතර එම විරාම කරාමය චීනවට්ටවලින් තනා ඇත්නම් ජේනුව ඇස්බැස්ටෝස්වලින් අසුරා තිබිය යුතු ය;
*(ආ)* බුරුල් වෑල්වයක් සහිත ස්කුරුප්පු විරාම කරාමයක්;
*(ඇ)* විෂ්කම්භය සෙ. මී. 05 කට වඩා වැඩි නළයකින් ජලය සැපයෙන අවස්ථාවක සොරොව්වක් හෝ සර්පන කපාටයක් සපයා තිබිය යුතු ය.

විරාම කරාමය හෝ කපාටය, එම වීදියේ පදික වේදිකාවක් ඇත්නම් පදික වේදිකාවට යටින් ද, සේවා සැපයෙන ස්ථානයට හැකි තරම් ආසන්නවද සවිකල යුතු අතර, විරාම කරාමයට සෑම වේදිකාවක දී ම පහසුවෙන් ළඟාවිය හැකි ආකාරයට චීනවට්ටි වැසුම් පෙට්ටියක් හා පියනක් සපයා තිබිය යුතු ය. විරාම කරාමය, කපාටය සහ වැසුම් පෙට්ටිය සභාපතිවරයා විසින් අනුමත කරන ලද වර්ගයක විය යුතුය.

25. සභාපතිවරයා විසින් හෝ තත් කාර්යය සඳහා සභාපතිවරයා විසින් ලියවිල්ලකින් බලයලත් නිලධරයෙකු විසින් පරීක්ෂා කර ලියවිල්ලක් මගින් අනුමත කරනු ලබන තෙක් යම් ස්ථානයකට අළුතින් ඉදිකර ඇති සේවාවක කොටසක් වන කිසිම නළ කපාට හා වෙනත් සවි කිරීම වසා නොදැමිය යුතු ය.

**භූගත සම්බන්ධ කිරීම**

26 (1) වෝල්ට් 500 ක් හෝ ඊට වැඩි පීඩනයක් ඇති යම් විදුලි ධාරාවක් දරන යම් ට්‍රාන්ස්පෝමරයක හෝ වෙනත් විදුලි උපකරණයක ආවරණයේ සිට ජල කර්මාන්තයක් හෝ ජලකාර්මාන්තයට සම්බන්ධ වෙනත් පෞද්ගලික සේවාවක කොටසක් වන යම් නළයකට හෝ උපකරණයට භූගත සම්බන්ධයක් සවිකිරීම කිසිම තැනැත්තකු විසින් නොකළ යුතු ය;
(2) (1) වැනි ඡේදයේ සඳහන් යම් විදුලි ට්‍රාන්ස්පෝමරයක හෝ වෙනත් විදුලි උපකරණයක භූ තහඩුව හෝ භූගත සම්බන්ධකයෙහි යම් කොටසක් ප්‍රාදේශීය සභාවේ ජල කර්මාන්තයේ හෝ එම ජල කර්මාන්තයට සම්බන්ධ පෞද්ගලික ජල සේවාවක කොටසක් වන යම් නළයකට හෝ උපකරණයට යටත් පිරිසෙයින් මීටර් 60 ක් වත් ඈතින් පිහිටුවිය යුතු ය;

27. විදුලි ආලෝක ක්‍රමයකින් විදුලි ධාරාව සපයනු ලබන ගුවන් විදුලි යන්ත්‍රයකට භූගත සම්බන්ධයක් අවශ්‍ය වන අවස්ථාවක දී එම භූගත සම්බන්ධකය ප්‍රාදේශීය සභාවේ ජල කර්මාන්තයේ හෝ එම ජල කර්මාන්තයට සම්බන්ධ යම් පෞද්ගලික සේවාවක කොටසක් වන යම් නළයකට හෝ උපකරණයට සෙ. මී. 60 කට නොඅඩු දුර ප්‍රමාණයකින් සවි කරනු ලබන භූ තහඩුවක් මගින් සාදනු ලැබිය යුතු ය.

28. ප්‍රාදේශීය සභාවේ ජල කර්මාන්තයට සම්බන්ධ වූ ජල මාපකයක් සවිකර ඇති යම් ස්ථානයක භූගත සම්බන්ධකයක් සවි කරන යම් තැනැත්තකු විසින් ඒ සම්බන්ධය ඒ මාපකයෙන් ඇතුළත පැත්තේ සවිකල යුතු ය. එසේ නැතහොත් ඒ මාපකය හරහා විද්‍යුත් නැම්මක් ඇතුළු කරනු ලැබිය යුතු ය.

*පෞද්ගලික සේවාවන් ප්‍රධාන ජලනලවලට සම්බන්ධ කිරීම*

29. (1) අළුතින් ඉදි කරනු ලැබූ පෞද්ගලික ජල සේවයක් 25 වැනි අතුරු ව්‍යවස්ථා යටතේ පරීක්ෂා කර අනුමත කරනු ලැබූ පසු ඉල්ලුම්කරු විසින් -

*(අ)* සහ සභාපතිවරයා විසින් තක්සේරු කරනු ලබන පරිදි කම්කරුවන් ද්‍රව්‍ය හා අධීක්ෂණය පිළිබඳ ගාස්තු ඇතුළු ප්‍රාදේශීය සභාවේ ප්‍රධාන ජලනළවලට හෝ ජල කර්මාන්තයට එම සේවාව සම්බන්ධ කිරීමේ වියදම,
*(ආ)* සම්බන්ධකය සහ ජලසැපයීම වෙනුවෙන් මූලික ගාස්තුවක් හෝ අතිරේක ගාස්තුවක් වශයෙන් රු. 25 ක් සභාව වෙත තැන්පත් කළ යුතු ය.

(2) මේ අතුරු ව්‍යවස්ථාවේ 1 වන ඡේදයෙන් නියමිත මුදල් ප්‍රමාණ නිසි ලෙස තැන්පත් කරනු ලබන තුරු එම සම්බන්ධ සිදු නොකළ යුතු ය.

30. (1) ප්‍රාදේශීය සභාවේ ප්‍රධාන ජලනලවල සිට ජල කර්මාන්තවල සිට ජලය සැපයීමට ඇති යම් පෞද්ගලික ස්ථානයක සවිකර ඇති නලවලට සම්බන්ධකයක් ඇති කිරීම සභාපතිවරයාගෙන් බලයලත් සභාවේ නිලධාරියකුගේ අධීක්ෂණය යටතේ මිස නොකළ යුතුය.

(2) එම ස්ථානයට ජලය සැපයීම එම සම්බන්ධය නිසි ලෙස ඇති කරන ලද වේලාවේ සිට ආරම්භ වූ ලෙස සියලු කාර්ය සඳහා සැලකිය යුතුය.

31. පෞද්ගලික ජල සේවයක් ප්‍රාදේශීය සභාවේ ප්‍රධාන ජලනලවලට හෝ ජල කර්මාන්තයට සම්බන්ධ කරනු ලැබූ පසු ඒ සම්බන්ධ ගිණුම් පිළිබඳ විස්තරයක් මෙහි උපලේඛනයේ "ආ" ආකෘතියේ ඉදිරියෙන් කළ යුතු අතර, ඒ ජල සේවය සම්බන්ධ කිරීමේ වියදම වශයෙන් ඉල්ලුම්කරු විසින් තැන්පත් කරන ලද මුදලින් වියදම් නොවී ඉතිරිව ඇති යම් මුදලක් වේ නම් එය ඉල්ලුම්කරු වෙත ආපසු ගෙවනු ලැබිය යුතුය. ඇත්ත වශයෙන් දරන ලද වියදම තක්සේරු කරන ලද වියදමට වැඩි වුවහොත් ඉහත වියදම් පිළිබඳ විස්තරය ලැබුණ විට ඉල්ලුම්කරු විසින් ඒ අතිරික්ත මුදල නොපමාව ප්‍රාදේශීය සභාව වෙත ගෙවිය යුතුය.

32. ප්‍රාදේශීය සභාවේ ජල කර්මාන්තයෙන් යම් ස්ථානයකට සපයනු ලබන ජලය මැනීම සඳහා වූ සියලුම මාපක ප්‍රාදේශීය සභාව විසින් සපයා සවි කළ යුතු අතර, ඒවා ප්‍රාදේශීය සභාවේ දේපළ ලෙස පවතින්නේය.

33. ජලය සපයනු ලබන ස්ථානයේ අයිතිකරු හෝ පදිංචිකරු විසින් (කම්කරුවන්, ද්‍රව්‍ය හා අධීක්ෂණය පිළිබඳ ගාස්තු ද ඇතුළුව) මාපක සවි කිරීමේ ගාස්තුව කලින් ගෙවිය යුතුය.

34. මාපකය මගින් සපයනු ලබන යම් ස්ථානයක අයිතිකරු හෝ පදිංචිකරු මාපකය නඩත්තු කිරීමේ හෝ අලුත්වැඩියා කිරීමේ ගාස්තුව ගෙවීමට යටත් නොවන්නේය.

එසේ වුව ද ඒ අයිතිකරු හෝ පදිංචිකරු විසින් ඕනෑකමින් කළ ක්‍රියාවක් හෝ ඔහුගේ නොසැලකිල්ල නිසා හෝ මාපකයට සිදුවූ හානිය හේතු කොට ගෙන යම් අලුත්වැඩියා කිරීමක් හෝ අලුත් කිරීම් අවශ්‍ය වූ විට එය අලුත් කිරීමේ හෝ අලුත්වැඩියා කිරීමේ ගාස්තුව සභාපති විසින් ඉල්ලා සිටිනු ලැබූ විට සභාවට ගෙවීමට ඒ අයිතිකරු හෝ පදිංචිකරු විසින් කළ යුතුය.

35. (1) මාපකය භාවිතා කිරීම සම්බන්ධයෙන් ප්‍රාදේශීය සභාව විසින් කලින් කල නියම කරනු ලබන ගාස්තු ප්‍රමාණ අනුව ගණන් බලනු ලබන කුලියක් මාපකයක් මගින් ජලය සපයනු ලබන යම් ස්ථානයක අයිතිකරු හෝ පදිංචිකරු විසින් කාර්තුවක් පාසා ප්‍රාදේශීය සභාවට ගෙවීම හෝ ගෙවීමට සැලැස්වීම කළ යුතුය.

(2) මේ අතුරු ව්‍යවස්ථාවේ කාර්යය සඳහා කාර්තුවක්, යන්නෙන් එක් එක්, වර්ෂයක ජනවාරි 01, අප්‍රේල් 01, ජූලි 01 සහ ඔක්තෝබර් 01 යන දිනවල ආරම්භවන අනුගාමී මාස තුනක පරිච්ඡේද අදහස් වේ.

36. (1) යම් කාර්තුවක් ආරම්භයේ දී හෝ අවසානයේ දී පිළිවෙලින් සටහන් කරන ප්‍රථම මාපක කියවීම හා අවසාන මාපක කියවීම අතර වෙනස සැලකිල්ලට ගෙන ඒ කාර්තුව තුළ පරිභෝජනය කරන ලද ප්‍රමාණය මෙහි පහත සඳහන් පරිදි ගණන් බැලිය යුතුය.

(2) අලුතෙන් සවිකරන ලද මාපකයක් සම්බන්ධයෙන් වූ විට ප්‍රථම කියවීම ඒ මාපකය සවිකරන ලද අවස්ථාව යටතේ සඳහන් කරන ලද කියවීම වන අතර, වෙනයම් අවස්ථාවක පෙරාතුවම වූ කාර්තුව සඳහා වූ අවසාන කියවීම ප්‍රථම කියවීම වන්නේය. යම් කාර්තුවක් සඳහා හෝ අවසාන කියවීම ඒ කාර්තුව අවසාන වීමෙන් දස දිනකට ප්‍රථම හෝ පසුව යෙදෙන දිනයක් නොවන යම් දිනක කරන ලද කියවීම වන්නේය.

එසේ වුවද අළුත්වැඩියා කිරීම සඳහා මාපකය ඉවත ගෙන යන ලදුව එකී කාලය ඇතුළත දී අවසාන කියවීම සටහන් කරනු ලැබිය නොහැකි වූ අවස්ථාවක ඒ මාපකය ඉවතගෙන යාමට ප්‍රථම අවසාන කියවීම කරනු ලැබිය යුතුය.

(3) යම් කාර්තුවක් තුල යම් ස්ථානයක දී මාපක දෙකක් හෝ ඊට වැඩි ගණනක් පාවිච්චි කරන ලද නම්, ඒ ඒ මාපකවල සඳහන් වූ ප්‍රමාණවල එකතුව කාර්තුව තුළ පරිභෝජනය කරන ලද දළ ප්‍රමාණය වන්නේය.

37. (1) මාපකයක් ක්‍රියා විරහිත වී ඇති බව දැනගත් කල්හි හෝ අලුත්වැඩියා කිරීමට හෝ වෙනස් කිරීමට ඉවත් කරන ලද කල්හි හෝ එසේ නැත්නම් අලුත් මාපකයක් සවි කරන ලද කල්හි හෝ පැරණි මාපකයක් නැවත සවිකරන ලද කල්හි ඒ බවට සටහනක් ඒ මාපකයෙන් ජලය සපයනු ලබන ස්ථානයේ කරනු ලැබිය යුතුය.

(2) මාපක ක්‍රියා විරහිත වී ඇති අවස්ථාවක හෝ නැතහොත් වෙනයම් හේතුවක් නිසා එය ඒ ස්ථානයෙන් ඉවත ගෙන යන අවස්ථාවක හෝ මාපයකයේ ක්‍රියාවිරහිත වී තිබුණ හෝ මාපකයක් රහිතව ජලය සපයන ලද හෝ කාලය තුල පරිභෝජනය කරන ලද ජල ප්‍රමාණය 28 වන අතුරු ව්‍යවස්ථාවේ විධිවිධාන කුමක් වුවත් ඒ කාලයට පෙරාතුවම වූ කාර්තුව තුළ සාමාන්‍යයෙන් දිනපතා පරිභෝජනය කරන ලද ජලයෙහි සාමාන්‍ය ප්‍රමාණය අනුව ගණන් බලනු ලැබිය යුතුය.

38. (1) යම් ස්ථානයක පදිංචිකරුවෙකු තම ස්ථානයෙහි ඇති මාපකයෙහි නිවැරදිතාවය ගැන ප්‍රශ්න කරයි නම් එය පදිංචිකරුගේ ඉල්ලීම පිට හා ඔහු විසින් රුපියල් 25 ක් වූ පරීක්ෂණ ගාස්තුවක් කලින් ගෙවන ලද කල්හි ඒ පදිංචිකරු ඉදිරියෙන් හෝ ඔහු විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් තැනැත්තෙකු ඉදිරියේ දී සභාපතිවරයා විසින් ඒ මාපකය පරීක්ෂා කරනු ලැබීමට සැලැස්විය යුතුය. ඒ පරීක්ෂණයෙහි ප්‍රතිඵලය සභාපතිවරයා කෙරෙහි හා පදිංචිකරු කෙරෙහි අනුගමනය විය යුතු අතර 35(2) වැනි අතුරු ව්‍යවස්ථාවෙහි අර්ථ නිරූපනය කරන ලද පරිදි ඒ කාර්තුව සඳහා මාපකයෙහි සඳහන් ජල ප්‍රමාණය ඒ පරීක්ෂණයෙහි ප්‍රතිඵලය අනුව නිවැරදි කරනු ලැබිය යුතුය.

(2) මාපකයේ සඳහන් ජල ප්‍රමාණය නිවැරදිවන හෝ නියම වශයෙන් සපයන ලද ජල ප්‍රමාණයෙන් 2%කට නොවැඩි වන අන්දමින් වෙනස් වන හෝ අවස්ථාවක (1) වැනි ඡේදය යටතේ කලින් ගෙවන ලද පරීක්ෂණ ගාස්තුව සභාපතිවරයා විසින් තබා ගත යුතුය.

(3) මාපකයේ සඳහන් ජල ප්‍රමාණයේ නියම වශයෙන් සපයන ලද ප්‍රමාණයෙන් 2% කට වැඩි වන අන්දමින් වෙනස් වන අවස්ථාවක (1) වන ඡේදය යටතේ කලින් ගෙනෙන ලද පරීක්ෂණ ගාස්තුව අයිතිකරු හෝ පදිංචිකරු වෙත ආපසු ගෙවනු ලැබිය යුතුය.

39. (1) සභාපතිවරයා විසින් නියම කරනු ලබන කාලවල දී ද කාර්තුවකට තුන්වරකට වඩා නොඅඩු වාර ගණනක් ද මාපකය කිය විය යුතුය.

(2) මාපකයක් කියවන ලද කවර අවස්ථාවක වුව ද පදිංචිකරු අමතන ලද ඒ කියවීම පිළිබඳ සටහනක් ඒ මාපකය මගින් ජලය සපයනු ලබන ස්ථානයේ තබනු ලැබිය යුතුය.

**ජලය සැපයීමේ ගාස්තු**

40. (1) ගෘහ භාණ්ඩ සඳහා ජලය සැපයීම ප්‍රාදේශීය සභාවේ අභිමතය පරිදි මාපකයක් මගින් වෙනත් ආකාරයකින් කළ හැකි වන අතර, ඒ සඳහා වූ ගාස්තු ප්‍රාදේශීය සභාව විසින් යෝජනා සම්මතයක් මගින් කලින් කල නියම කරනු ලබන අනු ප්‍රමාණය අනුව විය යුතුය.

(2) ගෘහ කාර්ය හැර වෙනත් කාර්ය සඳහා ජලය සැපයීම ප්‍රාදේශීය සභාවේ අභිමතය පරිදි මාපකයක් මගින් වෙනත් ආකාරයකින් කළ හැකිය

(3) සභාවේ ජල කර්මාන්ත මගින් ජලය සපයා ඇති කවර හෝ ස්ථානයකට කවර හෝ අවස්ථාවක සභාව විසින් මාපකයක් සවි කළ හැකිය.

41. (1) ගෘහ කාර්ය හැර වෙනත් කාර්ය සඳහා මාපකයක් මගින් ජලය සපයා ඇති අවස්ථාවක සපයන ලද සෑම ගැලුම් 10කටම රුපියල බැගින් වූ අනුප්‍රමාණයට ගාස්තු ගණන් බැලිය යුතුය.

(2) ගෘහ කාර්ය හැර වෙනත් කාර්ය සඳහා මාපකයක් මගින් හැර වෙනත් ආකාරයකට ජලය සපයා ඇති අවස්ථාවක කලින් කල සභාව විසින් යෝජනා සම්මතයක් මගින් නියම කරනු ලබන ගාස්තු එක් එක් පෞද්ගලික සේවාව වෙනුවෙන් මාසිකව ප්‍රාදේශීය සභාව වෙත කලින් ගෙවිය යුතුය.

42. 41 වැනි අතුරු ව්‍යවස්ථාවේ (2) වැනි ඡේදයේ විධිවිධාන සලස්වනු ලැබ ඇති අවස්ථාවල දී හැර, පෞද්ගලික ජල සැපයුමකින් ලබා ගත් ජලය ගෘහ කාර්ය හැර වෙනත් කාර්ය සඳහා භාවිතා කිරීම සැපයුමෙන් ජලය ලබා ගන්නා තැනැත්තා මෙහි උපලේඛනයේ දැක්වෙන "ඈ" ආකෘතියේ ගිවිසුමට ඇතුළත්ව ඇතොත් මිස, නොකළ යුතුය.

එසේ වුව ද, ඉහත කී ගිවිසුම අනුව වූ ජල සැපයුම නිසා වෙනත් යම් තැනැත්තකුට හෝ තැනැත්තන්ට ගෘහ කාර්ය සඳහා වූ ජල සැපයුමට බාධා ඇති වේ නම් හෝ බාධා ඇති වීමට ඉඩ ඇත්නම්, එම ගිවිසුම නොතකා ද අලාභ හෝ දණ්ඩන ගෙවීමේ වගකීමට යටත් නොවී ද සභාව විසින් ඒ තැනැත්තාට සපයන ජලය නතර කිරීම, අත්හිටුවීම හෝ අඩු කිරීම කළ හැකිය.

43. යම් පෞද්ගලික ස්ථානයකට සපයන ජලය සඳහා වූ ගාස්තු මෙහි උපලේඛනයේ දැක්වෙන "ඇ" ආකෘතියේ වූ ගිණුමක් ඉදිරිපත් කරනු ලැබීමෙන් පසු දින 15ක් ඇතුළත සභාපතිවරයාට හෝ සභාපතිවරයා විසින් ඒ වෙනුවෙන් බලය දෙන ලද සභාවේ නිලධරයෙකුට එම ස්ථානයේ අයිතිකරු හෝ පදිංචිකරු විසින් ගෙවිය යුතුය.

***නාස්තිය වැළැක්වීම***

44. (1) සභාවේ ජල කර්මාන්තවලට සම්බන්ධ කොට යම් ස්ථානයක ඇති පෞද්ගලික ජල සේවයක කොටසක් වන යම් නලයක කරාමයක වැල්වයක, මාපකයක හෝ වෙනත් සවි කිරීමක පිළිවෙල ප්‍රමාණය පිහිටීම ස්වභාවය හෝ තත්ත්වය හේතුකොට ගෙන ජල කර්මාන්තයෙන් පොදු හෝ පෞද්ගලික පාවිච්චිය සඳහා සපයනු ලබන ජලය අපතේ යෑමට අයුතු ලෙස පාවිච්චි කිරීමට, අයුතු ලෙස පරිභෝජනය කිරීමට හෝ අපවිත්‍ර කිරීමට ඉඩ ඇතැයි හෝ ජල කර්මාන්තයේ ජලය නිසි ලෙස පානය කිරීමට හා බෙදා හැරීමට බාධා ඇතිවීමට ඉඩ ඇතැයි හෝ විශ්වාස කිරීමට සභාපතිවරයාට හේතු ඇති අවස්ථාවක මෙහි උපලේඛනයේ "ඉ" ආකෘතියේ දැක්වෙන ආකෘතියේ වූ දැන්වීමක් එම ස්ථානයේ අයිතිකරු වෙත භාර දෙනු ලැබිය යුතුය.

(2) එවැනි සෑම දැන්වීමක අවශ්‍ය යැයි සභාපතිවරයා විසින් සලකනු ලබන වෙනස් කිරීම් නිශ්චිතව සඳහන් කරනු ලැබිය යුතු අතර, එම දැන්වීමේ නිශ්චිතව සඳහන් කරනු ලබන කාල පරිච්ඡේදයක් ඇතුළත අයිතිකරු විසින් එම වෙනස් කිරීම් සභාපතිවරයා සෑහීමකට පත්වන ආකාරයට සිදු කළ යුතුය.

(3) අයිතිකරුගේ නම හෝ ඔහු පදිංචි ස්ථානය දැන ගැනීමට නොමැති අවස්ථාවක එම දැන්වීම අදාල වන ස්ථානයේ හොඳින් පෙනෙන තැනක අලවනු ලැබුවහොත් එය අයිතිකරු වෙත නිසි ලෙස භාරදුන් ලෙස සලකනු ලැබිය යුතුය.

45. යම් ස්ථානයකට සපයන ජලය නතර කිරීම, අත් හිටුවීම, අඩු කිරීම හෝ ප්‍රාදේශීය සභාවේ ප්‍රධාන ජලනලවලින් හෝ ජල කර්මාන්තයෙන් එම ස්ථානයට ජලය සපයන නලය විසන්ධි කිරීම පහත සඳහන් අවස්ථාවල දී සභාපතිවරයා විසින් සිදු කළ හැකිය :-

*(අ)* එම ස්ථානයේ අයිතිකරුගේ හෝ පදිංචිකරුගේ ඉල්ලීම පිට,

*(ආ)* එම ස්ථානයේ අයිතිකරුගේ හෝ පදිංචිකරු මේ අතුරු ව්‍යවස්ථාවල විධිවිධාන යටතේ ගෙවිය යුතු මුදල් හිඟ තබා ඇති විට,

(ඇ) එම ස්ථානයේ අයිතිකරු හෝ පදිංචිකරු විසින් එම සේවය වැඩි කිරීම හෝ නලය දැමීම හෝ වෙනස් කිරීම මේ අතුරු ව්‍යවස්ථාවල විධිවිධානවලට අනුකූලව සිදු කර නැති විට,

(ඈ) ජල කර්මාන්තයට අලාභ කිරීම, ජලය අපවිත්‍ර කිරීමට නාස්ති කිරීමට, හෝ අයුතු ලෙස පාවිච්චි කිරීමට අදාල මේ අතුරු ව්‍යවස්ථාවල විධිවිධානවලට පටහැනිව එම ස්ථානයේ අයිතිකරු හෝ පදිංචිකරු විසින් යම් ක්‍රියාවක් හෝ දෙයක් කර හෝ නොකර පැහැර හැර ඇති අවස්ථාවක.

46. ප්‍රාදේශීය සභාවේ ජල කර්මාන්තයේ පෞද්ගලික ජල සේවයක් සපයනු ලැබ ඇති ස්ථානයක පදිංචිකරු විසින්, ඒ සේවයෙහි කොටසක් වන කරාමයකින්, නලයකින්, හෝ වෙනයම් සවි කිරීමකින් ජලය අපතේ යාමක් සිදුවන කවර විටක වුව ද ඒ බව වහාම සභාපතිවරයාට දැනුම් දිය යුතුය.

47. පෞද්ගලික ජල සේවයක කොටසක් වන යම් කරාමයකින් නලයකින් මාපකයකින් හෝ වෙනයම් සවි කිරීමකින් ජලය අපතේ යන බව දැන ගත් කවර විටක වුව ද සභාපතිවරයා විසින් හෝ ඔහු විසින් ඒ සඳහා ලියවිල්ලකින් යථා පරිදි බලය දෙන ලද යම් තැනැත්තකු විසින් ප්‍රාදේශීය ජල කර්මාන්තයෙන් ඒ සේවය වහාම විසන්ධි කළ යුතු අතර එලෙස අපතේ යෑමට හේතු වූ වරද ඒ ස්ථානයේ අයිතිකරු හෝ පදිංචිකරු විසින් නිවැරදි කරනු ලබන තුරු ඒ සේවය නැවතත් සම්බන්ධ කරනු නොලැබිය යුතුය.

48. 45 වැනි අතුරු ව්‍යවස්ථාවේ දක්වා ඇති යම් හේතුවක් මත විසන්ධි කරන ලද යම් පෞද්ගලික සේවා නලයක් නැවත ප්‍රාදේශීය සභාවේ ප්‍රධාන ජලනල වලට හෝ ජල කර්මාන්තයට සම්බන්ධ කිරීමේ වියදම වශයෙන් සභාපතිවරයා විසින් ඇස්තමේන්තු කරනු ලබන මුදල් ප්‍රමාණය, එම ස්ථානයේ අයිතිකරු හෝ පදිංචිකරු විසින් ප්‍රාදේශීය සභාවට කලින් ගෙවිය යුතුය. එම වැඩය සම්පූර්ණ වූ පසු වියදම් නොවූ යම් ශේෂයක් වේ නම් එය අයිතිකරුට හෝ පදිංචිකරුට ආපසු ගෙවිය යුතුය. ඇත්ත වශයෙන් සිදු වූ වියදම ඇස්තමේන්තු කළ වියදමට වඩා වැඩි වුවහොත් වැඩය සම්පූර්ණ කළ විගසම එම අතිරික්තය අයිතිකරු හෝ පදිංචිකරු විසින් ගෙවිය යුතුය.

## සාමාන්‍ය විධිවිධාන

49. මේ අතුරු ව්‍යවස්ථාවේ සාමාන්‍ය විධිවිධාන යටතේ අයවීමට ඇති හෝ මතුවට අයවීමට ඇති යම් ජල බද්දක් මාපක කුලියක් හෝ වෙනත් මුදල් ප්‍රමාණයක් අයකර ගැනීමට හානියක් නොමැතිව, සම්පූර්ණයෙන් හෝ කොටසක් ජල කර්මාන්තයට සම්බන්ධ කර ඇති යම් ප්‍රධාන ජල නලයක, පොදු වතුර මලක, සේවා නළයක හෝ වෙනත් උපකරණයක මාර්ගයෙන් ජල සම්පාදනය නතර කිරීම, අත්හිටුවීම, අඩු කිරීම වසා දැමීම හෝ වෙනතකට හැරවීම පහත සඳහන් සිදුවීම ඇති වීමට ඉඩ ඇති බවට සභාපතිවරයා සෑහීමට පත්වන කවර අවස්ථාවක දී වුව ද, සභාපතිවරයා විසින් කළ හැකිය. එම කරුණු නම්,

(අ) ජල කර්මාන්තයේ ඇති ජලය ප්‍රමාණවත් නොවන බව, හෝ

(ආ) ප්‍රධාන ජල නලයෙන් ජල කර්මාන්තය දීර්ඝ කිරීමේ හෝ අලුත්වැඩියා කිරීමේ කාර්යය සඳහා හෝ සේවා නල ප්‍රධාන නලවලට සම්බන්ධ කිරීමේ කාර්යය සඳහා එවැනි ක්‍රියාවක් අවස්ථානුකූල බව හෝ අවශ්‍ය බව, හෝ

(ඇ) කිසියම් පොදු ජල කාණුවකට වූ යම් හානියක් හෝ වැහි ජලය අපවිත්‍ර වීම හෝ අපතේ යාම හේතු කොටගෙන එවැනි ක්‍රියාවක් අවස්ථානුකූල බව හෝ අවශ්‍ය බව, හෝ

(ඈ) ගින්නක් ඇති වීමේ දී ජල කර්මාන්තයට හානියක් සිදු වූ බව හෝ සුදුසු වීමට ඉඩ ඇති බව.

50. එක් එක් පෞද්ගලික සේවාවේ විරාම කරාමය හෝ වැල්වය ද විරාම කරාමය හෝ වැල්වය සහ ප්‍රධාන ජල නලය අතර සේවා නලයේ කොටස ද ප්‍රාදේශීය සභාවේ දේපළ වශයෙන් සැලකිය යුතු අතර, එම කොටස නඩත්තු කිරීම සහ අලුත් කිරීම පිළිබඳ වියදම ප්‍රාදේශීය සභාව විසින් දැරිය යුතුය.

51. 25 වැනි අතුරු ව්‍යවස්ථාව යටතේ යම් පෞද්ගලික සේවා නලයක් හෝ සවිකිරීම අනුමත කිරීම හෝ පෞද්ගලික සේවා ජල නලය සම්බන්ධ කරනු ලබන ස්ථානයේ අයිතිකරුට හෝ පදිංචිකරුට මේ අතුරු ව්‍යවස්ථාවල යම් කොටසක් යටතේ යම් අවසරයක් හෝ පහසුකමක් දීම නිසා නලයේ යම් කොටසක් පුපුරා යෑම හෝ නල සවිකිරීම්වලට යම් කොටසකින් ජලය උතුරා යෑම හේතුකොටගෙන සිදු වූ යම් අලාභයක් පිළිබඳව වගකීම ප්‍රාදේශීය සභාවට පැවරෙන බව කිසිම කාර්යයක් සඳහා නොසැළකිය යුතුය.

52. ජලය සැපයීමට නොහැකි වීම, අසාමාන්‍ය නියඟය හෝ යම් කර්මාන්තයක් කිරීම නිසා ජල සැපයුමට ඇති වන තාවකාලික බාධා හෝ යම් නොවැලැක්විය හැකි හේතුවක් හෝ අනතුරක් නිසා සිදු වූවක් නම් ජලය සැපයීම කරනු ලබන්නේ කොන්ත්‍රාත්තුවක් හෝ ගිවිසුමක් හෝ වෙනත් ආකාරයකින් වුව ද එසේ ජලය සැපයීමට අපොහොසත් වීම සම්බන්ධයෙන් අලාභ ගෙවීමට ප්‍රාදේශීය සභාව යටත් නොවිය යුතුය.

53. (1) ගොඩනැගිල්ලක් හෝ ගොඩනැගිලි ඉදි කිරීමේ කාර්යය සඳහා යම් ස්ථානයකට ප්‍රාදේශීය සභාවේ ජල කර්මාන්තයෙන් දී ඇති තාවකාලික සම්බන්ධ කිරීමක් මගින් ජලය සපයනු ලබන අවස්ථාවක ඒ ගොඩනැගිල්ල හෝ ගොඩනැගිලි ඉදි කරනු ලැබූ විට, ඒ සැපයීම නතර කරනු ලැබිය යුතුය.

(2) (1) වැනි ඡේදයේ සඳහන් කාර්යය සඳහා සපයන ලද ජලය සඳහා වූ ගාස්තු 41 වැනි අතුරු ව්‍යවස්ථාවෙහි ගෘහ කාර්යයන් නොවන කාර්යයන් සඳහා නියමිත ප්‍රමාණයක් අනුව විය යුතුය.

54. මේ අතුරු ව්‍යවස්ථා යටතේ ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු සියලුම මුදල් සභාපතිවරයාට හෝ ඒ කාර්යය සඳහා සභාපතිවරයාගෙන් ලියවිල්ලකින් බලයලත් නිලධරයෙකුට ගෙවනු ලැබිය යුතුය.

55. මේ අතුරු ව්‍යවස්ථා සම්බන්ධයෙන් කෙරෙන සෑම කඩකිරීමකටම රුපියල් 750 කට නොවැඩි දඩයකින් දඬුවම් කරනු ලැබිය යුතු අතර, නොකඩවා සිදු කර ගෙන යන වරදක් සම්බන්ධයෙන් වූ විට වරදකරු කරනු ලැබීමෙන් හෝ එම කඩ කිරීමට අවධානය යොමු කරමින් සභාපතිවරයාගෙන්

හෝ සභාපතිවරයා විසින් බලය දෙන ලද නිලධරයෙකුගෙන් ලිඛිත දැන්වීමක් භාර දෙනු ලැබීමෙන් පසු එම වරද දිගටම සිදු කර ගෙන යන සෑම දිනයක් සඳහාම රුපියල් 250කට නොවැඩි අතිරේක දඩයකින් දඬුවම් කරනු ලැබිය යුතුය.

ප්‍රාදේශීය සභාව

**ජල කර්මාන්ත දෙපාර්තමේන්තුව**
*"අ" ආකෘතිය*

*(9 වැනි අතුරු ව්‍යවස්ථාව)*

අංකය :——————

—————— ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා වෙතය.
මෙහි උපලේඛනයෙහි දක්වා ඇති ආකාරයට
—————— කොට්ඨාසය
—————— වීදියේ
අංක.——————දරන නිවසේ
පෞද්ගලික ජල සේවා

* ඉදි කිරීම
* වෙනස් කිරීම
* දීර්ඝ කිරීම
* පිරිසිදු කිරීම

සඳහා ඔබගේ ලිඛිත අනුමතය මම මෙයින් ඉල්ලා සිටිමි

කුලී නිවැසියෙකු පදිංචි නම් වාර්ෂික කුලිය රු. ——————
අයිතිකරු පදිංචි නම් වාර්ෂික වටිනාකම රු.——————
පවතින සේවාවේ ප්‍රමාණය ——————
ජලය අවශ්‍ය වන්නේ ගෘහ කාර්යය සඳහා ද නැතහොත් වෙනත් කාර්ය සඳහා ද යන වග——————
ස්ථානය භාවිත කෙරෙන්නේ කුමන කාර්යයක් සඳහා ද යන වග :——————
තැන්පත් කළ මුදල——————

*උපලේඛනය*

| *පෞද්ගලික ස්ථානයක නළ* | | | *කරාම* | | *ජල භාජන* | |
|---|---|---|---|---|---|---|
| *දිග* | *ප්‍රමාණය* | *ගණන* | *පිහිටීම* | *ප්‍රමාණය* | *ධාරිතාවය* | *පිහිටීම* |

වෙනත් කරුණු :

කරුණාකර පැහැදිලිව ලියන්න

* අයිතිකරුගේ අත්සන :——————
* අයිතිකරුගේ නම :——————
* අයිතිකරුගේ ලිපිනය :——————
* පදිංචිකරුගේ අත්සන——————
* පදිංචිකරුගේ නම——————
* අනවශ්‍ය කොටස් කපා හරින්න——————

කාර්යාලය විසින් පිරවීම සඳහා

අනුමත කරන ලදී.

——————
ප්‍රාදේශීය සභාවේ සභාපති.

මුදල බැර කළ දිනය :——————
ජල කර්මාන්ත දෙපාර්තමේන්තුවට යොමු කළ දිනය:——————
වැඩය නිම කිරීමේ වාර්තාව :
කරාමවල පිහිටීම දක්වමින් ස්ථානයේ තනිරේඛා සැලැස්මක් මෙහි පහත ඇතුළත් කරන්න.

*සටහන :*

(1) ජල සම්පාදනය සඳහා කරනු ලබන සියළුම ඉල්ලීම් ඉදිරිපත් කළ යුත්තේ කාර්යාලයීය "අ" ආකෘති පත්‍රයෙහිය.
(2) ජල සම්පාදනය සඳහා කරනු ලබන සියලුම ඉල්ලීම් ප්‍රාදේශීය සභාව විසින් අනුමත කළ යුතුය.

(3) පෞද්ගලික ජල සේවයකට ඉඩ දෙන ලද විටෙක ප්‍රාදේශීය සභාවේ ප්‍රධාන නලය හෝ අතිරේක ප්‍රධාන නලය හා ජලය සැපයිය යුතු ස්ථානය සම්බන්ධ කිරීම, සභාපති විසින් බලය දෙනු ලැබූ ප්‍රාදේශීය සභාවේ නිලධරයෙකුගේ අධීක්ෂණය යටතේ කළ යුතු ය.

(4) පෞද්ගලික ජල සේවයක් සඳහා රුපියල් 25 ක ගාස්තුවක් අය කරනු ලැබේ

(5) සේවා නල සහ සවි කිරීම් යෙදීම් හා සවි කිරීම් සභාපතිවරයා විසින් යථාපරිදි බලය දෙනු ලැබූ තැනැත්තන් විසින් පමණක් කළ යුතු ය. තවද, සභාපතිවරයා විසින් බලය දෙන ලද නිලධරයෙකු විසින් අනුමත කරනු ලබන තෙක් එකී නල හා සම්බන්ධ කිරීමද පාවිච්චි කරනු නොලැබිය යුතු ය.

(6) ගෘහමය නොවන කාර්යයන් සඳහා සපයනු ලබන ජලය වෙනුවෙන් මාපකයක් මගින් ගාස්තු අයකරනු ලැබේ. මාපකය සවි කර නොමැති අවස්ථාවල දී ප්‍රාදේශීය සභාව විසින් තීරණය කරනු ලබන ප්‍රමාණ අනුව ගාස්තු අයකරනු ලැබේ.

(7) පෞද්ගලික ජල සේවා ඉදි කරන ලද නිවසක හෝ ස්ථානයක අයිතිකරු හෝ පදිංචිකරු විසින් එහි පදිංචිකරු වෙනස්වීමට ආසන්න කවර අවස්ථාවක වුව ද ඒ බව ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයාට දැනුම් දිය යුතු ය.

(8) පෞද්ගලික ජල සේවයක් සපයන ලද නිවසක හෝ ස්ථානයක පිහිටි යම් කරාමයකින්, මාපකයකින්, නලයකින් හෝ වෙනත් සවි කිරීමකින් ජලය අපතේ යන බවත් දැනගත් වහාම ඒ බව ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා වෙත දැනුම් දීම ඒ නිවසෙහි හෝ ස්ථානයෙහි සෑම අයිතිකරුවෙකුගේම හෝ පදිංචිකරුවෙකුගේම යුතුකම වන්නේ ය.

ඉල්ලුම්කරු.

"බී" ආකෘතිය

(31 වන අතුරු ව්‍යවස්ථාව)

ප්‍රාදේශීය සභා කාර්යාලය
200........

අංකය : ——————

ප්‍රාදේශීය සභාවේ ගිණුම

| දිනය | විස්තරය | | | රු. ශ. |
|---|---|---|---|---|
| | ....................වීදියේ අංක .......................... දරන ස්ථානයට | | | |
| | සේවාව සවි කිරීම හෝ මාපකය සවි කිරීම සඳහා ද්‍රව්‍ය. | .............. | .............. | .............. |
| | ඉහත කාර්යය සඳහා ශ්‍රම සහ අධීක්ෂණය | ............... | .............. | ............... |
| | ප්‍රධාන නලයට සම්බන්ධ කිරීමේ ගාස්තුව | .............. | ............... | .............. |
| | එකතුව | | | |
| | තැන්පත් කළ මුදල | | | |
| | අයවිය යුතු ශේෂය | | | |

....................................................................................................

ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා

**ප්‍රාදේශීය සභාව**

"ඇ" ආකෘතිය

(42 වන අතුරු ව්‍යවස්ථාව)

1. එක් පාර්ශ්වයක් ලෙස (මෙහි මින් මතු "අයිතිකරු" වශයෙන් සඳහන් කරනු ලබන)......................... පිහිටි වරිපනම් අංක......................... දරන ස්ථානයේ අයිතිකරු සහ අනික් පාර්ශ්වය ලෙස.......................... ප්‍රාදේශීය ද අතර ගෘහමය නොවන කාර්යයන් සඳහා මාපකයන් මගින් ජලය සැපයුම් පිණිස එළඹෙන ලද ගිවිසුමයි.

2. ගෘහමය නොවන කාර්යයන් සඳහා ඉහත කී ස්ථානයට ජල සේවයක් ලබා දීම සඳහා ප්‍රතිෂ්ඨාව එනම් :-

(අ) ...............
(ආ) ..............
(ඇ) ...............

මෙහි මින්මතු දක්වා ඇති කොන්දේසිවලින් බැඳී සිටීමට අයිතිකරු මෙයින් ගිවිස ගනී.

(අ) අඟල් ................. මාපකයක් මගින් ජලය සැපයිය යුතු ය.

(ආ) අයිතිකරු විසින් මාපකයේ කුලී වශයෙන් රු................. ක (රු........................) මුදලක් එක් කාර්තුවකට කලින් ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයාට ගෙවීම හෝ ගෙවීමට සැලැස්විය යුතු ය.

(ඇ) එක් එක් මාසයේදී සපයන ලද ජල ප්‍රමාණය වෙනුවෙන් ගැලුම් දාහකට (රු..............................) බැගින් ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයාට ගෙවීම හෝ ගෙවීමට සැලැස්විය යුතු ය. පළමුවන ගෙවීම................................................................ පළමුවන දින කළ යුතු ය.

03. මාපකය සඳහා හෝ ජලය සඳහා වූ ගාස්තු නියමිත දිනයෙන් දින 15 ක් ඇතුළත ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයාට ගෙවනු නොලැබුවහොත් සේවාව පාවිච්චි කිරීමේ අයිතිය අහිමිවන අතර, ප්‍රාදේශීය සභාව විසින් නතර කළ හැකිය.

04. දෙපාර්ශ්වයෙන් කවර පාර්ශ්වයක් විසින් වුවද ගිවිසුම අවසන් කිරීමට තමා අදහස් කරන බව දන්වන දින 30 ක දැන්වීමක් අනෙක් පාර්ශ්වයට දීමෙන් ගිවිසුම අවසන් කළ හැකිය. එය එසේ අවසන් කරනු ලැබූ විට අළුත් ගිවිසුමකට එළඹෙන තුරු ස්ථානයේ අයිතිකරුට සේවාව පාවිච්චියට ගැනීම සඳහා අයිතිවාසිකම් නොමැත්තේය.

පදිංචිකරු වෙනස් වීමට ආසන්න කවර අවස්ථාවක වුවද අයිතිකරු විසින් නිසි ලෙස දැන්වීමක් කළ යුතු අතර, ඉහත සඳහන් කොන්දේසි පිළිපැදීමට ලියවිල්ලක් මගින් එකඟ වන තෙක් කිසිම පදිංචිකරුවෙකුට සේවාව පාවිච්චි කිරීමට හිමිකම් නොලැබේ.

.................................. ක්‍රිවූ.................................... මස............................. වන දින දී අත්සන් කරන ලදී.

———————,
අයිතිකරු.

ප්‍රාදේශීය සභාවේ සභාපති,
අත්සනට සාක්ෂි.

1. ———————,

2. ———————.

*"ඈ" ආකෘතිය*
*(43 වන අතුරු ව්‍යවස්ථාව)*

——————— ප්‍රාදේශීය සභා කාර්යාලය
200.———————

.——————— දිනෙන් දින අවසන් වන කාර්තුව සඳහා.——————— වීදියේ අංකය———————දරන ස්ථානයට සපයන ලද ජලය සඳහා ප්‍රාදේශීය සභාව සමග ගිණුම.

| *යොමු අංකය* | *ජල ගිණුම* |
|---|---|

.———————දින කියවීම

——————— දින කියවීම
ගැලුම් 1000 ක්.———————ගණනේ පාවිච්චි කරන ලද ජලය..............................
ගෘහමය නොවන කාර්යයන් සඳහා සපයන ලද්දා වූ ද මාපකයක් මගින් මණින නොලැබූ ජලය ———————,

———————

ගෙවිය යුතු මුදල ———————

*සැ. යු.-* ඉහත කී දිනයෙන් දින 15 ක් ඇතුව ද ඉහත කී මුදල ගෙවන ලෙස ඔබගෙන් ඉල්ලා සිටිනු ලැබේ.

"ඉ" ආකෘතිය
(44වන අතුරු ව්‍යවස්ථාව)
දෝෂ සහිත සේවය වෙනස් කිරීම සඳහා වූ දැන්වීම

ප්‍රාදේශීය සභා කාර්යාලය
200 ....................................

…………………………… වීදියේ අංකය……………………………… දරන නිවසේ අයිතිකරු හෝ පදිංචිකරු වෙතය.

ඉහත සඳහන් ස්ථානයේ ජල සේවය පරීක්ෂා කිරීමේදී එහි පහත දැක්වෙන දෝෂ ඇති බව පෙනී ගියෙන්, අවශ්‍ය බවට මා විසින් සහතික කර මෙහි පහත දැක්වෙන වෙනස් කිරීම් හෝ අලුත්වැඩියා කිරීම් සිදු කිරීමට පියවර ගන්නා ලෙස ඉල්ලා සිටිනු ලැබේ.

මේ දැන්වීම ලැබී දින.................................. ඇතුලත මා සෑහීමට පත්වන පරිදි එකී වෙනස් කිරීම් හෝ අලුත්වැඩියා කිරීම් සිදු කිරීමට පැහැර හරිනු ලැබුවහොත් සේවය ජල කර්මාන්තයෙන් විසන්ධි කරනු ලබන අතර, එය මා සෑහීමට පත්වන පරිදි, අලුත්කිරීම, වෙනස් කිරීම, සහ අලුත්වැඩියා කිරීම සිදු කරන තෙක් එය නැවත සම්බන්ධ කරනු නොලැබේ.

…………………………………
සභාපති,

…………………………… ප්‍රාදේශීය සභාව.

වෙනස් කිරීම සහ - හෝ අලුත්වැඩියාව

*35- ළිං තැනීම*

01. මෙහි මින් මතු "සභාපතිවරයා" යනුවෙන් සඳහන් කරනු ලබන ප්‍රාදේශීය සභා සභාපතිවරයාගේ තත්කාර්ය සඳහා ලිඛිත අවසරයක් ලබාගෙන ඇත්නම් මිස කිසිම තැනැත්තකු විසින් සභාවේ පරිපාලන සීමාව ඇතුලත ළිඳක් තැනීම හෝ ළිඳක් තැනීමට සැලැස්සීම නොකළ යුතුය.

02. (1) යම් ළිඳක සැලැස්ම සහ පිරිවිතර, සභාපතිවරයා විසින් අනුමත කර ඇත්නම් මිස හෝ එසේ අනුමත කරන ලද සැලැස්ම සහ පිරිවිතරවලට අනුකූලව නොවන වෙනත් ආකාරයකින්, කිසිම තැනැත්තකු විසින් පානය හෝ වෙනත් ගෘහස්ථ කාර්යයන් සඳහා ජලය සැපයීම පිණිස හෝ මහජනයාට ජලය විකිණීම හෝ සැපයීම පිණිස හෝ යම් ළිඳක් තැනීම හෝ යම් ළිඳක් කැණීමට සැලැස්වීම නොකළ යුතු ය.

(2) යම් වැසිකිලි වලක, කුණුදිය වලක, දිය බස්නා වලක, උෟරු කොටුවක, ගාලක, ගවමඩුවක, වල වැසිකිළියක, හෝ පළුදු වූ නැතහොත් ඉදි නොකළ කාණුවක හෝ වගා කිරීමේ කාර්ය සඳහා සෑම වර්ෂයකට යටත් පිරිසෙයින් මීටර් 30.5 ක දුර ප්‍රමාණයක් ඇතුලත කිසිම ළිඳක් ඉදි කිරීම සඳහා යම් සැලැස්මක් අනුමත කිරීම හෝ අවසර දීම හෝ නොකළ යුතු ය. එසේ වුවද යම් කාරණයකට අදාළ විශේෂ අවස්ථාගත කරුණු අනුව සහ යටිපස, ජල මට්ටම හෝ වෙනත් යම් කාරණා සැලකිල්ලට ගෙන සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂකවරයාගේ උපදෙස් මත, ඊට වඩා අඩු දුර ප්‍රමාණයක් සඳහා, සභාපතිවරයා විසින් අනුමැතිය දෙනු ලැබිය හැකිය.

03. පානය සඳහා හෝ වෙනත් යම් ගෘහස්ථ කාර්යයක් සඳහා හෝ ජලය සැපයීම පිණිස ප්‍රයෝජනයට ගන්නා යම් ළිඳක සිට මීටර් 305 ක දුර ප්‍රමාණයක් ඇතුලත යම් ස්ථානයක, කිසිම තැනැත්තකු විසින් :-

*(අ)* කිසිම වැසිකිළිවලක්, කුණුදිය වලක්, දිය බස්නා වලක්, වල වැසිකිළියක්, ගාලක්, ගවමඩුවක් හෝ ඉදි නොකළ කාණුවක් තැනීම නැතහොත් තැනීමට සැලැස්වීම සඳහා අවසර දීම, හෝ

*(ආ)* (ගොම හා කොම්පෝස්ට්) පොහොර කිසිවක් හෝ දිරාපත්වන සත්ව හෝ ශාක කොටස් කිසිවක් තැන්පත් කිරීම නැතහොත් තැන්පත් කිරීමට සැලැස්වීම හෝ අවසරදීම හෝ,

*(ඇ)* සතියකට යටත් පිරිසෙයින් එක් වරක්වත් ඉවත් කරනු නොලබන අපද්‍රව්‍ය කිසිවක් එකතු වීමට සැලැස්වීම හෝ එකතුවීමට ඉඩ දීම. හෝ

*(ඈ)* කිසියම් කාණුවක් පළුදු වූ තත්ත්වයෙන් තිබෙන්නට ඉඩ හැරීම නොකළ යුතුය.

04. පානය පිණිස හෝ වෙනත් යම් ගෘහස්ථ කාර්යයක් සඳහා ජලය සැපයීමට ප්‍රයෝජන ගන්නා ළිඳක් පිහිටා ඇති ඉඩමට අයිතිකරු, බදුකරු හෝ පදිංචිකරු, විසින් සෑමවිටම :-

*(අ)* කවර හෝ දුරක සිට ළිඳට මතුපිට ජලය එක එල්ලේ ගලා එන,

*(ආ)* ළිඳේ ගැට්ටේ සිට මීටර් 4.5 කට අඩු දුරක සිට මතුපිට ජලය ළිඳට කාන්දු වීම,

*(ඇ)* ළිඳට යාව පිහිටි බිමේ බිම් මට්ටමේ සිට මීටර් 3.0 කට වඩා අඩු ගැඹුරකින් යටිබිම් ජලය ළිඳට කාන්දු වීම.

පිණිස අවශ්‍ය විය හැකි තත්ත්වයකින් සහ අලුත්වැඩියාවෙන් යුතුව තබා ගත යුතුය. තවද,

2. ළිඳේ මීටර් 30.5 ක දුරකින් ඇතුලත, එම ඉඩමේ ඇති සෑම කාණුවක්ම පිරිසිදුව සහ සෞඛ්‍යාරක්ෂිත තත්ත්වයෙන්ද, නිසි අලුත්වැඩියාවෙන් ද යුතුව තබා ගත යුතු ය.

05. පානය පිණිස හෝ වෙනත් යම් ගෘහස්ථ කාර්යයක් සඳහා ජලය සැපයීමට ප්‍රයෝජන ගන්නා ළිඳකින් ජලය ඇදීමට, කිසිම තැනැත්තකු විසින්, කිසිම අපිරිසිදු භාජනයක් පාවිච්චි නොකළ යුතු ය.

06. මහජනයාට ජලය සැපයීම පිණිස ප්‍රයෝජනයට ගන්නා ළිඳක සිට මීටර් 4.5 ක දුරක් ඇතුලත, කිසිම තැනැත්තකු විසින් රෙදි සේදීම නොකළ යුතු ය.

07. පානය හෝ ගෘහස්ථ කාර්යය සඳහා ජලය ප්‍රයෝජනයට ගන්නා ළිඳක් ඉසීම, සුද්දකර ව්‍යාසාධන කිරීම හා අලුත්වැඩියා කිරීම, අවශ්‍ය බව සභාපතිවරයා සලකන කවර හෝ අවස්ථාවක එවැනි ළිඳක් පිහිටා ඇති යම් ඉඩමක අයිතිකරුට, බදුකරුට හෝ පදිංචිකරුට, ලිඛිත දැන්වීමක් මගින් ඒ දැන්වීමේ නිශ්චයකොට දැක්වෙන යම් කාලසීමාවක් ඇතුලත, එම ළිඳ ඉසින ලෙස සහ ඒ සුද්දකර ව්‍යාසාධනය කරන ලෙසද සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරයා ගේ උපදෙස් අනුව අවශ්‍යයයි සභාපතිවරයා සලකන වෙනත් යම් අලුත්වැඩියාවන් කරන ලෙසද, දැනුම්දීමට සැලැස්විය හැකි අතර එම දැන්වීමේ නිශ්චය කොට දැක්වෙන කාලසීමාව ඇතුලත එය අයිතිකරු බදුකරු හෝ පදිංචිකරු, විසින් ඒ දැන්වීම අනුව ක්‍රියාකළ යුතු ය.

08. ළිං සම්බන්ධයෙන් වන මේ අතුරු ව්‍යවස්ථාවක විධිවිධාන උල්ලංඝනය කරන යම් තැනැත්තෙක් වරදක් කරන අතර, වරදකරු කරනු ලැබූ විට රු. 500 ක් නොඉක්මවන දඩයකටද, ඒ වරද දිගටම කරගෙන යන අවස්ථාවක නිසි අධිකරණ බලය ඇති අධිකරණයක් විසින් වරදකරු කිරීම කරනු ලැබීමෙන් පසුව හෝ එම උල්ලංඝනය කෙරෙහි අවධානය යොමු කරන සභාපතිවරයාගේ හෝ වෙනත් බලයලත් නිලධරයෙකුගේ හෝ ලිඛිත දැන්වීමක් භාරදෙනු ලැබීමෙන් පසුව එය උල්ලංඝනය කරගෙන යන එක් එක් දවස වෙනුවෙන් රු. 100.00 ක් නොඉක්මවන අතිරේක දඩයකට ද යටත් වන්නේ ය.

**36. පුස්තකාල**

01. පද සම්බන්ධය අනුව අන්‍යාර්ථයක් අවශ්‍යවේ නම්, මිස, පුස්තකාල පිළිබඳව වන මේ අතුරු ව්‍යවස්ථාවල "පුස්තකාලයාධිපති" යන යෙදුමෙන්, පුස්තකාලය භාරව සිටීමට, ප්‍රාදේශීය සභාව විසින් පත්කරනු ලබන තැනැත්තෙක් අදහස් වන අතර, ඔහුගේ සහායකයා ද ඊට ඇතුලත් වේ.

02. ප්‍රාදේශීය සභාව විසින් පිහිටුවා පවත්වාගෙන යන මහජන පුස්තකාලය-

(අ) බැහැර දෙන පුස්තකාලය,
(ආ) ආශ්‍රෙය පුස්තකාලය සහ
(ඇ) කියවීම් ශාලාව,
යන ඒවායින් සමන්විත වේ.

03. (1) මහජන පුස්තකාලයේ අධීක්ෂණය සහ සාමාන්‍ය පරිපාලනය, (මෙහි මින්මතු පුස්තකාල කමිටුව යනුවෙන් සඳහන් කරනු ලබන) පුස්තකාල කමිටුවක් වෙත පැවරෙන්නේය. එම කමිටුව සඳහන් තැනැත්තන්ගෙන් සමන්විත වේ.

(අ) මෙහි මින්මතු "සභාපතිවරයා" යනුවෙන් සඳහන් කරනු ලබන තත්කාලයෙහි ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා හෝ ඔහු විසින් නම් කරන ලද වෙනත් යම් තැනැත්තෙක්,
(ආ) ප්‍රාදේශීය සභාව විසින් ප්‍රාදේශිය සභාවේ සභිකයින් අතුරෙන් තෝරා ගනු ලබන 3 දෙනෙකුට නොවැඩි සභිකයන් සංඛ්‍යාවක් සහ,
(ඇ) ඒ රැස්වීමේදී ප්‍රාදේශීය සභාව විසින් තෝරා පත්කර ගනු ලබන ප්‍රාදේශීය සභා ප්‍රදේශයේ පදිංචි විශිෂ්ට තැනැත්තන් පස් දෙනෙක්.

(2) මහජන පුස්තකාලය භාරව සිටීමට ප්‍රාදේශීය සභාව විසින් පුස්තකාලයාධිපතිවරයෙකු පත්කරනු ලැබිය හැකි අතර, පුස්තකාලයෙහි ක්‍රමවත්භාවය පවත්වාගෙන යාම සම්බන්ධයෙන් ඔහු වගකිව යුතු ය.

4. (1) ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා නිල බලයෙන්, කමිටුවේ සභාපතිවරයා විය යුතු අතර, කමිටුවේ සෑම රැස්වීමකට ඔහු මූලාසනය දැරිය යුතු ය. යම් රැස්වීමකට සභාපතිවරයා පැමිණ නොමැති විට පැමිණ සිටින සාමාජිකයින් විසින් කමිටුවේ සාමාජිකයින් අතුරෙන් තෝරා පත්කර ගන්නා සාමාජිකයෙකු එම රැස්වීමෙහි මූලාසනය දැරිය යුතු ය.

(2) කවර හෝ රැස්වීමක මූලාසනය දරන සාමාජිකයාට එක් මූලික ඡන්දයක්ද, යම් ප්‍රශ්නයක් සම්බන්ධයෙන් පක්ෂ හා විපක්ෂ ඡන්ද සංඛ්‍යාව සමාන වුවහොත් තීරණ ඡන්දයක් ද ඇත්තේය.

5. සාමාජිකයින් පස් දෙනෙකුගෙන් ගණපූර්ණය වී ඇත්නම් මිස කමිටුවේ කිසි කටයුත්තක් නොකළ යුතු ය.

6. කමිටුව විසින් අවශ්‍ය යයි සලකන කොන්දේසි වලට යටත්ව යම් තැනැත්තකුට මහජන පුස්තකාල පරිශ්‍රයෙහි යම් කොටසක් පාවිච්චි කිරීමට ඉඩදීමට හෝ යම් තැනැත්තකු විසින් පුස්තකාල පිළිබඳව වන අතුරු ව්‍යවස්ථා අතුරෙන් යමක් උල්ලංඝනය කර ඇත්නම්, ඒ තැනැත්තාට එම පරිශ්‍රයෙහි යම් කොටසක් පාවිච්චි කිරීමට ඉඩදීම ප්‍රතික්ෂේප කිරීමට හෝ කමිටුවට බලය ඇත්තේය.

### බැහැර දෙන පුස්තකාලය

7(1) යම් තැනැත්තෙක්-

(අ) වයස අවුරුදු දොළහට නොඅඩු වේ නම් මිස,
(ආ) ප්‍රාදේශීය සභා ප්‍රදේශය තුළ පදිංචිව සිටීනම් හෝ ප්‍රාදේශීය සභා ප්‍රදේශය තුල කාර්යාලයක් හෝ ව්‍යාපාරික ස්ථානයක් ඇතිව සිටීනම් මිස;
(ඇ) පුස්තකාලයාධිපතිවරයා වෙත රු. 25.00 ක මුදලක් තැන්පත් කර ඇත්නම් මිස, සහ
(ඈ) ප්‍රාදේශීය සභාවේ බදු ගෙවන්නකු විසින් නිර්දේශ කර ඇත්නම් මිස, ඒ තැනැත්තා බැහැරදෙන පුස්තකාලයේ සාමාජිකයෙකු ලෙස ඇතුලත් කර නොගත යුතු ය.

(2) බැහැර දෙන පුස්තකාලයේ සාමාජිකයෙකු ලෙස ඇතුලත් වීමට අපේක්ෂා කරන සෑම තැනැත්තකුම පුස්තකාලයාධිපතිවරයාගෙන් ලබාගත හැකි ආකෘති පත්‍රයක් මත ඒ සඳහා ඉල්ලුම් කළ යුතු අතර, ඔහු විසින් ඒ ඉල්ලුම් පත්‍රය මෙහි පහත සඳහන් තැනැත්තකු ලවා පිටසන් කරවා ගත යුතු ය.

(අ) පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක්,
(ආ) ප්‍රාදේශීය සභාවේ සභිකයෙක්,
(ඇ) කමිටුවේ සාමාජිකයෙක්,
(ඈ) ආගමික පූජකවරයෙක්,
(ඉ) වෛද්‍ය වෘත්තියේ හෝ නීති වෘත්තියේ සාමාජිකයෙක්,
(ඊ) සාමදාන විනිශ්චකාරවරයෙක්,
(උ) වාර්ෂික සිවිල් ලැයිස්තුවේ නම් ඇතුලත් වී ඇති ආණ්ඩුවේ සේවකයෙක්,
(ඌ) ද්විතීය පාසලක ප්‍රධානාචාර්යවරයෙක්,
(එ) රුපියල් 14,400ට නොඅඩු වාර්ෂික ආරම්භක වැටුපක් ලබන, ප්‍රාදේශීය සභාවේ සේවකයෙක් හෝ,
(ඒ) ප්‍රාදේශීය සභා ප්‍රදේශයේ ග්‍රාම සේවා නිලධාරිවරයෙක්

(3) පූර්ව ඡේදය යටතේ ඉල්ලුම්පත්‍රයක් පිටසන් කිරීමට හිමිකම් ඇති කිසිම තැනැත්තකුට ඔහුගේ ඉල්ලුම්පත්‍රය පිටසන් කරවා ගත යුතු යැයි නියම නොකළ යුතු ය.

08. බැහැර දෙන පුස්තකාලයේ සාමාජිකයෙකු ලෙස ඇතුලත් කර ගන්නා සෑම තැනැත්තකුටම පුස්තකාලයාධිපතිවරයා විසින් ටිකට්පත් දෙකක් නිකුත් කළ යුතු අතර, ඒ තැනැත්තෙකුට එක් ටිකට් පතකට එක් පොතක් බැගින් ලබා ගැනීමට හිමිකම් ඇත්තේය.

09. බැහැර දෙන පුස්තකාලයේ සාමාජිකයෙකුට නිකුත් කරන ලද ටිකට් පතක් ඔහු විසින් රැගෙන යන ලද යම් පොතක් සඳහා ඔහු වගකිව යුතුය.

10. බැහැර දෙන පුස්තකාලයේ සාමාජිකයෙකුට නිකුත් කරන ලද ටිකට්පත් ඔහු අතින් නැති වූ අවස්ථාවක එම නැතිවීම ගැන ඔහු විසින් පුස්තකාලයාධිපතිවරයාට දැනුම් දිය යුතුය. ඒ ටිකට්පතට බැහැර දෙන පුස්තකාලයෙන් පොතක් ණයට ගෙන නොමැති බවට පුස්තකාලයාධිපතිවරයා සෑහීමකට පත්වුවහොත් ඔහු විසින් ඒ සාමාජිකයාට ටිකට්පතෙහි අනුපිටපතක් නිකුත් කළ හැකිය. ටිකට්පතක් නැති වී ඇති බව දැනුම් දෙනු ලැබූ දිනයේ සිට යටත් පිරිසෙයින් දවස් 30 ක කාලසීමාවක් ඉකුත් වී ඇත්නම් පුස්තකාලයාධිපතිවරයා විසින් ටිකට්පතෙහි එවැනි අනුපිටපතක් නිකුත් නොකළ යුතුය.

11. බැහැර දෙන පුස්තකාලයේ සාමාජිකයෙකු විසින් ණයට ලබා ගන්නා පොතක්, එය ණයට ගත් දින සිට දවස් 14 ක කාලයක් තුළ පුස්තකාලයාධිපතිවරයාට ආපසු භාර දිය යුතුය. එවැනි යම් පොතක් වෙනත් සාමාජිකයෙකු විසින් ඉල්ලා නොමැති නම්, ඒ පොත වැඩිදුර දවස් 14 ක් සඳහා ණයට ගැනීමට පුස්තකාලයාධිපතිවරයා විසින් ඒ සාමාජිකයාට ඉඩදිය හැකිය.

12. 11 වන අතුරු ව්‍යවස්ථාවේ සඳහන් දවස් 14 ක කාලසීමාව ඇතුලත යම් පොතක්, පුස්තකාලයාධිපතිවරයාට ආපසු භාරදීම සාමාජිකයෙකු විසින් පැහැර හරිනු ලැබූ අවස්ථාවක, ඒ පොත් ආපසු භාරදිය යුතු දිනය ඉක්මවා යන එක් එක් දවස වෙනුවෙන් ශත පනහක් බැගින් දඩයක් ගෙවීමට ඒ සාමාජිකයා යටත් වන්නේය.

13. බැහැර දෙන පුස්තකාලයෙන් තමා විසින් ණය ගන්නා පොත් II වන අතුරු ව්‍යවස්ථාවේ සඳහන් දවස් දහ හතරක කාලසීමාව ඉකුත්වීමෙන් පසුව දවස් 30 ක් ඇතුලත ආපසු භාරදීම, සාමාජිකයෙකු විසින් පැහැර හරිනු ලැබූ අවස්ථාවක, ඒ පොත නැතිවූ සේ සලකනු ලැබිය යුතුය.

14. සාමාජිකයෙකු විසින් ණයට ගන්නා ලද පොතක් නැතිවී ඇති ලෙස සැලකෙන අවස්ථාවක ඒ පොත ආපසු සපයා ගැනීමේ වියදම ඒ සාමාජිකයා විසින් ගෙවිය යුතුය.

15. කිසිම සාමාජිකයෙකු විසින් බැහැර දෙන පුස්තකාලයෙන් ණයට ගත් පොතකට හානි කිරීම හෝ කවර හෝ ආකාරයකින් එය විරූප කිරීම හෝ නොකළ යුතුය.

16. බැහැර දෙන පුස්තකාලයෙන් තමා ණයට ගැනීමට අපේක්ෂා කරන පොතකට සිදු වී ඇති හානියක් හෝ විරූප කිරීමක් පිළිබඳව පුස්තකාලයාධිපතිවරයාට දැනුම් දීම සෑම සාමාජිකයෙකුගේම යුතුකම වන්නේය. එවැනි හානියක් හෝ විරූප කිරීමක් පිළිබඳ පුස්තකාලයාධිපතිවරයාට දැනුම් දීම යම් සාමාජිකයෙකු විසින් පැහැර හැර ඇති අවස්ථාවක ඒ පොත ඔහුට හානියක් හෝ විරූපකිරීමකින් තොරව නිකුත් කරන ලද සේ සැලකිය යුතුය.

17. සාමාජිකයෙකු විසින් ආපසු භාරදෙන ලද පොතක්, තවදුරටත් නිකුත් කිරීමට නුසුදුසු වන තරමට ඔහු විසින් හානිකර හෝ විරූප කර ඇති බවට පුස්තකාලයාධිපතිවරයා සෑහීමකට පත් වන්නාවූ අවස්ථාවක, ඒ පොත නැවත සපයා ගැනීමේ වියදම දැරීමට ඒ සාමාජිකයා බැඳී සිටින්නේය. ඒ පොත නැවත සපයා ගැනීමෙන් පසුව, හානි වූ පොත, "මහජන පුස්තකාලය/හානිවූ පොතක් ලෙස විකුණන ලදී." යනුවෙන් මුද්‍රා තබා සාමාජිකයාට දෙනු ලැබිය යුතුය.

18. (1) බැහැර දෙන පුස්තකාලයෙන් ණයට ගත් පොතක්, කිසිම සාමාජිකයෙකු විසින් කිසිම තැනැත්තෙකුට බැහැර නොදිය යුතුය.

(2) මේ අතුරු ව්‍යවස්ථාවේ (1) වන ඡේදයේ විධිවිධාන උල්ලංඝනය කරන කවර හෝ සාමාජිකයෙකුගේ තැන්පත් මුදල අහිමි වන අතර, බැහැර දෙන පුස්තකාලයේ ඔහුගේ සාමාජිකත්වය අහෝසි වන්නේය.

19. (1) ආසාදන හෝ ස්පර්ශක රෝගයකින් පෙළෙන යම් තැනැත්තෙකු විසින් පාවිච්චි කල බව තමා දන්නා කිසිම පොතක් කිසිම සාමාජිකයෙකු විසින් බැහැර දෙන පුස්තකාලයට ආපසු භාර නොදිය යුතුය.

(2) බැහැර දෙන පුස්තකාලයෙන් සාමාජිකයෙකු විසින් ණයට ගන්නා ලද පොතක් ආසාදන හෝ ස්පර්ශක රෝගයකින් පෙළෙන තැනැත්තෙකු විසින් පාවිච්චි කර ඇති විට ඒ පොත විනාශ කළ යුතු අතර, එය නැවත ගැනීමේ වියදම සාමාජිකයා පුස්තකාලයාධිපතිවරයාට ගෙවිය යුතුය.

20. කිසියම් පොතක් ණයට ලැබිය යුත්තේ කවර සාමාජිකයෙකුට ද යන්න පිළිබඳ මතභේදයක්, බැහැර දෙන පුස්තකාලයක සාමාජිකයන් දෙදෙනෙකු හෝ වැඩි ගණනක් අතර උද්ගත වූ විටක, ඒ මතභේදය පුස්තකාලයාධිපතිවරයා විසින් විසඳිය යුතුය.

21. වෙනත් සාමාජිකයෙකු විසින් ණයට ගෙන ගොස් ඇති යම් පොතක් ණයට ගැනීමට යම් සාමාජිකයෙකු අපේක්ෂා කරන විට, ඔහු තමාගේ නම සහ පොතේ නම එම කාර්යය සඳහා තබා ඇති රෙජිස්ටරයක සටහන් කළ යුතුය. ඒ පොත ගෙන ගොස් ඇති සාමාජිකයා එය ආපසු භාර දුන් විට පුස්තකාලයාධිපතිවරයා විසින් එය රෙජිස්ටරයේ නම සටහන් කර ඇති සාමාජිකයාට නිකුත් කළ යුතුය. යම් පොතක් සඳහා සාමාජිකයන් දෙදෙනෙකු හෝ වැඩි සංඛ්‍යාවක් විසින් රෙජිස්ටරයෙහි නම සටහන් කර ඇති අවස්ථාවක, ඔවුන් රෙජිස්ටරයේ නම සටහන් කර තිබෙන අනුපිළිවෙල අනුව පොත ඔවුනට නිකුත් කළ යුතුය.

22. ප්‍රාදේශීය සභා ප්‍රදේශය තුළ පදිංචිව හෝ කාර්යාලයක් නැතහොත් ව්‍යාපාර ස්ථානයක් තබා ගැනීම නතර කරන යම් සාමාජිකයෙකු බැහැර දෙන පුස්තකාලයේ සාමාජිකයෙකුව සිටීම නතර වන අතර 8 වන අතුරු ව්‍යවස්ථාව යටතේ ඔහු වෙත නිකුත් කර ඇති ටිකට් පත් දෙක පුස්තකාලයාධිපතිවරයාට ආපසු භාරදිය යුතුය.

23. යම් තැනැත්තෙකු විසින් 7(1)(ඈ) අතුරු ව්‍යවස්ථාව යටතේ ගෙවා ඇති රුපියල් 25ක් වන තැන්පත් මුදල, බැහැර දෙන පුස්තකාලයට ඔහුගෙන් අයවිය යුතු මුදලක් වෙතොත් එය අඩුකර ඒ තැනැත්තාගේ සාමාජිකත්වය අවසානවීමේදී ඔහුට ආපසු ගෙවිය යුතුය.

24. බැහැර දෙන පුස්තකාලය ඉරිදා දින, ප්‍රසිද්ධ නිවාඩු දින සහ යටත් පිරිසෙයින් සාමාජිකයන්ට දවස් හතක දැනුම්දීමකින් පසු, තොග ගණන් ගැනීම සඳහා කමිටුව විසින් නියම කරන වෙනත් යම් දිනයන් හි හැර දිනපතා, පෙ. ව. 9.00 සහ ප. ව. 6.00 අතර කාලය තුළ විවෘතව තැබිය යුතුය.

අශ්‍රෙය පුස්තකාලය

25. *(අ)* අශ්‍රෙය පුස්තකාලය පාවිච්චි කිරීම සඳහා පුස්තකාලයාධිපතිවරයාගේ අවසරය ලබාගෙන ඇත්නම් මිස, සහ
*(ආ)* අශ්‍රෙය පුස්තකාලයේ තබා ඇති රෙජිස්ටරය අත්සන් කර ඇත්නම් මිස,
කිසිම තැනැත්තකු විසින් අශ්‍රෙය පුස්තකාලය පාවිච්චි කරනු නොලැබිය යුතුය.

26. පුස්තකාලයාධිපතිවරයා විසින් —
*(අ)* කියවීමට සහ ලිවීමට හැකි
(ආ) ප්‍රාදේශීය සභා ප්‍රදේශය තුළ පදිංචි
*(ඇ)* වයස අවුරුදු දොළහට නොඅඩු

කවර හෝ තැනැත්තකුට අශ්‍රෙය පුස්තකාලය පාවිච්චි කිරීමට අවසර දිය හැකිය.

27. කියවා බැලීම සඳහා තමා වෙත නිකුත් කරන ලද කිසිම පොතක් කිසිම තැනැත්තකු විසින් අශ්‍රෙය පුස්තකාලයෙන් පිටතට ගෙන නොයා යුතුය.

28. (1) මේ අතුරු ව්‍යවස්ථාවේ (2) වන ඡේදයේ විධිවිධානවලට යටත්ව අශ්‍රෙය පුස්තකාලය පෙ. ව. 8.00 සිට මධ්‍යාහ්න 12.00 දක්වා ද, ප. ව. 2.30 සිට ප. ව. 6.00 දක්වා විවෘතව තැබිය යුතුය.

(2) ප්‍රාදේශීය සභාව විසින් යෝජනා සම්මතයක් මගින් —

*(අ)* මේ අතුරු ව්‍යවස්ථාවේ (1) වන ඡේදයේ නිශ්චය කොට දැක්වෙන වේලාවන් දීර්ඝ කළ හැකිය.
*(ආ)* එම යෝජනා සම්මතයේ නිශ්චය කොට දක්වනු ලැබිය හැකි වේලාවන් තුල ඉරු දිනයන්හි සහ ප්‍රසිද්ධ නිවාඩු දිනයන්හි අශ්‍රෙය පුස්තකාලය විවෘතව තබන ලෙස කමිටුවෙන් ඉල්ලා සිටිය හැකිය.
*(ඇ)* තොග ගණන් ගැනීමේ කාර්යය සඳහා ප්‍රාදේශීය සභාව විසින් නියම කරනු ලැබිය හැකි දිනවල අශ්‍රෙය පුස්තකාලය වසා තබන ලෙස කමිටුවෙන් ඉල්ලා සිටිය හැකිය.

29. කිසිම තැනැත්තකු විසින් :-

*(අ)* පුස්තකාලයාධිපතිවරයාගේ අවසරය තත්කාර්යය සඳහා ලබාගෙන ඇත්නම් මිස, සහ
*(ආ)* කියවීම් ශාලාවේ තබා ඇති රෙජිස්ටරයේ අත්සන් තබා ඇත්නම් මිස, කියවීම් ශාලාව ප්‍රයෝජනයට නොගත යුතුය.

30. *(අ)* ප්‍රාදේශීය සභා ප්‍රදේශය තුළ පදිංචිකරුවෙකු වන ; සහ
*(ආ)* වයස අවුරුදු දොළහට අඩු නොවන
කවර හෝ තැනැත්තෙකුට කියවීම් ශාලාව ප්‍රයෝජනයට ගැනීමට පුස්තකාලයාධිපතිවරයා විසින් අවසර දෙනු ලැබිය හැකිය.

31. (1) මේ අතුරු ව්‍යවස්ථාවේ (2) වන ඡේදයේ විධිවිධානවලට යටත්ව කියවීම් ශාලාව පෙ. ව. 8.00 සිට මධහ්න 12.00 දක්වා ද, ප. ව. 2.30 සිට ප. ව. 6.30 දක්වා ද විවෘතව තැබිය යුතුය.

(2) ප්‍රාදේශීය සභාව විසින් යෝජනා සම්මතයක් මගින් :—

(අ) මේ අතුරු ව්‍යවස්ථාව (1) ඡේදයේ නිශ්චය කොට දැක්වෙන වේලාවන් දීර්ඝ කළ හැකිය.
(ආ) තොග ගණන් ගැනීමේ කාර්යය සඳහා ප්‍රාදේශීය සභාව විසින් නියම කරනු ලැබිය හැකි දිනවල කියවීම් ශාලාව වසා තබන ලෙස කමිටුවෙන් ඉල්ලා සිටිය හැකිය.

32. කියවීම් ශාලාවේ තබා ඇති හෝ කියවීම් ශාලාවට අයත් කිසිම පුවත්පතක්, වාර ප්‍රකාශනයක්, සඟරාවක්, සිතියමක්, ලියවිල්ලක්, අත්පිටපතක් හෝ වෙනත් යම් ලිපියක් කිසි තැනැත්තෙකු විසින් කියවීම් ශාලාවෙන් ඉවත් කරගෙන නොයා යුතුය.

**සාමාන්‍යය**

33. යම් ආසාදන, ස්පර්ශක හෝ චර්ම රෝගයකින් පෙළෙන හෝ මෑතකදී පෙළුණු තැනැත්තෙක් ඒ රෝගයකින් පෙළෙන තැනැත්තකුට මෑතකදී උපස්ථානයේ යෙදුණු කිසිම තැනැත්තෙකු, රෝගය බෝවීමේ කාලය සහ බීජෞෂණ කාලසීමාව ඉකුත්වන තෙක් මහජන පුස්තකාල පරිශ්‍රයට ඇතුළු නොවිය යුතුය.

34. කිසිම තැනැත්තෙකු -

(1) මහජන පුස්තකාල පරිශ්‍රයන් තුළ හෝ අවට නොහික්මුණු ආකාරයෙන් හැසිරීම හෝ එහි හිරිහැරයක් ඇති කිරීම නොකළ යුතුය.
(2) මහජන පුස්තකාලයෙහි හෝ ඒ අවට ප්‍රාදේශීය සභාවේ යම් ගොඩනැගිල්ලක කොටසකට හෝ යම් දේපලකට අලාභයක් හෝ යම් ආකාරයකින් ඒවා විරූප කිරීම නොකළ යුතුය.
(3) මහජන පුස්තකාලය වැසූ පසුව සතුටුදායක හේතු දැන්වීමක් කළ නොහැකිව පුස්තකාල පරිශ්‍රය තුළ රැඳී සිටීම හෝ නිකරුණේ රැඳී සිටීම නොකළ යුතුය.
(4) මහජන පුස්තකාල පරිශ්‍රය තුළද, දුම්බීම හෝ කෙළ ගැසීම නොකළ යුතුය.
(5) මහජන පුස්තකාල පරිශ්‍රය ඇතුළත දාදු කැටවලින් හෝ කාඩ් කුට්ටම්වලින් සූදුවේ නොයෙදිය යුතුය.
(6) මහජන පුස්තකාල පරිශ්‍රය ඇතුලත ඝෝෂා කිරීමෙන්, ගී ගැයීමෙන් හෝ වෙනත් ශබ්ද නැගීමෙන් එම පුස්තකාලය පාවිච්චි කරන්නන්ට බාධා නොකළ යුතුය.
(7) අපිරිසිදු තත්ත්වයකින් මහජන පුස්තකාල පරිශ්‍රයට ඇතුළු නොවිය යුතුය.
(8) මහජන පුස්තකාල පරිශ්‍රයට කිසිම සුනඛයෙකු හෝ වෙනත් සතකු ගෙන නොආ යුතුය.
(9) මහජන පුස්තකාල පරිශ්‍රයේ යම් කොටසක් තුළ නිදා ගැනීම හෝ යම් ආහාරයක් ගැනීම නොකළ යුතුය.

10. පුස්තකාලයාධිපතිවරයාට හෝ පුස්තකාලයාධිපතිවරයාගේ නියමය යටතේ ක්‍රියා කරන වෙනත් යම් තැනැත්තකුට මේ අතුරු ව්‍යවස්ථාව යටතේ ඔහුගේ බලතල නීත්‍යානුකූලව ක්‍රියාත්මක කිරීමෙහිලා බාධා නොකළ යුතුය.

35. 2 වන අතුරු ව්‍යවස්ථාව, 33 වන අතුරු ව්‍යවස්ථාව හෝ 34 වන අතුරු ව්‍යවස්ථාව පිළිබඳ සෑම උල්ලංඝනය කිරීමක්ම රුපියල් සියයකට නොවැඩි දඩයකින් දඬුවම් කරනු ලැබීමට යටත් වන්නේය.

### 37. අනාරක්ෂිත ළිං

01. ප්‍රාදේශීය සභාවේ පරිපාලන සීමාව ඇතුලත පිහිටියා වූද, යම් ළිඳක් පිහිටා ඇත්තා වූද, යම් ඉඩමක අයිතිකරු හෝ පදිංචිකරු විසින් ඒ ළිඳ බිම් මට්ටමේ සිට යටත් පිරිසෙයින් අඩි 03ක් උසට ගල් බැම්මකින් හෝ වෙනත් සුදුසු නිර්මිතයකින් වටකර තැබීමට සැලැස්විය යුතු අතර, ඒ බැම්ම හෝ වෙනත් නිර්මිතය නිසි අලුත්වැඩියාවෙන් යුතුව තබා ගැනීමට සැලැස්විය යුතුය.

02. අත්හැර දමන ලද සෑම ළිඳක්ම ඒ ළිඳ ගොඩකරන ලෙසට ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා විසින් ලිඛිත දැන්වීමක් කරනු ලැබීමෙන් මාසයක් ඇතුළත, ඒ ළිඳ පිහිටි ඉඩමේ අයිතිකරු හෝ පදිංචිකරු හෝ ගොඩකරනු ලැබිය යුතුය.

03. මේ කවර හෝ අතුරු ව්‍යවස්ථාවක් පිළිබඳව වන සෑම උල්ලංඝනය කිරීමක්ම රුපියල් හත්සිය පනහ නොඉක්මවන දඩයකින්ද, එම උල්ලංඝනය දිගටම කරගෙන යන අවස්ථාවක, වරදකරු කිරීමෙන් පසුව හෝ ඒ උල්ලංඝණය කෙරෙහි අවධානය යොමු කරමින් ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා විසින් ලිඛිත දැන්වීමක් භාරදෙනු ලැබීමෙන් පසුව, ඒ උල්ලංඝනය කරගෙන යන සෑම දිනයක් වෙනුවෙන්ම රුපියල් දෙසිය පනහක් නොඉක්මවන දඩයකින්ද, දඬුවම් කරනු ලැබීමට යටත් වන්නේය.

### 38 - කොණ්ඩා සැකසීමේ සැලුන්හල් සහ බාබර් සාප්පු

01. (1) කොණ්ඩා සැකසීමේ සැලුන්හලක් හෝ බාබර් සාප්පුවක් සඳහා (මෙහි මින්මතු "සභාපතිවරයා" සඳහන් කරනු ලබන) ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා විසින් නිකුත් කරන ලද බලපත්‍රයක් මත මිස කිසිම තැනැත්තකු විසින් කොණ්ඩා සැකසීමේ සැලුන්හලක් හෝ බාබර් සාප්පුවක් පවත්වාගෙන නොයා යුතුය.

(2) 14 වන අතුරු ව්‍යවස්ථාව යටතේ කලින් අවලංගු කරනු ලැබුවහොත් මිස, මේ අතුරු ව්‍යවස්ථාවේ (1) ඡේදය යටතේ නිකුත් කරන ලද සෑම බලපත්‍රයක්ම එය නිකුත් කරන ලද්දේ යම් වර්ෂයක් වෙනුවෙන්ද, ඒ වර්ෂයේ දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වන්නේය.

02. කොණ්ඩ සැකසීමේ සැලුන්හල හෝ බාබර් සාප්පුව සඳහා ප්‍රයෝජනයට ගන්නා ලද ගොඩනැගිල්ල හෝ ගොඩනැගිල්ලේ කොටස, එහි උපකරණ මෙහි පහත දැක්වෙන කොන්දේසිවලට හා නියමයන්ට අනුකූල වේ නම් මිස, කොණ්ඩා සැකසීමේ සැලුන්හලක් හෝ බාබර් සාප්පුවක් පවත්වාගෙන යාම සඳහා බලපත්‍රයක් ලැබීමට කිසිම තැනැත්තකුට හිමිකමක් නොමැත.

(1) ගොඩනැගිල්ල හෝ ගොඩනැගිල්ලේ කොටස —

(අ) ශක්තිමත්ව සාදා තිබිය යුතු අතර මීටර් 11.15ට නොඅඩු ගෙබිම ප්‍රමාණයකින් යුක්ත විය යුතුය;

(ආ) බිත්ති හුණු බදාමයෙන් තනා හුණු පිරියම් කර තිබිය යුතු අතර, වහලට ලීයෙන් හෝ සමාන ද්‍රව්‍යයකින් හෝ තැනූ සුදු පාට ආලේප කළ සිවිලිමක් තිබිය යුතුය. තව ද ගෙබිම සිමෙන්ති දමා, බිත්ති සහ වහළ සන්ධිවන ස්ථානය සිමෙන්තියෙන් වටකුරු හැඩයට සකස් කොට තිබිය යුතුය;

(ඇ) මැනවින් ආලෝකය සහ වාතාශ්‍රය ලැබෙන සේ තනා තිබිය යුතුය;

(ඈ) ප්‍රමාණවත්, කාණු සපයා තිබිය යුතු අතර, ගොඩනැගිල්ල ඇතුළත හෝ භූමිය තුළ හෝ සතුටුදායක වැසිකිළි පහසුකම් සපයා තිබිය යුතුය.

(2) ගොඩනැගිල්ලේ යම් කොටසක් නිවාසයක කාර්ය සඳහා ප්‍රයෝජනයට ගන්නේ නම් හෝ ප්‍රයෝජනයට ගැනීමට අදහස් කෙරේ නම් ඒ කොටස (199 වැනි අධිකාරය වන) නිවාසය සහ නගර සංවර්ධන ආඥාපනතේ විධිවිධානවලට අනුකූල විය යුතුය.

(3) සැලුන්හල හෝ සාප්පුව සඳහා පහත සඳහන් දෑ සපයා තිබිය යුතුය :-

(අ) සැලුන්හල හෝ සාප්පුව, ගණුදෙනුකරුවන් සඳහා විවෘතව ඇති සියලු වේලාවන්හි ප්‍රමාණවත් ජලසම්පාදනයක්;
(ආ) දිනපතා පාවිච්චි කරන ආයුධ සහ උපකරණ සේදීම හෝ ජීවානුහරණය සඳහා ප්‍රමාණවත් උතුරන ජලය හෝ විෂබීජනාශක හෝ සපයා ගැනීමේ ක්‍රමය;
(ඇ) කොණ්ඩා සකසන්නන්ට සහ බාබර්වරුන්ට ඔවුන්ගේ වැඩ කරගෙන යාමේදී අත් සෝදා ගැනීම සඳහා පහසුකම්;
(ඈ) ආයුධ හෝ උපකරණ ජීවානුහරණය පිණිස පාවිච්චි කරන විෂබීජනාශක සඳහා ප්‍රමාණවත් බඳුන් සංඛ්‍යාවක්;
(ඉ) ගණුදෙනුකරුවන්ගේ ප්‍රයෝජනය සඳහා ප්‍රමාණවත් තුවා සහ ඕවර් ඕල් සංඛ්‍යාව ;
(ඊ) ගණුදෙනුකරුවන්ට සහ සේවා නියුක්තයන්ට පහසුවෙන් ලබාගත හැකි පරිදි, ආසනවලට ආසන්නව තබා ඇති ප්‍රමාණවත් පඩික්කන් සහ අළු බඳුන් සංඛ්‍යාවක් ;සහ,
(උ) කපන ලද කෙස් සහ අපද්‍රව්‍ය බහාලීම සඳහා, ආවරණය කළ සහ එහා මෙහා ගෙනයා හැකි බඳුනක් ; සහ
(ඌ) ප්‍රමාණවත් අවශ්‍ය දෑ සපයා ඇති ප්‍රථමාධාර පෙට්ටියක්.

03. කොණ්ඩා සැකසීමේ සැලුන්හලක හෝ බාබර් සාප්පුවක බලපත්‍රධාරියා විසින් —

(අ) අවස්ථාවෝචිත පරිදි "බලපත්‍රලත් කොණ්ඩා සැකසීමේ සැලුන්හල" හෝ "බලපත්‍රලත් බාබර් සාප්පුව" යන වචන පැහැදිලිව සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවලින් පින්තාරුකල පුවරුවක්, සැලුනයේ හෝ සාප්පුවේ පිටත, ප්‍රකටව පෙනෙන ස්ථානයක සවිකර තැබිය යුතුය ;

(ආ) සැලුනයේ හෝ සාප්පුවේ ඇතුළත, ප්‍රකටව පෙනෙන ස්ථානයේ කොණ්ඩා සැකසීමේ සැලුන්හල් සහ බාබර් සාප්පු වන මේ අතුරු ව්‍යවස්ථාවල සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවලින් ද පිටපතක් රාමුකර තබාගත යුතුය.

04. කොණ්ඩා සැකසීමේ සැලුන්හලක් හෝ බාබර් සාප්පුවක් සඳහා බලපත්‍රධාරියකු විසින් —

(අ) ඒ සැලුනයේ හෝ සාප්පුවේ බිත්ති, යටත් පිරිසෙන් අවුරුද්දකට වරක්වත් දෙසැම්බර් මාසයේදී හුණු පිරියම් කිරීමට සහ සිවිලිම පින්තාරු කිරීමට සැලැස්විය යුතුය; තවද,

(ආ) ඒ සැලුනයේ හෝ සාප්පුවේ බිම, බිත්ති සිවිලිම, සවි කිරීම්, ගෘහභාණ්ඩ සහ උපකරණ සැමවිටම පිරිසිදුව තබාගැනීමට සැලැස්විය යුතුය.

05. කොණ්ඩා සැකසීමේ සැලුන්හලක් හෝ බාබර් සාප්පුවක බලපත්‍රධාරියා විසින් සේවයේ නියුක්තකර ඇති සෑම කොණ්ඩා සකසන්නකුම සහ බාබර් කෙනෙකුම -

(අ) ඔහුගේ ශරීරය සහ ඇඳුම් පැළඳුම් පිරිසිදුව තබාගන්නා බවට ;
(ආ) ඔහුගේ නියපොතු කපා කුණුවලින් තොරව තබාගන්නා බවට ;සහ
(ඇ) එක් එක් ගණුදෙනුකරුගේ කොණ්ඩය සැකසීමට හෝ කැපීමට මත්තෙන් සබන් ගා, අත්සෝදා ගන්නා බවට වගබලා ගැනීමට අවශ්‍ය පියවර, බලපත්‍රධාරියා විසින් ගනු ලැබිය යුතුය.

06. කොණ්ඩා සැකසීමේ සැලුන්හලක හෝ බාබර් සාප්පුවක බලධාරියා විසින් —

(අ) ඒ සැලුන්හලේ හෝ බාබර් සාප්පුවේ ඇති සෑම පඩික්කමක්ම පිරිසිදුව සහ සෞඛ්‍යාරක්ෂක තත්ත්වයෙන් තබාගත යුතුය,

(ආ) ඒ සැලුන්හලේ හෝ බාබර් සාප්පුවේ පාවිච්චි කරන සෑම කොණ්ඩා බුරුසුවක්ම හෝ පනාවක්ම දිනපතාම සේදීමට හෝ පිරිසිදු කරවීමට, බීජානුහරණය හෝ විෂබීජනාශනය කරවීමටත්, සැමවිටම ඒවා පිරිසිදු කර සෞඛ්‍යාරක්ෂක තත්ත්වයෙන් තබාගැනීමටත් සැලැස්විය යුතුය;

(ඇ) සැලුන්හලේ හෝ සාප්පුවේ පාවිච්චි කරන, රැවුල් කැපීමේදී ප්‍රයෝජනයට ගන්නා කතුරුවක් හෝ කෝප්පයක්ද, සබන් බුරුසු, ක්ලිපර්, රේසර් හෝ වෙනත් කැපීමේ උපකරණද පාවිච්චියට ගත් සෑම අවස්ථාවකම උණු ජලයෙන් සෝදා පිරිසිදු කිරීමට සැලැස්විය යුතුය; තවද,

(ඈ) එක් එක් ගනුදෙනුකරුගේ කොණ්ඩා සැකසීම හෝ කැපීම සිදුකළ පසුව සියළු කෙස් කොට සහ වෙනත් අපද්‍රව්‍ය; ඒවා දැමීම සඳහා සපයා ඇති බක්කියකට දැමීමට සැලැස්විය යුතුය.

07. කොණ්ඩා සැකසීමේ සැලුන්හලක හෝ බාබර් සාප්පුවක බලපත්‍රධාරියා විසින් —

(අ) කිසිම ලේ නවත්වන පැන්සල් වර්ගයක් පියරු මලක් හෝ ස්පන්ජියක් ; හෝ

(ආ) යම් ලේ ගැලීමක් නතර කිරීමේ කාර්යය සඳහා සීනක්කාරම් හෝ වෙනත් ද්‍රව්‍යයන් (එය කුඩු වශයෙන් ඇත්නම් මිස),

කිසිම ගණුදෙනුකරුවකු සඳහා පාවිච්චි කිරීම හෝ ඒ සැලුන්හලේ හෝ සාප්පුවේ සේවයේ යොදවා සිටින කිසිම කොණ්ඩා සකසන්නෙකුටම හෝ බාබර් කෙනෙකුට, ගනුදෙනුකරුවෙකු සඳහා පාවිච්චි කිරීමට ඉඩදීම හෝ නොකළ යුතුය.

08. කොණ්ඩා සැකසීමේ සැලුන්හලක හෝ බාබර් සාප්පුවක බලපත්‍රධාරියා විසින් යම් ගණුදෙනුකරුවකුගේ ප්‍රයෝජනය සඳහා යොදනු ලැබීමෙන් පසු පළමුවරට පාවිච්චි කරනු ලබන තුවායක් නොවන තුවායක් හෝ පිරිසිදු නැති "ඔවර්ඕල්" උඩ වැස්මක් හෝ නොසැපයිය යුතුය.

09. කොණ්ඩා සැකසීමේ සැලුන්හලක හෝ බාබර් සාප්පුවක බලධාරියා විසින් —

(අ) කුමන ආකාරයක හෝ ආසාදන, ස්පර්ශක හෝ චර්මගත රෝගයකින් පෙලෙන නැතහොත් එවැනි රෝගයකින් පෙලෙන තැනැත්තකුට මෑතකදී උපස්ථාන කළ කිසි තැනැත්තකුට දැනුවත්ව සැලුන්හලට හෝ සාප්පුවට කිසිම කාර්යයක් සඳහා ඇතුළුවීමට ඉඩ නොදිය යුතුය;

(ආ) ඉහත (අ) ඡේදයේ සඳහන් අයෙකු කිසිම තරාතිරමකින් සේවයේ නියුක්ත නොකළ යුතුය;

(ඇ) සැලුන්හලෙහි හෝ සාප්පුවෙහි තමා විසින් සේවයේ නියුක්තකර සිටින කිසිම කොණ්ඩා සකසන්නෙකුට හෝ බාබර් කෙනෙකුට ඉහත (අ)ඡේදයේ සඳහන් කිසිම තැනැත්තකුට සේවය කිරීමට දැනුවත්ව ඉඩ නොදිය යුතුය;

(ඈ) (අ) ඡේදයේ සඳහන් යම් තැනැත්තෙකුට වැරදීමකින් හෝ අහම්බෙන් සේවය කළ එවැනි යම් කොණ්ඩා සකසන්නකුට, ඔහුගේ දෑත් සෝදා පිරිසිදු කර ගැනීමෙන් පසුව මිස වෙනත් යම් ගණුදෙනුකරුවකුට සේවය කිරීමට ඉඩ නොදිය යුතුය;

(ඉ) ඉහත (අ) ඡේදයේ සඳහන් යම් තැනැත්තකු සඳහා පාවිච්චි කළ තවත් කවර හෝ උපකරණයක් බීජානුහරණය කරන තෙක් වෙනත් යම් තැනැත්තකු සඳහා පාවිච්චි කිරීමට ඉඩ නොදිය යුතුය.

10. කිසිම තැනැත්තකු විසින්, කොණ්ඩා සැකසීමේ සැලුන්හලක් හෝ බාබර් සාප්පුවක් තුළදී එහි සපයා ඇති පඩික්කමට හැර කෙළ නොගැසිය යුතුය.

11. කොණ්ඩා සැකසීමේ සැලුන්හලක හෝ බාබර් සාප්පුවක බලපත්‍රධාරියකු විසින් එම බලපත්‍රලත් ස්ථානය —

(අ) කිසිම වේලාවකදී ආහාර ගැනීමේ ස්ථානයක් ලෙස; හෝ;

(ආ) ගණුදෙනුකරුවන් සඳහා විවෘතව නොමැති රාත්‍රී කාලයේදී හැර නිදා ගන්නා ස්ථානයක් ලෙස පාවිච්චි කිරීම හෝ වෙනත් යම් තැනැත්තකුට එසේ පාවිච්චි කිරීමට ඉඩදීම හෝ නොකළ යුතුය.

12. (i) සභාපතිවරයා විසින් හෝ තත්කාර්ය සඳහා ඔහු විසින් පොදුවේ හෝ විශේෂයෙන් ලියවිල්ලක් මගින් බලය දෙන ලද ප්‍රාදේශීය සභාවේ යම් නිලධරයකු විසින් හෝ කවර හෝ කොණ්ඩා සැකසීමේ සැලුන්හලකට හෝ බාබර් සාප්පුවකට සියලු යුක්ති සහගත වේලාවන්හිදී ඇතුලු වී එය පරීක්ෂා කිරීම නීත්‍යානුකූල වන්නේය.

(ii) සභාපතිවරයාට හෝ සභාපතිවරයා විසින් ලියවිල්ලක් මගින් බලය දෙන ලද යම් නිලධරයකුට ස්ථානයට ඇතුළු වී එය පරීක්ෂා කිරීමට, කොණ්ඩා සැකසීමේ සැලුන්හලක හෝ බාබර් සාප්පුවක බලපත්‍රධාරියා විසින් හෝ එය භාරව සිටින තැනැත්තා විසින් ඉඩ දිය යුතු අතර, සභාපතිවරයාට හෝ ඒ නිලධරයාට අවශ්‍ය විය හැකි සියලු සහාය දිය යුතුය.

13. කොණ්ඩා සැකසීමේ සැලුන්හලේ හෝ බාබර් සාප්පු පිළිබඳ මේ කවර හෝ අතුරු ව්‍යවස්ථාවක් සම්බන්ධ සෑම උල්ලංඝනය කිරීමක්ම රුපියල් හත්සිය පනහක් නොඉක්මවන දඩයකින් සහ එම උල්ලංඝනය දිගටම කරගෙන යන අවස්ථාවක වරදකරු කිරීමෙන් පසුව හෝ ඒ උල්ලංඝනය, කෙරෙහි අවධානය කරමින් සභාපතිවරයා විසින් හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධරයකු විසින් හෝ යවන දැන්වීමක් භාර කරවීමෙන් පසුව හෝ ඒ උල්ලංඝනය කරගෙන යන සෑම දිනයක් වෙනුවෙන්ම රුපියල් දෙසිය පනහක් නොඉක්මවන දඩයකින් දඬුවම් කරනු ලැබීමට යටත් වන්නේය.

14. කොණ්ඩා සැකසීමේ සැලුන්හල් හෝ බාබර් සාප්පු පිළිබඳ මේ කවර හෝ අතුරු ව්‍යවස්ථාවක් කඩ කිරීම සම්බන්ධයෙන් දෙවරක් හෝ ඊට වැඩි වාර ගණනක් වරදකරු කරනු ලැබූ බලපත්‍රධාරියකුට නිසි බලය ඇති අධිකරණයක් විසින් නියම කරන වෙනත් යම් දඬුවමකට අතිරේකව, ඒ බලපත්‍රධාරියාගේ බලපත්‍රය ඒ අධිකරණය විසින් අවලංගු කිරීම නීත්‍යානුකූල වන අතර එම අවලංගු කිරීම වෙනුවෙන් කිසිම වන්දියක් ලැබීමට බලපත්‍රධාරියාට හිමිකමක් නොමැති විය යුතුය.

**39 - ප්‍රචාරක දැන්වීම්/දෘෂ්‍ය පරිසරය**

01. කිසිම තැනැත්තකු විසින්, යම් වීදියකට, පාරකට, ඇලකට, වැවකට, මුහුදට හෝ අහසට පෙනෙන කිසිම දැන්වීමක් ප්‍රදර්ශනය කිරීම හෝ ප්‍රදර්ශනය කිරීමට සැලැස්වීම, ඒ සඳහා ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද බලපත්‍රයක බලය යටතේ මිස, කරනු නොලැබිය යුතුය.

02. කවර හෝ දැන්වීම් ප්‍රදර්ශනය කිරීමේ බලපත්‍රයක් සඳහා වන සෑම ඉල්ලුම්පත්‍රයක්ම, මේ අතුරු ව්‍යවස්ථාවල 3 වැනි අතුරු ව්‍යවස්ථාවට අනුකූලව ප්‍රචාරක දැන්වීම් ප්‍රදර්ශනය කිරීමට අදහස් කරන දිනයට යටත් පිරිසෙයින් දවස් හතකට කලින් සභාවට ඉදිරිපත් කළ යුතුය.

03. 2 වැනි අතුරු ව්‍යවස්ථාව යටතේ ඉදිරිපත් කරන සෑම ඉල්ලුම්පත්‍රයක්ම පහත දැක්වෙන දේවලින් සමන්විත විය යුතුය :-

(අ) ලේකම්වරයාට යොමුකළ ලිඛිත ඉල්ලුම්පත්‍රය ;
(ආ) දැන්වීම ප්‍රදර්ශනය කිරීමට අදහස් කරන නිර්මිතයේ පිහිටීමට සාපේක්ෂව 1:1,000 පරිමාවට නොඅඩු පරිමාවකින් අඳින ලද භූමි සැලැස්ම ;
(ඇ) 1:1,000 පරිමාවට නොඅඩු පරිමාවකට අඳින ලද එම නිර්මිතයේ රූ සටහනක් ;
(ඈ) එම සැලැස්මේ රූප සටහනේ හෝ පිරිවිතරයේ, මේ අතුරු ව්‍යවස්ථාවට අනුකූල වනු පිණිස කරන සංශෝධන වෙතොත් ඒ සංශෝධන,

(ඉ) ප්‍රදර්ශනය කරන ප්‍රචාරක දැන්වීමෙහි යොදා ගන්නා වර්ණ සියල්ලම යොදා කුඩා පරිමාවකට අඳින ලද ඒ දැන්වීමේ පිටපතක් ;
(ඊ) යාබද වීදිවලට සහ ප්‍රධාන භූමි සළකුණුවලට සාපේක්ෂව ප්‍රචාරක දැන්වීමේ පිහිටීම දැක්වෙන සැලැස්මක් ;
(උ) මේ සභාවේ යෝජනා සම්මතයට නිශ්චය කොට දැක්වෙන සහ ගැසට් පත්‍රයේ යථා පරිදි පළ කරන ලද ගාස්තුව ;
(ඌ) ඒ ප්‍රචාරක දැන්වීම ප්‍රදර්ශනය කිරීමට අනුමැතිය දීමේ කාර්යය සඳහා ප්‍රාදේශීය සභාවට අවශ්‍ය විය හැකි වෙනත් යම් තොරතුරු.

04. ප්‍රාදේශීය සභාව විසින් ලියවිල්ලකින් අනුමත කරන ලද සැළසුම්වලට, රූප සටහන්වලට සහ පරිවිතරට අනුකූලව මිස, කිසිම තැනැත්තකු විසින් ප්‍රාදේශීය සභා ප්‍රදේශය ඇතුළත, යම් ප්‍රචාරක දැන්වීමක් හෝ ප්‍රචාරක දැන්වීම් හෝ ප්‍රදර්ශනය කිරීමේ කාර්යය සඳහා ප්‍රයෝජනයට ගැනීම පිණිස කිසිම පුවරුවක්, බිල් පුවරුවක්, දැන්වීම් පුවරුවක් හෝ වෙනත් යම් නිර්මිතයක් ඉදිකිරීම හෝ ඉදිකිරීමට සැලැස්වීම නොකළ යුතුය.

05. 2 වැනි අතුරු ව්‍යවස්ථාව යටතේ ඉදිරිපත් කරන ලද ඉල්ලුම් පත්‍රයක් ප්‍රාදේශීය සභාව විසින් අනුමත කරනු ලැබූ අවස්ථාවක නියමිත ගාස්තුව ගෙවන තෙක් ඉල්ලුම්කරුට බලපත්‍රය නිකුත් කරනු නොලැබිය යුතුය.

06. ප්‍රචාරක දැන්වීමක් ප්‍රදර්ශනය කිරීම සඳහා යම් තැනැත්තෙකුට බලපත්‍රයක් නිකුත් කරනු ලැබූ අවස්ථාවක ඔහු විසින් ප්‍රදර්ශනය කරනු ලබන සෑම ප්‍රචාරක දැන්වීමකම, බලපත්‍රයේ යොමු අංකය සහ බලපත්‍රධාරියාගේ නම ඇතුළත් කරන ලෙස ප්‍රාදේශීය සභාව විසින් ඒ තැනැත්තාට නියම කළ යුතුය.

07. මේ අතුරු ව්‍යවස්ථාවල විධිවිධාන, පහත දැක්වෙන ප්‍රචාරක දැන්වීම් කිසිවකට හෝ ඒ දැන්වීම් ප්‍රදීප්ත ප්‍රචාරක දැන්වීමක් හෝ ගුවන් නාම පුවරුවක් හෝ වන්නේ නම් මිස, අදාළ නොවිය යුතුය :-

(අ) ලබන ශුද්ධ මුදල් ප්‍රමාණය, පුණ්‍ය කටයුතු සඳහා යොදවන යම් ප්‍රසංගයකට අදාළ දැන්වීමක් ;
(ආ) කිසියම් ප්‍රසංගයක් පවත්වනු ලබන ස්ථානයේ, ඒ ප්‍රසංගයට අදාළව ප්‍රදර්ශනය කෙරෙන ප්‍රචාරක දැන්වීමක් ;
(ඇ) ආගමික, දේශපාලන හෝ මහජන රැස්වීමක් සම්බන්ධයෙන් වන ප්‍රචාරක දැන්වීම්;
(ඈ) "කුලියට දීමට තිබේ" යනුවෙන් වූ ප්‍රචාරක දැන්වීමක් ;
(ඉ) "විකිණීමට තිබේ" යනුවෙන් වූ ප්‍රචාරක දැන්වීමක් ;
(ඊ) ගෘහනාම පුවරු (එහි විශාලත්වය ප්‍රාදේශීය සභාව විසින් තීරණය කරනු ලැබේ);
(උ) වෘත්තීය කටයුතු සඳහා යොදාගනු ලබන, ප්‍රමාණයෙන් වර්ග මීටර් 0.093ක් නොඉක්මවන නාම පුවරුවක්;
(ඌ) වෙළෙඳ කටයුත්තක් හෝ ව්‍යාපාරයක් සඳහා පාවිච්චි කරන වාහනයක, එම වෙළෙඳ කටයුත්තේ හෝ ව්‍යාපාරයේ ස්වභාවය දැක්වෙන සහ අයිතිකරුගේ නම, ලිපිනය, දුරකථනය හෝ ටෙලෙක්ස් අංකය ආදිය දැක්වෙන ප්‍රචාරක දැන්වීමක්;

08. කිසිම තැනැත්තකු විසින් —

(i) යම් වීදියක, පාරක හෝ අඩි පාරක රිය මඟට උඩින් හෝ හරහා හෝ නෙරා සිටින ආකාරයකට ප්‍රචාරක දැන්වීමක් ප්‍රදර්ශනය කිරීම; හෝ
(ii) පොළවේ සිට මීටර් 12ක් ඉක්මවන උසකින් ඇති යම් පුවරුවක ප්‍රචාරක දැන්වීමක් ප්‍රදර්ශනය කිරීම; හෝ
(iii) කිසියම් වීදියකට හෝ පාරකට මුහුණලා යාව පිහිටි ගොඩනැගිල්ලක මුහුණතෙහි හෝ වෙළෙඳශාලා නාම පුවරුවක හෝ ඒ ගොඩනැගිලි මුහුණතෙහි සීමාව ඉක්මවා යන දිගකින් යුත් ප්‍රචාරක දැන්වීමක් සවි කොට නැතහොත් එල්ලා තැබීම;
(iv) ගුවන් නාම පුවරුවක ස්වරූපයේ ප්‍රචාරක දැන්වීමක් ප්‍රාදේශීය සභාවේ පූර්ව අනුමැතිය ලබා නොගෙන යම් ආකාරයකට තැනීම හෝ ඉදිකිරීම ;

නොකළ යුතුය.

09. කිසිම තැනැත්තකු විසින්, පෞද්ගලික හෝ පොදු ගොඩනැගිල්ලක, පොදු පූජනීය ස්ථානයක, පොදු උද්‍යානයක හෝ යම් පාලමක හෝ පාර හරහා ඇති මගී පාලමක දුරකථන හෝ විදුලි රැහැන් කණුවක, පැති බැම්මක, දුරකථ වේල්ලක, අමුණක, බෝක්කුවක, පර්වතයක, ඉවුරක හෝ ගසක ප්‍රචාරක දැන්වීමක් ප්‍රදර්ශනය නොකළ යුතුය.

10. මේ සභාවේ යෝජනා සම්මතයක නිශ්චය කොට දැක්වෙන සහ ගැසට් පත්‍රයේ යථා පරිදි පළ කරන ලද යම් ප්‍රදේශයක කිසිම ප්‍රචාරක දැන්වීමක්, ඒ දැන්වීම ප්‍රාදේශීය සභාව විසින් අනුමත කළ ආකාරයට තනා හෝ ඉදිකර ඇති වෙළෙඳශාලා පුවරුවක හෝ නාම පුවරුවක් වන්නේ නම් මිස ප්‍රදර්ශනය නොකළ යුතුය.

11. කිසි තැනැත්තෙකු විසින්, ප්‍රාදේශීය සභා ප්‍රදේශය ඇතුළත යම් වීදියක හෝ පාරක —

(i) යම් පුවරුවක, ආධාරකයක හෝ රාමුවක ප්‍රදර්ශිත යම් ප්‍රකාශක දැන්වීමක් ගෙනයාම හෝ ගෙනයාමට සැලැස්වීම නොකළ යුතුය;

(ii) යම් ප්‍රචාරක දැන්වීමක් ප්‍රදර්ශනය කිරීමට හෝ හඳුන්වාදීමේ කාර්යය සඳහා ගුවන් විදුලි යන්ත්‍රයක් ග්‍රැමපෝනයක්, සංගීත භාණ්ඩයක්, සීනුවක් හෝ වෙනත් උපකරණයක් පාවිච්චි නොකළ යුතුය.

12. (i) යම් ප්‍රචාරක දැන්වීමක අවලක්ෂණ හෝ පිළිකුල් සහගත සහ මහජන සදාචාරයට හානිකර යමක් නිරූපණය වන අවස්ථාවක ප්‍රාදේශීය සභාව විසින් ලිඛිත නිවේදනයක් මගින් ඒ නිවේදනයේ නිශ්චය කොට දැක්වෙන යම් කාලයක් ඇතුළත, ඒ ප්‍රචාරක දැන්වීම ප්‍රදර්ශනය කිරීම නතර කරන ලෙස, ඒ ප්‍රචාරක දැන්වීම ප්‍රදර්ශනය සිදු කරන තැනැත්තාට නියම කළ හැකිය.

(ii) යම් අතුරු ව්‍යවස්ථාවේ (i) වැනි ඡේදය යටතේ නිවේදනයක් භාරදෙනු ලැබූ කවර හෝ තැනැත්තකු විසින් එහි නිශ්චය කොට දැක්වෙන කාලය ඇතුළත ඒ නිවේදනය අනුව ක්‍රියා කළ යුතුය.

13. ප්‍රචාරක දැන්වීම් ප්‍රදර්ශනය පිණිස ප්‍රයෝජනයට ගන්නා යම් පුවරුවක අයිතිකරු හෝ බදුකරු විසින් —

(අ) ඒ පුවරුව නිසි අළුත්වැඩියාවෙන් යුතුව සහ තැනැත්තන්ගේ ආරක්ෂාව තහවුරු වන ආකාරයෙන් පවත්වාගෙන යා යුතුය; තවද

(ආ) ඒ පුවරුවේ ඉදිරිපස ප්‍රකටව පෙනෙන තැනක, පැහැදිලි හා කියවිය හැකි අකුරෙන්, ඔහුගේ නම සහ ලිපිනය ප්‍රදර්ශනය කළ යුතුය.

14. යම් ප්‍රචාරක දැන්වීමක් ප්‍රදර්ශනය කිරීම සඳහා නියමිත බලපත්‍ර ගාස්තුව ගෙවා ඇති බව පෙන්වීමට යම් ප්‍රචාරක දැන්වීමක ප්‍රාදේශීය සභාව විසින් ඇතුළත් කර ඇති යම් ලාංඡනයක්, සළකුණක්, අක්ෂරයක්, වචනයක් හෝ ඉලක්කමක් කිසිම තැනැත්තකු විසින් විරූප කිරීම හෝ කරවීම නොකළ යුතුය.

15. මේ අතුරු ව්‍යවස්ථාව පිළිබඳ සෑම උල්ලංඝනය කිරීමක්ම සම්බන්ධයෙන් රුපියල් හත්සිය පනහකට නොවැඩි දඩයකින්ද, ඒ උල්ලංඝණය දිගටම කරගෙන යන අවස්ථාවක වරදකරු කරනු ලැබීමෙන් පසුව හෝ ඒ උල්ලංඝනය කෙරෙහි අවධානය යොමු කරමින් ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා විසින් නැතහොත් සභාපතිවරයා විසින් බලය පවරන ලද නිලධරයකු විසින් යවන ලද ලිඛිත දැන්වීමක් භාරකරනු ලැබීමෙන් පසුව ඒ වරදකරගෙන යන සෑම දිනයක් වෙනුවෙන්ම රුපියල් දෙසිය පනහක් නොඉක්මවන අතිරේක දඩයකින්ද දඬුවම් කරනු ලැබීමට යටත් විය යුතුය.

16. (1) යම් ප්‍රාදේශීය සභා ප්‍රදේශයක් තුළ අවසර පත්‍රයක් නොමැතිව හෝ බලපත්‍රයෙහි යම් කොන්දේසිවලට හෝ නියමයන්ට පටහැනිව හෝ ප්‍රචාරක දැන්වීම් ප්‍රයත්නයක් ආරම්භ කර හෝ පවත්වාගෙන යන හෝ යළි ආරම්භ කර ඇති හෝ සම්පූර්ණ කර ඇති අවස්ථාවක මේ අතුරු ව්‍යවස්ථා යටතේ ඇති වෙනත් ප්‍රතිකර්මයකට අමතරව, ප්‍රාදේශීය සභාව විසින් ලිඛිත දැන්වීමක් මගින් ඒ ප්‍රචාරක ප්‍රයත්නය ක්‍රියාත්මක කරන හෝ ක්‍රියාත්මක කළ හෝ ක්‍රියාත්මක කරවූ දවස් හතකට අඩු නොවන්නාවූද දිනයකදී හෝ ඊට පෙර —

(අ) ඒ ප්‍රචාරක දැන්වීම් කටයුතු නතර කරන ලෙස ; හෝ

(ආ) ඒ ප්‍රචාරක දැන්වීම් කඩා දමන ලෙස හෝ වෙනස් කරන ලෙස හෝ මකා දමන ලෙස හෝ නියම කළ හැකිය.

(2) මේ අතුරු ව්‍යවස්ථාවේ (1) ඡේදය යටතේ දැන්වීමක් භාරකරනු ලැබූ තැනැත්තකු විසින් ඒ දැන්වීමෙහි නිශ්චය කොට දැක්වෙන කාලය ඇතුළත හෝ කාලය දීර්ඝ කරවා ගැනීම සඳහා ඉදිරිපත් කරන ඉල්ලුම්පත්‍රයක් මත ප්‍රාදේශීය සභාව මගින් දීර්ඝ කරන යම් කාලසීමාවක් ඇතුළත හෝ ඒ දැන්වීමෙහි දැක්වෙන කවර හෝ නියමයන් අනුව කටයුතු කළ යුතුය.

(3) (අ) මේ අතුරු ව්‍යවස්ථාවෙහි (1) ඡේදය යටතේ දැන්වීමක් භාරකරනු ලැබූ තැනැත්තකු විසින් එහි සඳහන් කාලසීමාව ඇතුළත හෝ ප්‍රාදේශීය සභාව විසින් දෙනු ලැබිය හැකි යම් වැඩිදුර කාලසීමාවක් ඇතුළත, ඒ දැන්වීමේ නියමයන් අනුව ක්‍රියා කිරීම පැහැර හැරියහොත්, අවස්ථාවෝචිත පරිදි ඒ ප්‍රචාරක දැන්වීම නතර කිරීමට, කඩා දැමීමට, වෙනස් කිරීමට හෝ මකා දැමීමට ප්‍රාදේශීය සභාවට බලය දෙන ආඥාවක් කරන

ලෙස ප්‍රාදේශීය සභාව විසින් නිසි මහේස්ත්‍රාත් අධිකරණයෙන් ඉල්ලීමක් කළ හැකි අතර, අදාළ තැනැත්තාට දැන්වීමක් භාර කරවා, ඔහුට කීමට ඇති කරුණුවලට සවන්දීමෙන් පසුව, ඒ බවට මහේස්ත්‍රාත්වරයා සෑහීමකට පත් වන්නේ නම් එසේ ආඥාවක් මහේස්ත්‍රාත්වරයා විසින් කරනු ලැබිය හැකිය.

(ආ) (1) වැනි ඡේදය යටතේ වූ දැන්වීම අනුව කටයුතු කිරීමට ඒ තැනැත්තා භාර ගතහොත් ඒ තැනැත්තාට එසේ කටයුතු කිරීමට අවස්ථාවක් සලසනු පිණිස සුදුසු යැයි අදහස් කෙරේ නම්, ඒ ආඥාව ක්‍රියාත්මක කිරීමට මාසයක් නොඉක්මවන සුදුසු යයි අදහස් කරන කාලයකට කල් තැබිය හැකිය.

**උපලේඛනය**

| | |
|---|---|
| ආදර්ශ අයදුම්පත්‍රය | I වන කොටස |
| බලපත්‍රයක් දීම සඳහා අයකළ යුතු ගාස්තු | II වන කොටස |
| ප්‍රචාරක දැන්වීම ප්‍රදර්ශනය කිරීම සීමාකර ඇති ප්‍රදේශ | III වන කොටස |

**40 - වාහන සහ සතුන්**

01. වාහන සහ සතුන් පිළිබඳ බදු සම්බන්ධයෙන් වන මේ අතුරු ව්‍යවස්ථාවල පද සම්බන්ධය අනුව අන්‍යාර්ථයක් අවශ්‍ය වේ නම් මිස—

"පනත" යන්නෙන් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත අදහස් වේ.
"ආදායම් පරීක්ෂක" යන්නෙන් සභාවේ ආදායම් පරීක්ෂක අදහස් වේ.

02. පනත මගින් නිදහස් කර ඇති වාහන හැර සභාවේ සීමාව ඇතුළත තබාගෙන ඇති සියළු වාහන පිළිබඳව සහ සෑම අශ්වයකුම, පෝනියකු, කොටළුවකු හෝ අලියකු පිළිබඳ වූ පනතේ 147 වැනි සහ 148 වැනි වගන්තිවල විධිවිධාන යටතේ නියම කර ඇති වාර්ෂික බද්ද එක් එක් වර්ෂයේ මාර්තු මස තිස්එක් වැනි දින හෝ ඊට පෙර සභාවේ කාර්යාලයට ගෙවිය යුතුය.

03. (1) වාර්ෂික බද්ද ගෙවනු ලැබූ සෑම වාහනයක් සඳහාම, ඒ වාහනයට උචිත වූ සභාව විසින් තත් කාර්යය සඳහා නියම කරනු ලැබිය හැකි වූ ද හඳුනාගැනීමේ අක්ෂරය සහ නිකුත් කරන තහඩුව අදාළ වන වර්ෂයද, වාහන ලේඛනයේ දැක්වෙන අනුරූප අංකයද, දැක්වෙන අංකය සහිත ලෝහ තහඩුවක් ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කළ යුතුය. නැතහොත් නිකුත් කිරීමට සැලැස්විය යුතුය.

(2) මේ අතුරු ව්‍යවස්ථාව (1) වැනි ඡේදය යටතේ නිකුත් කරන ලද යම් තහඩුවක්, පාවිච්චිය නිසා හෝ අන් හේතුවක් නිසා හෝ අපැහැදිලි බවට පත් වුවහොත් හෝ විරූප වුවහොත්, එම තහඩුව ප්‍රාදේශීය සභාවට දී රුපියල් හතරක ගෙවීමක් කළ විට අළුතෙන් තහඩුවක් ලබාගැනීමට, ඒ තහඩු අයිතිකරුට හිමිකම් ඇත්තේය.

(3) මේ අතුරු ව්‍යවස්ථාවේ (1) ඡේදය යටතේ නිකුත් කරන ලද යම් තහඩුවක් නැති වී හෝ සොරකම් කර ඇති බවට දිවුරුම් පත්‍රයක් අනුව හෝ අන්‍යාකාරයකින් ප්‍රාදේශීය සභාව සෑහීමකට පත්වේ නම්, එහි අයිතිකරු විසින් ඉල්ලුම්පත්‍රයක් ඉදිරිපත් කොට ඔහු විසින් රුපියල් 4ක් ගෙවනු ලැබූ විට එය නැති වූ හෝ සොරකම් කරන ලද තහඩුව වෙනුවට එහි අයිතිකරුට ප්‍රාදේශීය සභාව විසින් අළුත් තහඩුවක් නිකුත් කළ හැකිය.

04. (1) 3 වැනි අතුරු ව්‍යවස්ථාව යටතේ බලපත්‍ර තහඩුවක් නිකුත් කරනු ලැබූ යම් වාහනයක සන්තකය, භාරය හෝ පාලනය දරන තැනැත්තා විසින් ඒ තහඩුව ඒ වාහනයේ ප්‍රකටව පෙනෙන තැනක සවිකිරීමට සැලැස්විය යුතුය.

(2) මේ අතුරු ව්‍යවස්ථාවේ (1) වැනි ඡේදයේ විධිවිධාන උල්ලංඝනය කරන සෑම තැනැත්තෙක්ම රුපියල් හත්සිය පනහක් නොඉක්මවන දඩයකින් දඬුවම් ලැබීමට යටත් වන්නේය.

05. (1) සභාවේ සීමාව ඇතුළත ඕනෑම පාරක ගමන් කරන ඕනෑම වාහනයක් 4(1) වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ලෝහ තහඩුව පරීක්ෂා කිරීමේ කාර්යය සඳහා ආදායම් පරීක්ෂකවරයා හෝ යම් පොලිස් නිලධාරියකු හෝ ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා විසින් ලියවිල්ලකින් බලය දෙන ලද වෙනත් යම් නිලධරයෙකු විසින් හෝ නතර කර රඳවා තබාගැනීම නිත්‍යානුකූල වන්නේය. එවැනි යම් වාහනයක් පදවන්නා හෝ එය භාරව සිටින තැනැත්තා විසින් සභාපතිවරයාට හෝ ඒ නිලධාරියාට එම පරීක්ෂණය කිරීමට ඉඩ දිය යුතු අතර, අවශ්‍ය විය හැකි සියළු සහය ද දිය යුතු ය.

(2) මේ අතුරු ව්‍යවස්ථාවේ (1) ඡේදයේ විධිවිධාන උල්ලංඝනය කරන කවර හෝ තැනැත්තෙක් රු. 100ක් නොඉක්මවන දඩයකින් දඬුවම් ලැබිය හැකි වරදක් කරන්නේය.

41 - ණය

01. මෙහි පහත සඳහන් කාර්යයන් එකක් හෝ වැඩි ගණනක් සඳහා අවශ්‍ය විය හැකි මුදල් ප්‍රමාණයක්, ප්‍රාදේශීය සභාව විසින් ණයට ගත හැකි ය.

(අ) ප්‍රාදේශීය සභා පනතේ විධිවිධාන යටතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ හෝ භාරගන්නා ස්ථිර ස්වභාවයක වන යම් යම් වැඩක් ක්‍රියාත්මක කිරීම.

(ආ) ප්‍රාදේශීය සභා පනතේ විධිවිධාන යටතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ හෝ භාරගන්නා යම් පොදු සේවාවක් පිහිටුවීම, සම්පූර්ණ කිරීම, වැඩි දියුණු කිරීම හෝ සංවර්ධනය කිරීම.

(ඇ) එවැනි යම් වැඩක් හෝ පොදු සේවාවක කාර්යය සඳහා හෝ ඒ සම්බන්ධයෙන් අවශ්‍ය යම් ඉඩමක් හෝ ගොඩනැගිල්ලක් අත්කර ගැනීම.

(ඈ) එවැනි යම් වැඩක පොදු සේවාවක කාර්යය සඳහා අවශ්‍ය නම් යන්ත්‍ර සූත්‍ර, යන්ත්‍රස්ථාන හෝ උපකරණ සැපයීම.

(ඉ) ප්‍රාදේශීය සභා පනත හෝ වෙනත් යම් ලිඛිත නීතියක් හෝ යටතේ මුදල් ණයට ගැනීමට සභාවට බලය පැවරී ඇති වෙනත් කවර හෝ කාර්යයක්.

02. සභාව විසින් ණයට ලබාගන්නා මුදල් ප්‍රමාණයක් සහ ඒවාට උපචිත වන පොලිය ආපසු ගෙවීම සහතික කරනු පිණිස සභාව විසින් නියම කර අයකර ගන්නා වරිපනම්, බදු සහ බලපත්‍ර ගාස්තු ද, සභාවට අයත් දේපළ සහ සභාවට උපචිත වන වෙනත් යම් ආදායම් ලැබෙන මාර්ග ද ඒ ණය මුදල හෝ මුදල් හෝ ඉන් යම් කොටසක් හෝ දෙනු ලබන්නේ නම්, යම් ණය හිමියකු හෝ ණයහිමියන් විසින් ද, නැතහොත් වෙනුවෙන් ද, ඒ ණයහිමියාට හෝ ණයහිමියන්ට සභාව විසින් උකස්කර පවරා දෙනු ලැබිය හැකි ය.

03. කවර හෝ ප්‍රාදේශීය සභාවක් සභා ප්‍රදේශයෙහි කලින් පැවතියා වූ ද, බලතල කාර්යය සහ කර්තව්‍ය, (1980 අංක 35 දරන සංවර්ධන සභා පනතේ 18 වගන්තියේ (2) වන උප වගන්තියේ විධිවිධාන ප්‍රකාර) සභාව වෙත පැවරී ඇත්තාවූ ද, සංවර්ධන සභාව විසින් ලබාගන්නා ලද ණය වෙනුවෙන් ආපසු ගෙවිය යුතු තිබෙන මුදල් ප්‍රමාණය ද ඇතුළුව ප්‍රාදේශීය සභාව විසින් ලබාගත් ණය අවස්ථාවක ඊට පෙරාතුවම වූ වර්ෂ පහ සඳහා සියළුම වරිපනම් බදු, දේපළ සහ වෙනත් ආදායම් මාර්ගවලින් සභාව විසින් ලබාගන්නා ලද සාධාරණ සාමාන්‍ය වාර්ෂික ආදායම මෙන් පනස් ගුණයක් නොඉක්ම විය යුතු අතර, වර්ෂ පහක් පැවති නොමැති ප්‍රාදේශීය සභාවක් සම්බන්ධයෙන් වන විට, අමාත්‍යවරයාගේ අනුමැතියට යටත්ව සභාව විසින් තක්සේරු කරන ලද එහි එක් වර්ෂයක දළ ආදායම මෙන් දස ගුණයක් නොඉක්මවිය යුතු ය.

04. මේ අතුරු ව්‍යවස්ථාව ක්‍රියාත්මක වීම ආරම්භ වූ දිනයේ දී පැවති යම් ප්‍රමුඛතාවකට හෝ ඒ දිනකට පෙර ඇතිකරගන්නා ලද යම් ඇපකරයක් ප්‍රමුඛතාව කිසිවකින් බලපෑමක් නොවන්නේය.

05. (1) ප්‍රාදේශීය සභා පනතේ 178 වගන්තිය යටතේ ණයට ලබාගන්නා ලද සෑම මුදල් ප්‍රමාණයක්ම අවුරුදු 30ක කාලයක් ඇතුළත ආපසු ගෙවිය යුතු ය.

(2) 2 වන අතුරු ව්‍යවස්ථාවේ නිශ්චයකොට දැක්වෙන කාර්යය සඳහා සභාවක් විසින් යම් මුදල් ප්‍රමාණයක් ණයට ගන්නා අවස්ථාවක, එසේ ප්‍රතිප්‍රදානයක් එම වියදම අර්ථදායි නොමැතිව පවත්නා කාලසීමාව හෝ එම වියදම දැරීම ආරම්භවන මුල් වර්ෂයට පසුව එන මුදල් වර්ෂයේ ආරම්භ මාසයේ සිට අවුරුදු පහක කාලසීමාවක් යන මෙයින් වඩා කෙටි කාලසීමාව සඳහා අත්හිටුවන ලෙස ණයහිමියාගේ එකඟත්වය ඇතිව නියම කිරීම නිත්‍යානුකූල වන්නේය.

06. (1) සභාව විසින් ලබාගන්නා ලද ණය මුදල් සහ ප්‍රදේශය ඇතුළත කලින් පැවති සංවර්ධන සභාව විසින් ලබාගන්නා ලද ණය මුදල් ආපසු ගෙවීම පිණිස සභාව විසින් සලසන ලද ප්‍රතිපාදන දැක්වෙන වාර්තාවක් සපයන ලෙස අමාත්‍යවරයා විසින් ඉල්ලා සිටිනු ලැබීමෙන් මාසයක් ඇතුළත සභාවේ ලේකම්වරයා විසින් එම අමාත්‍යවරයාට යැවිය යුතු ය.

(2) ණයට ගන්නා ලද මුදල් ප්‍රමාණය පිළිබඳ සියළු විස්තර එම වාර්තාවේ ඇතුළත්විය යුතු අතර, එය ලේකම්වරයා විසින් සහතික කර තිබිය යුතු ය.

(3) සභාව විසින් -

(අ) ගෙවිය යුතු යම් වාරිකයක් ගෙවීම හෝ වාර්ෂික ගෙවීම හෝ පැහැර ඇති බව ; හෝ

(ආ) යම් ණයක් නිදහස් කිරීම සඳහා යොදාගත යුතු යම් මුදල් ප්‍රමාණයක් එසේ යොදාගැනීම පැහැර හැර ඇති බව.

මේ අතුරු ව්‍යවස්ථාව යටතේ සපයන ලද යම් වාර්තාවකින් හෝ අන්‍යාකාරයකින් අමාත්‍යවරයාට පෙනී ගියහොත් එම පැහැර හැරීම සිදුකර ඇත්තේ යම් මුදල් ප්‍රමාණයක් සම්බන්ධයෙන් ද. එම මුදල වහාම ගෙවන ලෙස අමාත්‍යවරයා විසින් විධාන කරනු ලැබිය හැකිය. අමාත්‍යවරයාගේ එම විධානය අනුව ක්‍රියාකළ විට සභාව විසින් ඒ බව අමාත්‍යවරයාට දැනුම් දිය යුතුය. අවස්ථාගත තත්ත්වය අනුව අවශ්‍ය යැයි පෙනී ගියහොත් සභාව විසින් අරමුදලින් ගෙවීම් කළ යුතු ය.

7. කිසියම් ගිණුමකට වැය බරක් කළ හැකි වියදමක් දැරීම සඳහා සභාව විසින් ණය මුදලක් ලබාගනු ලැබූ අවස්ථාවක, එම ණය මුදලේ මුල් මුදල ආපසු ගෙවීම සඳහා හෝ ඒ සඳහා පොලී ගෙවීම සඳහා හෝ අවශ්‍ය මුදල් ප්‍රමාණයක් ඒ ගිණුමට හර කළ යුතු ය.

උකස් පිළිබඳ විධිවිධාන

8. (1) මේ අතුරු ව්‍යවස්ථාවල කාර්ය සඳහා තුන්වන අතුරු ව්‍යවස්ථාවේ නිශ්චයකොට දැක්වෙන උකස් ඔප්පුවක් මගින් ඇතිකර ගත යුතු ය.

(2) මේ අතුරු ව්‍යවස්ථා මගින් ඇතිකර ගන්නා උකසකට හිමිකමක් ඇති සෑම තැනැත්තකු විසින්ම ඒ ඔප්පුවක් මගින් පැවරිය හැකි ය.

9. (1) මේ අතුරු ව්‍යවස්ථාව යටතේ සභාව විසින් ඇතිකර ගන්නා ලද උකසට තැනැත්තන් දෙදෙනෙකුට හෝ වැඩි ගණනකට හවුලේ හිමිකම් ඇති අවස්ථාවක, සභාවට ප්‍රතිවිරුද්ධ දැන්වීමක් ලිඛිතව දී ඇත්නම් මිස, ඒ උකස සඳහා ගෙවන යම් පොලියක් වෙනුවෙන් ඒ කවර හෝ එක් තැනැත්තකු විසින් බල සහිත රිසිට්පතක් දිය හැකි ය.

(2) මේ අතුරු ව්‍යවස්ථා යටතේ සභාව විසින් ඇතිකර ගන්නා ලද උකසක් වෙනුවෙන් බාල වයස්කරුවෙකුට ගෙවිය යුතු යම් මුදලක් සඳහා ඒ බාල වයස්කරුගේ භාරකරු විසින් දෙනලද රිසිට්පතක්, සභාවට ප්‍රමාණවත් නිදහස් කිරීමක් වන්නේ ය.

10. (1) මේ අතුරු ව්‍යවස්ථා යටතේ, සභාවක් විසින් උකසක් මගින් ණයට ලබාගන්නා ලද සෑම මුදලක්ම වාර්ෂිකව හෝ අර්ධ වාර්ෂිකව හෝ ත්‍රෛයිමාසිකව හෝ මාසික වාරිකවලින් හෝ ආපසු ගෙවිය යුතු ය.

(2) මේ අතුරු ව්‍යවස්ථාවේ (1) වැනි ඡේදයේ සඳහන් සියළු වාරික, සභාව විසින්, අරමුදලින් ගෙවනු ලැබිය හැකි ය.

**ණය ගැනීමේ පරිපූරක බලතල**

11. (1) 4 වන අතුරු ව්‍යවස්ථාවේ විධිවිධානවලට යටත්ව, සභාව විසින් අමාත්‍යවරයාගේ අනුමැතිය සහ මුදල් විෂය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව, සභාව විසින් ඃ

*(අ)* කිසියම් ගිණුම් කාලසීමාවක් වෙනුවෙන් ලැබිය යුතු මුදල් ලැබෙන සේ, දැරිය යුතුව ඇති හා ඒ වියදම් වැය බරක් කළ හැකි ගිණුම් කාලසීමාව තුළ දැරීමට ඇත්තා වූ ද, ඒ කාලසීමාව සඳහා සභාව විසින් පිළියෙල කරන ලද ඇස්තමේන්තුවල දී ගණන්ගෙන ඇත්තා වූ ද වියදම් දැරීමේ කාර්ය සඳහා ; හෝ

*(ආ)* මේ අතුරු ව්‍යවස්ථාව යටතේ ලබාගැනීමට සභාවට බලය දී ඇති ණයක් ලබාගන්නා තෙක් දැරිය යුතු වියදම් දැරීමේ කාර්ය සඳහා බැංකුවකින් හෝ අන්‍යාකාරයකින් තාවකාලික ණයක් හෝ අයිරාවක් වශයෙන් සභාවට තාවකාලික අවශ්‍ය විය හැකි මුදල් ලබාගත හැකි ය.

(2) (1) වන ඡේදයේ (ආ) විෂය යටතේ මුදල් ණයට ගනු ලැබූ අවස්ථාවක, ඉන් අනතුරුව ඒ ණය මුදල ලබාගත හොත්, එවිට මේ අතුරු ව්‍යවස්ථාවල ඒ ණය ආපසු ගෙවීම විධිමත් කරන විධි විධානවල කාර්ය සඳහා ඉහත කී විෂයය යටතේ ණයට ගන්නා ලද මුදලේ ප්‍රමාණයට, ඒ ණය එකී ඡේදය යටතේ ණය ගැනීම සිදුවූ අවස්ථාවන් වන විට ලබාගෙන තිබුනක් සේ සැලකිය යුතු ය.

12. (1) සභාවක් විසින් අමාත්‍යවරයාගේ අනුමැතිය සහ මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව, පහත සඳහන් කාර්යය එනම් —

*(අ)* මේ අතුරු ව්‍යවස්ථා යටතේ සභාව විසින් කලින් ණයට ගන්නාලද යම් මුදල් සහ සභා ප්‍රදේශය ඇතුළත කලින් පැවති සංවර්ධන සභා විසින් ණයට ගන්නා ලද මුදල් ආපසු ගෙවා නිදහස්වීම;

*(ආ)* කලින් ණයට ගන්නා ලද මුදල් ආපසු ගෙවීම සඳහා සභාවේ වෙනත් මුදල්වලින් පූර්ව දොළොස් මාසය තුළ තාවකාලිකව ලබාගෙන ඇත්තා වූ ද, එසේ ආපසු ගෙවීම කළ අවස්ථාවේ දී ණයට ගන්නා මුදලින් ප්‍රතියෝජනය කිරීමට අදහස් කලා වූ ද, මුදල් ප්‍රතියෝජනය කිරීම.

යන කාර්යය සඳහා මුදල් ණයට ගත හැකිය. එසේ වුව ද කලින් ණයට ගන්නා ලදුව,

*(අ)* වාරිකවලින් හෝ වාර්ෂික ගෙවීම්වලින්,

*(ආ)* ඉඩම් විකිණීමෙන් ලැබුණු මුදල්වලින්,

*(ඇ)* ඒ කාර්යය සඳහා ණයට ගන්නා ලද මුදල් හැර ආපසු ගෙවීමේ කාර්යය සඳහා නිසි පරිදි යොදාගත හැකි ප්‍රාග්ධන මුදලින් ආපසු ගෙවා ඇති මුදල් ප්‍රතියෝජනය කිරීමේ කාර්යය සඳහා, මේ නියෝගය යටතේ මුදල් ණයට ගැනීමට සභාවකට බලය නොමැත.

02. මේ අතුරු ව්‍යවස්ථා යටතේ ණයට ගන්නා ලද යම් මුදල් මුල් ණය මුදලේම කොටසක් වන්නාක් සේ, ආපසු ගෙවීමේ කාර්යය සඳහා සැලකිය යුතු අතර, නියමිත කාලසීමාවේ නොගෙවී ඉතිරිව ඇති කාල ඇතුළත ආපසු ගෙවිය යුතුය. තව ද තත්කාලයෙහි මුල් ණය කෙරෙහි අදාළ වන විධිවිධාන මේ අතුරු ව්‍යවස්ථාව යටතේ ණයට ගන්නා මුදල් කෙරෙහි ද අදාළ විය යුතු ය.

එසේ වුව ද ණයට ගන්නා ලද මුදල් ආපසු ගෙවීමේ කාලසීමා දීර්ඝ කරවා ගැනීමේ කාර්යය සඳහා සභාව විසින් ඉදිරිපත් කරන ලද ඉල්ලුම්පත්‍රයක් අනුව, අමාත්‍යවරයා විසින්, මුදල් විෂයභාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව, ණය හිමියා විමසා මේ නියෝගය යටතේ ණයට ගන්නා ලද මුදල් ආපසු ගෙවීම සඳහා ඇති කාලසීමාව, සුදුසු යයි අමාත්‍යවරයා අදහස් කරන දිනයක් දක්වා දීර්ඝ කළ හැකි ය.

**42 - බදු**

01. ප්‍රාදේශීය සභා ප්‍රදේශය ඇතුළත යම් බද්දක් නියම කිරීමේ හෝ අයකර ගැනීමේ කාර්යය සඳහා ලේකම්වරයාගේ මතය අනුව අවශ්‍ය විය හැකි තොරතුරු නිසැකව දැන ගැනීම පිණිස ලේකම්වරයා විසින් නිශ්චය කරනු ලැබිය හැකි ආකෘතියක් යම් වාර්තා සපයන ලෙස සහ එසේ නිශ්චය කරනු ලැබිය හැකි යම් තොරතුරු පිළිබඳ ප්‍රකාශනයක් කරන ලෙස ලේකම්වරයා විසින් ඒ බද්දට යටත් හෝ යටත්වීමට ඉඩ ඇති සියළු තැනැත්තන්ට හෝ ප්‍රාදේශීය සභා පනත යටතේ යම් බද්දක් නියම කර ඇති හෝ නියම කරනු ලැබිය හැකි යම් දේපළක අයිතිකරුවන් හෝ පදිංචිකරුවන් වන සියළු තැනැත්තන්ට හෝ අවශ්‍ය යැයි ලේකම්වරයා සලකන්නේ නම් ප්‍රාදේශීය සභා ප්‍රදේශය ඇතුළත සියළු ගෘහ මූලිකයන්ට හෝ ලියවිල්ලකින් වූ දැන්වීමක් මගින් නියම කරනු ලැබිය හැකි ය.

02. මේ අතුරු ව්‍යවස්ථාව යටතේ දැන්වීමක් භාරදෙනු ලැබූ සෑම තැනැත්තෙක්ම ඒ දැන්වීම ඔහුට ලැබී දවස් 14ක් ඇතුළත, ඒ දැන්වීම මගින් ඉල්ලා ඇති සියළු තොරතුරු ලියවිල්ලක් මගින් සැපයිය යුතු ය.

03. ඒ දැන්වීමට ආකෘති පත්‍රයක් යා කර ඇති අවස්ථාවක, ඒ තොරතුරු ඒ ආකෘතියෙහි සැපයිය යුතු අතර, එය ඒ තැනැත්තා විසින් අත්සන් කොට දාතම යොදා ප්‍රාදේශීය සභා කාර්යාලයට එවිය යුතුය. නැතහොත් භාරදිය යුතු ය.

04. තමා වෙත පළවන අතුරු ව්‍යවස්ථාව යටතේ නිකුත් කරන ලද දැන්වීමක් භාර ගැනීම ප්‍රතික්ෂේප වන්නා වූ හෝ පළවන අතුරු ව්‍යවස්ථාවේ සඳහන් තොරතුරු නිශ්චිත නියම කොට ඇති කාලසීමාව ඇතුළත ඒ තොරතුරු සැපයීම ප්‍රතික්ෂේප කරන්නා වූ හෝ නොසලකා හරින හෝ නොකර හරින හෝ කිසියම් වැදගත් විස්තරයක් සම්බන්ධයෙන් තමාගේ දැනීම අනුව අසත්‍ය හෝ නිවැරදි නොවන යම් තොරතුරක් සපයන්නා වූ කවර හෝ තැනැත්තෙක් වරදක් කරන අතර වරදකරු කරනු ලැබූ විට, රුපියල් හත්සිය පනහක් නොඉක්මවන දඩයකට ද, ඒ වරද සම්බන්ධයෙන් නිසි අධිකරණ බලය ඇති අධිකරණයක් විසින් වරදකරු කරනු ලැබීමෙන් පසුව ඒ වරද තවදුරටත් කරගෙන යන එක් එක් දවස වෙනුවෙන් රුපියල් සියයක් නොඉක්මවන අතිරේක දඩයකට ද යටත් වන්නේ ය.

05. මේ අතුරු ව්‍යවස්ථාවල "ලේකම්වරයා" යන්නෙන් ..... ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා අදහස් වන්නේ ය.

03-894

# විවිධ දැන්වීම්

## චාවකච්චේරි නගර සභාව

බලපත්‍ර ගාස්තු හා බදු - 2012

**නගර සභා ආඥාපනත (255 වැනි අධිකාරය)**

1979 අංක 42 දරන මහනගර සභා, නගර සභා (සංශෝධන) පනතිනුත්, 1985 අංක 20 දරන (සංශෝධන) පනතිනුත් සංශෝධනය කරන ලද නගර සභා ආඥාපනතේ (255 වැනි අධිකාරය) 162 වැනි වගන්තියේ බලතල ප්‍රකාරව 164, 164අ,ආ, 165 වගන්තිවලට අනුව 12% වටිනාකම එක්කළ බද්ද, 10% මුද්දර ගාස්තු, 2% රට නගා සිටුවීමේ බද්ද යනාදිය එක් කරමින් පහතින් දක්වා ඇති උපලේඛන අනුව 2012 වසර සඳහා බලපත්‍ර ගාස්තු හා බදු අයකිරීමට චාවකච්චේරි නගර සභාවෙහි රැස්වීම් තීරණ අංක 9(ii) න් තීරණය කර ඇති බව මෙයින් දන්වා සිටිමි.

මෙම බලපත්‍ර ගාස්තු හා බදු 2012 වසරේ මාර්තු මස 31 වැනි දිනට හෝ ඊට ප්‍රථමයෙන් ගෙවීම් කළ යුතුවේ.

කලින් තක්සේරු නොකරන ලද ව්‍යාපාර ස්ථානයක් සම්බන්ධයෙන් නගර සභාවේ රැස්වීම් තීරණය මගින් කටයුතු කරනු ඇත. තාවකාලික තක්සේරු කිරීමකට අනුව බලපත්‍ර ගාස්තු ගෙවීම් කළ යුතුවේ.

එක සමාන බදු තක්සේරු අංකයක් යටතේ අන් කර්මාන්ත (වෙළඳාම් එකකට වැඩි සංඛ්‍යාවකින්) කරනු ලබන්නේ නම් එවැනි එක් එක් අන් කර්මාන්තයකටම (එක් වෙළඳාමක්) අදාල කාර්යය සඳහා ප්‍රයෝජනයට ගන්නා ඉඩම් ප්‍රමාණය, තක්සේරු කරන ලද වාර්ෂික වටිනාකම පදනම් කරගත් ගාස්තු නැතහොත් බදු ප්‍රතිශතය තීරණය කිරීමත් සමග එම බදු ප්‍රතිශතය ගාස්තු ලෙස ගෙවීම් කළ යුතුවේ.

ඊ. දේවසගායම්පිල්ලෙයි,<br>සභාපති,<br>නගර සභාව, චාවකච්චේරිය.

2012 මාර්තු මස 01 වැනි දින,<br>නගර සභා කාර්යාලය,<br>චාවකච්චේරිය.

*(ඒ) අන්තරායදායක වෘත්තීන් :*

| *අනු. අංකය* | *ව්‍යාපාරයේ ස්වභාවය* | *වාර්ෂික බද්ද* *රු. 500 නොඉක්මවන* | *රු. 500ත් රු. 750ත් අතර* | *රු. 750 ත් රු. 1,500ත් අතර* | *රු. 1,500 ඉක්මවන* |
|---|---|---|---|---|---|
| | | *රු.* | *රු.* | *රු.* | *රු.* |
| 01. | හෝටලයක් පවත්වාගෙන යාම | 400 | 500 | 750 | 1,000 |
| 02. | නවාතැන් පොළක් පවත්වාගෙන යාම | 300 | 400 | 500 | 1,000 |
| 03. | භෝජනාගාරයක් පවත්වාගෙන යාම | 200 | 250 | 300 | 750 |
| 04. | තේ පැන් ශාලාවක් පවත්වාගෙන යාම | 150 | 200 | 300 | 750 |
| 05. | තේ පැන් ශාලාවක් සහ භෝජනාගාරයක් පවත්වාගෙන යාම | 200 | 250 | 300 | 1,000 |
| 06. | සිසිල් පැන් අලෙවි සලක් පවත්වාගෙන යාම | 200 | 250 | 300 | 750 |
| 07. | සිසිල් පැන් නිෂ්පාදනය සහ අලෙවිය | 250 | 300 | 350 | 1,000 |
| 08. | පාන් පෝරණුවක් පවත්වාගෙන යාම | 350 | 400 | 450 | 1,000 |
| 09. | මෝටර් රථ අලුත් වැඩියා කිරීමේ ස්ථාන : | | | | |
| | (අ) ලේත් යන්ත්‍ර වැඩ, ස්ප්‍රේ පේන්ටිං ටිංකරිං වැඩ | 300 | 350 | 400 | 750 |
| | (ආ) විදුලි/ගෑස් වෙල්ඩිං සමග මෝටර් වාහන අළුත්වැඩියා කිරීම | 350 | 400 | 450 | 1,000 |
| | (ඇ) ලේත් වැඩ පමණක් | 250 | 300 | 350 | 750 |
| | (ඈ) මෝටර් රථ අලුත්වැඩියා කිරීම් පමණක් | 450 | 500 | 600 | 1,000 |
| 10. | මෝටර් රථ සර්විස් කිරීම | 400 | 500 | 600 | 1,000 |
| 11. | ටයර් ටියුබ් වෙල්කනයිස් කිරීම | 250 | 300 | 350 | 750 |
| 12. | මෝටර් විදුලි රැහැන් නැවත සවිකිරීම | 100 | 150 | 200 | 500 |
| 13. | පාපැදි අලුත් වැඩියා කිරීමේ ස්ථානයක් | 150 | 200 | 300 | 750 |
| 14. | දර අලෙවි ස්ථාන | 100 | 150 | 200 | 500 |
| 15. | දැව කපන ස්ථාන පවත්වාගෙන යාම (යන්ත්‍රෝපකරණ) | 300 | 350 | 400 | 1,000 |
| 16. | දැව කපන ස්ථාන පවත්වාගෙන යාම (පිරිස් බල) | 200 | 250 | 300 | 500 |
| 17. | කපාපු දැව අලෙවිය | 350 | 400 | 450 | 1,000 |
| 18. | වඩු වැඩ : | | | | |
| | (අ) මෝටර් රථ බොඩි සෑදීම | 400 | 500 | 600 | 1,000 |
| | (ආ) ගෘහ භාණ්ඩ නිපදවීම | 350 | 400 | 450 | 1,000 |

| අනු. අංකය | ව්‍යාපාරයේ ස්වභාවය | වාර්ෂික බද්ද රු. 500 නොඉක්මවන | රු. 500ත් රු. 750ත් අතර | රු. 750 ත් රු. 1,500ත් අතර | රු. 1,500 ඉක්මවන |
|---|---|---|---|---|---|
| | | රු. | රු. | රු. | රු. |
| | (ඇ) සාමාන්‍ය වඩු වැඩ | 250 | 300 | 350 | 750 |
| 19. | රන් ආභරණ වැඩපල : | | | | |
| | (අ) එක් අයෙක් වැඩ කරන | 350 | 400 | 450 | 500 |
| | (ආ) එක් අයෙකුට වඩා වැඩි | 400 | 500 | 600 | 1,000 |
| 20. | කොන්ඩා මෝස්තර කිරීමේ ස්ථාන | | | | |
| | (අ) එක් අයෙක් වැඩ කරන | 250 | 300 | 350 | 500 |
| | (ආ) එක් අයෙකුට වඩා වැඩි | 350 | 400 | 450 | 750 |
| 21. | රෙදි සෝදන ස්ථාන (ලොන්ඩරිය) | 200 | 250 | 300 | 500 |
| 22. | බැටරි චාර්ජ් කිරීමේ ස්ථාන | 250 | 300 | 350 | 500 |
| 23. | යකඩ කම්හල් පවත්වාගෙන යාම | 200 | 250 | 300 | 500 |
| 24. | විදුලි, ගෑස් වෙල්ඩිං වැඩපළ | 400 | 500 | 600 | 1,000 |
| 25. | මස් අලෙවි සල | 400 | 500 | 600 | 1,000 |
| 26. | රා තැබෑරුම් පවත්වාගෙන යාම | 600 | 700 | 850 | 1,000 |
| 27. | මත්පැන් අලෙවි සල | 400 | 500 | 800 | 1,000 |
| 28. | පෙට්‍රල්, ඩීසල්, භූමිතෙල් වර්ග පිරවුම්හල | 450 | 500 | 800 | 1,000 |
| 29. | කෘෂිකාර්මික රසායන ද්‍රව්‍ය අලෙවිය | 400 | 450 | 500 | 1,000 |
| 30. | රෙදිපිලිවලට සායම් දැමීම, මුද්‍රණ වැඩ | 350 | 400 | 450 | 500 |
| 31. | මුද්‍රණාලයක් පවත්වාගෙන යාම | 350 | 400 | 450 | 1,000 |
| 32. | මිරිස්, ධාන්‍ය ඇඹරුම් හල | 350 | 400 | 500 | 800 |
| 33. | සහල් මෝල සහ ඇඹරුම්හල | 400 | 500 | 600 | 1,000 |
| 34. | සිමෙන්ති ගබඩාකර අලෙවි කිරීම | 300 | 350 | 400 | 1,000 |
| 35. | උළු කැට, සීට්, ගඩොල්, ගැල්වනයිස් තහඩු රැස්කර අලෙවි කිරීම | 300 | 350 | 400 | 1,000 |
| 36. | යන්ත්‍රෝපකරණ මගින් ගල් කැපීම | 450 | 550 | 650 | 1,000 |
| 37. | ඡායාරූප ගැනීමේ ස්ථානයක් | 400 | 450 | 500 | 750 |
| 38. | පුද්ගලික සන්නිවේදන ස්ථානයක් | 300 | 500 | 750 | 1,000 |
| 39. | ටිංකරින් වැඩකරන ස්ථානයක් | 200 | 300 | 400 | 500 |
| 40. | කුකුල් කොටුවක් පවත්වාගෙන යාම (කුකුළන් 50ටවැඩි) | 200 | 400 | 500 | 1,000 |
| 41. | වාහනයක් මගින් අයිස් ක්‍රීම් අලෙවි කිරීම | - | - | - | 1,000 |
| 42. | ගමනාගමන සේවා ස්ථානයක් | 250 | 500 | 750 | 800 |
| 43. | හුණු මෝලක් පවත්වාගෙන යාම | 250 | 300 | 350 | 400 |
| 44. | වෛද්‍ය රසායනාගාරයක් පවත්වාගෙන යාම | 250 | 300 | 400 | 500 |
| 45. | ගෑස් සිලින්ඩර අලෙවි සල | 300 | 350 | 400 | 1,000 |
| 46. | කොහු හස්ත කර්මාන්ත | 200 | 250 | 300 | 500 |
| 47. | කරවල රැස්කර අලෙවි කිරීම | 200 | 250 | 300 | 1,000 |
| 48. | පපඩම් සාදා අලෙවි කිරීම | 200 | 250 | 300 | 500 |
| 49. | පුද්ගලික තැපැල් කාර්යාලයක් පවත්වාගෙන යාම | 300 | 600 | 750 | 1,000 |
| 50. | කිරි වර්ග අලෙවි සල | 100 | 500 | 750 | 1,000 |
| 51. | පාන්, බිස්කට්, පැණි රස කෑම අලෙවි සැල | 200 | 400 | 500 | 800 |
| 52. | ගෑස් පිරවූ බීම, පළතුරු යුෂ නිෂ්පාදන කිරීමේ ස්ථාන | 200 | 300 | 400 | 1,000 |
| 53. | විදුලි පංකා අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් | 200 | 300 | 400 | 700 |
| 54. | විදුලි කණු, කොන්ක්‍රීට් ගල් නිපදවන ස්ථානයක් | 450 | 600 | 700 | 1,000 |
| 55. | ජංගම ෂෝට් ඊට්ස් අලෙවි සැලක් | 200 | 300 | 400 | 500 |
| 56. | යුෂ නිපදවන ස්ථානයක් | 200 | 300 | 400 | 500 |
| 57. | සත්ත්ව චිකිත්සාගාරයක් | 250 | 500 | 750 | 1,000 |
| 58. | මත්පැන් නිපදවන ස්ථාන | 1,000 | 2,000 | 2,500 | 3,000 |
| 59. | ප්ලාස්ටික් වැද්දුම් වැඩ කිරීමේ ස්ථානයක් | 300 | 500 | 750 | 1,000 |
| 60. | ගොඩනැගිලි ද්‍රව්‍ය විකිණීම | 3,000 | 4,000 | 4,000 | 5,000 |
| 61. | සිමෙන්ති ද්‍රව්‍ය නිපදවීම, විකිණීම | 1,500 | 2,500 | 2,500 | 3,000 |
| 62. | ප්ලාස්ටික් භාණ්ඩ නිපදවීම, විකිණීම | 1,500 | 2,000 | 2,000 | 2,500 |
| 63. | තෙල් නිෂ්පාදන හල | 1,000 | 2,000 | 2,000 | 3,000 |
| 64. | ඇලුමිනියම් සවිකිරීම් | 1,000 | 2,000 | 2,000 | 3,000 |
| 65. | අන්තර්ජාල පහසුකම් ලබාදීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම | 500 | 1,000 | 1,000 | 1,500 |
| 66. | විදුලි යන්ත්‍ර හා ශබ්ද විකාශන යන්ත්‍ර කුලියට දීම | 1,000 | 2,000 | 3,000 | - |
| 67. | දුරකථන සම්ප්‍රේෂණ කුලුණු | 10,000 | 10,000 | 10,000 | 10,000 |

| අනු. අංකය | ව්‍යාපාරයේ ස්වභාවය | වාර්ෂික බද්ද<br>රු. 500 නොඉක්මවන<br>රු. | <br>රු. 500ත් රු. 750ත් අතර<br>රු. | <br>රු. 750 ත් රු. 1,500ත් අතර<br>රු. | <br>රු. 1,500 ඉක්මවන<br>රු. |
|---|---|---|---|---|---|
| (බී) අනතුරු රහිත වෘත්තීන් : | | | | | |
| 01. | රෙදි සාප්පු | 400 | 500 | 700 | 1,000 |
| 02. | රෙදි මසන ස්ථානය | | | | |
| | (අ) එක් මැහුම්කරුවෙක් පමණක් | 200 | 250 | 300 | 350 |
| | (ආ) 2-3ත් අතර මැහුම්කරුවන් | 250 | 300 | 350 | 500 |
| | (ඇ) 3ට වඩා වැඩි මැහුම්කරුවන් | 300 | 350 | 400 | 1,000 |
| 03. | මැහුම් යන්ත්‍ර අලෙවි කරන ස්ථානයක් | 400 | 500 | 600 | 1,000 |
| 04. | පේෂ කර්මාන්ත ස්ථානයක් | 300 | 350 | 400 | 500 |
| 05. | යාන්ත්‍රික පේෂ කර්මාන්ත ස්ථානයක් | 400 | 500 | 600 | 1,000 |
| 06. | රන් ආභරණ සාප්පුව | 300 | 450 | 600 | 1,000 |
| 07. | රන් ආභරණ නිෂ්පාදනය සහ අලෙවි ස්ථානයක් | 400 | 500 | 750 | 1,000 |
| 08. | ඉංග්‍රීසි බෙහෙත් අලෙවි ස්ථානයක් | 300 | 350 | 400 | 1,000 |
| 09. | ආයුර්වේද බෙහෙත් අලෙවි ස්ථානයක් | 150 | 200 | 250 | 500 |
| 10. | කුළුබඩු සාප්පුවක් | 500 | 700 | 900 | 1,000 |
| 11. | මෝටර් රථ අමතර කොටස් විකිණීමේ ස්ථානයක් | 400 | 500 | 750 | 1,000 |
| 12. | පාපැදි අමතර කොටස් විකිණීමේ ස්ථානයක් | 150 | 200 | 250 | 1,000 |
| 13. | පාවහන් හා සම්භාණ්ඩ අලෙවි ස්ථානයක් | 400 | 500 | 700 | 1,000 |
| 14. | සීට් වර්ග කුෂන් කිරීමේ ස්ථානයක් | 400 | 450 | 500 | 600 |
| 15. | විදුලි උපකරණ අලෙවි ස්ථානයක් | 250 | 300 | 350 | 1,000 |
| 16. | පටිගත කිරීමේ ස්ථානයක් | 150 | 200 | 250 | 800 |
| 17. | ඔරලෝසු අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් | 150 | 200 | 250 | 500 |
| 18. | මැටි බඳුන් විකිණීමේ ස්ථානයක් | 200 | 250 | 300 | 500 |
| 19. | පොත්හලක් පවත්වාගෙන යාම | 200 | 250 | 300 | 1,000 |
| 20. | බුලත්, පුවක්, දුම්කොළ, සුරුට්ටු විකිණීම | 100 | 150 | 200 | 500 |
| 21. | මිනී පෙට්ටි විකිණීමේ ස්ථානයක් | 150 | 500 | 800 | 1,000 |
| 22. | විසිතුරු භාණ්ඩ විකිණීමේ ස්ථානයක් | 150 | 500 | 800 | 1,000 |
| 23. | කිරි සහ මුදවපු කිරි විකිණීම | 100 | 150 | 200 | 500 |
| 24. | පුටු, මේස සහ උත්සව භාණ්ඩ කුලියට දීම | 150 | 500 | 800 | 1,000 |
| 25. | පුවත්පත්, සඟරා අලෙවි ස්ථාන | 100 | 150 | 200 | 500 |
| 26. | රූප රාමු කිරීම | 200 | 250 | 300 | 500 |
| 27. | යකඩ භාණ්ඩ අලෙවි සැලක් | 400 | 600 | 800 | 1,000 |
| 28. | ගුවන් විදුලි යන්ත්‍ර අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් | 300 | 500 | 700 | 800 |
| 29. | ඇලුමිනියම්, රිදී භාණ්ඩ විකිණීම | 400 | 600 | 800 | 700 |
| 30. | මිරිස් එකතු කිරීමේ ස්ථානයක් | 400 | 500 | 600 | 1,000 |
| 31. | සහල් එකතු කිරීමේ ස්ථානයක් | 400 | 500 | 600 | 700 |
| 32. | තල තෙල් එකතු කිරීමේ ස්ථානයක් (ලීටර් 100ට වඩා වැඩි) | 400 | 500 | 600 | 700 |
| 33. | පොල් තෙල් එකතු කිරීමේ ස්ථානයක් (ලීටර් 100 ට වඩා වැඩි) | 100 | 300 | 400 | 500 |
| 34. | සත්ව ආහාර විකිණීමේ ස්ථානයක් | 250 | 500 | 700 | 1,000 |
| 35. | ගෘහ භාණ්ඩ විකිණීමේ ස්ථානයක් | 350 | 400 | 450 | 500 |
| 36. | තේ කොළ එකතු කිරීමේ සහ අලෙවි ස්ථානයක් (කිලෝග්‍රෑම් 250ට වඩා වැඩි) | 250 | 300 | 350 | 400 |
| 37. | කුඩා පරිමාණ කර්මාන්ත | 150 | 200 | 200 | 250 |
| 38. | ශබ්ද විකාශන කුලියට දීම | 100 | 150 | 200 | 250 |
| 39. | ඡායා පිටපත් කිරීමේ ස්ථානයක් | 100 | 150 | 400 | 500 |
| 40. | රියැදුරු පුහුණු ස්ථානයක් | 400 | 450 | 500 | 1,000 |
| 41. | යතුරු පැදි විකිණීමේ ස්ථානයක් | 400 | 500 | 700 | 1,000 |
| 42. | පරිගණක පුහුණු මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම | 450 | 500 | 750 | 1,000 |
| 43. | පුද්ගලික ඉංග්‍රීසි වෛද්‍ය මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම | 400 | 600 | 800 | 1,000 |
| 44. | පුද්ගලික වෛද්‍ය තාක්ෂණ ස්ථානයක් | 250 | 300 | 400 | 500 |
| 45. | පොදු ශාලා පවත්වාගෙන යාම | 250 | 500 | 750 | 1,000 |
| 46. | ඇස් කණ්ණාඩි අලුත්වැඩියා කිරීම සහ අලෙවිය | 400 | 500 | 600 | 800 |
| 47. | රූපලාවන්‍ය මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම | 350 | 400 | 450 | 500 |
| 48. | දන්ත වෛද්‍ය මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම | 400 | 500 | 600 | 700 |

| අනු. අංකය | ව්‍යාපාරයේ ස්වභාවය | වාර්ෂික බද්ද රු. 500 නොඉක්මවන රු. | රු. 500ත් රු. 750ත් අතර රු. | රු. 750 ත් රු. 1,500ත් අතර රු. | රු. 1,500න් ඉහල රු. |
|---|---|---|---|---|---|
| 49. | රබර් මුද්‍රා නිෂ්පාදන මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම | 150 | 200 | 250 | 500 |
| 50. | පරිගණක හා පරිගණක අමතර කොටස් අලෙවි ස්ථානය | 350 | 400 | 450 | 1,000 |
| 51. | හිස් ගෝනි, හිස් බෝතල් රැස්කර අලෙවිකිරීම | 150 | 200 | 250 | 300 |
| 52. | ලෝහ, දැව ගෘහ භාණ්ඩ අලෙවි සැල | 250 | 300 | 400 | 1,000 |
| 53. | චිත්‍රපට තැටි කුලියට දීම | 150 | 200 | 250 | 500 |
| 54. | තීන්ත වර්ග අලෙවි සැල | 500 | 750 | 1,000 | 1,200 |
| 55. | සිනමා ශාලාවක් පවත්වාගෙන යාම | 500 | 750 | 1,000 | 1,200 |
| 56. | මෝටර් රථ අලෙවි සැල | 1,000 | 1,500 | 2,000 | 2,500 |
| 57. | පාපැදි අලෙවි සැල | 750 | 1,000 | 1,500 | 2,000 |
| 58. | ජංගම දුරකථන අලෙවි සැල | 750 | 1,000 | 1,500 | 2,000 |
| 59. | ජංගම දුරකථන අලෙවිය සහ අළුත්වැඩියා කිරීම | 750 | 1,000 | 2,000 | 2,500 |
| 60. | මංගල්‍ය ශාලාවක් පවත්වාගෙන යාම | 1,000 | 1,500 | 2,000 | 2,500 |
| 61. | නවාතැන් පවත්වාගෙන යාම | 1,000 | 1,500 | 2,000 | 2,500 |
| 62. | ධාන්‍ය වර්ග ඇසුරුම් කිරීමේ ස්ථානය | 300 | 600 | 900 | 1,200 |
| 63. | කාය වර්ධන මධ්‍යස්ථානය | 300 | 500 | 750 | 1,000 |
| 64. | කොන්ක්‍රීට් කණු, ගල් සාදන ස්ථානය | 1,000 | 2,000 | 2,500 | 3,000 |
| 65. | පරණ යකඩ රැස්කර අලෙවි කිරීමේ ස්ථානය | 750 | 1,000 | 1,500 | 2,000 |
| 66. | පාර්සල් යැවීමේ සේවය | 750 | 1,000 | 1,500 | 2,000 |
| 67. | වීඩියෝ පටිගත කිරීම | 500 | 1,000 | 1,500 | 2,000 |
| 68. | මැහුම් යන්ත්‍ර අළුත්වැඩියා කිරීම | 250 | 500 | 750 | 1,000 |
| 69. | පරිගණක අළුත්වැඩියා කිරීම | 1,000 | 1,500 | 1,500 | 2,000 |
| 70. | වාහන, යන්ත්‍රෝපකරණ කුලියට දීම, | 1,000 | 2,000 | 2,000 | 3,000 |
| 71. | නොයෙක් වර්ගයේ ලුණු විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 | 1,000 | 1,000 | 1,500 |
| 72. | ජිම් මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම | 500 | 1,000 | 1,000 | 1,500 |
| 73. | ප්ලාස්ටික් භාණ්ඩ තොග විකිණීම | 1,000 | 2,000 | 2,000 | 3,000 |
| 74. | පුද්ගලික ආයුර්වේද වෛද්‍ය මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම | 500 | 1,000 | 1,000 | 1,500 |

(සී) සුවිශේෂී වෘත්තීන්

| අනු අංකය | ව්‍යාපාරයේ ස්වභාවය | වාර්ෂික බද්ද රු. 500 නොඉක්මවන රු. | රු. 500ත් රු. 750ත් අතර රු. | රු. 750 ත් රු. 1,500ත් අතර රු. | රු. 1,500න් ඉහල රු. |
|---|---|---|---|---|---|
| 01. | බැංකු | 3,000 | 4,000 | 6,000 | 7,500 |
| 02. | රක්ෂණ ආයතන | 3,000 | 4,000 | 6,000 | 7,500 |
| 03. | පුද්ගලික මූල්‍ය ආයතන | 3,000 | 4,000 | 6,000 | 7,500 |
| 04. | උකස් ගන්නා ස්ථානය | 3,000 | 4,000 | 6,000 | 7,500 |
| 05. | නොතාරිස් | 300 | 500 | 700 | 1,000 |
| 06. | සැලසුම් ශිල්ප ස්ථානය | 500 | 750 | 1,000 | 1,500 |
| 07. | කොන්ත්‍රාත්කරු | 3,000 | 4,000 | 5,000 | 6,000 |
| 08. | විගණකවරු | 500 | 750 | 1,000 | 1,500 |
| 09. | පුද්ගලික අධ්‍යාපන ආයතනය | 500 | 750 | 1,000 | 1,500 |
| 10. | ගණකාධිකාරීන් | 400 | 600 | 800 | 1,000 |
| 11. | මුදල් පොලියට දීමේ ස්ථානය | 400 | 600 | 800 | 1,000 |
| 12. | තැරැව්කරු | 400 | 600 | 800 | 1,000 |
| 13. | මිනින්දෝරු | 500 | 750 | 1,000 | 1,500 |
| 14. | ගමනාගමන නියෝජිත | 500 | 750 | 1,000 | 1,500 |
| 15. | රැකියා නියෝජිත | 500 | 750 | 1,000 | 1,500 |
| 16. | විදුලි සැපයුම්කරුවන් | 500 | 750 | 1,000 | 1,500 |
| 17. | නල සවිකරන්නන් | 500 | 750 | 1,000 | 1,500 |
| 18. | රැහැන් (කේබල්) රූපවාහිනී සේවය ලබාදෙන්නන් | 1,000 | 1,500 | 2,000 | 3,000 |
| 19. | ප්‍රචාරක සේවය | 300 | 400 | 500 | 600 |
| 20. | පුද්ගලික පෙර පාසැල් : | | | | |
| | (අ) සිසුන් 30ට අඩු | - | - | - | 300 |
| | (ආ) සිසුන් 30ට වැඩි | - | - | - | 500 |
| 21. | පුද්ගලික පාසැල් | 1,000 | 2,000 | 2,000 | 3,000 |
| 22. | තැපැල් සේවය | 500 | 1,000 | 1,000 | 1,500 |

03-790

**චාවකච්චේරි නගර සභාව**

සේවා ගාස්තු අයකිරීම් - 2012

චාවකච්චේරි නගර සභාවෙන් 2012 ජනවාරි මස 20 වැනි දින පවත්වන ලද මාසික සභා රැස්වීමේදී තීරණ අංක 9(1) මගින් පහත දක්වා ඇති සේවා ගාස්තු 2012 වසරට පනවා අයකිරීමට සභාවෙන් අනුමැතිය ලබාදී ඇති බව මෙයින් දැනුම් දෙමි.

ඊ. දේවසගායම්පිල්ලෙයි,
සභාපති,
නගර සභාව, චාවකච්චේරිය.

2012 මාර්තු මස 01 වැනි දින,
නගර සභා කාර්යාලය,
චාවකච්චේරිය.

*රු. ශත*

01. *ගොඩනැගිලි ඉල්ලුම්පත්‍ර අංශය :-*

| | | රු. ශත | |
|---|---|---|---|
| (i) | ගොඩනැගිලි ඉල්ලුම්පත්‍රයක ගාස්තුව | 300 0 | (බදු ඉවත් කරමින්) |
| (ii) | ගොඩනැගිල්ල ඉදිකිරීම් සහතික ගාස්තුව | 500 0 | (බදු ඉවත් කරමින්) |
| (iii) | ඉදිකිරීමේ සහතිකය පරීක්ෂක ගාස්තුව (ගොඩනැගිල්ලේ විශාලත්වයට අනුව නාගරික සංවර්ධන අධිකාරිය විසින් තීරණය කරනු ලබන මුදල) | | (බදු ඉවත් කරමින්) |
| (iv) | ගොඩනැගිලි ඉල්ලුම්පත්‍රය පරීක්ෂක ගාස්තුව (ගොඩනැගිල්ලේ විශාලත්වයට අනුව නාගරික සංවර්ධන අධිකාරිය විසින් තීරණය කරනු ලබන මුදල) | | (බදු ඉවත් කරමින්) |
| (v) | ගොඩනැගිල්ල අනුමැතියට කාලය දීර්ඝ කිරීමේ ගාස්තුව (එක් අවුරුද්දකට) | 200 0 | (බදු ඉවත් කරමින්) |
| (vi) | සැලසුම් ශිල්පී ලියාපදිංචි ගාස්තුව | 2,500 0 | (බදු ඉවත් කරමින්) |
| (vii) | සැලසුම් ශිල්පී අළුත්කිරීමේ ගාස්තුව | 2,500 0 | (බදු ඉවත් කරමින්) |
| (viii) | ගොඩනැගිල්ල නිර්මාණ සිතියමේ ගාස්තුව | 100 0 | (බදු ඉවත් කරමින්) |
| (ix) | උද්ධෘත පිටපතක ගාස්තුව | 500 0 | (බදු ඉවත් කරමින්) |
| (x) | උද්ධෘත පරීක්ෂක ගාස්තුව (එක් කැබැල්ලකට) | 50 0 | (බදු ඉවත් කරමින්) |

*02. වාහන හා සතුන් සඳහා බදු :-*

| | | | |
|---|---|---|---|
| (i) | යතුරු පැදියක බලපත්‍ර ගාස්තුව | 20 0 | (බදු ඉවත් කරමින්) |
| (ii) | හඳන බල්ලෙකු සඳහා බලපත්‍ර ගාස්තුව | 10 0 | (බදු ඉවත් කරමින්) |

*03. පුස්තකාල අංශයේ ගාස්තු අයකිරීම :-*

| | | | |
|---|---|---|---|
| (i) | සාමාජික ඉල්ලුම්පත්‍රයක ගාස්තු | 10 0 | (බදු ඉවත් කරමින්) |
| (ii) | නව සාමාජිකත්ව ගාස්තුව | 100 0 | |
| (iii) | සාමාජිකත්වය අළුත්කිරීමේ ගාස්තුව | 50 0 | |
| (iv) | නව සාමාජිකත්ව (ළමුන්) ගාස්තුව | 50 0 | |
| (v) | සාමාජිකත්වය (ළමුන්) අළුත්කිරීමේ ගාස්තුව | 25 0 | |
| (vi) | අදාල කාල සීමාව තුළ භාර නොදුන් පොතක් සඳහා දඩ මුදල (එක් දිනයකට) | 1 0 | |
| (vii) | සාමාජිකයා විසින් නැති කරන පොතකට අයකිරීම - පොතෙහි වටිනාකම මෙන් දෙගුණයක්, හා පොත බඳින කුලිය රු. 50 ක් | | |
| (viii) | කාර්යාලයීය නිලධාරියා විසින් නැති කරන පොතකට අයකිරීම - පොතෙහි වටිනාකමින් + 25%ක් | | |

*04. වරිපනම් අංශයේ අයකිරීම් :-*

| | | | |
|---|---|---|---|
| (i) | වරිපනම් නම වෙනස් කිරීමට ඉල්ලුම්පත්‍ර ගාස්තුව | 150 0 | (බදු ඉවත් කරමින්) |
| (ii) | වරිපනම් නම වෙනස් කිරීමට පරීක්ෂක ගාස්තුව | 300 0 | (බදු ඉවත් කරමින්) |
| (iii) | වීථි රේඛා සහතික ගාස්තුව | 100 0 | (බදු ඉවත් කරමින්) |
| (iv) | නොපවරාගැනීමේ සහතිකය | 100 0 | (බදු ඉවත් කරමින්) |
| (v) | හිමිකම් සහතිකය | 100 0 | (බදු ඉවත් කරමින්) |

*05. දඩාවතේ යන සතුන් පාලනය කිරීම :-*

| | | |
|---|---|---|
| (i) | රැඳවුම් මුදල - එක් එළුවකුට | 100 0 |
| (ii) | දඩ මුදල - එක් එළුවෙකුට | 200 0 |

| | | රු. ශත | |
|---|---|---|---|
| (iii) | නඩත්තු වියදම - දිනකට එක් එළුවෙකුට | 50 0 | |
| (iv) | රැඳවුම් මුදල - එක් හරකෙකුට | 200 0 | |
| (v) | දඩ මුදල - එක් හරකෙකුට | 500 0 | |
| (vi) | නඩත්තු වියදම - දිනකට එක් හරකෙකුට | 100 0 | |

*06. ගෝ ඝාතක ගාස්තු :-*

| | | | |
|---|---|---|---|
| (i) | එළු (එකක් සඳහා) | 50 0 | |
| (ii) | හරක් (එකක් සඳහා) | 100 0 | |

*07. සමුළු ශාලා කුලිය :-*

| | | | |
|---|---|---|---|
| (i) | ශාලාව පරිහරණය කිරීමේ ගාස්තුව (එක් දිනකට) | 500 0 | (බදු ඉවත් කරමින්) |
| (ii) | පුටු පරිහරණය කිරීමේ ගාස්තුව (දිනකට එක් පුටුවකට) | 10 0 | (බදු ඉවත් කරමින්) |

*08. ක්‍රීඩා පිට්ටනි අයකිරීම් :-*

| | | | |
|---|---|---|---|
| (i) | ක්‍රීඩා වැඩසටහන් - පළමු දිනය | 250 0 | (බදු ඉවත් කරමින්) |
| (ii) | පසුව එළඹෙන එක් දිනකට | 100 0 | (බදු ඉවත් කරමින්) |
| (iii) | විනෝදාංශ සහ වෙනත් වැඩසටහන් (එක් දිනකට) | 1,000 0 | (බදු ඉවත් කරමින්) |

*09. ජල සැපයුම :-*

| | | | |
|---|---|---|---|
| (i) | නල ළිං ජල සැපයුම (එක් මාසයකට) | 60 0 | |
| (ii) | අළුතින් ජල සැපයුම ලබාගැනීම සඳහා ඉල්ලුම්පත්‍ර ගාස්තුව | 100 0 | |
| (iii) | හිස් ජල බවුසරය සැපයීම (එක් දිනකට) | 1,000 0 | |
| (iv) | ජලය සමග ජල බවුසරය සැපයීම (දිනකට එක් වතාවක්) | 1,500 0 | |
| (v) | ජලය සමග ජල බවුසරය ගෙනගොස් සැපයීම (පුද්ගලිකව) (දිනකට එක් වතාවක්) | 2,500 0 | |
| (vi) | ජලය සමග ජල බවුසරය ගෙනගොස් සැපයීම (පුද්ගලික හැර වෙනත්) (දිනකට එක් වතාවක්) | 1,500 0 | |
| (vii) | නගර සභා බලසීමාවට පිට නම් සෑම අතිරේක කිලෝමීටරයකටම | 100 0 | |

*10. කසල බැහැර කිරීම :-*

| | | | |
|---|---|---|---|
| (i) | ට්‍රැක්ටරය මගින් ඝණ අපද්‍රව්‍යයන් බැහැර කිරීම (එක් වතාවකට) | 300 0 | |
| (ii) | කුකුල් මස් වෙළඳසැලේ කසල බැහැර කිරීමට ගාස්තුව (මාසිකව) | 5,000 0 | |
| (iii) | ආහාරපාන වෙළඳසැලේ කසල බැහැර කිරීමට ගාස්තුව (එක් වතාවකට) | 2,000 0 | (බදු ඉවත් කරමින්) |
| (iv) | වැසිකිළි මල අපද්‍රව්‍යයන් බැහැර කිරීම (එක් වතාවකට) | 4,000 0 | (බදු ඉවත් කරමින්) |
| (v) | නගර සභා බල සීමාවට පිට නම් සෑම අතිරේක කිලෝමීටරයකටම | 100 0 | (බදු ඉවත් කරමින්) |

*11. වෙළඳ සැල් කුලී අයකිරීම :-*

| | | | |
|---|---|---|---|
| (i) | මිළ තක්සේරු කිරීම් දෙපාර්තමේන්තුවෙන් තක්සේරු කරන මුදල, කුලිය වශයෙන් අය කෙරේ | | (බදු ඉවත් කරමින්) |

*12. ව්‍යාපාර බලපත්‍ර ගාස්තු :-*

| | | | |
|---|---|---|---|
| (i) | වෙළෙඳ සැලේ ආදායම, දේපලෙහි වටිනාකම යනාදිය අනුව ව්‍යාපාර බලපත්‍ර ගාස්තුව අයකෙරේ. | | (බදු ඉවත් කරමින්) |
| (ii) | වෛද්‍ය සහතික ඉල්ලුම්පත්‍රය | 100 0 | (බදු ඉවත් කරමින්) |

*13. පාරිසරික බලපත්‍ර :-*

| | | | |
|---|---|---|---|
| (i) | අළුත් ඉල්ලුම්පත්‍රයක ගාස්තුව | 100 0 | (බදු ඉවත් කරමින්) |
| (ii) | ඉල්ලුම්පත්‍රය අළුත් කිරීමේ ගාස්තුව | 50 0 | (බදු ඉවත් කරමින්) |
| (iii) | පරීක්ෂක ගාස්තුව (ස්ථානයේ මූලධනයට අනුව වෙනස්වේ) | | (බදු ඉවත් කරමින්) |
| (iv) | බලපත්‍ර ගාස්තුව (අවුරුදු තුනකට එක් වරක්) | 3,000 0 | (බදු ඉවත් කරමින්) |

14. දැන්වීම් සඳහා වූ අයකිරීම් :-

*(I) පෞද්ගලික දේපල*

| | රු. ශත | |
|---|---|---|
| (i) දැන්වීම් පුවරුවක් සඳහා ගාස්තුව (වර්ග අඩි 1කට) | 50 0 | (බදු ඉවත් කරමින්) |
| II. *නගර සභා දේපල (පරිශ්‍රය)* | | |
| (i) දැන්වීම් පුවරුවක් සඳහා ගාස්තුව (වර්ග අඩියකට) | 50 0 | (බදු ඉවත් කරමින්) |
| (ii) පරිශ්‍රය කුලිය -( වර්ග අඩි 1කට) | 100 0 | (බදු ඉවත් කරමින්) |
| III. *නගර සභා දේපල (ගොඩනැගිල්ල)* | | |
| (i) දැන්වීම් පුවරුවක් සඳහා ගාස්තුව වර්ග අඩි 1කට | 100 0 | (බදු ඉවත් කරමින්) |
| IV. *දැන්වීම් බැනර්* | | |
| (i) දැන්වීම් බැනරයක් සඳහා ගාස්තුව - වර්ග අඩි 1කට (එක් සතියකට) | 15 0 | (බදු ඉවත් කරමින්) |
| (ii) දැන්වීම් බැනරයක් සඳහා ගාස්තුව - වර්ග අඩි 1ක ට (මාස තුනකට) | 50 0 | (බදු ඉවත් කරමින්) |
| V. *වාහනය මගින් වූ ස්ථිර දැන්වීම් (එක් දිනකට)* | 500 0 | (බදු ඉවත් කරමින්) |
| VI. *වාහනය මගින් වූ සංචාරක දැන්වීම් (එක් දිනකට)* | 500 0 | (බදු ඉවත් කරමින්) |
| VII. ප්‍රදීප්ත දැන්වීම් පුවරු | | |
| (i) දැන්වීම් පුවරුවක් සඳහා ගාස්තුව - (වර්ග අඩි 1කට) | 200 0 | (බදු ඉවත් කරමින්) |
| VIII. ප්‍රචාරක දැන්වීම් (එක් ප්‍රචාරකයට) | 15 0 | (බදු ඉවත් කරමින්) |

*15. පොදු වෙළඳපල අයකිරීම් :-*

| | | |
|---|---|---|
| I. පරිශ්‍ර කුලිය : | | |
| (i) එළවළු වෙළඳපල 5x 5 (එක් දිනකට) | 25 0 | (බදු ඉවත් කරමින්) |
| (ii) බුලත් වෙළඳ සැල 5x 5(එක් දිනකට) | 25 0 | (බදු ඉවත් කරමින්) |
| (iii) රෙදිපිළි වෙළඳසැල 5x 5 (එක් දිනකට) | 25 0 | (බදු ඉවත් කරමින්) |
| (iv) පළතුරු වෙළඳසැල 5x 5(එක් දිනකට) | 20 0 | (බදු ඉවත් කරමින්) |
| (v) රතුළුණු වෙළඳ සැල 5x 5 (එක් නකට) | 20 0 | (බදු ඉවත් කරමින්) |
| (vi) පොල් වෙළඳ සැල 5x 5(එක් දිනකට) | 20 0 | (බදු ඉවත් කරමින්) |
| (vii) නිෂ්පාදිත භාණ්ඩ සඳහා බද්ද - විකුණුම් මිළෙන් 4%ක් | | |
| II. *මාළු වෙළඳපල :* | | |
| (i) පරිශ්‍ර කුලිය - 5' x 5' (දිනකට එක් පුද්ගලයෙකුට) | 30 0 | (බදු ඉවත් කරමින්) |
| (ii) මාළු කපා ශුද්ධ කිරීමට පරිශ්‍ර කුලිය (දිනකට එක් පුද්ගලයෙකුට) | 30 0 | (බදු ඉවත් කරමින්) |
| (iii) මාළු සඳහා බද්ද - මාළු විකුණුම් මිළෙන් 4%ක් | | |
| III. *වාහන ගාල් කිරීම :* | | |
| (i) පාපැදියක් ගාල් කිරීමේ ගාස්තුව | 5 0 | (බදු ඉවත් කරමින්) |
| (ii) යතුරු පැදියක් ගාල් කිරීමේ ගාස්තුව | 10 0 | (බදු ඉවත් කරමින්) |
| (iii) ත්‍රි රෝදරථයක්, කුඩා වාහනයක් ගාල් කිරීමේ ගාස්තුව | 20 0 | (බදු ඉවත'කරමින්) |
| (iv) ලොරියක්, විශාල වාහනයක් ගාල් කිරීමේ ගාස්තුව | 30 0 | (බදු ඉවත් කරමින්) |
| (v) වාහනයක් ඇතුලුවීමේ ගාස්තුව - එක් වතාවකට (අවම කි. ග්‍රෑ. 1,500) | 50 0 | (බදු ඉවත් කරමින්) |

16. පොදු වැසිකිළි :-

| | | |
|---|---|---|
| (i) පාවිච්චි ගාස්තුව - එක් වතාවකට | 5 0 | (බදු ඉවත් කරමින්) |

17. විනෝදාංශ බද්ද :-

(i) ස්ථිර සිනමාහල්වලින් විකුණුම් කරනු ලබන ඇතුල්වීමේ කුවිතාන්සියේ මුළු වටිනාකමින් 10%ක්.

(ii) සංස්කෘතික ශාලා සහ වෙනත් ස්ථානවල ගාස්තු අයකිරීම් වැඩසටහන් පවත්වන්නේ නම්, සභාවෙන් පූර්ව අනුමැතිය ලබාගත යුතු අතර විකුණුම් ගාස්තු අයකිරීම් කුවිතාන්සියේ වටිනාකමින් 10%ක් බද්ද ලෙස ගෙවීම් කළ යුතුවේ.
(වේදිකා නාට්‍ය, රූකඩ නැටුම්, අභිනය නැටුම්, වෙනත් වේදිකා මත පවත්වන ඒ හා සමාන වූ නැටුම් මෙයට ඇතුළත් නොවේ.)

03-791

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.